
# පුස්තකාල බලය



ජේම්ස් තොම්සන්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

# පුස්තකාල බලය

Sinhala Translation of “Library Power;
a new Philosophy of Librarianship” by
JAMES THOMPSON

# පුස්තකාල බලය

## පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ නව දර්ශනයක්

ජේම්ස් තොම්සන් BA, FLA
පුස්තකාලයාධිපති, රෙඩිං විශ්ව විද්‍යාලය
එක්සත් රාජධානිය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

ප්‍රථම මුද්‍රණය 1986

ප්‍රකාශනය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
නිදහස් මාවත, කොළඹ - 7.

# හැඳින්වීම.

එක්සත් රාජධානියේ රෙඩිං සරසවියේ පුස්තකාලයාධිපති ජේම්ස් තොම්සන් ගේ "Library Power; A New Philosophy of Librarianship" නම් ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය 'පුස්තකාල බලය' නමින් ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි. 1974 වර්ෂයේ ප්‍රථම වරට ප්‍රකාශනයට පත් වූ මෙය එතැන් පටන් ලොව පුරා ම පුස්තකාල ක්ෂෙත්‍රයේ විශාල ආන්දෝලනයක් ඇති කළ ග්‍රන්ථයකි. පුස්තකාලය මිනිස් සමාජයේ සෑම අංශයකට ම තීරණාත්මක අන්දමට වැදගත් වන ආකාරයත්, එම නිසා එය සතු අසීමිත බලයත් පිළිබඳව මෙහිදී කතුවරයා ඉතාමත් සරල හා පැහැදිලි ලෙස කරුණු ඉදිරිපත් කරයි. පුස්තකාලයාධිපතිත්වයේ දර්ශනය සකස් විය යුත්තේ, පුස්තකාල සතු මෙම විශාල බලය පදනම් කර ගෙන බව දක්වන කතුවරයා, වර්තමානයේ බොහෝ පුස්තකාලයාධිපතිවරුන් තම පුස්තකාල සතු මෙම බලතල හා ඒවායේ වැදගත්කම පිළිබඳව නිසි අවබෝධයක් ඇතිව නො සිටීම පොදුවේ පුස්තකාලවලත්, පුස්තකාල වෘත්තියේත් දුර්වලත්වයට බල පා ඇති ප්‍රධාන සාධකය බව පැහැදිලි කරයි.

පුස්තකාලයාධිපතිවරයාගේ පෞද්ගලිකත්වය, අදාළ පුස්තකාලයේත්, පුස්තකාල වෘත්තියේත් දියුණුවට බලපාන ආකාරය පැහැදිලි කරන කතුවරයා, සාර්ථක පුස්තකාල වෘත්තියක් බිහි කරලීමට නම් පුස්තකාලයාධිපතීන් සම්ප්‍රදායානුකූලව ඉටු කළ ලිපිකාර කටයුතු, අර්ධ වෘත්තීය කටයුතු සහ පරිපාලන කාර්යයන් වෙනත් අයට පවරා පුස්තකාලයාධිපතිත්වයේ වෘත්තීයමය අංශයට තම කටයුතුවල දී මුල් තැනක් ලබා දිය යුතු බව දක්වයි.

පසුගිය සියවස් කිහිපය තුළ පුස්තකාල වෘත්තිය වර්ධනය වූ ආකාරය හකුළා දක්වන කතුවරයා මෙබඳු දර්ශනයක් නොතිබීම නිසා පුස්තකාල වෘත්තියට එයට හිමි නියම ස්ථානය නොලැබීම නිදසුන් සහිතව ඉදිරිපත් කරයි. තමාගේ අදහස් සනාථ කරලීම සඳහා දාර්ශනිකයින් රාශියක් උපුටා දක්වමින් පුස්තකාල වෘත්තිය පිළිබඳ තමාගේ නව අදහස් ඉතාමත් මැනවින් ඉදිරිපත් කිරීම කතුවරයාගේ දක්ෂතාව හොඳින් පෙන්නුම් කරයි.

පසුගිය දශකය තුළ ලොව පුරා ම, විශේෂයෙන් ම යුරෝපයේ හා උතුරු ඇමරිකාවේ පුස්තකාල විද්‍යා පාසල්වල පුස්තකාල හා විඥාපන විද්‍යාව හදරන ශිෂ්‍යයන්ට මෙම කෘතිය අනිවාර්ය පාඨ ග්‍රන්ථයක් වීම මෙම ග්‍රන්ථයේ වැදගත්කම මොනවට කියාපාන සාධකයකි.

මෙම ග්‍රන්ථය සිංහල පරිවර්තනය කිරීමේ කාර්යය පුස්තකාල සේවා මණ්ඩලය මඟින් පවරනු ලැබුයේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ හිටපු ප්‍රධාන පර්යේෂණ නිලධාරී ඒ. සී. ආර්. පෙරේරා මහතා වෙත ය. ඇතැම් විෂය මූලික කරුණු පරිවර්තනය කිරීමේ දී මා ඔහුට සහාය වුවද, මෙබඳු කටයුතු- වලදී ඔහුට ඇති දීර්ඝ අත්දැකීම් මත, ඒ. සී. ආර්. පෙරේරා මහතා තම කාර්යය ඉතා උනන්දුවෙන් සහ මනා ව ඉටු කර ඇති බව සඳහන් කළ යුතු ය. ඒ පිළිබඳව ඒ මහතාට ඉතාමත් ස්තුතිවන්ත වෙමි. මෙම ග්‍රන්ථය කියවා බලා එහි සිංහල පරිවර්තනයක් ඉදිරිපත් කිරීමේ අදහසට මුල පටන් ම අනුකූලතාවයක් දැක්වූ මණ්ඩලයේ සභාපති එස්. අතුකෝරාළ මහතාටත්, විවිධ අන්දමින් අනුග්‍රහය දැක්වූ මණ්ඩලයේ අධ්‍යක්ෂ එන්. අමරසිංහ මහතාටත්, සෝදුපත් බැලීමෙන් සහාය වූ සමන් තිලකසිරි මහතා සහ ශ්‍රියානි පෙරේරා මෙනෙවියටත්, විවිධ අන්දමින් සහාය වූ සහකාර පුස්තකාල- යාධිපති එම්. තිලකරත්න මහත්මියටත්, අත් පිටපත යතුරු ලියනය කළ ජී. එච්. අයිරාංගනී සහ පද්මා රත්නායක මෙනෙවියන්ටත්, පිට කවරය සකස් කළ රංජිත් බණ්ඩාර මහතාටත්, මුද්‍රණ කටයුතුවලදී සහාය වූ නෙල්සන් පීරිස් මහතාට සහ හොඳින් මුද්‍රණ කටයුතු කළ ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ මුද්‍රණ ශිල්පීන්ටත් කෘතඥ වෙමි.

උපාලි අමරසිරි
නියෝජ්‍ය අධ්‍යක්ෂ.

1986 මාර්තු
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
නිදහස් මාවත,
කොළඹ 07.

# පටුන

පිටු


| | | |
|---|---|---|
| 1. | පිළිබිඹුව | 1 |
| 2. | මුහුණත දර්ශනය | 7 |
| 3. | විශිෂ්ට ගණය | 14 |
| 4. | ව්‍යුහය | 22 |
| 5. | කටයුතු | 36 |
| 6. | සමාජය | 43 |
| 7. | අධ්‍යාපනය | 58 |
| 8. | සංස්කෘතිය | 73 |
| 9. | බලපෑම | 83 |
| 10. | ඇප කැපවීම | 106 |
| 11. | අනාගතය | 120 |
| 12. | අවසානය | 131 |

1

# පිළිබිඹුව

අපේ සමාජයෙහි පුස්තකාලවලට ලැබෙන්නේ ගරු තැනකි. පාසල් මෙන් ම පුස්තකාල ද හැම තැනක ම පිහිටා ඇත. ඒවායේ අගය සම්පූර්ණයෙන් ම පිළිගන්නා අතර පුස්තකාලවල ප්‍රයෝජනය සඳහා මහජන මුදල් සහ සම්පත් සැලකිය යුතු ප්‍රමාණයක් සපයා තිබේ. එහෙත් නිසැක ව ම සිදු වී ඇත්තේ, පුස්තකාල වෘත්තියෙහි යෙදී සිටින්නන් පුස්තකාල සතු බලය ගැන නොදන්නවා මෙන් ම, ඒ ගැන නොසලකා සිටින බව ද දක්නට ලැබීමයි.

පුස්තකාල කාර්යයන් පිළිබඳ විශේෂයෙන් ම එහි ශිල්පීය සහ සංවිධානාත්මක අංශය පිළිබඳ ව විස්තර සහිත ව හදරා පර්යේෂණයන් ද කර ඇත. බොහෝ කල් ගත වූවාට පසු මෑතක දී පුස්තකාල පාඨකයන්ගේ අවශ්‍යතා ගැන ද හැදෑරීම ආරම්භ කර තිබේ. එහෙත් පුස්තකාලවල බලය සහ හැකියාව විග්‍රහ කර අගය කිරීමට තවමත් නියම ප්‍රයත්නයක් දරා නැත.

පුස්තකාලවල ලේඛන සුරක්ෂිත කිරීමේ සහ භාරව සිටීමේ කාර්යයන් කෙරෙන් මූලික වශයෙන් පුස්තකාල බලය ඇතිවේ. පුස්තකාල, මානව විද්‍යා සහ තාක්ෂණ දැනුම පිළිබඳව ගබඩා වේ. මනුෂ්‍ය වර්ගයාගේ අර්ථ සිද්ධීන් සහ සොයා ගැනීම් ඇතුළු මානව ශිෂ්ටාචාරයේ වාර්තා පුස්තකාල සුරක්ෂිත කරයි. ඒවා ප්ලේටෝගේ "Republic" පොත විය හැකිය. එසේත් නැත්නම් හාර්වේගේ "Exercitatio anatomica de motu cordis et Sanguinis" හෝ ඩාර්වින්ගේ "on the origin of species" නමැති කෘතීන් විය හැකිය. ආර්.සී. බෙන් ලියා තිබෙන අන්දමට "සංස්කෘතියක පාරම්පරික කාර්යය වනුයේ යම් කිසි වර්ගයකට ජීවත් වීමට උපකාරි වීමයි. මෙයින් අදහස් කරන්නේ යට ගිය අතීතය ආරක්ෂා කිරීමයි". —පුස්තකාල අපේ සංස්කෘතිය ආරක්ෂා කරනවා පමණක් නොව, සංනිවේදන මාර්ගවල නියෝජිතයන් ලෙස සම්ප්‍රේෂණයේ වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

තෝමස් කාලයිල් 'The hero as a man of letters' නමැති සිය කෘතියෙහි මෙය පැහැදිලි ව මෙන් ම සත්‍ය ලෙස විස්තර කරයි. 'ආත්මය වසා සිටි ශරීරයත්, එහි ද්‍රව්‍යමය කොටසත්. සිහිනයක් මෙන් සම්පූර්ණයෙන් අතුරුදහන් වූ විට සකල අතීතයේ ම ආත්මයත් එය හඬ නගා පැහැදිලි ලෙස ප්‍රකාශ වන කට හඬත් ගැබ් වී ඇත්තේ පොත්වල ය. විශාල නාවික බල ඇණි සහ හමුදාවන් ද, වරායවල් සහ යුද්ධායුධ ගබඩාවන්ද, මහත් නගරවල්, උත්තුංග ගෝලාකාර ගොඩනැගිලි ශිඛරවල් ද විශාල යන්ත්‍රෝපකරණ ද, මේ සියල්ල මහාර්ඝ ය, බලවත් ය: එහෙත් ඒවාට සිදු වන්නේ කුමක් ද? ඇගමෙම්නෝන්වරු සහ ඇගමෙම්නෝන්, බොහෝ පෙරික්ලිස්වරු සහ ඔවුන්ගේ ග්‍රීසිය: ඒ සියල්ල දැන් කුඩා කැබලිවලට කැඩී සුන් බුන් වී ඇත. එහෙත් ග්‍රීසියේ පොත්, ඒවායෙහි හැම චින්තකයකුට ම ග්‍රීසිය සැබවින් ම පවතියි. නැවතත් ඒවාට ජීවනය දිය හැකි ය. මනුෂ්‍ය වර්ගයා කළ, සිතූ දිනා ගත් හෝ ඔවුන්ගේ තත්ත්වය: ඒ සියල්ල පොත් පිටුවල පුදුමාකාර ලෙස සුරක්ෂිතවී තිබේ.'

අධ්‍යාපනයෙහි පුස්තකාල සතු කාර්ය භාරය, ඒවායෙහි බලය තව දුරටත් ප්‍රකාශ වීමකි. බටහිර ශිෂ්ටාචාරයෙහි විධිමත් අධ්‍යාපන ක්‍රමය නිතර ම පොත් කේන්ද්‍රස්ථානයෙහි ලා සලකන බැවින්, පුස්තකාල සහ විධිමත් අධ්‍යාපන ක්‍රමය අතර ඇති කිට්ටු සම්බන්ධකම නොවැළැක්විය හැකි බව ජේ. එච්. ෂේරා (Shera) ප්‍රකාශ කරයි. පොත් දුර්ලභ සහ මිල අධික කාලයන්හි පවා ලබා ගත හැකි පොත පත, පැපිරස් ලේඛන හෝ වේවා, හම් ලේඛන හෝ වේවා, මැක්ගෆි ගේ කියවීම් පොත හෝ වේවා, ගුරුවරයා සහ ශිෂ්‍යයා යන දෙදෙනා ම අධික ලෙස පොත්වල පිහිට පැතූහ. තවමත් පොත පත ස්වයං අධ්‍යාපනයෙහි සම්පූර්ණ සහ අත් දුටු ක්‍රමය ලෙස පවතියි.

අධ්‍යාපන විෂයයෙහි පුස්තකාල බලය පැහැදිලි ලෙස දර්ශනය වන්නේ විශ්ව විද්‍යාලයීය සහ ශාස්ත්‍රීය පුස්තකාල-වල ය. ඒවායේ ප්‍රමාණය, නිතර ම විශාල වන සහ සුරක්ෂිත කෙරෙන, කිසි දිනෙක ලක්ෂයකට වඩා අඩු නොවන ඒවායේ

පොත් එකතුව, විශ්ව විද්‍යාල භූමියෙහි ප්‍රධාන තැනක පිහිටා ඇති ඒවායේ දර්ශනීය ගොඩනැගිලි සහ අවුරුදු ගණනාවක් තිස්සේ පුස්තකාල වෙනුවෙන් වියදම් කරන ලද මුදල් යන සියල්ල මෙයට දෙස් දෙයි.

අධ්‍යාපනයෙහි පුස්තකාල බලය යනුවෙන් හැඳින්-වෙන්නේ ජාතික සහ පෞද්ගලික වශයෙන් පුස්තකාල ද්‍රව්‍යමය සංවර්ධනයේ උපකරණ වශයෙනි. ඌන සංවර්ධිත රටවල පැහැදිලි ලක්ෂණයක් නම් පුස්තකාල දුර්ලභ වීමයි. එහෙයින් දුප්පත් මිනිසා නියත වශයෙන් ම වාගේ නූගත් මිනිසෙකි.

වඩා භාවාත්මක මට්ටමකින් ප්‍රකාශ කළ හොත් බුද්ධිමය සහ කලාත්මක අර්ථය අනුව සංස්කෘතිය හා සමඟ ඇති පුස්තකාලවල සම්බන්ධතාව නිසා පුස්තකාල බලය පැන නගියි. නිර්මාණ සහ පාරිකල්පිත කෘති සාහිත්‍යමය ස්වරූපයකින් පුස්තකාලවල තිබෙනවා පමණක් නොව, සම්පූර්ණයෙන් සංස්කෘතික කටයුතු ගැබ්වන පරිදි ඔවුන් ගේ කාර්ය භාරය පුළුල් කර ඇත. පුස්තකාල සහ කලාවන් යන දෙකට ම වග කියන පළාත් පාලන බලධාරී කම්වු පත් කිරීමෙන්, මේ දෙක අතරේ ඇති දැඩි සම්බන්ධතාව සාමාන්‍ය-යෙන් පිළිබිඹු කරයි. පුස්තකාල රංග ශාලා සහ පුස්තකාල ප්‍රදර්ශන, ග්‍රැමෆෝන් තැටි සහ ටේප් එකතු, චිත්‍රපටි සේවා සහ චිත්‍ර එකතු ද පුස්තකාලවලින් සැපයේ. දේශන, සහ ගායනා හෝ වාදන වලට එමගින් අනුග්‍රහය සපයයි. අත්කම් ප්‍රදර්ශනය කිරීමට ධෛර්ය දේ. ප්‍රාදේශීය ඉතිහාසය වැනි ක්ෂෙත්‍රයන්හි උනන්දු වීමට සලස්වා ඒ පිළිබඳ ප්‍රකාශන නිකුත් කරයි.

සමාජයේ සංස්කෘතික කටයුතුවලට පුස්තකාල සම්බන්ධ වීම නිසා සමාජයේ ක්‍රීඩා සහ විනෝදාත්මක කාර්යයන්වද පුස්තකාල සම්බන්ධ වේ. එක් මහජන පුස්තකාලයාධිපති-වරයකු ප්‍රකාශ කර ඇති අන්දමට, පුස්තකාලය දැන් කෞතුකාගාරය, නාට්‍ය ශාලාව, සිනමා ශාලාව, තැටි සමාජ, විවිධ ප්‍රකාශන ශාලා, රැස්වීම් ශාලා සහ (සමහර පුස්තකාල ආපන ශාලා සපයන බැවින්) ආපන ශාලා සමග සම්බන්ධකම්

පවත්වයි. නූතන ජීවිතයේ විවේකය වැදගත් තැනක් දරන බැවින් 'ව්‍යාප්ති සේවා' පුස්තකාල විසින් බාර ගැනීම නිසා පුස්තකාල බලය තවත් ශක්තිමත් වී ඇත.

විශේෂ ප්‍රශ්න සහිත සමාජයේ අවශ්‍යතා පිළිබඳව ද පුස්තකාල සම්බන්ධ වී ඇත. ආරෝග්‍යශාලා වලට, බන්ධනාගාරාවලට සේවා සපයනු ලැබේ. ආබාධිත පුද්ගලයනට කියවීම් පහසුකම් සකස් කොට ඇත. රට හැර යන්නන් ගේ ප්‍රයෝජනය සඳහා විශේෂ ලිපි සංග්‍රහ පිළියෙළ කර ඇත. ළමයින් සහ තරුණයන් අතර සේවාවන් පිළිබඳව පුස්තකාල වලට දීර්ඝ වාර්තාවක් තිබේ. ගෙදරින් පිට යා නොහැකි හා සමාජයෙන් වෙන් ව වෙසෙන පාඨකයන්ට ජංගම සේවා පිළියෙළ කර ඇත.

ඇස්. ආර්. රංගනාදන් ප්‍රකාශ කරන අන්දමට, 'ද්‍රව්‍යමය ප්‍රීතියත්, මානසික සතුටත්, ආත්මික වාසනාවත් ඇති කිරීමට පුස්තකාලවලට බලය තිබේ. පුස්තකාල, සියල්ලන් ගේ නිත්‍ය ස්වයං අධ්‍යාපනයට මාර්ගයක් සපයා දීමේ යුතුකම හාර සමාජ ආයතනය වන අතර අදහස් හුවමාරුවට ද විවේක කාලය සංවිධානය කිරීමට ද ප්‍රජාතන්ත්‍රවාදයේ අවශ්‍යතාවන් සැපයීමට ද උගත්කම පැතිර වීමට ද වෙළෙඳ හා කාර්මික ව්‍යාපාරවල සාර්ථක භාවයට ද ආධාර වේ.'

මේ සියල්ලට වඩා හාත්පසින් ම නව අර්ථයකින් කියතොත් පුස්තකාල, සමාජ හා දේශපාලන පරිවර්තන සඳහා බලවත් ආයුධ වේ. ඒවා අවිශ්වාසයට හා සැකයට භාජනය වූ අතර, හැම වර්ගයක ම ඒකාධිපතිවරුන් පුස්තකාල බොහෝ විට යටපත් කර හෝ ඉවත් කර දැමූ බව ඉතිහාසයේ සඳහන් වේ. පසුගිය ශත වර්ෂයේ දී මහජන පුස්තකාල ක්‍රමය පිහිටුවීම පිළිබඳව බ්‍රිතාන්‍යයේ පාලක පක්ෂය විරුද්ධ වූයේ ය. පුස්තකාල සහ පත පොතට ප්‍රවේශය ලැබීමෙන් තම තත්ත්වයට වඩා ඉහළින් කම්කරුවනට අදහස් ලැබී පුස්තකාල රටේ නොසන්සුන්තාවට මුල් වී රාජ ද්‍රෝහීකම්වලට හේතු වේ යයි ඔවුහු කල්පනා කළහ. මේ අදහස් දරූ අය ඇත්ත වශයෙන් ම

නිවැරදි බව පසු කල දක්නට ලැබුණි. තමන් ගේ සුළු අධ්‍යාපනය ප්‍රාදේශීය පුස්තකාලය භාවිතා කිරීමෙන් වැඩි දියුණු කර ගත් කම්කරු ජනතාව ගේ පරම්පරා කිහිපයෙන් වඩා යුක්ති සහගත, වඩා මානුෂික හා වඩා ප්‍රජාතන්ත්‍රවාදී වූ මේ රටේ වර්තමාන දේශපාලන තත්ත්වය පැන නැගී ඇත. ''ප්‍රජාතන්ත්‍රවාදී සමාජය පොත්වල දියණියයි. එය දෙවියන් වහන්සේ විසින් ලියන ලද පොත අභිබවා මිනිසා විසින් ලියන ලද පොත ජය ගැනීමක් වන අතර ඒකාධිපති වාදය විසින් නියම කරන ලද නීති පොත ද ජය ගැනීමකි.'' යයි ඔර්ටෙගා වයි ගැසට් නමැත්තා ලියා තිබේ.

වඩාත් විප්ලවවාදී ලෙස ප්‍රකාශ කරනවා නම් පුස්තකාල පැවතෙන්නේ චින්තනයේ නිදහස සඳහායි. නිදහසේ ඉතාමත් වැදගත් අංගයක් පමණක් නොව සමස්තයක් වශයෙන් නිදහස ලබා ගැනීම සහ රැක ගැනීමට මාර්ගයක් ලෙස මේ නිදහස ආරක්‍ෂා කර ගැනීමෙන් පුස්තකාලයාධිපති අද්විතීය සේවයක් කරන බව බ්‍රෝඩ්ෆීල්ඩ් අවධාරණයෙන් ප්‍රකාශ කර තිබේ. 'නිදහසේ කල්පනා කර පැමිණෙන ලද මත දරන හා සිතන මිනිසුන් සහිත සමාජයක් බිහි කිරීමට උපකාර වීම'' පුස්තකාලයක ප්‍රධාන කාර්යයක් ලෙස හෙතෙම විස්තර කරයි. ''පරමාර්ථයන්ගේ ඉතාමත් අවසානය මනුෂ්‍ය සත්ත්වයායි. ඔහු ගේ නිදහස් තත්ත්වය ඔහුගේ උසස් ම තත්ත්වයයි. ඔහු ගේ නිදහසේ ඉතාමත් මූලික අංගයක් වනුයේ සිතීමේ නිදහසයි. එය පවත්වා ගෙන යාමට මූලික අවශ්‍යතාව පුස්තකාලයයි.'' යනුවෙන් හේ තව දුරටත් ප්‍රකාශ කරයි.

මේ කිසි ම ස්වභාවයක්වත්, මේ කිසි ම වගකීමක්වත්, මේ කිසි ම බලයක්වත් පිළිබිඹු කිරීමට පුස්තකාල වෘත්තිය අපොහොසත් වී සිටියි. ඇත්ත වශයෙන්ම රජයේ හෝ ජාතික වශයෙන් තමන් 'වෘත්තියමය' තත්ත්වයක සිටින බවවත් ඔප්පු කිරීමට තවමත් පුස්තකාලයාධිපතිවරුනට හැකිවී නැත. වෘත්තියක සාමාජිකයන් ලෙස හැඳින්වෙන්නෝ කණ්ඩායමක් වශයෙන් යම් විශේෂ ගුණ සතු ව සිටී යයි පෙනෙන, කණ්ඩායමක් වශයෙන් බලය පැවරීමට මහජනයාට හැකි වන, හා

මහජනයා කෙරෙහි කණ්ඩායමක් ලෙස බලපෑමක් කළ හැකි අයයි'' යනුවෙන් එන්සල් සමීක්ෂණයේ ඉදිරිපත් කරන ලද 'වෘත්තිය' යන්නෙහි නිර්වචනය පිළිගත හොත් ඒ අනුව පුස්තකාලයාධිපතිවරුන් වෘත්තියක් බවට රජයේ මට්ටමින් හෝ ජාතික මට්ටමින් හෝ කිසි ප්‍රශ්නයක් නොමැතිව ඔප්පු වී තිබේ දැයි පිළිගෙන නැත.

*References*


1. Benge, R C: *Libraries and cultural change*. **London, Bingley, 1970.**
2. **Shera, J H:** *The foundations of education for librarianship*. **New York. Becker and Hayes, 1972.**
3. **Ranganathan, S R:** *Library needs of renascent India*. **Presidential Address, Eighth All India Library Conference, 1949.**
4. **Ortegay Gasset, J: 'The mission of the librarian'.** *Antioch review*, vol 21, 1961.
5. **Broadfield, A:** *A philosophy of librarianship*. **London, Grafton, 1949.**
6. **Fielding, F D O: 'A valediction on a non - profession'.** *Australian library journal*, May 1972.

# 2

# මුහුණත දර්ශනය

පුස්තකාලවලින් ඉදිරිපත් වන බලයේ පිළිබිඹුව පුස්තකාලයාධිපතිවරුන් විසින් අගය කරන්නේ ඉතාමත් අඩු හා අසම්පූර්ණ අන්දමිනි. එබැවින් ඔවුන්ගෙන් ඉටු විය යුතු කාර්යය ඉටු විය යුතු ආකාරයට වඩා ඉතාමත් අඩු පාඩු සහිත ලෙස පමණක් නොව ඔවුන් ගැන ඔවුන් විසින් ම ඇති කරන පිළිබිඹුව පුස්තකාලවල වැඩි යහපතට එරෙහි ව කෙළින් ම ක්‍රියා කරයි.

පුස්තකාල භාරකරුවන් වශයෙන් පුස්තකාලයාධිපතිවරුන් රැස් කරන සම්පත් හේතු කොට ගෙන ඔවුහු තමන් තුළ ප්‍රබෝධයක් හෝ උද්යෝගයක් ඇති කර ගන්නවාට වඩා අකාර්යශීලී බවට පත් වෙති. ''වරදෙහි මුල ඇත්තේ පුස්තකාලය ගබඩාවක් ලෙස සැලකීමේ පාරම්පරික අදහසෙහිය. තමා විසින් ම දියුණුවීම සහ නිස්කලංක ව සිටීම යන කරුණු දෙකට ම බොහෝ පුස්තකාලවලින් මාර්ග සැපයේ. එහෙත් පෝෂණය කිරීම, උනන්දු කිරීම සහ ධෛර්යමත් කිරීම යන පුස්තකාල අවශ්‍යතා පිළිගනු ලබන්නේ ස්වල්ප දෙනකු විසිනි. පාරම්පරික පුස්තකාලයේ කේන්ද්‍රීය කරුණ එහි පොත් තොගයයි. මහජන පුස්තකාලයක පොත් තොගය කෙතරම් විධිමත් ලෙස සකස් කොට තිබුණත් ඒ සියල්ල පැහැදිලි ලෙසම නිෂ්ප්‍රයෝජන ය, වැඩකට නැත'' යනුවෙන් ඩෙරෙක් ටොයින් ප්‍රකාශ කරයි.

එහි ප්‍රතිඵලය වනුයේ පුස්තකාලය භාවිතා කරන්නන් එහි ඇතුළු වන, එ ලෙස ම රූපාකාරයෙන් ප්‍රකාශ කළහොත් ලෝකයට තම සේවය ඉටු කිරීමට පුස්තකාලයාධිපතිට ප්‍රාදූර්භූත වන ඉදිරි දොරටුවට වඩා පොත් පත් සහ අනිකුත් ද්‍රව්‍ය පුස්තකාලයට ඇතුළු වන පසු පස දොරටුව වැදගත් තැනක් ගැනීමයි.

සූචි සකස් කිරීම සහ රාක්ක ක්‍රමයද, ක්‍රමචර්යා කටයුතු හා ලිපිකරු වැඩ කටයුතු ද, වැනි පොත් සුරක්ෂිත කිරීමේ නොයෙකුත් ක්‍රම ගැන පුස්තකාලයාධිපතිවරුන් විසින් කරනු ලබන අවධාරණයේ ප්‍රතිඵලයක් වශයෙන් මේ තත්ත්වය තවත් උග්‍ර විය. මේ නයින් වෙනස්වීම්වලට හා නවීකරණයට ඉතාමත් එරෙහි නිල පාලන ක්‍රමයක් ඇති විය. මෙවැනි පුස්තකාලයාධිපති තනතුරට ඉතාමත් සුදුසු තැනැත්තා අන්තර්වර්තකයකු ලෙස හැඳින්විය හැක. ක්‍රමානුකූල එහෙත් ප්‍රතිභා ශක්තියක් නොමැති කෙනෙකි. එහෙයින් පුස්ත-කාලයාධිපතිවරයකු උගත්, ඇසූ පිරූ තැන් ඇති සහ බුද්ධිමත් පුද්ගලයකු ලෙස ජනප්‍රිය පිළිබිඹුවකින් ඔහුට ලබා ගත හැකි යම් ප්‍රයෝජනයක් ඇත්නම් සම්පූර්ණයෙන් මෙහිදී එය නොලැබී යයි.

පුස්තකාලයාධිපතිවරයකු ගේ මෙ වැනි පිළිබිඹුවකින් මතු සිදු විය හැකි ප්‍රතිඵලයක් මෑතක දී සිදු විය. 1939 වසරේ දී එක්සත් ජනපදයේ කොන්ග්‍රස් සභාවේ පුස්තකාලයාධිපති වශයෙන් කවියකු පත් කිරීමත් 1972 දී බ්‍රිතාන්‍ය පුස්තකාලයේ ප්‍රධාන විධායක වශයෙන් සිවිල් සේවකයකු පත් කිරීමත් මේ සිදුවීම් ය. පුස්තකාල ඉතිහාසයේ මේ සිද්ධි දෙක විශ්ලේෂණ-යට භාජනය කළ යුත්තේ පුස්තකාල වෘත්තිය විසින් ම අනුන්ට කපන ලද වළෙහි තමන් ම වැටුණු බැවිනි. මේ හැම අවස්ථාවකදීම පුස්තකාලයාධිපතිවරුන්ට සලකා ඇත්තේ ඔවුන් පෙන්නු තම තත්ත්වයේ ආකාරයට මිස ඔවුන්ගෙන් බලාපොරොත්තු විය හැකි තත්ත්වය අනුව නොවේ. මෙයට ප්‍රධාන හේතුව පුස්තකාලයාධිපතිවරුන් තමන් ගැන ම වැරදි නිගමනවලට බැස සිටීමයි. රොබර්ට් ඇස්. ටේලර් ප්‍රකාශ කරන පරිදි 'මානවීය ධර්මයන්ට අදාල ආයතනයක ප්‍රධානීන් ලෙස නොව, තොග ලේඛන සහ පාලනය පමණක් භාරව සිටින ගබඩා භාරකරුවන් ලෙස පුස්තකාලයාධිපතිවරු තමන් ගැන ම සලකති.'

කොන්ග්‍රස් සභාවේ පුස්තකාලයට ආචිබෝල්ඩ් මැක්ලීෂ් පත් කිරීම ගැන ඊවා ගෝල්ඩ්ස්මිට් විසින් විස්තර කරන පරිදි, පුස්තකාලයාධිපති කම වෘත්තියක් ලෙස සලකන සේ ඉල්ලා සිටි විට එය මහා බොරුවක් ලෙස සලකා රූස්වෙල්ට් ජනාධිපතිතුමා එම ඉල්ලීම ඉවත ලූයේ යයි ඕ කියයි.

විශාල පුස්තකාලයක ප්‍රධානියකු තුළ තිබිය යුත්තේ චිත්තෝත්පාදක ශක්තියක් හා විචක්ෂණ භාවයක් බවත් එවැන්නකු පොත් ගැන දන්නා, පොත්වලට ඇල්මක් ඇති, පොත් නිර්මාණය කිරීමට දත් කෙනකු විය යුතු බවත්, ජනාධිපතිවරයා ගේ උපදේශකයන්ගෙන් කෙනකු වන පිලික්ස් ෆ්‍රැන්ක්ෆර්ටර් විනිශ්චයකාරතුමා ලියා තිබේ. ඔහුට මේ ගුණාංග තුන ඇත්නම් පුස්තකාල වෘත්තිය පිළිබඳ ශිල්ප නිපුණතාව පහසුවෙන් ලබා ගත හැකි යයි හේ තව දුරටත් ප්‍රකාශ කරයි.

තිස් අවුරුද්දකට පමණ පසු, විශේෂයෙන් කොන්ග්‍රස් සභා පුස්තකාලයේ මැක්ලීෂ්ගේ සාර්ථකත්වයේ අනුසාරයෙන් රූස්වෙල්ට් ජනාධිපතිතුමා ගේ තීරණය සමග විරුද්ධ වීමට එතරම් පහසු නැත. අරුන්ඩෙල් එස්ඩෙයිල් විසින් මැක්ලීෂ් විස්තර කරන ලද අන්දමට "හේ පුහුණු නීතිඥයෙකි, රට තොට පතළ තැනැත්තෙකි. ප්‍රධාන පෙළේ කවියෙකි. ඇත්තවශයෙන් ම බුද්ධිමතෙකි". පුස්තකාලයාධිපති තනතුරට ඔහු සමග තරඟ කළ අය පුස්තකාල ශිල්පියෝ වෙති. ඇමරිකාවේ සිටි සුදුසුකම් ලත් පුස්තකාලයාධිපතිවරුන් අතර කොන්ග්‍රස් සභාවේ පුස්තකාලයාධිපති වීමට තරම් උසස් කෙනෙක් නැතැයි එකල පවා පුස්තකාල සභරාව කල්පනා කළේය.

මේ සම්පූර්ණ සිද්ධියම 1971 - 72 දී එක්සත් රාජධානියේ දී ද නැවතත් සිදු විය. බ්‍රිතාන්‍ය පුස්තකාලය කර ගෙන යාමට සුදුස්සෙක් බ්‍රිතාන්‍ය පුස්තකාලයාධිපතිවරුන් අතර නැතැයි නැවතත් කල්පනා කරන ලදී. අවශ්‍ය වී ඇත්තේ පුස්තකාලයාධිපතිවරයකුට වඩා පරිපාලකයකු යයි නිලධාරීහු කල්පනා කළහ. ඒ තනතුර පුස්තකාලයාධිපති යන්න වෙනුවට

ප්‍රධාන විධායක වශයෙන් නම් කරන ලද්දේ එබැවිනි. 'ජාතික පුස්තකාලයේ කළමනාකාරිත්වය සඳහා සිවිල් සේවය යොදා ගැනීම ගැන පුස්තකාලයාධිපතිවරු සාධාරණ අන්දමටත් වඩා කැලඹී නොසිටීම තමාට පුදුම යයි' පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ කෙනෙත් ලෝමාස් ප්‍රකාශ කර තිබේ. 'වගකිව යුත්තන් විසින් පත්තර දැන්වීමක වචන සමග ඇස් බැන්දුම් කිරීමට සූදනම් වන අතර සහ තමන්ගේ ඇස් පනා පිට ම බාහිර පුද්ගලයකු රක්‍ෂාව පැහැර ගෙන යන තෙක් නිකම් බලා ගෙන සිටින අය අතික් වෘත්තීන්හි සිටිත් නම් මට සිතා ගත හැක්කේ ඉතා ස්වල්ප දෙනකු ගැන පමණි.' යනුවෙන් හේ තව දුරටත් ප්‍රකාශ කළේය. පුස්තකාලයාධිපතිවරුන් තමන් ගැන ම බලා කියා ගැනීමට අපොහොසත් අය ලෙස ලෝමාස්ට පෙනී ගිය බැවින් හෙතෙම පහත දැක්වෙන උපදේශය ඔවුනට දුන්නේය. "ඒ අතරතුර මා යෝජනාවක් කරන්නට කැමතියි, එනම් ඔබ අතුරෙන් ජ්‍යෙෂ්ඨ අය නියමිත සංඛ්‍යාවක් තෝරා ගෙන රජයේ මට්ටමේ උසස් රැකියාවන් සඳහා ඔවුන් උනන්දුවෙන් සූදනම් කරන්න. කාන්තාවන්ට සමාජ ගති සිරිත් උගන්වන පාසල් හෝ ව්‍යාපාර කටයුතු පිළිබඳ උගන්වන පාසල් ගැන සඳහන් කිරීමට මම පසුබට වෙමි. සමහර විට හොඳ ම නිදර්ශනය වශයෙන් ගත හැක්කේ කළ නොහැකි කාර්යයක් මෙන් පෙනී ගිය හඳ මත ගොඩ බැසීම සඳහා ඇමරිකන්වරුන් මිනිසුන් තෝරා ගෙන පුහුණු කළ අන්දමයි. ජ්‍යෙෂ්ඨ පදවි සඳහා ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීමට දැන් සිටම පියවර ගතහොත් ඊ ළඟ අවස්ථාව පැමිණි විට ඔබ සූදනම් ව සිටිනවා ඇත. එවිට උසස් ම මට්ටමේ ඉතාමත් අවශ්‍ය කාර්යයන් සඳහා පුස්තකාලයාධිපතිවරුන් සැපයීමට නොහැකි වූ බවට පුස්තකාල වෘත්තිය අන්තිමේදී විස්මයෙන් ආපසු නො බලන බව නිසැක ය."

එහෙත් කොන්ග්‍රස් සභාවේ පුස්තකාලයාධිපති වශයෙන් කවියකු පත් කිරීමත්, බ්‍රිතාන්‍යයේ පුස්තකාලයාධිපති වශයෙන් සිවිල් සේවකයකු පත් කිරීමත්, යන සිද්ධි දෙක ම පුස්තකාල වෘත්තිය තම කාර්ය භාරය හා තත්ත්වය ඌන ලෙස හා අසම්පූර්ණ ලෙස අර්ථ නිරූපණය කිරීමෙන් කෙළින් ම ඇති වූ ප්‍රතිඵලයකි.

තමා ගැන ම සීමා සහිත අදහසක් පුස්තකාල වෘත්තිය විසින් දැරීමේ හේතුවලින් බොහෝ සංඛ්‍යාවක් ඓතිහාසික වේ. පුස්තකාල පොත් එකතුන් කුඩා වූ කල සහ මේ හා සම්බන්ධ වූ පුද්ගලයන් සංඛ්‍යාව සිය ගණනකට පමණක් සීමා වූ එක්සත් ජනපදයේ ශාස්ත්‍රීය පුස්තකාලයාධිපතිත්වයේ මුල් කාලයේ එය වර්ධනය වූ ආකාරය ආතර් ඇම්. මැක්ඇනලි විස්තර කරන්නේ මෙසේය. ''පුස්තකාලයාධිපතිවරුන් ගේ ප්‍රධාන කාර්යය වී ඇත්තේ පොත් ඇණවුම් කිරීම, සුචි සැකසුම හා පොත් වර්ගීකරණය වැනි පුස්තකාල පාලනය නොහොත් පොත් පිළිවෙළට තබා ගැනීමේ ක්‍රමයයි. පොත් භාවිතය ගැන දක්වන ලද්දේ ඉතා අඩු සැලකිල්ලකි. මේ ශත වර්ෂය ආරම්භ වන තෙක් පළමුවන 'ආශ්‍රය පුස්තකාලයාධිපතිවරයා' පත් නොකරන ලදී. පොත්වල අන්තර්ගත දේ පිළිබඳව හෝ ආයතනය තුළ පුස්තකාලයට අයත් අධ්‍යාපනික කාර්ය භාරය ගැන දක්වන ලද්දේ ඉතා අඩු සැලකිල්ලකි. උසස් තත්ත්වයේ අධ්‍යාපනයට පුස්තකාල සේවය වැදගත් ය යන සංකල්පය ඉස්මතු වීමට තව කලක් ගත විය.''

පුස්තකාලය පාලනය කිරීම ගැන පමණක් සැලකිලිමත්වීම ඔවුන්ගේ කාර්යය වූ බැවින් පුස්තකාලයාධිපතිවරුන් විසින් ඉටු කළ යුතු යුතුකම්වල මට්ටම් භේදයක් ආදිය පුස්තකාල-යාධිපතිවරුන් වටහා ගත්තේ ඉතා කලාතුරකිනි. එහෙයින් ලිපිකාර හා වෘත්තීය කටයුතු අතර වෙනසක් ඔවුන් දුටුවේ නැත.

මේ පුස්තකාල පාලන ආකල්පය වෘත්තීය හා ලිපිකාර කාර්යයන් අතර වෙනස බෙදා වෙන් කර ගැනීමට අපොහොසත් වීම නිසා බරපතල ප්‍රතිඵල දෙකක් ඇති විය. එකක් පුස්තකාල වෘත්තියට ඉතාමත් හානිකර තත්ත්වයක් වූ වේතන පහළ තත්ත්වයේ තිබීමයි. අනෙක ගැහැනු අය වැඩි සංඛ්‍යාවක් පුස්තකාල සේවයට ඇතුළු වීමයි. ගැහැනු අයට පුස්තකාල සේවය මනා ලෙස ගැලපෙන්නාක් මෙන් පෙනුනු අතර ඔවුහු අඩු වේතනවලට වැඩ කිරීමට සතුටු වූහ.

අවාසනාවකට මෙන් තමන්ගේ ම ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගැනීමට පුස්තකාලයාධිපතිවරුන් අසතුටු සේ පෙනේ. ද්විතීයික විද්‍යාල හා විශ්ව විද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ට ශාස්ත්‍රීය පදවි පිරි නැමීමේ ප්‍රශ්නය ගැන එල්ඩ්‍රඩ් ස්මිත් කථා කරද්දී වර්තමාන කාලය යොද මෙසේ කථා කරයි. 'තමන් ගේ ශ්‍රමය පුස්තකාල කටයුතුවල වඩා සම්ප්‍රදායික අංශයට අවධානයෙන් යෙදීමෙන්, පරිපාලන අරමුණු වඩා අවධාරණය කිරීමෙන් සහ නිලධාරීන්ගේ සංවිධානාත්මක සැලැස්මවල් යොද ගැනීමෙන් ද්විතීයික විද්‍යාල හා විශ්ව විද්‍යාල පුස්තකාලයාධිපතිවරු තම වර්ගයා ගේ ශාස්ත්‍රීය නොවන අංශය සමඟ ප්‍රබල ලෙස සම්බන්ධ වී සිටිත්. පූර්ණ කාලීන ව ශාස්ත්‍රීය පදවි දරන්නන් ලෙස තමන් පිළි ගැනීම පිණිස ඉතා දැඩි ලෙස කථා කළ පුස්තකාලයාධිපතිවරු පවා තමන් ඒ තත්ත්වයට පිළි ගැනීම කළ යුතු අය කෙරෙහි තමන් ගැන ම තමා විසින් දැක්විය යුතු පිළිබිඹුවෙහි නොහොත් ප්‍රතිරූපයෙහි බරපතල අඩුපාඩුකම් පිළි ගනිති.'

ශාස්ත්‍රීය පුස්තකාලයාධිපති තනතුරු දරන ඇමරිකානු පුස්තකාලයාධිපතීන්ගේ සමාජ සම්භවයන්, අධ්‍යාපනික තත්ත්වයන් හා පෞද්ගලිකත්ව ලක්ෂණ ගැන අධ්‍යයනයක් කළ පෙරී ඩී. මොරිසන් එම නිගමනයට පැමිණියේ ය. ශාස්ත්‍රීය පදවි දරන බොහෝ පුස්තකාලයාධිපතිවරුන්ට ද ඇත්තේ වෘත්තීය රක්ෂාවල යෙදෙන්නන්ට ඇති ජීවිත දර්ශනයක් නොව, ලිපිකාර රක්ෂාවල යෙදෙන්නන්ට ඇති ජීවිත දර්ශනයකි. ඔවුන්ගෙන් බොහෝ දෙනකු නියම වශයෙන් ම කරන්නේ ලිපිකාර තත්ත්වයේ වැඩ බව මෙයින් පිළිබිඹු විය හැක. 'ප්‍රබල නායකත්වයක් ඇති කරන ලක්ෂණවල හිඟකමක් සහ අධීක්ෂණයෙහි දක්ෂතාවන්ගේ හීනතා පොදු වශයෙන් ඔහුට දක්නට ලැබිණ. මේ පොදු රීතියට ඇති ව්‍යාතිරේකයන් ගේ ලක්ෂණ හඳුනා ගැනීමට ද ඔහුට හැකි විය. ඒවා නම් වෘත්තියෙහි විශිෂ්ටයන්ගේ ලක්ෂණයයි.

*References*


1. Toyne, D: 'The creative artist in the public library' *Library Association record,* January 1973.
2. Taylor, R S: *The making of a library: the academic library in transition.* New York, Becker and Hayes 1972.
3. Goldschmidt, E: 'Archibald Macleish, Libarian of Congress' *College and research libraries,* January 1969.
4. Esdaile, A: 'The Librarian of Congress' *Library Association record,* August, 1939.
5. Lomas, K: 'Libraries from an MP's point of view' *Library Association record,* April 1973.
6. McAnally, A M: 'Status of the university librarian in the academic community' *In* Orne, J *ed*: *Research libarianship: essays in honor of Robert B Downs.* New York Bowker, 1971.
7. Smith, E: 'Academic status for college and university librarians–problems and prospects'. *College and research libraries,* January 1970.
8. Morrison, P D: *The career of the academic librarian.* Chicago, American Library Association, 1969.

# 3

# විශිෂ්ට ගණය

පුස්තකාල වෘත්තියෙහි ධුරාවලිය තුළ පදවි තත්ත්වය වැඩි වනවිට ලිපිකාර තත්ත්වයෙන් නොව වෘත්තීය හා කළමනාකාරිත්ව තත්ත්වයෙන් තමන් දෙස ම බැලීමට පුස්තකාලයාධිපතිවරු පටන් ගත්හ. පුස්තකාල සේවයේ ඉහළ පදවි සඳහා උසස් කිරීම්වලට තුඩු දෙන ගුණාංගයන් ද ඔවුහු හඳුනා ගත්හ. 'හුදු අධ්‍යාපන ප්‍රමාණය, නියම වෘත්තීය පුහුණුව, රක්ෂාවක් වශයෙන් පුස්තකාල සේවයට මුල් අවස්ථාවේදී ම බැඳීම, සංවිලතාව සහ ප්‍රකාශන ගණනාවක් කර තිබීම' මේ ගුණාංග වශයෙන් හඳුනා ගන්නා ලදි. ඒවා එකින් එක ගෙන විස්තරාත්මක ව පරීක්ෂා කිරීම වැදගත් ය. එහෙත් ඒවා පිළිබඳ ව කළ හැකි පොදු නිරීක්ෂණ ගණනාවක් කිරීම ද අවශ්‍ය වේ.

මේ ලක්ෂණ හෝ ඒවායින් වැඩි කොටසක් සතු ව සිටින පුස්තකාල සේවයේ සාමාජිකයෝ විශිෂ්ට ගණයට අයත් වෙත්. පුස්තකාල වෘත්තිය විසින් පුස්තකාලවල බලය යම් විටෙක පිළිබිඹු කරන්නේ එවැනි විශිෂ්ට ගණයක් පදනම් කර ගැනීමෙන් පමණි. දෙවැනි ගණයේ පුස්තකාලයාධිපතිවරුන්, සහකාරයන්, සහ සූචි සකසන්නන් ඕනෑවටත් වඩා වැඩියෙන් සිටින බව, 1887 වැනි ආදි කාලයක දී (ජැක් ඩෝල්ටන් සඳහන් කරන පරිදි) මෙල්විල් ඩිවි චෝදනා කළේය. ඔහුට ඇත්ත වශයෙන් ම අවශ්‍ය වූයේ වෘත්තීය කටයුතුවලදී ඉතා හොඳින් වැඩ කරන බවට පෙර නිමිති දක්වන විශාල සංඛ්‍යාවකින් පරිස්සමින් තෝරා ගන්නා ලද කුඩා කණ්ඩායමක් ය. බුද්ධිය සම්බන්ධයෙන් තිබිය යුතු උසස් තත්ත්වය ගැනවත් නොසලකා ඕනෑ ම යහපත් යයි සලකන ස්ත්‍රියකට හෝ පුරුෂයකුට පුස්තකාලයාධිපතිත්වය පිරිනැමිය යුතු දැයි ඩෝල්ටන් ප්‍රශ්න කරයි.

පුස්තකාල අධ්‍යාපනයේ පැරණි මෙන් ම නිරන්තර කරදරයක් ලෙස ද ගුණයට එරෙහි ව ප්‍රමාණය පිළිබඳ ප්‍රශ්නයක් ලෙස ද සලකනු ලබන මේ ගැටලුව එල්ඩ්‍රඩ් ස්මිත් විසින් ද විසඳීමට තැත් කර මෙසේ ප්‍රකාශ කරයි. 'අතිරේක වෘත්තියමය පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් පුස්තකාලවලට අවශ්‍යය යන වැරදි විශ්වාසය මත අවුරුදු ගණනාවක් එල්බී ඌන අධ්‍යාපනයක් ලත් උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් පාසල්වලින් පිට කර ඇත. අතිරේක වෘත්තීයමය පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් ශාස්ත්‍රීය පුස්තකාලවලට අවශ්‍ය නැත. මොනවා නැතත් පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරු ඕනෑවටත් වැඩියෙන් සිටිත්. ඔවුන්ගෙන් බොහෝ දෙනකු වැඩි කාලයක් ගත කරන්නේ ලිපිකාර වැඩවල යෙදීමෙනි. මේ කාර්යය අඩු පඩියකට වෘත්තීයම ය නොවන පුද්ගලයන් ගේ අතින් ඒ තරමට ම හොඳින් කර ගත හැකි වේ. ශාස්ත්‍රීය පුස්තකාලවලට අවශ්‍ය ව ඇත්තේ දැනට වැඩි කොට ම පුද්ගලයන් නොමැති අංශ වූ පොත් එකතුව දියුණු කළ හැකි, වැදගත් ආශ්‍රය හා ග්‍රන්ථ විඥපකයන් වශයෙන් ක්‍රියා කළ හැකි, වඩා හොඳ අධ්‍යාපනයක් ලත්, පුස්තකාලයාධිපතිවරුන් ය.

විශිෂ්ට ගණය යන වචනය නොයෙදුව ද ස්මිත් තර්ක කරන්නේ ද එවැනි කොටසක් සම්බන්ධයෙනි. වෘත්තීය පුස්තකාල සංගම්වල සාමාජිකත්වයෙහි සංයුතිය 'භින්න ජාති' බැවින් වෘත්තීය සම්මතයන් පිහිටුවා ගැනීමට ඔවුන්ට අවස්ථාවක් නොලැබිණි. එවැනි සංගම් නිෂ්ඵල බවට පත් වූයේ එබැවිනි.

විශිෂ්ට ගණයේ පුස්තකාලයාධිපතිවරුන් ගේ ලක්ෂණ ගැන කථා කරන විට එම සේවයට ඇතුළු වන අයගේ අධ්‍යාපනික සුදුසුකම් ඉතා වැදගත් ය. මෙය සම්මත ලෙස පිළි ගැනුණකි. 1923 දී මේ සම්බන්ධයෙන් ලියූ චාර්ල්ස්, සී විලියම්සන් ගේ උද්ධෘත පාඨයක් ඩෝල්ටන් ගෙන හැර දක්වයි. 'යම්කිසි පුද්ගලයකුට පුස්තකාල විද්‍යාව සම්බන්ධයෙන් කෙතරම් පුළුල් පුහුණුවක් දුන්නත් ඔහුට හොඳ සාමාන්‍ය අධ්‍යාපනයක් නැත්නම් හෙතෙම සාර්ථක පුස්තකාලයාධිපතිවරයෙක් නොවන්නේ ය. පුස්තකාලයාධිපති තනතුර සඳහා

ලබන පුහුණුවේ ඉතාමත් අත්‍යවශ්‍ය කොටස ද්විතියික විද්‍යාලයක මාර්ගයෙන් ලබන සාමාන්‍ය අධ්‍යාපනයයි. පුස්තකාලයාධිපති තනතුර සඳහා විශේෂයෙන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය කාලය ඉතාමත් කෙටි ය. ඉතාමත් වැදගත් සුදුසුකම විවිධ මාර්ගවලින් ලබා ගත හැකි සාමාන්‍ය අධ්‍යාපනය සහ මිනිසුන් සහ පොත් පිළිබඳ දැනුම වූ අතර එය වැඩිපුරම පිහිටීම බලාපොරොත්තු විය හැක්කේ ද්විතියක අධ්‍යාපනය අවසන් කළ කෙනකු තුළය.''

මේ ප්‍රකාශයට ඩෝල්ටන් තමා ගේ මතය එකතු කරයි. 'අපේ අන්තර් ජාතික පුස්තකාලයාධිපති සහෝදරත්වයට ආදර්ශ පාඨය වී ඇත්තේ 'පාණ්ඩිත්‍යය සහ සේවය' යන්නයි. අපි හැම විට ම එකක් සම්බන්ධයෙන් සම්පූර්ණ වූ අතර, අනෙක සම්බන්ධයෙන් අඩුපාඩු සහිත වීමු. තරුණ උගත්හු අප සේවයෙහි කිසි කලෙක නොසිටියහ. අදත් නැත. සර්ව සම්පූර්ණ පාණ්ඩිත්‍යයක අවශ්‍යතාව අදට වඩා කිසි කලක දූනි නැත.'

උසස් අධ්‍යාපනික සුදුසුකම්වල මූලික වැදගත්කම පිළිබඳ එවැනි මත කරණ කොට ගෙන පුස්තකාලයාධිපතිවරුන් ගේ විශිෂ්ට ගණයේ පදනම ලෙස පුස්තකාල විද්‍යාව පිළිබඳ මූලික උපාධිය සැලකීම ඉබේ ම බැහැර වේ. උසස් අධ්‍යාපනික සුදුසුකම් ගැන සැලකිලිමත් විය යුත්තේ උසස් අධ්‍යාපන ආයතනවල වැඩ කරන පුස්තකාලයාධිපතිවරුන් සම්බන්ධ-යෙන් පමණක් නොවන බව මෙහිදී සඳහන් කළ යුතු ය. මහජන පුස්තකාල අංශය සම්බන්ධයෙන් මේ සුදුසුකම් වැදගත් ය. නගරයක හෝ ප්‍රදේශයක පුස්තකාලයාධිපතිවරයකු ගේ වැදගත්කමට ඇති එක ම සුදුසුකම, ඔහු අනෙක් පුරවැසියන්ට වඩා උගත් කෙනෙකුය යන්නයි. එසේ නැත්නම් ඔහුත් ඔහු ගේ පුස්තකාලයත් අන්‍යයන්ට මාර්ගෝපදේශනය කරන්නේ කෙසේද?

පුස්තකාලයාධිපතිවරයකුගෙන් බලාපොරොත්තු විය හැකි අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සම්මත ක්‍රමයක් සකස් කර ගැනීමට නොයෙක් වාරවලදී උත්සාහ කරනු ලැබීය. මේ

හැම අවස්ථාවකදී ම උපාධියක් සතු ව සිටීම මූලික අංගය වශයෙන් පොදු එකඟත්වයකට පැමුණුණි. උපාධිධර වෘත්තියක් බිහි කිරීමට මහා බ්‍රිතාන්‍යයේ පුස්තකාල සංගමය දැන් නිල වශයෙන් පොරොන්දු වී ඇත. ''කාර්මික ශිල්පියා ගේ කාර්ය භාරය පරිගණක යන්ත්‍රයට හා ආධුනිකයාට භාර කළ විට පුස්තකාලයාධිපතිවරයකු වීම සඳහා උසස් ම අවශ්‍යතා වන්නේ බහුශ්‍රැත වීමත් පාඨකයා සහ ගුරුවරයා ගේ තත්ත්වයේ කටයුතු කිරීමත්'' යයි බාර්සන් නියම ලෙස අවධාරණය කරා ඇත. ''පුස්තකාලයාධිපතිවරයකු ගේ අධ්‍යාපනික සුදුසුකම් ආචාර්ය උපාධිය දක්වා ම උසස් විය යුතු නැත. එහෙත් සාමාන්‍ය ආචාර්ය උපාධිධරයකුට වඩා පොත් රාශියක් කියවා තිබීමත් ඒවායේ විෂය පථය පුළුල් වීමත් වඩා වැදගත්'' ය. යනු බාර්සන්ගේ පරමාධ්‍යාශ මතයයි. එහෙත් තත්ත්වාකාර-යෙන් සඳහන් කළහොත් පුස්තකාලයාධිපතිවරයකු උසස් උපාධියක් සතු කර ගෙන තිබුණහොත් ඔහුගේ තත්ත්වයත් ඔහු කෙරෙහි තබන විශ්වාසයත් වැඩි වනවා ඇත.

විශිෂ්ට ගණයේ පුස්තකාලයාධිපතිවරයකු මුල් අවදියේදී ඉතා හොඳ අධ්‍යාපනයක් ලබා තිබිය යුතු පමණක් නොව තමාගේ ජීවිත කාලය තුළ ම ඔහු අධ්‍යාපනය ලැබීමේ කටයුතු වල නිරතව සිටිය යුතු ය. එ මෙන් ම ඔහු සංස්කෘතික හා කලා කටයුතු සමග හැකි තරම් සම්බන්ධ වී සිටිය යුතු වේ. 'පුස්තකාලය ගොඩනැගිල්ලකි, ආයතනයකි, සේවා නියෝජ්‍යත්වයකි. එය පිහිටා තිබෙන සමාජය තුළ බලයකි. එහෙත් එහි ක්‍රියාකාරිත්වයෙහි පුළුල් බව හා ලක්‍ෂණ රඳා පවතින්නේ එය පාලනය කරන පුද්ගලයන් මත ය. විශේෂයෙන් ම ප්‍රධාන පුස්තකාලයාධිපති මත ය. පුස්තකාලය හා සමාජය හා සම්බන්ධවන ආකාරය කෙරෙහි ඔහු ගේ උනන්දුව හා ක්‍රියා කලාපය බෙහෙවින් බල පාන්නේය. එබැවින් පුස්තකාලයාධිපතිවරු කෙතරම් දුරට අධ්‍යාපනික කටයුතුවලට සම්බන්ධ වී සිටිත් ද, කෙතරම් සංස්කෘතික කටයුතුවල නිරත වී සිටිත් ද යනු ප්‍රශ්න කිරීම උචිත ය. සැලකිය යුතු ප්‍රමාණයකට ඔවුන් එවැනි කටයුතුවල සහභාගි වී ඇත්නම් මහජන පුස්තකාල සහ අනිකුත් සංවිධානාත්මක

සංස්කෘතික කටයුතු හා සමග කිට්ටු සතුටුදයක සම්බන්ධ-තාවක් තිබෙන බවට සාක්ෂි ඇතැයි' සමාජයේ පුස්තකාලය සතු තත්ත්වය ගැන විමසුමක් කළ බ්‍රයන් ලක්හම් පුස්තකාලයාධිපතිගේ කාර්ය භාරය ගැන නිගමනය කළේය.

සාර්ථක පුස්තකාලයාධිපතිවරුන් සතු ව තිබිය යුතු දෙවැනි ගුණාංගය එ නම් වෘත්තීය පුහුණුව, පැහැදිලි ලෙස ම පුස්තකාලයාධිපති තැන සතුව තිබිය යුතු සාමාන්‍ය අධ්‍යාපනයට හා සංස්කෘතික හැකියාවන්ට වඩා වැදගත්කමෙන් අඩු බව ඉහත දක්වූ විස්තරයෙන් පැහැදිලි වේ. ප්‍රමාණවත් කෙටි පාඨමාලාවක් එක් කරුණක් සම්බන්ධයෙන් සැපයිය හැකි අතර අනෙක සම්බන්ධයෙන් එසේ සැපයිය නොහැක.

''පුස්තකාල විද්‍යාව දූන් උගන්වන දෙය පිළිබඳ ඕනෑම සමීක්ෂණයකින් සහ එම විද්‍යාල දූනට නිරත වී සිටින කරුණු පිළිබඳ ඕනෑම පරීක්ෂණයකින් පැහැදිලි වන දෙයක් නම් වර්තමානයට අවශ්‍ය ව ඇත්තේ හුදු පාරම්පාරික වැඩ සටහන් තව දුරටත් නඟා සිටුවීමට උත්සාහ කිරීම නොව අමුතු ම අවධාරණ මාලාවක් සහ අමුතු ම ප්‍රතිපත්ති මාලාවක් අනුගමනය කිරීම ය. ශිලිපීය කරුණු ඉගැන්වීමේදී සැබැවින් ම පුස්තකාල විද්‍යාලවලට උපදෙස් දීම අවශ්‍ය නොවේ. එහෙත් දූනට ඒවා අනුගමනය කරන ක්‍රියා මාර්ගයට වඩා වෙනස් ක්‍රියා මාර්ගයක් ඒවාට පෙන්වා දිය යුතු ය. සමහර විට ඉදිරි අවුරුදු කිහිපය තුළ පුස්තකාල විද්‍යාලවල ඉතා වැදගත් කාර්යය වනුයේ ශිෂ්‍යයන්ට ඉගැන්වීම නොව කාර්ය භාර හා අරමුණුවල අර්ථ නිරූපණය කිරීම'' යයි ඩෝල්ටන් ලියා තිබේ.

පුස්තකාල විද්‍යාලයක් විසින් කළ යුත්තේ සමාජය තුළ අධ්‍යාපනයෙහි හා සංස්කෘතියෙහි පවතින පුස්තකාලයෙහි බලය උගන්වා සමාජයෙහි යහපත උදෙසා මේ බලය උපයෝගී කර ගැනීමට වෘත්තියට බැඳෙන ආධුනිකයන් සූදනම් කිරීමයි. එවිට පාරම්පරික ශිල්පීය පුහුණුව පරමාර්ථය ම වශයෙන් නොව පරමාර්ථයක් කරා යන මාර්ගයක් වශයෙන් එය සතු ස්ථානයට පත්වනවා ඇත. එයින් තව දුරටත් නිගමනය කළ හැක්කේ පුස්තකාලයාධිපති තනතුර සඳහා

සිරිත් පරිදි කරන ආරම්භක පුහුණුව සඳහා කාලය කෙටි විය යුතුය යන්නය. එය සාමාන්‍යයෙන් අවුරුද්දකට වඩා දික් විය යුතු නොවේ. යොමු ආශ්‍රය පිළිබඳ ඉක්මන් කෙටි පාඨමාර්ග සහ විශේෂ උපකරණ වලින් විශේෂ විෂයයන් පිළිබඳ තොරතුරු සොයන වැඩ වැනි විශේෂ අංශ පිළිබඳ සවිස්තර පුහුණුව අවසානයේදී කළ යුතුය. තවත් ඒ හා සම්බන්ධ දෙයක් නම් පුස්තකාල විසින් ම (පෙරි මොරිසන් කියන අන්දමට) පළපුරුදු පුස්තකාලයාධිපතිවරුන්ට සාරවත් සේවස්ථ අධ්‍යාපනයක් සැපයීම යි. පුස්තකාල සංගම් (පන්සල් ගේ සමීක්ෂණයෙන් නිර්දේශ කර ඇති අන්දමට) වෘත්තීය සන්නිවේදනය දියුණු කිරීම සඳහා හා වෘත්තීය සංවර්ධනය ප්‍රබෝධමත් කිරීම සඳහා සේවා සැපයීම සම්බන්ධයෙන් වඩා උද්යෝගී සක්‍රිය ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු ය.

සාර්ථකත්වය සඳහා මොරිසන්ගේ තුන් වැනි ගුණාංගය වන්නේ රක්ෂාවක් වශයෙන් පුස්තකාල සේවයට මුල් අවස්ථාවේදී ම බැඳීමයි. පුස්තකාල සේවය විශිෂ්ට ගණයේ වෘත්තියක් වශයෙන් ස්ථිර ලෙස ස්ථාපනය වූවා නම් එය තිබුණාට වඩා සාමාන්‍ය ගුණාංගයක් වනු ඇත. පුස්තකාල සේවයට උසස් ම ගණයේ ශිෂ්‍යයන් ඇදී නොඑන බවත් එවැනි ශිෂ්‍යයන් සේවයට බැඳුණත් බොහෝ දෙනකු සේවයෙහි රඳවා ගැනීමට නොහැකි බවත් මෑතකදී කරන ලද අධ්‍යයනයකින් හෙළි වූ කරුණු වලට එල්ඩ්රඩ් ස්මිත් අවධානය යොමු කරවයි. පුස්තකාල සේවය විශිෂ්ට ගණයේ ලා සලකා එය උසස් දර්ශනයක් ලෙස හෝ න්‍යාය ධර්මයක්ලෙස හෝ සලකනු ලැබුවහොත් එවැනි ප්‍රශ්න විද්‍යාමාන නොවනු ඇත. එවිට වෘත්තියට ඇදී එන අය, වඩා සේවයට කැප වන අතර තමා කරන වැඩ ගැනත් එහි වැදගත්කම ගැනත් එය ඉටු කිරීමට තමා විසින් කළ යුතු කාර්ය භාරය ගැනත් ඇප කැප වී වැඩ කරන ක්‍රියාශීලී ප්‍රතිභා ශක්තියක් ඇති අය සේවයට බැඳෙතියි ස්මිත් විසින් බලාපොරොත්තු වූ පුද්ගලයෝ, සාමාන්‍යයෙන් රීතියක් වශයෙන් සේවයට බැඳෙන්නාහ.

සාර්ථක පුස්තකාලයාධිපතිවරයකු ගේ ගුණාංගයක් ලෙස සංචලතාව ඒ තත්ත්වයෙන්ම සැලකිය නොහැක. එහෙත් එයින් වැදගත් ප්‍රශ්න රාශියක් මතු වෙයි. පුස්තකාලයාධිපති තනතුර දැන් පවත්නා තත්ත්වය අනුව සංචලතාව යනුවෙන් හැඳින්වෙන්නේ උසස්වීම් සෙවීමට වඩා මඳක් වැඩි දෙයකි. එයින් අදහස් කෙරෙන්නේ පුස්තකාලවල පාරම්පරික කාර්ය මණ්ඩල ව්‍යුහය වන ධුරාවලි පිරමීඩය ස්ථිර ලෙස අනවතරයෙන් නැගීමයි. පුස්තකාලයාධිපති තනතුර, වෘත්තිය තත්ත්වයේදී (ඊළඟ පරිච්ඡේදයේදී විස්තර කර ඇති අන්දමට) ධුරාවලියට අයත් නොවන ලෙස ව්‍යුහගත වී විශිෂ්ට ගණයේ වෘත්තියක් වූවා නම්, මේ නො ඉවසිලි සංචලතාව අවශ්‍ය වන්නේ නැත.

කෙසේ හෝ වේවා සංචලතාවයෙහි නෛසර්ගික කුසලතා ද ඇත. පුස්තකාලවල යහපත සඳහා සහ පෞද්ගලික ව පුස්තකාලයාධිපතිවරුන් ගේ යහපත සඳහා ද පුස්තකාල අතර කාර්ය මණ්ඩල වෙනස් වීමක් තිබිය යුතු ය. පුස්තකාල අතර කාර්ය මණ්ඩල ක්‍රමවත් පිළිවෙළකට හුවමාරු වීමෙන් පුස්තකාලවලට නිතර ම නව අදහස් සහ කටයුතු සම්බන්ධයෙන් විවිධ නව මාර්ග ලැබෙනවා ඇත. ඒ අනුව වෘත්තීය අන්තර් පුස්තකාල අදහස් හුවමාරුව හා සම්බන්ධතාව වැඩි දියුණු වනු ඇත. පෞද්ගලිකව පුස්තකාලයාධිපතිවරුන් සම්බන්ධයෙන් නම් විවිධ සිද්ධි ආශ්‍රයෙන් හා විවිධ අවස්ථාවල තමාගේ පුහුණුව සහ පළපුරුද්ද පරීක්ෂා කර බැලීමටත්, එක් පාඨක පිරිස් වර්ගයක ගේ වඩා ඕනෑ එපාකම් ඉගෙන ගැනීමටත්, තමාගේ වෘත්තිය දැනුම හා ආචාර ධර්ම පර සංසේවනය වැනි ක්‍රමයකින් වැඩි දියුණු කර ගැනීමටත්, ඔවුනට හැකි වේ. තමා ගේ විශේෂඥ දැනුම වඩා වැඩි දියුණු, ප්‍රසන්න, අවබෝධයක් ඇති තැන්වල දී වාසි ප්‍රයෝජන ලබනවාට වඩා ඉතා දුෂ්කර සහ වරප්‍රසාද අඩු අවස්ථා හා තැන්වලට දීමට පෞද්ගලික පුස්තකාලයාධිපතිවරු අවශ්‍ය අන්දමට උනන්දු විය යුතු වෙති.

පුස්තකාලයාධිපතිවරයකුට තිබිය යුතු, මොරිසන් විසින් දක්වන ලද ගුණාංග පහෙන් අවසාන ගුණාංගය වූ, පුස්තකාල-යාධිපතිවරයා විසින් පළ කර ඇති ප්‍රකාශන සංඛ්‍යාව පැහැදිලි ව ම වැදගත් වන්නේ ඔහු යම් කිසි ආකාරයෙක නිවේදකයකු නොහොත් ප්‍රකාශකයකු විය යුතු බැවිනි. පොත් සහ පුස්තකාල සම්බන්ධයෙන් එය හුදෙක් ප්‍රකාශකයකු වශයෙන් විය හැකි ය. සාමාන්‍ය වශයෙන් පුවත්පත්වල හා සඟරාවල, රූපවාහිනියේ සහ රේඩියෝවේ විය හැකි ය. විද්වත් තත්ත්වයක සිට වෘත්තීය වශයෙන් හෝ යම් කිසි විෂය ක්ෂෙත්‍රයක කරන සැලකිය යුතු සේවයක් විය යුතු ය. සමහර විට නිදර්ශනයක් ලෙස කවියකු වශයෙන් කරන නිර්මාණ කෘතියක් විය හැකි ය. කුමන තත්ත්වයේ වුවත්, කුමන ක්ෂෙත්‍රයක වුවත් පුස්තකාලයාධිපතිවරයකුට නිශ්ශබ්දව සිටිය නොහැක.


*References*

1. Dalton, J: 'Library education'. *In* Orne, J *ed*: *Research librarianship: essays in honor of Robert B Downes*. New York, Bowker, 1971.
2. Smith, E: 'Academic status for college and university librarians problems and prospects'. *College and research libraries,* January 1970.
3. Barzun, J: 'The new librarian to the rescue'. *Library journal* 1st November 1969.
4. Luckham, B: *The library in society*. London, Library Association, 1971.

# 4

# ව්‍යූහය

පුස්තකාලයාධිපතිත්වය විශිෂ්ට ගණයෙහි ලා සැලකෙන වෘත්තියක් වීමට නම් එය අද පවත්නා අන්දමට ව්‍යූහගත විය නොහැක. පුස්තකාලවල කාර්ය මණ්ඩලය බහු ශ්‍රේණි සහිත විය යුතු අතර එහි පාලනය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට විය යුතුය.

මේ අවශ්‍යතා සෑම වර්ගයක ම පුස්තකාලවලට අදාළ වේ. එහෙත් පොදු ප්‍රතිපත්ති පිළිබඳ සමහර ප්‍රකාශවලට පූර්විකාවක් වශයෙන්,- 1962 නෝර්වුඩ්හි පිහිටුවන ලද ඊස්ට් ඇන්ග්ලියා පුස්තකාලය වැන්නක කාර්ය කලාප ඉතිහාසය විස්තරාත්මක ව සලකා බැලීම සුදුසු ය. ආරම්භයේ සිට ම විශ්ව විද්‍යාල පුස්තකාලයාධිපතිවරයා වන ඩබ්ලිව්. එල්. ගට්ස්මන් විෂය විශේෂඥ ව්‍යූහයක් පිහිටෙව්වේ ය. ඔහු තමා ගේ පුස්තකාලයාධිපතිවරුන් පත් කළේ ප්‍රධාන වශයෙන් ඔවුන් ගේ ශාස්ත්‍රීය සුදුසුකම් අනුව ය. ඒ ඒ ක්ෂෙත්‍රවල ඔවුන් ගේ කාර්යයන් වූයේ පොත් තේරීම, විශේෂ ග්‍රන්ථ නාමාවලි පිළිබඳ විමසීම් ගැන කටයුතු කිරීම, විෂයයන් සම්බන්ධ ග්‍රන්ථ නාමාවලී සහ තොරතුරු උද්ධරණ අංශ ගැන උපාධි අපේක්ෂකයනට උපදෙස් දීම සහ වර්ගීකරණය විය. සම්ප්‍රදායික පුස්තකාල සේවා ධුරාවලියක් මගින් කෙරෙන සංවර්ධනයක් මත රඳා නො සිට විෂය විශේෂඥතාව පදනම් කර ගත් රක්ෂා ව්‍යූහයක් පුස්තකාලයේ සෑම ක්ෂෙත්‍රයකට ම හේ සැලසුම් කළේය.

එසේ වුවත් සියලු පුස්තකාලවල ස්වභාවය කරණ කොට ගෙන, පරිපාලන කාර්යයන් මාලාවක් පුස්තකාල අතර බෙදා ගැනීම සඳහා කටයුතු සැලැස්වීමට ඔහුට සිදු විය. එහෙත් ඒවා පුළුල් අර්ධ කාලීන සහභාගිත්වයට වඩා විවාර්ය උපදේශ හා සාමාන්‍ය අධීක්ෂණ ස්වභාවයෙන් පොත් නිකුත් කරන ස්ථානය, පොත් ඇණවුම් කිරීම සහ පොත් ප්‍රතිග්‍රහණය

වැනි පුස්තකාල සේවයේ සමහර අංශ උපාධිධර නොවන ජ්‍යෙෂ්ඨ පුස්තකාල සහකාරයන් ගේ පාලනය යටතේ තබනු ලැබීය. මේ විෂය විශේෂඥ ක්‍රමය ආරම්භ කර අවුරුදු දහයකට පසු කරන ලද සමීක්ෂණයකදී, පුස්තකාලවල කාර්ය භාර ගැටුම් හා සංවිධානාත්මක පීඩනය ගැන, ගට්ස්මන් නිරීක්ෂණ ගණනාවක් කළේය. ඔහු ගේ ප්‍රධාන අදහස වූයේ නියම විද්වත් පුද්ගලයා නිතර ම පෞද්ගලික ව හා තනි ව වැඩ කරන අතර, පුස්තකාලයාධිපතිවරයා අනිවාර්යයෙන් ම කණ්ඩායමක සාමාජිකයෙක් යන්නයි. ප්‍රකාශන හා විශිෂ්ට උගත්කම. ඉගැන්වීම් හා පරිපාලන පළපුරුද්ද, ප්‍රකාශන විශාල සංඛ්‍යාවක් නොමැති ව ඉබේ ම ස්වඋත්සාහයෙන් ලබා ගත් උගත්කම සහ පෞද්ගලිකත්වය යන ගුණාංග විද්වතකු තුළ නැවතත් අවරෝහණ පිළිවෙළට සොයනු ලැබේ. අනෙක් අතට පුස්තකාලයාධිපතිවරයකු තුළ නැවතත් අවරෝහණ පිළිවෙළට සොයනු ලබන්නේ පුස්තකාල වැඩ පිළිබඳ දීර්ඝ කාලයක් තුළ පුළුල් පළපුරුද්ද, පරිපාලන කටයුතුවල සාමාර්ථය, මහජන සම්බන්ධතාවල පෞද්ගලි-කත්වය හා දක්ෂකම, විශිෂ්ට උගත්කම යන්නයි.

ගට්ස්මන් ගේ ක්‍රමය වැදගත් ආකාර දෙකකින් මේ වර්ගීකරණයට ප්‍රතිවිරුද්ධ වේ. පළමුවැන්න තමා ගේ පුස්තකාලයාධිපතිවරුන් තුළ තිබිය යුතු ප්‍රධාන ගුණාංග ලෙස තීක්ෂණ බුද්ධියක් සහ ශාස්ත්‍රීය සුදුසුකම් හෙතෙම බලා-පොරොත්තු වේ. දෙවනුව තමා ගේ පුස්තකාලයාධිපතිවරුන් විෂය පිළිබඳ විශේෂඥ ඥානය අනුව අගය කර, සම්ප්‍රදායානුකූල වර්ගයේ උසස්වීම් බලාපොරොත්තු වන අවශ්‍යතාවද ඔහු බැහැර කර තිබේ. ඔහු සඳහන් කර ඇති පරිදි සම්ප්‍රදායානුකූල ව කටයුතු කරන පුස්තකාලවල ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති පදවිවලට උසස්වීම් අඩියෙන් අඩියට විය යුතු ය. එ වැනි අවස්ථාවලදී විෂය පිළිබඳ විශිෂ්ටත්වයට වඩා කළමනාකාර පළපුරුද්ද මුල් තැනක් ගනියි.

කෙසේ හෝ වේවා සාම්ප්‍රදයික වර්ගයේ ව්‍යුහය සඳහා පැහැදිලි ක්‍රියාකාරිත්ව අවශ්‍යතාවන් දක්නට නැතැයි ගට්ස්මන් ප්‍රකාශ කරයි. එම නිසා පුස්තකාලයාධිපතිවරුන් තෝරා

ගැනීමේදී සාම්ප්‍රදයික ධුරාවලි මිනුම් දණ්ඩක් යොද ගැනීම අවශ්‍ය නැතැයි හේ කියයි. ශාස්ත්‍රීය කටයුතුවලට, විශාල ව්‍යාපාරවලට යොද ගන්නා මිනුම් දඬු උපයෝගී කර ගැනීම සුදුසු නැතැයි හේ අදහස් කරයි. විශේෂයෙන් පුස්තකාලවලට අවශ්‍ය කළමනාකාර දක්‍ෂකම් උසස් ගණයෙහි ලා නොගැනෙන බැවිනි. ශාස්ත්‍රීය පුස්තකාලයාධිපතිවරුන්, අමතක කරන ලද මහාචාර්යවරුන් වශයෙන් ය යන්න ඔහු ගේ කල්පනාවයි. එහෙත් උගත්කමට අර්ධ වශයෙන් හෝ කැපවී සිටීමට පුස්තකාලයාධිපතිවරයකු තුළ තිබිය යුතු අවශ්‍යතාව හා තමා ගේ කළමනාකාර දක්‍ෂකම් වැඩි දියුණු කර ගෙන ඔහු ගේ පරිපාලන උපක්‍රම අලුත් කර ගැනීමට ඇති අවශ්‍යතාව අතර 'අභිලාෂ පිළිබඳ ගැටුමක්' තවමත් තිබේ යයි හේ පෙන්වා දෙයි.

ඊස්ට් ඇන්ග්ලියාවේ ලැබූ අත්දැකීම් අනුසාරයෙන් විෂය විශේෂඥ ක්‍රමයේ ප්‍රබලකම් ද දුබලකම් ද මැනීමට ගව්ස්මන් උත්සාහ කළේය. පළමු කොට පුස්තකාලයක් පාඨකයන්ට සේවයක් සැපයීම අරමුණු කර ගත් සේවා ආයතනයක් බැවින්, දිනපතා පොදු අවශ්‍යතාවන්ට විෂය පිළිබඳ විශේෂඥ දැනුම අවශ්‍ය වන්නේ අර්ධ වශයෙන් යයි ඔහු අවබෝධ කර තිබිණි. දෙවනුව, විෂය විශේෂඥ දැනුම ඇත්ත වශයෙන් ම අවශ්‍ය වන්නේ පොත් එකතුව වැඩි දියුණු කිරීම වැනි ප්‍රධාන පෙළේ කාර්යයන් සඳහාය යනු ඔහු ගේ නිගමනය විය. තුන්වෙනුව, පුස්තකාල සේවා සංවිධානය කිරීමෙහි ලා යුධ හමුද ක්‍රමයට දෙනු ලබන අණ කිරීම් මාලාවකින් වඩා කාර්යක්ෂම ලෙස මෙය කළ හැකි වුව ද, විද්වත් කණ්ඩායමක් තුළ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩා අඩු කාර්යක්ෂම ක්‍රමයකින් වුව ද ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට වඩා පරිස්සමින් කළ යුතු යයි හේ කල්පනා කරයි. 'විෂය පිළිබඳ විශේෂඥ දැනුමක් ලබා ගැනීමේ අවක්‍රියාකාරිත්ව අංශය ගැන පහසුවෙන් පිළිතුරක් සොයා ගත නොහැක. නිවැරදි අන්දමේ වෘත්තීය ආචාර ධර්මයන්ගෙන් එය අභිභවනය කළ හැකි ය, යන විශ්වාසය පමණක් මට ප්‍රකාශ කළ හැක. කෙසේ හෝ වේවා පුස්තකාලයක වැඩ වලින් වැඩි කොටසක් කණ්ඩායමක් වශයෙන් කළ යුතු වැඩ ය.

එක එක පුද්ගලයා ගේ ක්‍රියාකාරිත්වය තවමත් බොහෝ ප්‍රමාණයකට රඳා පවතින්නේ පුද්ගලයා ගේ අභ්‍යන්තර මෙහෙයවීම අනුව ය. මේ ආචාර ධර්ම ඇති කිරීමට, මට පෙනෙන හොඳ ම ක්‍රමය නම් ඔවුන් ගේ සහජ සාමර්ථ්‍යයන් අවුස්සා ඔවුන් ඇල්ම දක්වන සහජ හැකියාවන් දියුණු කර ගැනීමට උපකාර වීමය. ඊට වඩා වැඩි හොඳ ක්‍රමයක් නැත. පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ආයතනයට සමස්තයක් වශයෙන් බල පාන තීරණ ගැනීමට සහභාගි වන සම තත්ත්වයේ පුද්ගලයන් කණ්ඩායමක ස්වභාවය ගන්නා විට, ආයතනයේ කාර්යක්ෂමතාව දියුණු වේ, යයි හේ සඳහන් කරයි

පළමුවෙන් ම කිවයුතු පොදු නිරීක්ෂණය නම් නව වර්ගයේ වෘත්තීය න්‍යාය ධර්මයක අවශ්‍යතාව ගට්ස්මන් ද පිළිගෙන තිබෙන බවයි. දෙවනුව පුස්තකාලයාධිපති තත්ත්වය සමන්විත වන්නේ කුමන වර්ගයේ පුස්තකාල කාර්යයන්ගෙන් ද, එසේ නොවන්නේ කුමන වර්ගයේ කාර්යන්ගෙන් ද යන්න හේ තීරණාත්මක ලෙස නම් කරයි. පුස්තකාලයාධිපති තත්ත්වය වශයෙන් ඔහු වෙන්කර දක්වන්නේ පොත් තේරීම, ග්‍රන්ථ නාමාවලි සකස් කිරීමට සහාය, පාඨකයන්ට උපදෙස් දීම හා වර්ගීකරණයයි. අනෙකුත් පුස්තකාල කාර්යයන් ජ්‍යෙෂ්ඨ පුස්තකාල සහකාරවරුන්ට භාර දී ඇත. කාර්යාවලියේ මේ බෙදීම ඊ ළඟ පරිච්ඡේදයෙහි සම්පූර්ණයෙන් විස්තර කර තිබේ.

කෙසේ හෝ වේවා දැනට පමණක් එය වෘත්තීය ව්‍යුහයක ප්‍රතිපත්ති සාකච්ඡා කිරීමට ආරම්භයක් ලෙස සැලකිය හැක. ගට්ස්මන් ගේ ක්‍රමයේ තුන් වන පොදු කරුණ වන ප්‍රජාතන්ත්‍රවාදීකරණ ප්‍රතිපත්ති මෙහිදී සාකච්ඡා කෙරේ.

සිය වෘත්තිය – ශ්‍රේණි පුස්තකාලයාධිපතිවරුන්, පුස්තකාල සහකාරයන් සහ ජ්‍යෙෂ්ඨ පුස්තකාල සහකාරයන් ගෙන් වෙන් කිරීමෙන් ගට්ස්මන් ශ්‍රේණි දෙකක කාර්ය මණ්ඩල ව්‍යුහයක් ඇති කළේය. එක ශ්‍රේණියක් අනෙක් ශ්‍රේණියට මාරු කිරීමට ඇති ඉඩ කඩ අල්ප ය. එක ශ්‍රේණියක සේවක පිරිස් බඳවා ගන්නා සුදුසුකම් අනෙක් ශ්‍රේණියේ සුදුසුකම්වලට වඩා වෙනස්

බැවිනි. ඔහු ගේ වෘත්තිය ශ්‍රෙණි පුස්තකාලයාධිපතිවරු සියල්ලෝ ම හොඳ ගෞරව උපාධිධරයෝ වෙත්. සමහරුන්ට විශේෂ වැදගත්කමක් ඇති ක්ෂෙත්‍රවල උසස් උපාධි ද ඇත. තමන් දැනට කරන කාර්යයන්ට අමතර කටයුතු භාර නො ගෙන ඔවුන්ට කථිකාචාර්යවරයකු ගේ වැටුප් පරිමාණයේ දියුණු විය හැක. ඊස්ට් ඇන්ග්ලියා විශ්ව විද්‍යාල පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ පුස්තකාල සහකාරවරයකු කෙතරම් කලක් සේවයේ යෙදෙව්වත් ඔහුට කිසි කාලෙක නියම ආකාරයෙන් පුස්තකාලයාධිපතිවරයකු විය නො හැකිය. ගට්ස්මන් විසින් ඇත්ත වශයෙන් ම ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ වෘත්තිය විශිෂ්ට ගණයක් පිහිටුවන ලදි.

කෙසේ හෝ වේවා ජාතික මට්ටමින් අනිකුත් විශිෂ්ට ගණ තිබිය යුතු පහත දැක්වෙන සේවක පිරිස් සම්බන්ධ ශ්‍රෙණි හතර මත පදනම් වූ ඉන්දියාවේ විශාල පුස්තකාල ජාලයක් ඇති කිරීම සඳහා රංගනාදන් ගේ සැලැස්මවල් අනුව මෙය හොඳින් විස්තර කළ හැක.

1. සාමාජික ප්‍රාන්තවල පුස්තකාලයන්හි අධ්‍යක්ෂවරුන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වශයෙන් හෝ සංගම් මට්ටමේ ජාතික පුස්තකාලයාධිපතිවරු හා නියෝජ්‍ය ජාතික පුස්තකාලයාධිපතිවරුන් වශයෙන් හෝ දිස්ත්‍රික්ක මධ්‍යම පුස්තකාලවල හෝ ප්‍රධාන නගර 54 ක පිහිටි මධ්‍යම පුස්තකාලවල හෝ විස්සක් පමණ වූ විශ්ව විද්‍යාල පුස්තකාලවල හෝ විශ්ව විද්‍යාල කිහිපයක පිහිටුවීමට බලාපොරොත්තු වන පුස්තකාල විද්‍යා පීඨවල අධිපති වශයෙන් හෝ කටයුතු කිරීමට හැකි වෘත්තියේ නායකයෝ.

2. තනි ව ම හා නිදහස් ව පිළිගත් පුස්තකාල භාර ව සිටිය හැකි හෝ නායකයන් ගේ අනුඅභ්‍යාසිකයන් වශයෙන් හෝ නගරවල කුඩා පුස්තකාලවල පුස්තකාලයාධිපති-වරුන් වශයෙන් හෝ දිස්ත්‍රික්කයන්හි මධ්‍යම පුස්තකාලවල නියෝජ්‍ය පුස්තකාලයාධිපතිවරුන් වශයෙන් හෝ රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්

වශයෙන් සහ ජාතික මහා පුස්තකාලවල හෝ විශාල දෙපාර්තමේන්තුවල පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරුන් වශයෙන් හෝ විශාල වාණිජ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන් වශයෙන් හෝ ප්‍රධාන පෙළේ විද්‍යාලවල පුස්තකාලයාධිපතිවරුන් වශයෙන් හෝ පුස්තකාල විද්‍යායතනවල ගුරුවරුන් වශයෙන් හෝ ක්‍රියා කළ හැකි පුද්ගලයෝ.

3. මෙහෙයවීම යටතේ ඉහත 1 සහ 2 වන ඡේදවල සඳහන් කළ පුස්තකාලවල වැඩ කළ හැකි හෝ කුඩා විද්‍යාල හා මහජන පුස්තකාල සහ විශාල පාසල් පුස්තකාල නිදහස් ව භාර ව සිටිය හැකි හෝ පුද්ගලයෝ.

4. කුඩා ශාඛා පුස්තකාලවල හෝ ජංගම පුස්තකාලවල හෝ කුඩා පාසල් පුස්තකාලවල පාඨක සේවා ඉටු කළ යුතු අය.

මේවා අතුරෙන් විශිෂ්ට ගණයෙහි ලා ගැනීමට සුදුසුකම් ඇත්තේ පළමු වන වර්ග තුනට පමණි. තුන් වැනි වර්ගයේ සුදුසුකම් හැටියට විශ්ව විද්‍යාල උපාධියක් ලැබ පුස්තකාල විද්‍යාව පිළිබඳ එක් අවුරුදු පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාර්ගයක් අනුගමනය කර තිබීම අවශ්‍ය බව රංගනාදන් ප්‍රකාශ කරයි. පුස්තකාල විද්‍යාව පිළිබඳ දෙවසරක පශ්චාත් උපාධියක් සහිත ගෞරව උපාධිධරයන් නම් වඩා යෝග්‍ය දක්ෂ විශ්ව විද්‍යාල උපාධිධරයන් දෙවන වර්ගය සඳහා සුදුස්සන් හැටියට හේ දක් වූයේ ය. මූලික වශයෙන් පුස්තකාල විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව අනුගමනය කළ, ඒ විෂය සම්බන්ධයෙන් ම පසු ව ආචාර්ය උපාධියක් ලබා ගත් පළමු වන පන්තියේ ගෞරව උපාධියක් හෝ ඇම්. ඒ. උපාධියක් සහිත, නිසර්ගයෙන් ම දක්ෂ උසස් පුද්ගලයෝ පළමු වැනි ශ්‍රේණිය සඳහා ඔහුට අවශ්‍ය විය. ඔහු ගේ වර්ගවලින් එකකට හෝ පළමු වන තුනට අවශ්‍ය සුදුසුකම් හැටියට දක්වා ඇති විශේෂ කරුණුවල හැම දෙයක් ම නොපිළිපැද්දත් ජාතික ව්‍යුහයක් සඳහා ඔහු ගේ සැලැස්ම ~~පහත~~ දැක්වෙන පරම ප්‍රතිපත්ති මත පදනම් වී තිබේ. පළමුව පුස්තකාලයාධිපතිකම විශිෂ්ට ගණයේ

වෘත්තියකි. දෙවනු ව, කෙසේ වෙතත් ඒ වෘත්තිය තුළ ශ්‍රේණි කිහිපයක් ඇත. තුන්වනු ව එහි පහත ම මට්ටමට නොහොත් පහත ම ශ්‍රේණියට වුවත් අවම සුදුසුකම විශ්ව විද්‍යාල උපාධියක් වැනි හොඳ අධ්‍යාපනයකි. හතරවැනිව, මේ පුස්තකාලයාධිපතිවරුන් සඳහා කාර්යයන් වැදගත් සහ බලවත් තත්ත්වයකින් බලාපොරොත්තු වේ.

ගට්ස්මන් සහ රංගනාදන් යන දෙදෙනා ගේ ම සංකල්පවලින් සකස් කර ගන්නා ලද හේතු යුක්ති සහගත පියවරක් නම් ඕනෑම වර්ගයක ප්‍රධාන පුස්තකාලයක වැඩ කරන නියම වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන් ගේ සංඛ්‍යාව අඩුවන අතර පුස්තකාලයාධිපති නොවන තත්ත්වයේ ලිපිකාර පරිපාලන සහ (ඡයාරූප ශිල්පී, ශ්‍රව්‍ය දෘශ්‍ය ආදී) ශිල්පීය සහාය ඔවුනට ලැබෙනු ඇත. මෙයින් සිදුවිය හැකි එක ප්‍රතිඵලයක් නම් පුස්තකාලයන්හි කාර්ය මණ්ඩල සඳහා යන වියදම් අඩුවීමයි. නිදර්ශනයක් වශයෙන් බ්‍රිතාන්‍ය පුස්තකාලවල මුළු වියදමින් සියයට ජනහක් පමණ වේතන සඳහා වැය කිරීම හා සසඳන විට වේතන සඳහා තමාට වැය වන්නේ මුළු වියදමින් සියයට හතළිහක් පමණ යයි ගට්ස්මන් වාර්තා කරයි.

ශාස්ත්‍රීය හෝ වේවා මහජන හෝ වේවා ඕනෑ ම විශාල පුස්තකාලයකට සේවය කරන කාර්ය මණ්ඩලයේ සිය දෙනාකු අතුරින් විස්සකට වැඩි නොවන සංඛ්‍යාවක් පුස්තකාලයාධිපති තත්ත්වයේ අය විය යුතු යයි දැඩි රීතියක් ලෙස ප්‍රකාශ කළ හැක. ශාස්ත්‍රීය පුස්තකාලයක මේ එක් එක් නිලධාරියා යම් විශේෂ විෂය ක්ෂේත්‍රයකට හෝ විෂය වර්ගයේ (නිදර්ශන වශයෙන් සිතියම් අධි ලේඛන) කරුණුවලට සම්බන්ධ කාර්යයන් භාරව සිටිනු ඇත. මහජන පුස්තකාලයක විෂයයන් හා සම්බන්ධ පුස්තකාලයාධිපතිවරු හා (ළමයින් සඳහා කරන සේවාවන් වැනි) විශේෂ සේවාවන් සම්බන්ධ ව වගකීම ඇති පුස්තකාලයාධිපතිවරු යන දෙවර්ගය ම සිටිති. එහෙත් මේ කිසි ම පුස්තකාල වර්ගයක පොත් ප්‍රතිග්‍රහණය හෝ පොත් සංසරණය හෝ පුස්තකාලයාධිපතිවරුන් භාරයේ නො තිබේ. සේවාවන් හා අනිකුත් කාර්යයන් පිළිබඳව ඊළඟ පරිච්ඡේදයෙහි විස්තර සහිතව පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

ඉහත ඡේදවල කෙටියෙන් සඳහන් කර ඇති ව්‍යූහයට පදනම් වූ සිද්ධාන්ත ප්‍රබල ලෙස ප්‍රතික්ෂේප කිරීමක්, තවමත් වෘත්තීය පත පොතෙහි දක්වා නැත. ඒ වෙනුවට පුස්තකාලයාධිපති තත්ත්වයෙහි කළමනාකරු සහ උගතා අතර භේදය යන තේමාව සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් ම වැදගැම්මකට නැති තර්ක කිරීම් පැවතිණි. ශාස්ත්‍රීය පුස්තකාල සන්දර්භය තුළ පවත්නා පරිපාලන දෙකට බෙදීම සම්බන්ධයෙන් ආතර් එම්. මැක්ඇනලි සංක්ෂිප්ත විස්තරයක් සපයා ඇත. 'නූතන විශ්ව විද්‍යාල පුස්තකාලවල වෘත්තීය කාර්ය මණ්ඩලය වැඩියෙන් සමන්විත වන්නේ එකිනෙකට පැහැදිලි ලෙස වෙනස් කණ්ඩායම් දෙකකිනි. ඒ කාණ්ඩායම් දෙක විශේෂඥයෝ සහ පරිපාලකයෝ වෙත්. විෂයයන්, භාෂා සහ ක්ෂේත්‍ර ගැන විශේෂඥයන් ද, අධි ලේඛන විද්‍යාඥයන් ද, ආරක්ෂකයන් ද, සන්නිවේදන විශේෂඥයන් ද, ක්‍රම විශ්ලේෂකයන් ද, පිළිබඳව පුස්තකාල පත පොතෙහි නිතරම වාගේ සඳහන්කර ඇත. විශ්ව විද්‍යාලයක විශේෂඥයෝ තව දුරටත් යටත් සේවක පිරිසක් නො වෙත්. තමන් ම තමන් අගය කර, අධ්‍යාපන ප්‍රතිපත්ති නිගමනය කරන සම තත්ත්වයේ අය වෙති. ඔව්හු විශ්ව විද්‍යාලයයේ ධුරාවලි සංවිධාන ව්‍යූහයට අයත් නොවෙත්. උපාධි ශිෂ්‍යයන්ටත්, පීඨවලටත් උසස් මට්ටමේ පර්යේෂණ ව්‍යාපෘතිවලටත් හොඳ සේවයක් සැපයීමට නම් පුස්තකාල විශේෂඥයෝ අවශ්‍ය වෙත්. ඔව්හු විශ්ව විද්‍යාලයට මෙන් ම පුස්තකාල පරිපාලනයටත් එක ලෙස ම සම්පූර්ණයෙන් ප්‍රයෝජන වෙත්. උසස් විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන් පීඨාධිපතිවරුන්ට සමාන වැටුපක් ලබන බව මතක තබා ගත යුතු ය.

නිලධාරි වාදය මුල් තැනක් ගන්නා රටක වෘත්තීය පරිචයට වඩා උසස් අගයක් පරිපාලන නිපුණතාවලට දෙනු ලැබේ. එහෙත් පරිපාලන කාර්යයන්හි ගත කරන කාලය, වෘත්තීය නොවන පරිචයන්හි ගත කරන කාලය යයි බ්‍රන්ඩ් සහ වැසර්මන් පෙන්වා දෙයි. පන්ති කාමර විධායක සාමාජිකයකු පරිපාලන කටයුතු සඳහා පන්ති කාමරයෙන් බැහැරව ගිය විට, යම් කාලයක් ගත වන තුරු ඔහු විනය ආරක්ෂා කර ගැනීමට

තැත් කර, යමක් ඉගැන්වීමට උත්සාහ කරනවා ඇත. එහෙත් වැඩි කාලයක් නො ගොස් දෙවන කාර්යය අපහසු දෙයක් බව පෙනී යයි. එබැවින් පරිපාලන වැඩ, විශාරදත්වයට හා වෘත්තිය කටයුතුවලට හානි කර බවක් පෙනේ.

එකක් පරිපාලකට හා අනෙක් විෂය විශේෂඥට වශයෙන් වොස්පර්, විශ්ව විද්‍යාල පුස්තකාලයේ වෙනස් වෘත්තිය ඉණි මං දෙකක් ඇති කිරීමට යෝජනා කළේය. හැම ඉණි මගක් ම එක ම උසට නැගිය හැකි විය යුතු ය. මෙය සිදු වන්නේ ද ඒ ආකාරයට ම ය. මේ තත්ත්වය උභතෝකෝටික ප්‍රශ්නයකට මුහුණ දෙන්නාක් මෙන් පෙනේ. පුස්තකාල විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි ලැබුවෝ පරිපාලකයෝ පමණක් විය යුත්තෝ ද? අනිකුත් සියලුම කාර්ය මණ්ඩල වල අය කලට වේලාවට විෂය පිළිබඳ ආචාර්ය උපාධිය ලැබිය යුතුද? ඔවුන් අතර පොදු එකඟත්වයක් ඇති වන්නේ කුමන අවදියකදී ද? අවසාන ප්‍රතිඵලය කුමක් වුවත් පැහැදිලි ලෙසම විෂය (හෝ අනිකුත්) විශේෂඥයාට පදවි අනුව හා වේතනය අනුව පුස්තකාල පරිපාලකගේ තත්ත්වයට සමානව ම දියුණු වීමට ඉඩ කඩ තිබිය යුතු ය. කිසි ම පරිපාලන කටයුත්තක් භාර ගන්නේ නැති ව, පන්ති කාමර අංශයක දක්ෂ පුද්ගලයකුට ආචාර්ය තත්ත්වයේ සිට පරිපූර්ණ මහාචාර්ය ධුරයට දියුණු විය හැක. ඇත්ත වශයෙන් ම පුස්තකාල පීඨවලට ද ඒ හැකියාව තිබිය යුතු ය. මේ ප්‍රශ්නය විද්‍යාල පුස්තකාලවල නම් එතරම් ම විද්‍යාමාන නො වේ.

මේ විස්තරයේ පළමු වන ඡේදය කියවන විට කරුණ පිළිබඳ වැරදි අවබෝධයක් ඇති ව සිටින්නා සේ පෙනේ. 'පුස්තකාල පරිපාලක' ගේ තත්ත්වයට පැමිණීමට විශේෂඥයාට (එනම් නියම පුස්තකාලයාධිපතිට) ඉඩ දී ඔවුන් දෙදෙනා එක ම තත්ත්වයෙහි ලා සැලකීම නොව සම්ප්‍රදායානුකූලව අදහස් කරන පරිපාලක, ලිපිකරු, නිලධාරියාට වැඩියෙන් නියම පුස්තකාලයාධිපති තමා ගේ වටිනාකම ඔප්පු කරයි. පළමු වන ඡේදයෙන් ඇත්ත වශයෙන් ම විස්තර කෙරෙන්නේ අලුත් තත්ත්වයේ පුස්තකාලයාධිපති, පැරණි ක්‍රමයේ පුස්තකාලයාධිපති ගේ තත්ත්වය හිමි කර ගන්නා බවත්,

පුස්තකාලවල පාරම්පාරික ව්‍යුහය තව දුරටත් වැදගත් නොවන බවත් ය. 'වෙනත් වෘත්තිය ඉණි මං' ගැන රොබට් වොස්පර් ගේ යෝජනාව මේ නයින් කිසි අර්ථයක් ගෙන නො දේ. ගට්ස්මන් ප්‍රකාශ කළ අන්දමට පුස්තකාලයක පරිපාලන අංශයට, අවශ්‍ය වනවාට වඩා වැදගත් තැනක් දී තිබේ. පුස්තකාල, සමහර විට හොඳට දිග පළල සහිත ඉඩ ඇති, සැලකිය යුතු අය වැයක් හා පඩි පතක් සහිත, විශාල ආයතන බව සත්‍යයකි. එහෙත් පළමුවැනිව නඩත්තු කිරීමත්, දෙවැනිව හැසිරවීමත්, තුන්වැනිව පරිපාලනය කිරීමත්, පුස්තකාලයාධි-පතිවරුන් කරදර විය යුතු කරුණු නොවේ. පුස්තකාලයාධිපති වරු චිත්තෝත්පාදක කාල්පනිකත්වයත්, විශේෂඥ දැනුමත්, දිරි ගැන්වීමත් සපයා, ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කළ යුත්තෝ ය. එහෙත් ඔවුන් උළුවහු තේරීම, ගණන් තැබීම හෝ රක්ෂණ කාඩ් පත් එකතු කිරීම වැනි දෑ කළ යුතු නොවේ. පුස්තකාල කාර්ය මණ්ඩල ව්‍යුහයේ පරිපාලන අංශයක් තිබිය යුතු වුවත්, එය පුස්තකාලයාධිපතිවරුන් ගෙන් සමන්විත විය යුතු නො වේ.

පුස්තකාලයාධිපතිකම හා සම්බන්ධ න්‍යාය ධර්මයට අදාළ නියම තත්ත්වය බ්‍රෝඩ්පීල්ඩ් විස්තර කරන්නේ මෙසේ ය. 'නිදහස් සහ සක්‍රිය කල්පනාවට වඩා බාහිර ව ව්‍යාපාරයකට සමාන ක්‍රමයක පෙනුමට උසස් අගයක් දෙන සමාජයේ මසුරුකම හා සාම්ප්‍රදයික සිරිත් නිසා බලෙන් ම කාර්යක්‍ෂම ව්‍යාපාරිකයකු වීමට අද පුස්තකාලයාධිපතිට සිදු ව තිබේ. පුස්තකාලයාධිපති කෙරෙහි සමාජයේ යුතුකම්වලින් එකක් නම් කාර්යක්ෂමතාව හෝ දරිද්‍රතාව අතර ඇති උභතකෝටික ප්‍රශ්නය ඔහු වෙත පැවරීම වැළැක්වීම යි. අකාර්යක්ෂමතාව නිසා අපට ම තත්ත්වය දුෂ්කර කර ගැනීම මෝඩ ක්‍රියාවක් බැවින් සමහරු කාර්යක්ෂමතාව සඳහා තර්ක කරති. එහෙත් කාර්යක්ෂමතාව කරණ කොට ගෙන අපට පහසු වන්නේ එක් තනි ක්‍රියාවක් පමණක් හෝ තනි ක්‍රියාවලියක් පමණකි. සමස්තයක් වශයෙන් ගතහොත් කාර්යක්ෂමතාවට ඇති භක්තිය කරණ කොට ගෙන ඇති වන චිත්ත ආකල්පයේ ප්‍රතිඵලය වනුයේ ඉතා මත් ප්‍රයෝජන දේ කිරීමට අප නිදහස් කරනු ලැබ තිබීම නොව, ප්‍රස්තුත ක්‍රියාවලියෙක වැඩි කොටසක් ඉවු

කිරීමට බැඳී සිටීම යි. අපේ කාලය සහ ශක්තිය සීමා සහිත බැවින් එක් කාර්යයකට අප යොදන කාලය සහ ශක්තිය අනෙක් කාර්යයට නො ලැබේ. එබැවින් අවසාන ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා අප යොදා ගන්නා මාධ්‍යවල කාර්යක්ෂමතාව රැක ගෙන ඒවා සම්පූර්ණත්වයට පත් කර ගත යුතු ය. ඒ අතර ම ඒවා සඳහා අපෙන් ගත වන කාලය සහ අපේ අවධානය බෙහෙවින් අඩු කළ යුතු ය.

කළ යුතු යමක් ඇත්නම් කාර්යක්ෂමව එය කළ යුතු ය. සිය කාර්යය ඉටු කරන කාර්යක්ෂමතාව සමග දබර වීම අවශ්‍ය නොවේ. එහෙත් අනිකුත් කාර්යයක කාර්යක්ෂමතාව ක්‍රියාකාරීත්වය සඳහා එක් කාර්යයක් කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට වර්තමාන සමාජයේ සංකීර්ණත්වය මගින් ඉඩ ලැබෙන අතර ධෛර්යය ද ලැබේ. මෙසේ ඉටු කළ යුත්තේ තවත් තුන් වැනි කාර්යයක් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා ය. මේ අන්දමට මෙවැනි ක්‍රියාවලියේ අවසානයක් නැත. ඒවා ඉටු කළ යුතු ඉතාමත් සුදුසු ක්‍රියාවන් ද නැතිනම් ලබා ගත යුතු ඉතාමත් සුදුසු ප්‍රතිඵල ලබා දෙන ක්‍රියාවක් ද යන්න ගැන නොව, එක් ක්‍රියාවක් අනෙක් ක්‍රියාවට කාර්යක්ෂම ලෙස ගලපමින් හා කාර්යයන් ඉටු කරන්නේ කෙසේ ද යන්න පමණක් ගැන කල්පනා කරමින්, කාර්යශීලී සහ සමාජයෙන් අනුමත කරනු ලබන ජීවිතයක් ගත කිරීමට පුළුවන. විශේෂඥයන් අතර ජ්‍යෙෂ්ඨත්ව ධුරාවලියක් තිබිය නොහැකි බැවින් මෙතෙක් යෝජනා කරන ලද ක්‍රමය පොදුවේ යොදා ගැනීමෙන් අදහස් කරන්නේ පුස්තකාලවල තිබෙන සාම්ප්‍රදායික ධුරාවලි කාර්යමණ්ඩල ව්‍යුහයේ අවසානය යි. අධි ලේඛන විද්‍යාඥයෙක් සිතියම් පුස්තකාලයාධිපතිවරයකුට වඩා ජ්‍යෙෂ්ඨ යයි සිතිය යුතු නොවේ. එ මෙන් ම ප්‍රංස සාහිත්‍ය පිළිබඳ විශේෂඥයෙක් දේශීය ඉතිහාසය පිළිබඳ පුස්තකාලයාධිපතිවරයකුට වඩා ජ්‍යෙෂ්ඨ විය නොහැක. මැක්ඇනලි ගේ ප්‍රකාශය අනුව 'මේ ක්‍රමය පොදු සම්බන්ධකමකින් එකට බැඳුණු සගයන් ගේ සමාගමක් පමණි.' මැක්ඇනලි මෙහි සඳහන් කරන්නේ විශ්ව විද්‍යාල පීඨයක තත්ත්වයට පැමිණෙන ශාස්ත්‍රීය

පුස්තකාල ගැන ය. තමන් ගැන ම හා තමන් ගේ වැඩ ගැන ඔව්හු සීමාවන් තුළ තමන් ගේ ම ප්‍රතිපත්ති සකස් කර ගෙන සිය කටයුතු කර ගෙන යති. නව පත් කිරීම්, උසස් කිරීම්, නිලය දරන කාලය ගැන කරන නිර්දේශ ගැන සාමාන්‍යයෙන් ඔව්හු හෝ අතුරු කමිටුවක් හෝ කැමැත්ත දෙති, ඔව්හු නායකත්වය භාර ගන්නා නමුත් අධිකාරිත්වයට අකමැති වෙත්. ආඥාදායකයන් ප්‍රතික්ෂේප කරති. ඔවුන්ට මාර්ගෝපදේශ දිය හැක. එහෙත් පරිපාලනය කළ නොහැක. ඔව්හු තමන්ට සමාන සගයෝ සහ ස්වාධීන පුද්ගලයෝ වෙත්, යයි මැක්ඇනලි තව දුරටත් දක්වයි.

මැක්ඇනලි ගේ විස්තරය සියලු පුස්තකාල වර්ගවලට එක සමාන ව අදාළ වේ. වඩා අවබෝධමත් ආදර්ශ අනුගමනය කිරීමට වඩා පළාත් පාලන ධුරාවලි අනුකරණය කිරීමට නැඹුරු ව සිටින මහජන පුස්තකාල තුළ දැඩි නිලධාරි ක්‍රමය හැම විට ම බලගතු ව පවත්නා බව කීම සාධාරණ ය. විස්තරාත්මක ව නොවුවත් සාමාන්‍යයෙන් සියලු පුස්තකාල වලට අදාළවන නියමයන් මැක්ඇනලි සකස් කරයි. 'ක්‍රමවත් ලෙස පවත්වන පිය රැස්වීම් අවශ්‍ය වේ. පීඨයක් මසකට වරක්වත් රැස්විය යුතු යයි බොහෝ විශ්ව විද්‍යාල නියම කරයි. සම්ප්‍රදායානුකූලව පවත්වා ගෙන යන පැරණි අංශවලට මාසයකට වරක් පැයක් පමණ රැස්වීමෙන් සිය කටයුතු සාකච්ඡා කළ හැකි ය.

පුස්තකාල පීඨ යම්කිසි ක්‍රමාවලියකට පුරුදු වීම සඳහා වැඩි කාලයක් ගත වනු ඇත. පන්ති කාමර පීඨ මේ රැස්වීම් අත්‍යවශ්‍ය ලෙස සලකා වැඩි කාලයක් ඔවුනට දෙති. පුස්තකාලයාධිපතිවරුන්ට ද එසේ කිරීමට සිදුවේ. රජයේ හා පරිපාලනයේ පීඨයන් සිය යුතුකම් සහ අයිතිවාසිකම් පාවිච්චි කරන එක මාර්ගයක් මේ කමිටුව බැවින් පැහැදිලි ලෙස ම වඩා කමිටු ප්‍රයෝජනයට ගන්නවා ඇත. පුස්තකාල කාර්ය මණ්ඩලය ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීමෙහි ද අරමුණු සකස් කිරීමෙහි ද වැඩියෙන් සහභාගි වීම බලාපොරොත්තු වේ.

මේ සම්පූර්ණ ක්‍රමයෙන් බලාපොරොත්තු විය හැකි ප්‍රතිඵල පිළිබඳ සංක්ෂිප්තයක් එල්ඩ්රඩ් ස්මිත් විසින් සපයා තිබේ. 'එකිනෙකා සමග තිබෙන සිය ධුරාවලි සහ නිලධාරි ක්‍රම පිළිබඳ සම්බන්ධකම් පුස්තකාලයාධිපතිවරුන් විසින් විද්‍යාලයීය සහ වෘත්තීය සම්බන්ධකම්වලට පරිවර්තනය කර ගත යුතුය. මෙයින් අදහස් කරන්නේ සමූහ සංවර්ධනය ග්‍රන්ථ නාමාවලී හැසිරවීම සහ තොරතුරු සේවා වැනි කරුණු වලදී තීරණ ගැනීම, විද්‍යාලයීය රාමුව තුළ ක්‍රියා කරන හා ඉතාමත් අවශ්‍ය ආයතනික තහනම් කිරීම් වලින් සීමාසහිත කළ තනි විශේෂඥ වෘත්තිකයන් අභිමතය තුළ විය යුතු ය යන්නය. වෘත්තීය කටයුතු අධීක්ෂණය කිරීම අත් හළ යුතු අතර, සාමාන්‍ය පරිපාලන සමායෝජනය සහ සමානයන අගය කිරීම ඒ තැන ගත යුතු ය. ත්‍යාග ප්‍රදනය් කිරීම් කළ යුත්තේ වෘත්තීය දක්ෂතා පදනම් කර ගෙන ය. නිලධාරි ක්‍රමය තුළ තත්ත්වය අනුව නොවේ.

කෙසේ හෝ මේවා එවැනි ක්‍රමයකට පදනම් වූ හැම පුස්තකාල වර්ගයකට ම අදාළ වූ, නියම න්‍යාය ධර්මය අවුරුදු විස්සකට පමණ, පෙර බ්‍රෝඩ්පීල්ඩ් විසින් පහත දැක්වෙන අන්දමට ඉතා මත් ගැඹුරු ලෙස විස්තර කරන ලදී.

''සැලකිය යුතු නිදහසක් බුක්ති විඳින පුස්තකාලයාධිපති සිය සගයන් ගේ උත්පාදන ශක්තිය කොන් නො කර කටයුතු නියම කිරීමේ දී එයට අදාළ වැඩි ම නිදහස දීමෙන් සිය යුතුකම් ඉටු කළ යුතු ය. මෙය ඔවුන් ගේ අයිතිවාසිකමකි. පුස්තකාල-යාධිපතින් ගේ පරිත්‍යාගයක්වත් වැඩියෙන් වැඩ කරවා ගැනීමේ උපක්‍රමයක්වත් මෙන් එය පෙනුණත් එවැන්නක් නොවේ. යම් පුස්තකාල ප්‍රතිපත්තියක් යන්ත්‍රයක හා සමාන ව ක්‍රියාවේ යෙදවීමට වඩා පුද්ගලයන්ට අයුක්තියක් සිදුවීම වැළැක්වීම වැදගත් බැවින් නියම කිරීම්වල සම්පූර්ණතාවයේ අඩු වීම ගණන් ගත යුතු නොවේ. කිසිම සාකච්ඡාවක් නො මැති ව වැරදි මාර්ගයේ යනවාට වඩා නිදහසේ සාකච්ඡා කර කිසි ම දිශාවකට නොගියත් කමක් නැත.''

*References*


1. Guttsman, W L 'Subject specialisation in academic libraries: some preliminary observations on role conflict and organizational stress., *Journal of librarianship*, January 1973.

2. Ranganathan, S R: *Library needs of renascent India.* Presidential Address, Eighth All India Library Conference, 1949.

3. McAnally, A M: 'Status of the university librarian in the academic community.' *In* Orne, J *ed*: *Research librarianship essays ih honor of Robert B Down,.* New York, Bowker, 1971.

5, Smith , E: 'Academic status for college and university librarians – problems and prospects.' *College and research libraries,* January 1970.

# 5

# කටයුතු

ප්‍රධාන පුස්තකාලයාධිපතිවරයකු ගේ සභාපතිත්වය යටතේ වෘත්තීය නොවන කාර්යයන් ගෙන් නිදහස් වූ කුඩා විශේෂඥ මණ්ඩලයක් විසින් ක්‍රියා කරවනු ලබන, ධුරාවලියකින් තොර ව ව්‍යුහගත පුස්තකාලයක් පිළිබඳ බලාපොරොත්තුව එක වරට ම නිර්භීත දෙයක් ලෙස හැඟී ගියත්, එය ඉතාමත් පහසුවෙන් ලබා ගත හැකි අතර ඉතා ප්‍රායෝගික ය. මේ පරිච්ඡේදයේ පරමාර්ථය සම්ප්‍රදායානුකූල පුස්තකාල කාර්යයන් එක් රැස් කර, මේ සංකල්පය අනුව ඒවා අනුමත කිරීම හෝ නැවත වෙන් කොට පැවරීම ය. මේ ක්‍රියාව, විශිෂ්ට ගණයේ පුස්තකාලයාධිපතිවරයකු ගේ නියම කාර්යය කුමක්ද, නියම නොවන කාර්යය කුමක්ද, පුස්තකාල බලයට අදාළ කුමක්ද, අදාළ නොවන්නේ කුමක්ද, යන්න හඳුනා ගැනීමට ද උපකාරී වෙයි.

පහත දැක්වෙන කාර්‍ය ලැයිස්තුව සම්පූර්ණ නැත. එහෙත් අදාළ සංකල්පය යොදා ගැනීම නිදර්ශනය කිරීමට තරම් එය පුළුල් වේ. ලැයිස්තුවේ අනු පිළිවෙළ වැදගත් නො වේ. එහෙත් දළ වශයෙන් ලැයිස්තුව පටන් ගන්නේ අරමුණුවලිනි. අවසන් වන්නේ නියම සේවාවලිනි. මේ හැම කාර්යයකට ම කෙළින් සංකේත හතරෙන් එකක් දක්වා තිබේ. එහි වැදගත්කම පසුව විස්තර කෙරේ.

- XX අරමුණු තීරණය කිරීම
- XX ප්‍රතිපත්ති සකස් කිරීම
- XX සම්පූර්ණ සැලසුම් කිරීම
- XX ඇස්තමේන්තු සකස් කිරීම
- XX අය වැය සකස් කිරීම
- \+ විගණනය
- XX ගොඩනැගිලි හා ඉඩ කඩ සැලසුම් කිරීම

+ ගොඩනැගිලි නඩත්තු කිරීම

+ උපකරණ, ලිපි කඩදසි හා අනෙකුත් ද්‍රව්‍ය මිලට ගැනීම

xx පුස්තකාල කටයුතු සංවිධානය කිරීම

xx පුස්තකාල කටයුතු සම්බන්ධීකරණය කිරීම

+ සේවක වාර්තා පවත්වාගෙන යාම

+ කාර්‍ය මණ්ඩල පාලනය

+ කාල සටහන් සකස් කිරීම

xxx පොත් තේරීම

x පොත් ඇණවුම් කිරීම

x සඟරා හා වාර ප්‍රකාශන ප්‍රතිග්‍රහණය

x සූචිකරණය

xxx වර්ගීකරණය

x භාවිතය සඳහා ද්‍රව්‍ය සකස් කිරීම

x පොත් පත් රාක්ක ගත කිරීම සහ රාක්ක පිළිවෙළ

x තොග ගණන් ගැනීම

x සංසරණ පාලනය

xxx විමර්ශණ කාර්‍යය

xxx ග්‍රන්ථ විද්‍යාත්මක සහාය

xxx තොරතුරු උද්ධරණය

xxx පාඨක උපදේශ

මේ ලැයිස්තුව පරීක්ෂා කිරීමේ ආරම්භයේදීම + ලකුණ දමා ඇති කාර්යයන් ඉවත් කළ හැක්කේ පුස්තකාලයාධිපතිත් වයට මේ කාර්යයන්ගේ කිසිම සම්බන්ධකමක් නැති බැවිනි. ඇණවුම් පිළියෙළ කිරීම, භාණ්ඩවලට ගෙවීම හා මුදල් භාර ගැනීම වැනි කටයුතු ඇතුළත් විගණනය එයින් පළමුවැන්න යි. දෙවැන්න, පුස්තකාල පරිශ්‍රය නඩත්තු කිරීම, කැඩුණු ජනේල සැදීම සහ තීන්ත ගෑම වැනි කටයුතුයි. පොත් පත් හා සඟරා වැනි, පුස්තකාල ද්‍රව්‍ය හැර අනෙක් සියලුම වර්ගයේ සැපයුම් ගැන කටයුතු කිරීම තුන් වැන්නයි. සේවක වාර්තා පිළිබඳ ලේඛන කටයුතුවලට හතරවැන්න අදළ වේ. පස්වැන්න වන

සේවක පිරිස පාලනය කිරීම වඩා පැටලිලි සහිත ය. අනෙක් වෘත්තීය පුද්ගලයකු මෙන් වෘත්තීය පුස්තකාලයාධිපතිවරයකු ද, සේවකයන් බඳවා ගැනීම ගැන සැලකිලිමත් වුව ද, සම්මතයන් ගැන ද, විනය සහ වෘත්තීය පිළිබඳ උපදෙස් දීමෙහි ද, දුන්වීම් සහ සම්මුඛ පරීක්ෂණ පිළියෙළ කිරීම, වාර්තා එක් තැන් කිරීම, පැමිණීම ගැන සොයා බැලීම, පෞද්ගලික ප්‍රශ්න සොයා බැලීම සහ කාල සටහන් සකස් කිරීම (මේ ලැයිස්තුවේ + ලකුණු කර ඇති හයවන කාර්යය) සේවක පිරිස් නිලධාරියකු ගේ භාරයේ තැබිය යුතු ය. මේ ලැයිස්තුවේ අනෙකුත් කාර්යයන් ද සමහර විට පොත් තබන්නකු ගේ ආධාර ඇතිව කළ හැකි ය. සේවක පිරිස් නිලධාරියා බොහෝ පුස්තකාලවල පරිපාලන ලේකම් වශයෙන් නම් කළ හැකිය.

මේ ලැයිස්තුවේ අප විසින් ඊ ළඟට සලකා බැලිය යුත්තේ x ලකුණ යොදා ඇති කරුණු ය. මේවා අර්ධ වෘත්තිය **වේ.** ඒ කාර්යයන් ඉටු කිරීමට විශ්ව විද්‍යාල උපාධියක් අවශ්‍ය නො වේ. එ මෙන් ම විධිමත් පුහුණුවක් ද අවශ්‍ය නො වේ. සමහර කාර්යයන් ඇත්ත වශයෙන් ම පුහුණුව නොලත් ශ්‍රමයෙන් හෝ (විශ්ව විද්‍යාලවල නම්) ශිෂ්‍යයන් විසින් කළ හැකි වේ. ලැයිස්තුවේ පළමුවෙන් ම ඇත්තේ පොත් ඇණවුම් කිරීමයි. බොහෝ විට එය පොත් තේරීම හා සමාන කළ හැක. පොත් ඇණවුම් කිරීම, පොතක් මිල දී ගැනීම තීරණය කළ පසු කරන හුදු ලිපිකාර කාර්යයකි. එය, ඇණවුම් ආකෘතිය සකස් කිරීම, පොත් වෙළෙන්දට හෝ ප්‍රකාශකයාට ඒ ආකෘතිය යැවීම, පොත් ලැබුණු පසු ලැබුණ බව සටහන් කිරීම හා මුදල් ගෙවීමට කටයුතු යෙදීම වේ. කාර්යයක් වශයෙන් එය නොයෙක් අත්දමේ සුළු ප්‍රතිඵල හා පටලැවිලි ඇති කරයි. එවැනි කාර්යයක් හොඳින් කළ හැක්කේ ඒ කාර්යය ගැන හොඳ පළපුරුද්දක් ඇති කෙනෙකු විසිනි. කෙසේ හෝ වේවා, පොත් තෝරන්නන් ගේ ම විචාර්ය අධීක්ෂණය එයට අවශ්‍ය වුවත්, ක්‍රමචර්යා කාර්යයක් වශයෙන් ලිපිකාර කාර්ය මණ්ඩලයක සහාය ඇති ව ජ්‍යෙෂ්ඨ පුස්තකාල සහායකයකු (එනම් පුස්තකාල විද්‍යා පුහුණුව ලත්, උපාධියක් නොලත්

කෙනෙක්) විසින් සම්පූර්ණ සතුටුදායක ලෙස එය ඉටු කළ හැකි වේ. ඒ කරුණු ම මේ ලැයිස්තුවේ දෙවැනි හා තුන්වැනි කාර්යයන් වන සඟරා ප්‍රතිග්‍රහණය හා සූචිකරණයට අදාළ වේ.

සාම්ප්‍රදායික පුස්තකාල සේවයේ සූචිකරණයට නිතර ම උසස් තැනක් ලැබිණි. දිනපතා කෙරෙන මූලික සූචිකරණය මොළයට වද නො දෙන, සති ගණනක පුහුණුවකින් පසු පාසල් හැර ගිය තැනැත්තකුට පවා ඉටු කළ හැකි, පහසු කාර්යයකි. ජාතික ලෙස සංවිධානය වූ සූචිකරණ සේවයක් ඇති කිරීමෙන් පසු මෙය ඉතාමත් පහසු කාර්යයක් වනු ඇත. කෙසේ හෝ වේවා, විශාල පුස්තකාලයක සූචි සැකසුම හා ඒ හා සම්බන්ධ අනෙකුත් කාර්යයන් සඳහා ප්‍රධාන සමායෝජක හා සංවිධායකයකුගේ අවශ්‍යතා ව නිතර ම පවතිනවා ඇත. වරද තිබුණේ සාම්ප්‍රදායික වැඩි සුදුසුකම් ලත් සූචි සම්පාදන කණ්ඩායමෙහි ය.

මේ ලැයිස්තුවේ හතර වැනි කාර්යය, එනම් භාවිතය සඳහා ද්‍රව්‍ය සූදානම් කිරීම (අකුරු යෙදීම, ලේබල් ගැසීම, මුද්‍රා තැබීම ආදිය) ඉතාමත් පහසු කාර්යයෝය. පුහුණු කරනු ලැබූ වඳුරන් විසින් වුවත් එය කළ හැකි ය.

පස්වැනි කාර්යය ලෙස ගැනෙන පොත් පත් රාක්ක ගත කිරීම සහ රාක්ක පිළියෙළ කිරීම, නොයෙකුත් විශේෂඥ පුස්තකාලයාධිපතීන් විසින් නියම කරන ලද ක්‍රම චර්යා සහ උපදෙස් අනුව ක්‍රියා කරමින්, අනියම් හෝ ශිෂ්‍ය ශ්‍රමිකයන් විසින් කළ හැකි ය.

හයවැනි කාර්යය වන තොග ගණන් බැලීම, ඊට වඩා උසස් මට්ටමක නැති අතර ඒ හා සමානව ම සංවිධානය කළ හැකිය.

අවසාන කාර්යය වන සංසරණ පාලනය, ප්‍රතිග්‍රාහක නොහොත් පිළි ගැනුම් නිලධාරී තත්ත්වයට වඩා ඉහළ තත්ත්වයක නොමැති නිලධාරීන් විසින් කළ හැක. එහෙත් ජ්‍යෙෂ්ඨ පුස්තකාල සහකාරවරයකු එය භාර ව සිටිය යුතු ය.

මේ විග්‍රහයේ ප්‍රතිඵලයක් වශයෙන්, මූලික කාර්ය ලැයිස්තුවේ කාර්යයන් 27 ක් වෘත්තිය කාර්ය මණ්ඩලයේ කිසි ම උපකාරයක් මත රඳා නො සිට කරුණු 14 දක්වා අඩු වී තිබේ. වෘත්තිය කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය ආරම්භ වන්නේ XX ලකුණු කර ඇති තුන්වැනි කාර්ය සමූහයෙනි. ඒ කාර්යයන් පාලක මණ්ඩලයට හා සභාපතිට අයත් වන අතර පුස්තකාලයේ පාලක මණ්ඩලය හා පාඨකයන් ද නොයෙක් තරාතිරමෙන් සහභාගිත්වයට යොදවයි.

මේ කාර්යයන් සමූහයේ පළමුවැනි කාර්යය අරමුණු තීරණය කිරීම යි. කිසි ම සැකයක් නැතිව එය සම්පූර්ණ ලැයිස්තුවේ ම වැදගත් ම කාර්යයයි. මේ ක්‍රියාකාරිත්වයේ කොටස් තුන ගැන ප්‍රමාණවත් විස්තරයක් බ්‍රිතාන්‍ය පුස්තකාල සංගමයේ අත් පොතේ "පුස්තකාලවල වෘත්තීය හා වෘත්තීය නොවන කටයුතු" යන ශීර්ෂය යටතේ විස්තර කර ඇත. පුස්තකාලය සමාජයට සහ පාඨක ඕනෑ එපාකම්වලට අදාළ කිරීම (එනම් පෞද්ගලික ව සහ කණ්ඩායම් වශයෙන් පුස්තකාලයයේ පාඨක සමූහය සමග කිට්ටු සම්බන්ධතාවක් ඇති කර ගැනීම) බලධාරීන් සමග සාකච්ඡා කිරීම (එනම් පුස්තකාලය එක් කොටසක් වන සංවිධානයේ අනිකුත් නිලධාරීන් හා අංශ සමග සාකච්ඡා කිරීම) පාලක මණ්ඩලයේ සහ පුස්තකාල කමිටුවේ රැස්වීම්වලට සහභාගිවීම, අරමුණු තීරණය කිරීම හවුල් කාර්යයකි. එය ප්‍රධාන පුස්තකාලයාධිපතිට පමණක් කළ හැක්කක් නොවේ. එය විශිෂ්ට ගණයේ පුස්තකාලයාධිපතිවරුන් සම්පූර්ණයෙන් සහභාගිවන්නක් විය යුතු ය.

තුන්වැනි සමූහයේ දෙවැනි කාර්යය වනුයේ ප්‍රතිපත්ති සකස් කිරීම යි. එයින් කෙරෙන්නේ අරමුණු, සැලසුම් සහ ප්‍රමුඛතාවන්ට පරිවර්තනය කිරීමයි. මෙය කළ හැක්කේ විශේෂඥ පුස්තකාලයාධිපතිවරුන් ගේ උපදෙස්, තොරතුරු හා මාර්ගෝපදේශකත්ව පදනම මත පමණකි. සම්පූර්ණ සැලසුම් කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම, අයවැය ලේඛනය පිළියෙළ කිරීම, ගොඩනැගිලි සහ ඉඩ කඩ සැලසුම් කිරීම, පුස්තකාල කාර්යන් සමායෝජනය කිරීම යන සමූහය, ඉතිරි

කාර්යයන් හයට ද ඒ හේතුව මත ම ඒ කරුණු අදාළ විය යුතු ය. ප්‍රශ්නයට පිළිතුරු සපයන සහ අර්ථවත් ලෙස දැක්විය හැකි එක ම වර්ගයේ පුස්තකාල පාලනය ප්‍රජාතන්ත්‍රවාදී කරණය බව මෙයින් නියෝජනය වේ. ප්‍රධාන පුස්තකාලයාධිපති කොතරම් දක්ෂ වුවත්, කොතරම් නවීන අදහස් ඇති අයකු වුවත්, කොතරම් ප්‍රබුද්ධ අයකු වුවත් ඔහු පුස්තකාලයේ එක ම පාලකයා වීම නරක සහ භයානක දෙයක් වේ.

හතරවැනි මෙන් ම අවසාන කාර්යය සමූහය, විශේෂඥ පුස්තකාලයාධිපතිවරුන් ගේ කාර්යයන් ගෙන හැර දක්වයි. එය ගට්ස්මන් විසින් යෝජනා කරන ලද ක්‍රියා මාර්ගය අනුගමනය කරයි. පළමුවැනි කාර්යය පොත් තේරීමයි. සාහිත්‍යකරුවකු ලෙස එය පුස්තකාලයාධිපති ගේ නියම කාර්ය භාරයයි. විෂය පිළිබඳ දැනුමක්, සාහිත්‍ය පිළිබඳ දැනුමක්, පොත් පත් ලැබෙන තැන් ගැන දැනුමක් ද පොත් තේරීමට පදනම් වී ඇත. පාඨක සමූහය සමඟ සාකච්ඡා පැවැත්වීම, සහයෝගය දීම සහ සම්බන්ධකම මෙයට අයත් වේ. එහි අරමුණ වන්නේ ඒ පුස්තකාලයයේ මුදල් තත්ත්වයේ සීමාවන් ඇතුළත පුස්තකාලයේ අවශ්‍යතාවන්ට සරි ලන හොඳ ම පොත් එකතුවක් ලබා ගැනීමයි. පුස්තකාල බලයට එය මූලික සේවයකි.

දෙවැනි කාර්යය වන වර්ගීකරණය මුළුමනින් ම සලකා බලන විට අඩු වටිනාකමකින් යුක්ත වුවත් එයට ද හිමි ස්ථානයක් තිබේ. පාඨකයන් විසින් හෝ පාඨකයන් සඳහා පුස්තකාලයාධිපති විසින් හෝ එක වර ම උද්ධරනය කිරීමට පහසුවන ආකාරයට යම්කිසි ක්ෂේත්‍රයක පොත් සකස් කිරීම සඳහා විෂය ගැන දැනුමක් ද, ඒ සම්බන්ධ පොත පත ගැන දැනුමක්ද, ඒ පොත පත භාවිත කරන අන්දම ගැන දැනුමක් ද අවශ්‍ය වේ. මෙය නියම පුස්තකාලයාධිපතිත්වය වන අතර සමාජයේ අවශ්‍යතාවන්ට සම්බන්ධකම් දක්වන බලය ගෙන හැර දක්වන පුස්තකාලයාධිපතිවරුන් ගේ ගුණාංගයකි.

තුන්වැනි කාර්යය වන විමර්ශන කාර්යය මේ වර්ගයේ බලයේ ආකාරය ගෙන හැර දක්වයි. යම් පුස්තකාලයාධිපතිවරයකු විමර්ශන සේවා සැපයුවොත් හෙතෙම ඉහළ ම ගණයේ

පුස්තකාලයාධිපතිවරයෙකි. හතරවැනි සහ පස්වැනි කාර්යයන් වන නාමාවලීකරණයට සහාය සහ තොරතුරු උද්ධරණයට ඒ කරුණුම අදාළ වේ. හතර වැන්න ඊට අමතර ව තමා ගේ පාණ්ඩිත්‍යය ගෙන හැර දැක්වීමට පුස්තකාලයාධිපතිවරයාට ලැබෙන කදිම අවස්ථාවකි.

මේ කාර්යයන් සමූහයේ අවසාන කාර්යය වන පාඨක-යන්ට උපදෙස් දීම සියල්ලට ම වඩා දුෂ්කර හා ඉතාමත් වැඩි සේවයක් අපේක්ෂා කෙරෙන කාර්යයයි. එය නොයෙක් ආකාර වේ. ප්‍රාදේශීය ඓතිහාසික පොත් එකතුවක, දේවගැති පාලිත ප්‍රදේශයක ලේඛන විමසන ආකාරය පර්යේෂකයකුට පෙන්වා දීම, විශ්ව විද්‍යාල පුස්තකාලයක සුචිය පාවිච්චි කරන අන්දම උපාධි අපේක්ෂකයකුට කියාදීම, යම්කිසි ව්‍යාපෘතියක් සඳහා පොත් පත් තොරතුරු සොයන අන්දම පාසල් ළමයින් කණ්ඩායමකට කියා දීම වැනි කටයුතු එයට ඇතුළත් වේ. තමා ගේ විශේෂඥ ඥානය විදහා දක්වීමට හා බෙද ගැනීමට ද පුස්තකාලයාධිපතිවරුන් ගේ බලය සියල්ලන්ට විදහා දැක්වීමට ද මෙයින් පුස්තකාලයාධිපතිට ඉඩ ප්‍රස්තාවක් ලැබේ.

මේ පරිච්ඡේදයේ කෙටියෙන් දක්වා ඇති පරිදි, කාර්යයන් ගේ විග්‍රහය හා නැවත බෙදා දීම නිසා පුස්තකාලයකට ඇතිවන ප්‍රතිඵලය නම් "ගොයම් ගස යට කර ගෙන වල් පැලැටි වැඩීම" හා සම කළ හැකි ඕනෑම ක්‍රමයක අවසානය යි. ඒ සියල්ලටම වඩා මේ පොතේ පසුව එන පරිච්ඡේදවල දක්වා ඇති පරිදි තම නියම ඉලක්ක සහ අරමුණු කරා යෑමට පුස්තකාලවලට හැකි වෙනවා ඇත.

*References*


1. *Professionl and non-professional duties in libraries*. London, Library Association, 1962.
2. Vagianos, L: 'The librarian and the garbageman: professionalism reconsidered,' *Library journal, 1st February 1973*.

6

# සමාජය

සමාජයේ මහජන පුස්තකාල පිළිබඳ ව බ්‍රයන් ලක්හම්ගේ අධ්‍යයනයෙන් ප්‍රධාන හා මූලික කරුණු දෙකක් ඉස්මතු වේ. පළමු ව, පුස්තකාල හැඩ ගැසෙන්නේ පුස්තකාලයාධිපතිවරුන් අතින් නොව සමාජය විසිනි. එබැවින් මහජන පුස්තකාලයයේ දර්ශනය, අරමුණු හා කාර්ය භාරය ආපස්සට බැලීමෙන් පමණක්, ඉතිහාසඥයාට කාලයේ දුර ප්‍රමාණය අනුව ලැබෙන විෂය මූලිකත්වයේ ප්‍රමාණයට දැකිය හැකි ය. වෘත්තීය වශයෙන් පුස්තකාලයාධිපතිවරුන් අතර ඩිවි සහ පැනිට්සි ජව්‍ය රික්තයක (Vacuum) ක්‍රියා නො කළ බව හැම විට ම මතක තබා ගත යුතු ය. ඔවුන් ශ්‍රේෂ්ඨ පුස්තකාලයාධිපතිවරුන් වූයේ තමන්ගේ සමාජ කාර්ය හා වටහා ගැනීම නිසා යයි ඇත්ත වශයෙන් ම තර්ක කළ හැකි ය. ''මහජන පුස්තකාල පිළිබඳ මහා සංවර්ධන, වෘත්තියෙන් පිටතදී තීරණය වන්නට ඇතැ'' යි පුස්තකාල කටයුතු ගැන පරීක්ෂණ පැවැත්වූ නොයෙක් කමිටු සම්බන්ධයෙන් ලක්හැම් නිගමනය කරයි.

පුස්තකාලයාධිපතිවරුන් සම්බන්ධයෙන් ම වූ ලක්හැම්ගේ දෙවැනි කරුණ පළමුවැන්නෙහි ම කොටසකි. සමාජයේ පුස්තකාල අවශ්‍යතාවන්ට පෞද්ගලික පුස්තකාලයාධිපති ගේ අනුකූලතාවයේ ඉතා ඉහළ ම වැදගත්කම මෙයයි. 'මහජන පුස්තකාලය......අපේක්ෂා පරමාර්ථ සහ දෘෂ්ටීන් සහිත ක්‍රියාශීලී පරිසරයක ක්‍රියා කරන වැදගත් ලෙස සහ සියුම් මාර්ගවලින් පවා දෙනු ලබන සේවයේ ස්වභාවය වෙනස් කළ හැකි පුද්ගලයන් ගෙන් සමන්විත හා පාලනය කරනු ලබන සමාජ ආයතනයකි.'

මේ පොතේ මෙන් ම මේ පරිච්ඡේදයෙහි ද තේමාව මෙයයි. සමාජය විසින් ම දක පිහිටුවන ලද සමාජයේ පුස්තකාලයට අයත් කාර්ය භාරය සහ පුස්තකාල වෘත්තියට පවරා ඇති කාර්ය භාරය ගැන ඒ වෘත්තියේ ම අර්ථ නිරූපණය

පොදුවේ විනිශ්චය කළ විට පුස්තකාල වෘත්තියේ ප්‍රවණතාව මෙතෙක් සම්පූර්ණයෙන් ම හෝ බොහෝ ලෙස අක්‍රියශීලී සහ ඇතුළතට නෙත් යොමන එකක් බවත් එය වෙනස් විය යුතු එකක් බවත් ඉහත පරිච්ඡේදවලින් පැහැදිලි වේ. ලක්හැම් සහ ජේ. එච්. ෂේරා මේ මතය අනුමත කරයි. ජේ. එච්. ෂේරා ඉතාමත් ව්‍යක්ත ලෙස මෙසේ ප්‍රකාශ කරයි. "පැපිරස් මිටි සහිත මන්ත්‍රකාර පූජකයකු වශයෙන් ද, තුනී හම්වල ලියූ බයිබල් පාඨ සහ විවරණවල සංකේත සංග්‍රහයන් බොහෝ ඕනෑකමින් කියවන ශ්‍රමණ තාපසයන් වශයෙන් ද, පොත්වලින් වැසුණු කාමරයක, ඉණි මහක් උඩට වී සිටින ග්‍රන්ථ අනුරක්තක මෙන් ද, ඉතාමත් රහසේ කතා කළත් ඇසෙන තරම් නිශ්ශබ්දතාවක් ඇති පුස්තකාල කියවීම් ශාලාවේ, තුෂ්ණිම්භූතව හා ඇවිදින විට ශබ්ද නොවන සේ පාදවලට දැමූ පෝරු සහිත වූ නැන්දම්මා කෙනකු මෙන්ද පුස්තකාල පාලනය කරන පුස්තකාලයාධිපති ගේ කාලය සඳහට ම හමාර ය. තමාගේ වෘත්තිය කර ගෙන ගිය, සංස්කෘතික පරිසරය ඇති කිරීම වන, සිය කාලයට අවශ්‍ය සමාජ අවශ්‍යතාව සපුරා ලීම සඳහා එක් එක් පුද්ගලයා ඔහුට ආවේණික ලෙස අනුකූලතාවකි. පුස්තකාල සේවයේ ඕනෑ ම අංශයක සේවය කිරීම තෝරාගත්තත්. නූතන පුස්තකාලයාධිපති, හොඳින් අධ්‍යාපනය ලැබූ, වෘත්තිය වශයෙන් ප්‍රවීණ වූ හාඅද ලෝකයේ සන්නිවේදන ක්‍රියාවලියේ උසස් කොටසක් කිරීම සඳහා ඉහළ සුදුසුකම් ලබා සිටිය යුතුය."

මේ පොදු තේමාව මත ම ලක්හැම් තවදුරටත් උපුටා දැක්වීම සුදුසු ය. "සූදානම් වී සිටිය යුතු අන්දමට වඩා අඩුවෙන් පුස්තකාල වෘත්තිය සූදානම් වී සිටි නව විලාසයක පුස්තකාල යාධිපති සේවයක් අවශ්‍ය වනු ඇත. එහෙත් ඔවුහු තමන් ගේ අවබෝධ හා විශ්වාස තමන් ගේ වැඩට බලපෑමට ඉඩ ලැබූ තනි පුද්ගලයෝ වෙත්. එකිනෙකට තරඟකාරී කාර්ය භාර තුනක් පුස්තකාලයාධිපති ගේ කාර්‍ය ලෙස යෝජනා කළ හැක. භාරකරු, මැදිහත් වෙන්නා සහ සංවිධායක වශයෙනි. මෙයින් පළමුවැන්න සාම්ප්‍රදායික වුවත් ඒ කෙරෙහි ඇත්තේ පටු

ආකල්පයකි. කළ යුතු වැඩ හැටියට ගණන් ගත්තේ, පොත් සොයා ගෙන එන මහජනයාට ලබා ගත හැකි, තිබෙන පොත් එකතු කිරීම, ආරක්ෂා කිරීම හා පොත් සහ අනෙකුත් ද්‍රව්‍ය වර්ගීකරණයයි. මෙයට දෙ වැනි වූ, මෙයට වඩා පුළුල් කාර්ය භාරයකටද ඉඩ දීමට සිදු වී තිබේ. එනම් ප්‍රකාශිත පොත පත වැඩි සංඛ්‍යාවක් තිබෙන බැවින් මහජනයාට ඉදිරිපත් කිරීමේදී විමංසන බුද්ධිය වඩා යෙදීම හා මේ තොරතුරු පාවිච්චි කිරීමට සුදුසු අය හඳුනා ගෙන, ප්‍රදර්ශන, අධ්‍යයන උපදෙස් ආදී මාර්ගවලින් ඒවා භාවිත කිරීමට ධෛර්ය දීමයි. සමහර විට අනාගතයේ පුස්තකාලයාධිපතිට සංවිධායකයකු වශයෙන් ඊටත් වඩා ක්‍රියාශීලී කාර්ය භාරයක් පැවරෙනු ඇත. ඉබේ ම ඇති නො වුණු සම්බන්ධතා ක්‍රියා හෝ කණ්ඩායම් ඇති කරමින් එහෙත් මහජනයා ගේ සියලුම කොටස්වලට පුස්තකාලය යහපත් වීමට ඉඩ දෙන, සංස්කෘතික සම්ප්‍රදායයන් පුළුල් ලෙස පතුරවමින් ඇත්තට ම පුස්තකාලය සමාජය තුළ සක්‍රිය සමාජ බලවේගයක් කරමින්, ඔහු පුස්තකාලයෙන් බැහැරව ක්ෂේත්‍රයට බහිනවා ඇත.

සමාජයේ, පුස්තකාලයට අයිති තැන බුද්ධිමත් ලෙස ගැඹුරට විග්‍රහ කර හඳුනා ගැනීමට තැත් කළේ ෂේරා ය. පුස්තකාලය ප්‍රධාන වශයෙන් නිවේදන මාර්ගවල නියෝජිත ආයතනයක්, ඒජන්සියක් ලෙස හෙතෙම දකියි. එහෙත් එය පුස්තකාලයාධිපති ගේ අර්ථ නිරූපණය මත රඳා පවතින්නේ ඉතාමත් විශේෂ අන්දමකට ය. එක් එක් කුඩා ක්ෂේත්‍රවල විශේෂඥතාවක් ලබා ගැනීම සහ වෙනත් ක්‍රම මගින් කුඩා කොටස්වලට බෙදීමේ ප්‍රවණතාවක් ඇති මේ යුගයේ, සමාජය එකට බැඳ තැබීමේ සංස්කෘතික කාර්යය පුස්තකාලයට හිමි වන බැවින්, පුස්තකාලය මහත් බලවේගයක් විය හැකි යයි හේ පවසයි. කෙසේ හෝ වේවා සංස්කාරක නමින් ඔහු හඳුන්වන්නේ අනුකූලතාව ලබා ගැනීම නොවේ. ඔහු කියන පරිදි ප්‍රවෘත්ති පත්‍ර, රූපවාහිනිය වැනි ජන සංනිවේදන මාර්ග ප්‍රකාශන ගණයෙහි ලා වැටෙන අතර, 'පුස්තකාලය ප්‍රශ්න විචාරණශීලිය'.

ඕර්වල් ගේ '1984' වැනි සංත්‍රාසයන් මඟ හැරවීමට පෞද්ගලවාදය සාමාන්‍ය තත්ත්වයට වඩා උසස් තත්ත්වයකින් තිබිය යුතුය. ෂේරා ගේ මතය අනුව පුස්තකාල පෞද්ගලවාදයේ බලකොටුවේ ''එක එක පුද්ගලයා තමාට අභිමත පරිදි හා තමාගේ අදහස් ඉටු කර ගැනීමට පුස්තකාලයට පැමිණෙයි. සිතිය යුත්තේ කුමක්ද? සිතිය යුත්තේ කුමන අවස්ථාවේ ද? යන්න පුස්තකාලයේදී පාඨකයාට කියනු නො ලැබේ. එහෙත් ඔහු ගේ පර්යේෂණයන්හිදී අනෙක් අය ගේ මත හා චින්තන තමා ම අනාවරණය කර ගෙන, ඒ මත හා චින්තන තමා නොපිළිගත්තත් ඒවායේ වැදගත්කම අනුව ඒවා අවබෝධ කර ගැනීමටත් ඒවා අගය කිරීමටත් උත්සාහ කළ යුතු ය. ''පුස්තකාලය එක්සත් කිරීමේ බල වේගයක් මිස, සම වර්ගික කිරීමේ - බල වේගයක් නොවන බව'' ෂේරා අවධාරණය කරයි. පුස්තකාලවල මේ සක්‍රිය හා බලවත් කාර්යයන් ගැන බොහෝ පුස්තකාලයාධිපතිවරුන් අවබෝධ කර ගෙන සිටියද, ප්‍රබල අන්දමට ක්‍රියා කරන ජනමාධ්‍යය මෙන් නොව ඔව්හු පුදුමාකාර ලෙස අක්‍රියශීලී ව හා නිශ්ශබ්ද ව සිටිත්. රජයේ ආයතනවලින්, වෙළෙඳ හා දේශපාලන කණ්ඩායම්වලින්, එක්තරා ආකාරයකට සිතන්නට සාමාන්‍ය පුරවැසියාට කරන බල කිරීම පිළිකුල් සහගත ය. මෙහිදී එක ම ආරක්ෂාව වශයෙන් පවතින්නේ පොත්වල අන්තර්ගත වී ඇති පරිදි පෙර සියලු පරම්පරාවන් ගේ සහ සියලු අන්දමේ අවස්ථාවන්ට මුහුණ දුන් මිනිසුන් ගේ චින්තන සහ අනුභූති නොහොත් අත්දැකීම්වලට ඔවුනට මුහුණ දීමට සැලැස්වීමයි.

නිදහසේ භාවිත කළ හැකි පුස්තකාල හැම තැන ම තිබෙන තුරු ජාතික හා අන්තර්ජාතික ලෙස මිනිසුන්ට අදහස් හා මත කැවීම වඩා පහසු නොවනු ඇත. පෞද්ගලික නිදහසේ බලකොටුවලින් වැඩි ගණන් ඉතිරි ව නොමැති බැවින් කිසි ම සැකයක් නැති ව පුස්තකාල බලයේ ඉතාමත් වැදගත් ම අංගය වූ මෙය නොසලකා හැරීමට පුස්තකාලයාධි-පතීන්ට නොහැකි වනු ඇත යන්න මතක තබා ගත යුත්තකි.

ෂේරා අවසන් කරන අන්දමට පුස්තකාලයාධිපතීන් මත සමාජය විසින් බොහෝ විට නොදැනුවත්ව ම පටවන වගකීම ඉතා බරපතළය.

බ්‍රිතාන්‍යයේ මහජන පුස්තකාල වැඩීම පිළිබඳ ලක්හැම්ගේ විස්තරය මෙතැන දී වැදගත් ය. 1880 ගණන්වල හා 1890 ගණන්වල පුස්තකාල වැඩි වශයෙන් සපයන ලද්දේ කම්කරු ජනතාවට ය. පාඨක සමූහයා ගෙන් 16 % ලිපිකාර හා කම්කරු නොවන අය වූහ. 21% වෘත්තිය හා කළමනාකාර තත්ත්වවල අය වූහ. එහෙත් 63% ක් වැනි විශාල සංඛ්‍යාවක් කම්කරු අය වූහ. මෙවැනි තත්ත්වයක් ගැන සමහරු කැමැත්ත නොදක්වූහ. මෙය පැහැදිලි වූ එක් අවස්ථාවක් නම් ඉතාමත් ප්‍රචලිතව තිබුණ එහෙත් සම්පූර්ණයෙන් අසත්‍ය මධ්‍යම පන්තිකයන් ගේ මිථ්‍යා මතයන් ලෙස සැලකෙන (මෙය ඉවත ලන ලද්දේ ඉතාමත් මෑතකදී ය) 'අසරණ නිවාස වලට පොත් ගෙන යාමට දීමෙන් බෝවන රෝග පැතිරිය හැකිය' යන්නයි.

වරප්‍රසාද අඩුවෙන් ලබන අයට පමණක් නොව, පොත පත වැදගත් කාර්යයන් සඳහා භාවිත කරන අයට සහ පොදු පාඨකයාට එක හා සමාන ව සේවයක් කරන ආයතනයක් ලෙස මහජන පුස්තකාල විසි වැනි ශතවර්ෂයේදී සලකන ලදී. පුස්තකාලය භාවිත කිරීම හැමට ම සාධාරණ විය යුතු බව එතැන් සිට පැවති පොදු රීතිය වුව ද පුස්තකාලයාධිපතිවරු ගණනාවක් බුද්ධිමත් පාඨකයන් ලෙස ඔවුන් සලකන අයට විශේෂයෙන් සේවය සැලසීමට අදහස් කළහ. පසු ව දක්වුණු න්‍යාය ධර්මයේ නිදර්ශනයක් ලෙස ඇල්. ආර්. මැක්කොල්වින්ගේ අදහස් ලක්හැම් ගෙන හැර දක්වයි. 'මට තෝරා ගැනීමක් කළ යුතු ව තිබුණ බැවින් වෙන කිසිම දෙයකින් නොපිරිමැහෙන මනුෂ්‍ය අවශ්‍යතා සහ පොත් වර්ගවලට මුල් තැනක් දීම මා කළ ඥානවන්ත ක්‍රියාවකි. වැඩෙහි යෙදීමටත්, කල්පනා කිරීමටත්, සිහින දැකීමටත්, සැලසුම් කිරීමටත්, සාකච්ඡා කිරීමටත්, තර්ක කිරීමටත් සෙවීමටත් කැමති අය සිටින අතර චිත්‍රපට, ප්‍රවෘත්ති පත්‍ර,

රේඩියෝව හෝ කාණ්ඩ වශයෙන් බැඳ තබා ඇති පොත්වල නිමග්න වීමට ළඟ ම ඇති පැන්ස දෙකේ පුස්තකාලයට යන අයට වඩා ඒ අයට මා සේවය කළ යුතු යයි මට කීමට සිදුවුණි'.

අද වැනි කාලයක මෙවැනි න්‍යාය ධර්මයක අවදානම භයානක ය. මෙයින් ඇති වන ප්‍රතිඵලය නම් ජනගහනයෙන් වැඩි කොටසකට තොරතුරු ලබා ගැනීමට හෝ ප්‍රබුද්ධ මනසක් ඇති කර ගැනීමට ජන මාධ්‍ය මිස වෙන මාර්ගයක් නැති වීමයි. ඒ නිසා ඔවුහු හැම අන්දමකම සමාජ සහ බුද්ධිමත් වංචාවලට හසු වෙත්. මනඃකල්පිත ලෝකයට පාඨකයා කැඳවාගෙන යන සාහිත්‍යය, පුස්තකාලවල රැස් කර නොතිබීමට කිසිම හේතුවක් නොමැත. ඉතා ම අඩු වශයෙන් එවැනි පොත පතින් කියවීම් රුචිය වැඩේ. (ලක්හැම්ගේ පාඨයක්ම යොදු ගනිමින් කියතොත්) මත දරන්නන් ගේ සහ ක්‍රියාවේ යෙදෙන්නන් ගේ නායක අවශ්‍යතා ගැන පමණක් පුස්තකාලයාධිපතින් සැලකිල්ලක් දැක්වීම භයානක වරදකි. නැවතත් ලක්හැම්ගේ ම පාඨයක් යොදු ගනිතොත් මහජන පුස්තකාලය සඳහා අරමුණු විය යුත්තේ 'වෙළෙඳ භාණ්ඩයක් සේ අනුන් අතට පත්වී බාහිර ලෝකයට ගොස් තම සේවා දියුණු කිරීමයි'. මේ නව අදහස ගැන ඔහු ඇමරිකාවෙන් නිදර්ශනයක් ගෙනූ හැර දක්වයි. නගරබද ජීවිතය පිරිහීමත් සමග ඇමරිකාවේ නගරවල ජීවත් වූ සාම්ප්‍රදායික වැසියන් කෙමෙන් කෙමෙන් අතුරුදහන්වී, කියවීමේ රුචියක් හෝ හොඳ අධ්‍යාපනික පසුබිමක් රහිත නව පදිංචිකාරයෝ පදිංචි වන්නට වූහ. 'සංස්කෘතික කටයුතුවලින් බැහැර වී වරප්‍රසාද අඩුවෙන් ලත් අය සමග කෙළින්ම වැඩ කළ යුතු යයි මේ තත්ත්වය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වූ බැල්ටිමෝර් නිගමනය කළේය. සම්ප්‍රදායික ආයතනගත තත්ත්වයෙන් පිටත වැඩ කළ හැකි, පුරවැසියන් යම් තැනකද, ඔවුන් වෙතට පුස්තකාලය ගෙන යා හැකි ක්ෂේත්‍ර පුස්තකාලයාධිපති සංකල්පය ඇති ව, ඊනොක් ප්‍රැට් නිදහස් මහජන පුස්තකාල අභියෝගයට මුහුණ දුන්නේය.

මින් පසු ව ඇති පරිච්ඡේද දෙකෙහි දැක්වෙන පරිදි අධ්‍යාපනික වශයෙන් සහ සංස්කෘතික වශයෙන් වැදගත් කාර්ය භාරයක් පුස්තකාල විසින් ඉටු කළ යුතුව ඇත. එහෙත්

නිදහස් සහ පොදු නිවේදන මාර්ගවල නියෝජිතයන් වශයෙන් ඒවාට ඇති කාර්ය භාරය හැම විට ම මුල් තැනක් ගනියි. සාමාන්‍ය අධ්‍යාපන ආයතනවලට ආධාර කිරීම වැනි සීමා සහිත අර්ථයෙන් පුස්තකාල මූලික වශයෙන් අධ්‍යාපන කටයුතුවලට යොමුවී තිබීම කනගාටුදායක ය.

සමාජය තුළ පුස්තකාලයයේ සේවය පිළිබඳ විග්‍රහ කිරීමේදී නිවේදනයට පසු, ඊළඟට ෂේරා සංරක්ෂණය කෙරෙහි යොමුවේ. 'පුස්තකාලය, සංස්කෘතික වශයෙන් පරිණතභාවයට පත්වීමේ ප්‍රතිඵලයකි. ඒවා ඇති වූයේ සමාජ තැනින් තැන යෑම නවත්වා, නාගරික වූවාට පසුව හා සංවිධානාත්මක මානුෂික සම්බන්ධතා සාර්ථක ලෙස පවත්වාගෙන යාමට ලේඛන වාර්තා වැදගත් වූ විට ය. පුස්තකාල ආරම්භ වූයේ කෙසේද?, කවදද? යන්න ගැන වාර්තා නැත. එහෙත් ආදිතම පුස්තකාලවලින් ඉටු වන්නට ඇත්තේ අවශ්‍යයෙන් ම පොත් එක් රැස් කර තිබෙන අධිලේඛ කාර්යයක් බව දැනට ඉතිරි ව විසිරී ඇති කැඩී බිඳී ගිය ලේඛනවලින් සිතා ගත හැකිය. මෙසේ එක් රැස් කර තැබීම කරන ලද්දේ ව්‍යාපාර හෝ වෙළෙඳ කටයුතු හා රාජ්‍ය පරිපාලන කටයුතුවලට අවශ්‍ය වන පරිද්දෙන් ලේඛන ආරක්ෂා කර තැබීමට හා මතු එන පරම්පරාවලට ඇදහිලි විශ්වාස දැක්වීමට ය. කෙටියෙන් කියතොත් පුස්තකාලය ලිඛිත දෙයෙහි ගැබ්වී ඇති, සාර්ථක ජීවිතය මතු පරම්පරාවලට පැතිරවීමක් මිස ඊට වැඩි යමක් නොවේ. එබැවින් ආරම්භයේ පටන් ම පුස්තකාලය සමාජ සංවිධානයේ ප්‍රතිඵලයක් වන අතර උගත්කමේ මෙහෙකාරියක් විය. එ කල උගත්කම අතිශයින් පෞද්ගලිකව පැවති ශත වර්ෂවල එය දර්ශනවාදීන් ගේ ද, පණ්ඩිත ජනයාගේ ද, ගූඪ දේ සොයා ගන්නන්ගේ ද එක ම සම්පත විය.

අද පවා පොත් භාර ව සිටීම වැදගත් පරමාර්ථයක් ලෙස ද එය පුස්තකාලයාධිපතිත්වයේ උච්ඡතම ප්‍රකාශිතයක් ලෙස ද සලකන අය තව ම සිටින බව ෂේරා දක්වයි. 'දුර්ලභ පොත් කාමරයකට හෝ නාමාවලි කෞතුකාගාරයකට' තවමත් වැඳුම් පිදුම් කිරීම නිසා පුස්තකාලයාධිපති පොත් භාවිත කිරීමට වඩා, පොත් ආරක්ෂා කිරීම ගැන වෙහෙස

වෙන කෙනකු යන දුර්මතය ප්‍රචලිතව ඇත. සංස්කෘතික උරුමයක් සංරක්ෂණය කිරීම තරම්ම වැදගත් වන පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය කිරීම, පුස්තකාලයාධිපතිත්වයේ මූලික මූලධර්ම අමතක වීමට හේතු වීම ගැන ඔහු කනගාටු වේ. පුස්තකාල එකතුන් ක්‍රමානුකූලව ගොඩනැංවීම මෙන්ම ඒවා සංරක්ෂණයත් වැදගත්ය. මේ සියල්ලම කළ යුත්තේ වත්මන් සහ අනාගත පුරවැසියන්ගේ භාවිතය සහ ශුභසිද්ධිය උදෙසා වේ. සංරක්ෂණය යනු පුස්තකාල ද්‍රව්‍ය භාවිත නොකොට ආරක්ෂා කිරීම නොවේ.

පුස්තකාල බලය මූලික වශයෙන් පැන නගින්නේ පුස්තකාලය මානවීය, විද්‍යා හා තාක්ෂණික දැනුම ගබඩා කරන තැන් යන කරුණ මත බව පොතේ පළමු වැනි පරිච්ඡේද-යෙන් පැහැදිලි ව ම කියා ඇත. මෙය කිසි කලෙක කිසිවෙකින් හෝ වෙනස් නොවේ. ෂේරා ප්‍රකාශ කරන අන්දමට, 'සංරක්ෂණය කිරීම පුස්තකාලයට මූලික ය, වැදගත් ය'. කෙසේ හෝ වේවා මෙතැනදී පුස්තකාල වෘත්තිය විසින් තමාට අයිති තවත් සමාජ කාර්ය භාරයක් සම්බන්ධයෙන් කරන ලද අර්ථ විග්‍රහය සුනු විසුනු වී ගොස් ඇත. නොයෙක් වර්ගයේ ග්‍රන්ථොන්මාදවලින් පෙර පුස්තකාලයාධිපති පරම්පරාවන් තුමං අනාගත හැකියාවන් මොට කර ගත් අතර වර්තමාන පරම්පරාව අධික උනන්දුව දැක්වීම පිණිස පොත් වලින් හැකි තාක් දුරට අයින් වී එවැනිම ක්‍රියා මාර්ගයක් අනුගමනය කරයි. නියම ක්‍රියා මාර්ගය ප්‍රත්‍යක්ෂ ය. පුස්තකාල පොත් එකතුන් පරිස්සමින් ගොඩ නගා ආරක්ෂා කළ යුතුය. එහෙත් එසේ කළ යුත්තේ වර්තමාන හා අනාගත පරපුරට ය. එය කළ යුතු නිසාමවත්, ප්‍රසිද්ධිය ලබා ගැනීම පිණිසවත් පුස්තකාලයාධිපතිවරුන් ගේ ම තෘප්තිය පිණිසවත් නො වේ. අධි ලේඛනවල භාරය ආරක්ෂා සහිත විය යුතු ය. ලබා ගත නොහැකි දෙයක් විය යුතු නොවේ.

අධ්‍යාපනයෙහි හා ස්වයං අධ්‍යාපනයෙහි පුස්තකාලය සතු කාර්ය භාරය ෂේරා අනතුරු ව සාකච්ඡා කරයි. එය ඊ ළඟ පරිච්ඡේදයෙහි වෙන ම සාකච්ඡා කරනු ලැබේ. ඉන්පසු ව කියවීම් රුචිය දියුණු කිරීම සම්බන්ධයෙන් පුස්තකාලයේ

කාර්ය භාරය සාකච්ඡා කරයි. මේ කාර්ය භාරය ගැන ඔහුට එ තරම් පැහැදීමක් නැත. එහෙත් අනෙක් පුස්තකාලයාධිපතිවරුන් එය අගය කොට සලකන බැවින් සාකච්ඡා කිරීමට පෙළඹේ. 'පුද්ගලයා ගේ සහ සමාජයේ සදචාරාත්මක සහ බුද්ධිමය යහපතට හේතු වීම සඳහා ක්‍රියාව වැදගත් වේ යයි යන විශ්වාසය පදනම් කර ගෙන කියවීමේ ක්‍රියාව පමණක් ගැන නියම අගය කිරීමට මෙහිදී අපි මුහුණ දෙමු. අපේ වර්තමාන සංස්කෘතියෙහි මේ විශ්වාසය පෙළඹවීමේ හේතු, වැඩි කොට ම සමාජ ආර්ථික වේ. මක්නිසාද යත්, ආර්ථික නිදහස සහ දියුණු සමාජ තත්ත්වයක් රඳා පවතින්නේ දැනුම මත වන අතර දැනුම ලබා ගැනීම පිණිස ඉතාමත් වැදගත් මාර්ගයක් වනුයේ කියවීමයි. එබැවින් සමාජයේ තමා සතු සම්පූර්ණ කාර්ය භාරය ඉටු කිරීමට නම්, පුස්තකාලය විසින් කළ යුත්තේ පාඨකයන්ට පොත් අවශ්‍ය වූ විට ඒවා ලබා දීම පමණක් නොව පොත් භාවිතය ගැන රුචියක් උනන්දුවෙන් ඇති කිරීමයි'.

සමීක්ෂණවලින් පුස්තකාල මිදීමටත්, අහිතකර හෝ සමාජයට නොගැලපෙන අදහස් පාඨකයා තුළ උපදවීමට සමහර පොත් වර්ග උපකාරී වේ යන මතය බිඳ දැමීමටත්, මේ අදහස ඉවහල් වේ යයි ෂේරා කල්පනා කරයි. 'කියවීමෙන් මිනිසා සම්පූර්ණ පුද්ගලයෙක් වේ' යන බේකන්ගේ ධර්මය පුස්තකාලයාධිපතිවරුන් අතර විචාරීමක් හෝ විවේචනයක් නොමැතිව භාර ගැනීමට මෙයින් හේතු භූත වූ නිසා ඒ අදහස අනිවාර්යයෙන් ම අභිමත වේ යයි හේ නිගමනය කරයි. ළමයකු පොතක් අතැතිව සිටිනා විට 'ඔහු ගේ ආත්මය දෙවියන් සමගය' යන්න ව්‍යංගික කරවීම සමාජය තුළ පොත පත සතු කාර්ය භාරය ගැන අවුල් සහගත තත්ත්වයක් ඇති කරවන්නකි. පුස්තකාලයාධිපතීන් පාඨකයන්ට ඉස්තරම් පොත පත සපයා දුන්නොත් පමණක් එහි සම්පූර්ණ කාර්ය භාරය ඉටු කළා වේ. එසේ නොමැතිව කියවන වාලේ පොත පත කියවීමට ධෛර්ය දීමෙන් කිසි වැදගැම්මක් ඇති බවක් ඔහුට නො පෙනෙයි.

ෂේරා ගේ මතය අනුව සමාජ සහ ආර්ථික තත්ත්වයන් යම් ස්ථාවර මට්ටමකට පැමිණෙන තුරු, පුස්තකාල මගින් කියවීම වර්ධනය කරලීමට ගන්නා උත්සාහයන් ගෙන් එතරම් පලක් නොවේ. ඒ අනුව සමාජය සංවර්ධනය වී, සංස්කෘතික තත්ත්වයන් එක්තරා ඉහළ මට්ටමකට පැමිණෙන තුරු පුස්තකාලවල හෝ කියවීමේ සංවර්ධනයක් ඇති නොවේ. මේ තත්ත්වය මත පුස්තකාල, කියවීම වර්ධනය කිරීමේ ආයතනයක් ලෙස කටයුතු කිරීමේ එතරම් වැදගත් කමක් තිබේදැයි යන්න සැක සහිත බවද ෂේරා අවසාන වශයෙන් සඳහන් කරයි.

ෂේරාගේ තර්ක ඉතාමත් ඉහළ මට්ටමේ වේ. ඉතාමත් නවීකරණය වූ වර්තමාන සමාජවල පවා පුළුල් ව පැතිරී පවතින, අකුරු නොදත්කම පිළිබඳ මූලික ප්‍රශ්නය, පාඨකයකු උගතකු හා උගත් පුස්තකාල පරිහරණය කරන්නකු ලෙස ඔහුට අමතක වී ගියා සේ ය. පුස්තකාලයාධිපතිවරු කියවීම්, ඉගැන්වීම් සම්බන්ධයෙන් පුහුණු ගුරුවරු විය යුතු නොවෙති. එහෙත් මෙම ගැටලු ලිහිල් කිරීම සඳහා ඔවුන්ට උපකාරී විය හැකි මාර්ග බොහෝ ය. පාරවල නාමපුවරු පවා කියවීමට නොදත් අප සමාජයේ ඕනෑ ම පුරවැසියකුට ඇති වන අපහසුකම් ගැන සලකා බලන විට කියවන්නන් වාලේ කියවීමට පුරුදු වීමෙහි කිසි වරදක් නැත. 'සමාජ වශයෙන් හා පෞද්ගලික වශයෙන් අකුරු නොදත්කම අතිශයින් අන්තරාදයක යයි' ආර්. සී. බෙන්ග් සඳහන් කරයි.

කියවීමෙහි ඉතා අදක්ෂ හෝ කියවීම ආරම්භ කරන අය සඳහා සුදුසු දේ සරල හා ලිහිල් ආකාරයෙන් ගෙන හැර දක්වා (විශාල මුද්‍රණ, ලෙහෙසි වචන) හෝ ඉතාමත් පහසු දේ පහසු අන්දමට හෝ කියවන ද්‍රව්‍ය සැපයීම පුස්තකාල මගින් කළ හැක. පෞද්ගලික ව උපකාර කරන හා ධෛර්ය දෙන ළමා පුස්තකාලයාධිපතිවරයකු ඇති පුස්තකාලයකින් සිය වැදගත් ම සේවය ළමයින් උදෙසා කළ හැක.

එහෙත් පුස්තකාලයකට කළ හැකි විශාලතම සේවය නම් තවමත් පුස්තකාල විසින් සම්පූර්ණයෙන් නොසලකා හැර තිබෙන සේවය ම ය. එනම් පුස්තකාලවලට ඇතුළු වීමට මිනිසුන් පොළඹවා ගැනීම යි. බොහෝ පුස්තකාලවලට අති විශාල භය උපදවන ගොඩනැගිලි ඇත. ඒවායේ සේවා හැම අන්දමක ම සීමා කිරීම් හා තහනම් කිරීම්වලින් කොටු වී තිබේ. දඩ එවැන්නකි. කල් ඉකුත්වූ පොතක් නමින් ඇත්ත වශයෙන් දෙයක් තිබේද? නිශ්ශබ්ද ව සිටින සේ කියැවෙන දැන්වීම් (අධ්‍යයන කාමරවල නම් මෙය තිබිය යුතුය.) එහෙත් පොත් බැහැර දෙන පුස්තකාලයක නිශ්ශබ්දතාව අවශ්‍යමද? ඔව්හු ඉතාමත් හාස්‍ය ජනක හා පැටලිලි සහිත සූචි සකස් කිරීම් හා වර්ගීකරණ කිරීම් කරති. උපකාරී වන සංඥා හා යොමු ඔව්හු භාවිතා නොකරති. බොහෝ විට පුස්තකාල කාර්ය මණ්ඩලය ඉතා රළු, ඕනෑවට වඩා කටයුතුවලට මැදිහත් වන අය වෙති. කිසි ම වරප්‍රසාද නොලත් පාඨකයකුට වර්තමාන පුස්තකාලයක් අසළට ළඟා වීමටවත් නො හැකිය.

එබැවින් පුස්තකාල බලය, වර ප්‍රසාද නොලත් පාඨකයාට කිසිසේත් නො ලැබේ. ඇත්ත වශයෙන් ම ඔහු පුස්තකාල පිළිකුල් කරනවා ඇත. තමාට කෙළින් ම කිසි ම ප්‍රයෝජනයක් නො ලැබෙන දෙයකට මුදල් ආධාර දෙන බව, ආදායම් බදු ගෙවන්නකු හා වරිපනම් ගෙවන්නකු හැටියට ඔහුට හැඟී යනවා ඇත. පුස්තකාලයාධිපතිවරුන්ගේ වෘත්තීය ආචාර ධර්මය විය යුත්තේ ඔවුන්ගේ අවශ්‍යතා (පුස්තකාල තම සේවාවන් පිරි නමන ආකාරයට සහ නියම පොත් පත් යන දෙයාකාරයෙන් ම) අනිවාර්ය බව සැලකීමයි.

කියවීමට ඇති පොත පත උසස් ගණයෙහි නොමැති නම් කියවීමේ රුචිය දියුණු කිරීමෙන් පලක් නැත යන ෂේරා ගේ මතය ඕනෑවට වඩා ඉහළින් බලාපොරොත්තු වීමක් බව කිව යුතු ය. බෝවන වසංගත රෝගයක් දුර්වල පුද්ගලයන් ගේ සිට ශක්තිමත් පුද්ගලයන්ට පැතිරෙන්නාක් මෙන් කියවීමේ රුචිය පැතිරෙන්නේ නැත. එහෙත් හැම දෙනා ම කොතැනින් හෝ ආරම්භ කළ යුතු ය. ජාතක පොතට පෙර අත ගැසෙන්නේ අන්දර්ගේ කතාවලට බව අමතක නොකළ යුතුය.

සමාජය තුළ පුස්තකාලයේ කාර්ය භාරය තොරතුරු පතුරුවන තැනක් වශයෙන් සැලකීමෙන්, ෂේරා වඩා වැදගත් ම කරුණට මුල් තැනක් දෙයි. වර්තමාන යුගය 'සමාජය සැලසුම් කිරීමෙහිදී ව්‍යවහාරික විද්‍යාව බෙහෙවින් උපයෝගී කර ගැනීම ගැන සැලකිල්ලක් දක්වන යුගයක් බව ෂේරා විස්තර කරන අතර, සාර්ථක ලෙස තොරතුරු සැපයීම මත අප කටයුතු රඳා තිබෙන බව ඔහු අදහස් කරයි. තොරතුරු ප්‍රචාරණය........සමාජ ක්‍රියාවලියේ ඉතාමත් මූලික කරුණක් වන අතර ඉතාමත් අත්‍යවශ්‍ය දෙයක් ද වේ. මේ කටයුත්තෙහි පුස්තකාලයයේ කාර්ය භාරය කෙ තරම් විශාල තත්ත්වයකට පත් වී තිබේ ද යත් වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන් ගේ තත්ත්වයෙන් ඔබ්බට ඒ ගැන විශාල සැලකිල්ලක් ඇතිවී තිබේ.

කෙසේ හෝ වේවා පුස්තකාලවල නියම බලය ගැන නියම ලෙස වටහා නො ගත් එමෙන් ම වැදගත් කමෙන් අඩු අනෙකුත් කාර්යයන්හි වඩා නියැළුණු පුස්තකාල වෘත්තිය මේ කාර්ය භාරය ඉටු කිරීමට උදසීන වීම පුදුමයක් නො වේ. ෂේරා කියන අන්දමට 'තමන්ගේ සමාජ කාර්ය භාරයට ආවේණික පුස්තකාල කාර්යයන් වටහා ගැනීමට මුල් වෘත්තිය පුස්තකාල-යාධිපතිවරුන්ට පුදුම ලෙස නො හැකිවීම,' හේතු කිහිපයක් කරණ කොට ගෙන වූ බව කිව හැක. භාරකාරත්වය සහ ආරක්ෂා කිරීමට ඕනෑවට වඩා සැලකිල්ලක් දැක්වීම, මහජන අවධානය ලබා ගැනීමට සහ ඊටත් වඩා මහජන ආධාරය ලබා ගැනීමට කළ අරගලය, වඩා වෘත්තියමය වගකීම් ඉවත් කොට, කළමනාකරණය සහ පුස්තකාල පාලනය පමණක් පිළිබඳ ව මුල් යුගයේ වූ උනන්දුව, පොත් භාවිත කිරීමට දිරි දෙනවාට වඩා පොත් ආරක්ෂා කිරීම අරමුණු කර ගෙන පුස්තකාලය නියෝගවලින් බැඳ තැබීම සහ ඒ කරණ කොට ගෙන ශාස්ත්‍රකාමී අයට කිසිම වැදගත් සේවා කාර්යයක් ඉටු කිරීමට පුස්තකාලයාධිපති අපොහොසත්වීම, පොත් ප්‍රමාණයෙන් සහ කාර්ය මණ්ඩල සංඛ්‍යාවෙන් පුස්තකාල සාපේක්ෂ වශයෙන් ඉතා ම අසරණ තත්ත්වයක සිටීම, දැක්විය හැක.

තොරතුරු සැපයීම පිළිබඳ කාර්යයන් කෙරෙහි පුස්තකාලයාධිපතිවරුන් දක්වන පැස්බරාගේ ආකල්පය ගැන නිදර්ශනයක් දීමට, ප්‍රධාන වෘත්තිය පුස්තකාල සංගමයට තවමත් කිසි අන්දමකින් බැඳී නැති, බ්‍රිතාන්‍යයේ විඥාපන විද්‍යාඥයන් ගේ ආයතනයේ කුහුල දනවන ඉතිහාසය ගෙන හැර දැක්වීම පමණක් ප්‍රමාණවත් ය. සමහර පුස්තකාල වර්ග තුළ සහ සමහර වෘත්තිය කණ්ඩායම් අතර නොයෙක් ප්‍රදේශ-වල මේ පොදු තත්ත්වයට වැදගත් ව්‍යතිරේක තිබෙන බව කිවමනා නොවේ. නිදර්ශනයක් වශයෙන් මහජන පුස්තකාල පරමාර්ථ සහ අරමුණු සම්බන්ධයෙන් ජාතික වශයෙන් පිළිගත් සම්මතයක පදනම ලෙස පුස්තකාල සංගමයේ ලන්ඩන් සහ ප්‍රාදේශීය කවුන්ටි ශාඛාවේ මහජන පුස්තකාල පර්යේෂණ මණ්ඩලය, 1971 දී ලේඛනයක් සකස් කළේය. ඒ ලේඛනයේ මහජන පුස්තකාල විස්තර වන්නේ බහු - කාර්ය තොරතුරු - අධ්‍යාපන - සංස්කෘතික නියෝජිත ආයතනයක් ලෙසිනි. තොරතුරු ප්‍රචාරණය සම්බන්ධයෙන් අරමුණු දෙකක් එහි දක්වා ඇත.

> ‘මහජන පුස්තකාල තොරතුරු මධ්‍යස්ථාන වශයෙන් වැඩි දියුණු කිරීම,
>
> ‘තොරතුරුවල විශේෂඥ මූලාශ්‍රවලට යොමු කළ හැකි සම්බන්ධ කාරක ස්ථාන වශයෙන් මහජන පුස්තකාල භාවිතය දියුණු කිරීම’.

තොරතුරු ප්‍රචාරණය පිළිබඳ පුස්තකාලයයේ කාර්ය භාරය එහි ඉතාමත් අත්‍යන්ත ආකාරයෙන් ලූවී වාගියානොස් විසින් පිළි ගෙන තිබේ. පුස්තකාලයාධිපතිවරයකු විසින් සපයන සේවය පුද්ගලයන් සහ තොරතුරු සම්භාර අතර ක්‍රියා කරන පුහුණු මධ්‍යස්ථයකුගේ වැනි යයි හේ ප්‍රකාශ කරයි. කෙසේ හෝ වේවා මේ සේවය නියම ආකාරයෙන් ඉටු කළ හොත් එහි වටිනාකම විවාද රහිත බව පිළි ගන්නා අතර එය භාවිතා කරන බොහෝ අවස්ථාවලදී අදාළ දක්ෂකම් ‘වෘත්තීය’ යන් සම්මානීය පිරිනැමීමට තරම් ප්‍රමාණවත් දැයි හේ ප්‍රශ්න කරයි. තුණ්ඩ තීක්ෂ්ණ ඉවත් කරන්නා ශිෂ්ටාචාර

සමාජයක් තුළ ඉතාමත් අත්‍යවශ්‍ය සේවයක් ඉටු කරයි. එහෙත් කුණු බක්කි ශුද්ධ කිරීම වෘත්තියක් වශයෙන් කිසිවෙක් නොසලකයි.

මේ මතය පදනම් කර ගෙන, පිළි ගත නොහැකි තරම් සීමා සහිත පුස්තකාලයාධිපතිත්වය ගැන සංකල්පයක් වාගියානෝස් ඉදිරිපත් කරයි. සමාජය තුළ පුස්තකාලවල ඇති පොදු කාර්ය භාරය සම්බන්ධයෙන් ඩීවි ගේ කාලයේ සිට ඇති අදහස් ඉතාමත් ස්වල්ප වශයෙන් වෙනස් වී තිබීම ගැනත් යල් පැනපු හා අදාළ නොවන වෘත්තිය තත්ත්වයකට දැඩි ලෙස ඇලී, ඩීවිගේ වික්ටෝරියන් යුගයේ සිට පැවත ආ බොරු සමාජ අයිතිවාසිකම්වලට අයිතිය කියාපෑම ගැනත් හෙතෙම පුස්තකාලයාධිපතිත්වය විවේචනය කරයි. තමන් පුහුණු සේවා වැඩකරුවන් වශයෙන් සලකනු ලැබීම ගැන තෘප්තිමත් වී කුණු බක්කි ශුද්ධ කරන්නන් වැනි අය මෙන් 'වෘත්තිය වශයෙන් එක්සත් වීමේ' වාසි ලබා ගත යුතු බව හේ කල්පනා කරයි.

තොරතුරු බෙද හැරීම යන කරුණු පිළිබඳ ව පුස්තකාලවල බලය වාගියානෝස් අවවර්තිත අන්දමකට අනුමත කරයි. එහෙත් මේ පරිච්ඡේදයෙහි පරීක්ෂණයට භාජනය කරන ලද පුස්තකාලවල අනිකුත් වැදගත් කාර්ය භාරයන් හේ සම්පූර්ණයෙන් අමතක කර දමයි. එනම් පුස්තකාල සංනිවේදන මාර්ගයක් වශයෙන් පුස්තකාලයේ සංරක්ෂණ කාර්ය භාරය සහ කියවීමේ රුචිය දියුණු කිරීමට පුස්තකාලය බැඳී සිටීම වේ. අධ්‍යාපනික කටයුතු හා සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් පුස්තකාලයේ කාර්ය භාරය ද හෙතෙම අමතක කරයි. පුස්තකාලාධිපතිත්වය වෘත්තියක් වශයෙන් සැලකිය හැක්කේ මේ සියල්ල එක්තැන් වූ විට ය. ඉහතදී සඳහන් කරන ලද මහජන පුස්තකාල පර්යේෂණ කණ්ඩායමේ ලේඛනයෙහි පුස්තකාලයක අරමුණ පහත සඳහන් අන්දමට නියමාකාරයෙන් විස්තර කර ඇත. 'අධ්‍යාපනික, ආර්ථික, කාර්මික, විද්‍යාත්මක, හා සංස්කෘතික වශයෙන් සියලුම අංශවලින් ජීවිතයේ ගුණාත්මක පක්ෂය රැකගැනීමට උපකාරී වීම සහ පූර්ණවූ ද, සමතුලිත වූද, පුද්ගල භාවය සහිතව නියම

පුරවැසියන් වශයෙන් සියල්ලන්ට වර්ධනය වීමට සමාන අවස්ථා තිබෙන මනුෂ්‍යයාගේ වාසනාවේ සම්පූර්ණත්වය කරා යන සහ තමා ගැන ද, තම අසල්වැසියන් ගැන ද, තමා ගේ පරිසරය ගැන ද අවබෝධයක් දෙන ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය ගොඩ නැගීම'.

*References*


1. **Luckham, B**: *The library in society*. **London, Library Association, 1971.**
2. **Shera, J. H**: *The foundations of education for librarianship*. **New York, Becker & Hayes, 1972.**
3. **McColvin, L R**: *The chance to read*. **London, Phoenix House, 1956.**
4. **Benge, R C**: *Libraries and cultural change*. **London, Bingley, 1970.**
5. **'Public library aims and objectives'**. *Library Association record*, **December 1971.**
6. **Vagianos, L: 'The librarian and the garbageman: professionalism reconsidered'.** *Library journal*, **1st February, 1973.**

# 7

## අධ්‍යාපනය

අධ්‍යාපනයෙහි පුස්තකාලයට අයත් කාර්ය භාරය ඇත්ත වශයෙන් ම පවතින්නකි. එහෙත් පුස්තකාලවල අරමුණු සහ අධ්‍යාපනයෙහි අරමුණු එකක් යයි එයින් නො හැඟේ.

'පුස්තකාලයාධිපතිවරයා අධ්‍යාපනඥයා ගේ ක්ෂේත්‍රයට ඇතුළුවීම පරිස්සමින් මඟ හැරියයුතු යයි' එක් පුස්තකාලයාධිපතිවරයකු (ඇල්. ස්ටැන්ලි ජාස්ට්) අවධාරණයෙන් කීවේ එහෙයිනි. එහෙත් දශකයට පසු තවත් එවැන්නෙක් (කාල් තොම්සන්) එයට පටහැනි විය. 'අධ්‍යාපන කටයුතුවලින් වෙන්වී මහජන පුස්තකාලවලට සිය වගකීම් ඉටු කළ නොහැක,' යනු ඔහුගේ අදහස විය.

මේ පොතේ පළමුවන පරිච්ඡේදයෙහි දක්වා ඇති පරිදි අධ්‍යාපන කටයුතුවල පුස්තකාලවල මැදිහත්වීම අනිවාර්ය බව ෂේරා විසින් දක්වා ඇත. බටහිර ශිෂ්ටාචාරයෙහි සාම්ප්‍රදයික අධ්‍යාපන ක්‍රමය නිතර ම පොත් කේන්ද්‍රගත එකක් විය. ඒ සම්ප්‍රදය ඔක්ස්ෆර්ඩ් සහ කේම්බ්‍රිජ් වැනි විශ්ව විද්‍යාලවලින් ද, යුරෝපා මහාද්වීපයේ ප්‍රසිද්ධ විශ්ව විද්‍යාලවලින්ද, උරුම වූවකි. පුස්තකාලය නම් කර ඇත්තේ විශ්ව විද්‍යාලයයේ හදවත නොහොත් කේන්ද්‍රය වශයෙනි. 'මේ දිනවල නියම විශ්ව විද්‍යාලය පොත් එකතුවකි' යන කාලයිල් ගේ වචනය හැම පුස්තකාලයාධිපතිවරයකු විසින් ම පුන පුනා සිහි කරනු ලැබේ. විශ්ව අධ්‍යාපනයක සාර්ථකත්වය පිළිබඳ ව දහනව වන ශත වර්ෂයේ දී ආරම්භ වූ විශාල ලෙස පැතිරී ගිය විශ්වාසය, පුස්තකාල සෑම තැන ම ඇති කිරීම සමඟ එකට ඇඳී තිබිණි. ෂේරාගේ වචනවලින් කියතොත් 'පුස්තකාලය, සියල්ලන්ට අවබෝධය' දියුණුව හා ප්‍රීතිය ගෙන එන 'විශ්ව අධ්‍යාපනයෙහි අතවැසියා' වේ.

මේ තේමාව නිතර නිතර දක්නට ලැබේ. සමාජයේ පවත්නා පුස්තකාලය පිළිබඳ ලක්හැම් කළ අධ්‍යයනයට හැඳින්වීමක් සපයන තෝමස් කෙලී මෙසේ ලියයි. 'මහජන පුස්තකාල සහ වෘද්ධ අධ්‍යාපන සංවිධාන යන දෙ කොටසට ම අවශ්‍ය සම්පත් සපයනු ලැබූ විට සමාජයේ ධනය, ශුභ සාධනය සහ ප්‍රීතිය සඳහා මේ දෙඅංශය විසින් ම කළ යුතු විශාල සේවයක් ඇත'. මහජන පුස්තකාල පර්යේෂණ කණ්ඩායමේ ලේඛනයෙන් උපුටා ගත් උද්ධෘත පාඨයෙන් අවසන් වූ පසුගිය පරිච්ඡේදය 'මිනිසාගේ පූර්ණ සතුට වැඩි දියුණු කිරීම' ගැන සඳහන් කළ බව මතක ඇත. මේ පොතේ පළමු වැනි පරිච්ඡේදයේ සඳහන් කළ පරිදි, පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ රංගනාදන් ගේ න්‍යායයේද සතුට, ප්‍රීතිය හා සොම්නස ගැන සඳහන් කර තිබේ.

ස්වයං අධ්‍යාපනයෙහි ලා පුස්තකාලයට අයත් කාර්ය භාරයට කිසිවකු විසින්, අඩුම වශයෙන් ජාස්ට් පවා විරුද්ධ වී නොමැති බැවින් මේ තේමාව කෙසේ හෝ වේවා සාමාන්‍යයෙන් යොද ගන්නේ සාම්ප්‍රදායික අධ්‍යාපනයට වඩා ස්වයං අධ්‍යාපනයට ය. පාසල් විසින් ඉතා මත් අඩු ම වශයෙන් සපයන පහසු කම්වලට අතිරේකව, තැපැල් මාර්ගික පාඨමාලා සහ සන්ධ්‍යා පන්ති හැමතැන ම පටන් ගැනීමට පෙර, පුස්තකාල ප්‍රධාන වශයෙන් ස්වයං දියුණුවේ මාර්ග ලෙස සැලකූ ශත වර්ෂයකට එපිට කාලයේ තත්ත්වය, ලක්හැම් සිහිපත් කරයි. පුස්තකාලය එවක 'පාසල, තාක්ෂණික විද්‍යාලය, කලා සහ සාහිත්‍ය ලෝකයට කවුළුව' විය. පුස්තකාලය භාවිතා කරන්නෝ වූයේ, ස්වයං දියුණුව සොයා යෑමට තරම් විශාල උනන්දුවක් තිබූ අයයි,.

මෙයට සමාන්තර ඇමරිකන් තත්ත්වය ෂේරා විස්තර කරයි. දැඩි පෞද්ගලාර්ථ වාදය හා ස්වයං දියුණු පුද්ගලයා පිළිබඳ ඇමරිකන් විශ්වාසයට අනුබල දීමෙන්, පුස්තකාලය සහ ඇමරිකන් සංස්කෘතිය කිට්ටු සම්බන්ධතාවයකට පමුණුවා, එය ඇමරිකන් ජීවිතය නමැති පූර්ණ නිර්මාණයේ පැහැදිලි අංගයක් බවට පත් විය. ස්වයං අධ්‍යාපනය, මහජන පුස්තකාලයට පෙර

නොතිබුණ සිත් කාවදින සමාජ පිළිගැනීමක් දුන්නේ ය. අරමුණු නිතර ම හොඳම ඒවා නොවූවාට ඒවා අඩුවශයෙන් අරමුණු විය. එහෙයින් ඒවා පුස්තකාලය අක්‍රිය කරනවාට වඩා, ක්‍රියාශීලී කළේය. ශත වර්ෂ ගණනාවක් පුස්තකාලය ඇට සැකිල්ලක් බවට පත් කළ සාම්ප්‍රදායික පොත් සංරක්ෂණ කාර්ය භාරය දුර්වල භාවයට පත් කිරීමට එය උදව් වූ අතර අත් ලිපි වෙළුම් ක්‍රමයේ සිට සියලු ආකාර ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රම, චිත්‍රපට, ශබ්ද පටිගත කිරීම් සහ සූක්ෂම ඡායාරූප පුනර් නිෂ්පාදනය, දක්වා පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ සංකල්පය පුළුල් කිරීමෙන් සංරක්ෂණය සම්බන්ධ කාර්ය භාරය වෙනස් කිරීමට උදව් වූයේ ය. පුස්තකාලය සහ කෞතුකාගාරය ද, පුස්තකාලය සහ අධි ලේඛනාගාරය ද, ඊටත් වඩා පුස්තකාලය සහ පාසල ද වෙන් කරන මායිම් මඳක් මැකී යන ස්වභාවයට පැමිණිය ද මේ ආයතන තුන අතර අන්තර් සම්බන්ධතා එය අවධාරණය කළේය. 'පුස්තකාලයට ආධාර ලබා ගැනීමට ඇති සුදුසුකම, පාඨකයන් ලියා පදිංචි කිරීම හා පොත් සංසරණය වැනි එක්තරා අන්දමකට අර්ථයක් නැති කාර්යයන් කෙරෙන්, සේවය සපයනු ලබන වර්ගයන්ගේ කටයුතු අනුව මැනිය හැකි හා අගය කළ හැකි නියම සේවය කරා ඇත් කළේය' යි ලේන් පෙන්වා දෙයි. සිය ජීවිතය සාරවත් කර ගැනීමේ පරමාර්ථය ඇති ව, එක් එක් කෙනාගේ බුද්ධි මහිමයේ තරමට යෝග්‍ය පොත පත සැපයීමට එය උත්සාහ කළේය. මේ ශත වර්ෂයේ මුල දී මේ රටට සංක්‍රමණය වූවන් සංස්කෘතියට හැඩ ගැස්වීමට සිදු වූ අවස්ථාව එය අත් දුටු උසස් ම අවස්ථාවයි. අවසාන වශයෙන් සහ සමහර විට ඒ සියල්ලටම වඩා වැදගත් වන්නේ ඉතාමත් පැහැදිලි සමාජ අවශ්‍යතාවකට පුස්තකාලය විසින් අවනතියක් ඇති කරන ලෙස සැලසීමයි. ස්වයං අධ්‍යාපනය සමාජය තුළ කෙතරම් වැදගත් කාර්ය භාරයක් උසුලන්නේ ද යන්නට ඒ ව්‍යාපාරය තුළ ඇති මහා උනන්දුවම සාක්ෂියකි. බුද්ධි සීමාවේ විකාශනයකට නිතර ම කෙරෙන උද්ඝෝෂණය කෙරෙහි පුස්තකාලයාධිපතිවරුන් දක්වන ප්‍රති ක්‍රියාවෙන් පෙනී යන්නේ, පුස්තකාලයාධිපතිත්වය පරිණතිය ලබා ගැනීමේ හා සමාජ වගකීම් අවබෝධ කර ගැනීමේ මාර්ගයට අවතීර්ණ ව ඇති බවයි.

මේ තත්ත්වයේ වෙනසක් ඇති නොවී ය. 'පුද්ගලයා සඳහා අධ්‍යාපනික නියෝජිතයන් වශයෙන් මහජන පුස්තකාල භාවිතා කිරීම දියුණු කිරීම' යනුවෙන් එය පළමු වන පරමාර්ථය ලෙස මහජන පුස්තකාල පර්යේෂණ මණ්ඩල ලේඛනය ප්‍රකාශ කරයි. පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඕනෑ ම න්‍යාය ධර්මයක ස්වයං අධ්‍යාපනයෙහි ලා පුස්තකාලයේ සමාජ අගය වැදගත් ලෙස දිගට ම පැවතිය යුතුයි. විධිමත් අධ්‍යාපන ක්‍රමයෙන් සමහර පුද්ගලයන් නිතර ම මග හැරී යනවා ඇත. විශේෂයෙන් ශාස්ත්‍රීය සහ වෘත්තීය විශේෂඥතාව ලබා ගැනීම සඳහා ඇති වර්තමාන අවනතිය වැඩි වශයෙන් දිගට ම පැවතුණොත් විධිමත් ලෙස ලැබූ සිය අධ්‍යාපනය තමන් සතු කාලය තුළ තමන් කැමති පරිදි වැඩි දියුණු කර ගැනීමට අනෙක් අයට අවශ්‍යවනවා ඇත.

කෙසේ හෝ වේවා, අධ්‍යාපනයෙහි පුස්තකාල බලය විධිමත් අධ්‍යාපන ක්‍රමය සමඟ ඇති සම්බන්ධතාව තුළින් මේ දිනවල වඩාත් ඉස්මතු ව පෙනේ. 'විධිමත් අධ්‍යාපන වැඩ පිළිවෙළෙහි අඩු පාඩු පිරවීම' යනුවෙන් මහජන පුස්තකාල පර්යේෂණ කණ්ඩායම පරමාර්යක් ලෙස දක්වයි. මෙයින් අදහස් කෙරෙන්නේ පාසල් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීමයි. ප්‍රධාන වැඩ කටයුතු වන්නේ පුස්තකාල පිළිබඳ ව්‍යාප්ති කර ගෙන යාමට පන්තිවලට පහසුකම් සැපයීම සහ පන්තිවලට විශේෂ උදව් දීමයි. එහෙත් විධිමත් අධ්‍යාපන ක්‍රමයෙහි පුස්තකාල විසින් අඩු පාඩු පිරවීම මෙයට වඩා බොහෝ දුර ගොස් තිබේ.

'අධ්‍යාපනය ව්‍යාප්ත කරලීම සඳහා සැලැස්ම' යන බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ධවල පත්‍රිකාව නිසා පුස්තකාල සංගමය විසින් 1973 සකස් කරන ලද ලේඛනය සියලු මට්ටම්වල අධ්‍යාපන කටයුතුවල පුස්තකාල සහභාගිවීම අළලා ලියන ලද්දකි. ළදරු පාසල් මට්ටමේ දී ළමයින් විසින් කියවීමේ දස්කම ප්‍රගුණ කිරීම පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතුය. ප්‍රාථමික හා ද්විතීයික පාසල් මට්ටමේ දී පාසල් පුස්තකාල සම්පත් මධ්‍යස්ථාන සංවර්ධනයට

විශේෂ අවධාරණයක් ඇතිව ක්‍රියා කළ යුතුය. විශ්ව විද්‍යාලවල පූර්ණකාලීන හා අර්ධකාලීන ශිෂ්‍යයන් අනවරතයෙන් වැඩි වෙද්දී ද, කාර්මික හා අමතර අධ්‍යාපන දෙන විද්‍යාල හා වේගයෙන් දියුණු වන බහුතාක්ෂණික විද්‍යාල සම්බන්ධයෙන් ද එසේම ය. පුස්තකාල සහ විධිමත් අධ්‍යාපන ක්‍රමය අතර ඇති සම්බන්ධතාවයේ යථා ස්වභාවය පොත් අලෙවිය පිළිබඳ පවත්නා සංඛ්‍යා ලේඛන විභාග කළ විට එලෙස ම පැහැදිලි ය. 'පන්ති කාමරවල සහ පුස්තකාලයන්හි භාවිතය සඳහා ප්‍රාථමික හා ද්විතීයික පොත් අලෙවිය අවුරුද්දකට දස ලක්ෂයක් පමණ වේ, යයි ගෝඩන් ග්‍රැහැම් ගණන් බලා තිබේ. තෙ වන අදියර සඳහා පොත් අලෙවිය අවුරුද්දකට පවුම් දස ලක්ෂයක් පමණ ය.

පාසල්වල පමණක් නොව අධ්‍යාපනයෙහි විශ්ව විද්‍යාල තත්ත්වය දක්වා හැම මට්ටමකදී ම 'පුද්ගලයා තනි තනිව තමා ගේ පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථාන ඇති කර ගත යුතුය' යන්නට වැඩි අවධාරණය යොදනු ලැබේ. සමහර පාසල්වල පන්තිවල උගන්වන දැඩි පාඩම් ක්‍රමය ස්වතෝන්වේෂන් ක්‍රම (heuristic methods) වෙනුවෙන් අත්හැර දමා තිබේ. එසේම විශ්ව විද්‍යාලවල ද සාමාන්‍ය දේශන ක්‍රමය වෙනුවට සාකච්ඡා, සම්මන්ත්‍රණ සහ නිබන්ධන පන්ති පවත්වා සුහද හා විධිමත් නොවන ආකාරයෙන් මාර්ගෝපදේශය දීම සඳහා ව්‍යාපාරයක් තිබුණි. ඒ. ඇම්. මැක්ඇනලි විසින් තත්ත්වය පහත දැක්වෙන අන්දමට කැටි කොට දක්වා තිබේ. "ශිෂ්‍යයෝ තනි තනිව ඉගෙනීම සඳහා වඩා වැදගත් තත්ත්වයක් ද, වඩා නිදහසක් ද, වඩා ඉඩ කඩ ද ඉල්ලා සිටිති. තමා ගේ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යයා වෙත වඩා වගකීම් පවරන ඕනෑම අධ්‍යාපනික වැඩ පිළිවෙළක් සඳහා අවශ්‍යයෙන් ම පොත් සහ පුස්තකාලවල වැඩි භාවිතය අවශ්‍ය වේ."

පුස්තකාල පහසුකම් සැපයීම පිළිබඳව අවධානයක් යොමු නො කොට, ජාතික අධ්‍යාපන වැඩ පිළිවෙළවල් සකස් කළ විට විධිමත් අධ්‍යාපන ක්‍රමය තුළ පුස්තකාලවල වැදගත්කම පිළිබඳ සාක්ෂි ඉබේ ම ලැබේ. ඉතා මෑතක දී පළ කරන ලද ලිපියක සානාවේ පාසල් පුස්තකාලවල ඉතාමත් කනගාටුදයක

තත්ත්වය ගැන ක්වාමේ නියාකෝ විස්තර කර ඇත. "මේ තත්ත්වය පැන නැඟී ඇත්තේ අධ්‍යාපනික බලයක් වශයෙන් පුස්තකාලයේ, පවත්නා සහ අනාගත කාර්ය භාරය අප්‍රිකාවේ සම්පූර්ණයෙන් අවබෝධ කර ගෙන නොමැති බැවිනි. ප්‍රතිපත්ති සකස් කරන්නන් සහ වගකීම් සහිත නිලධාරීන් පුස්තකාලවල අගය නොදන්නා අතර, අප්‍රිකානු රටවල හැම තැන ම ක්‍රියාවේ යොදවන බොහෝ අධ්‍යාපනික වැඩපිළිවෙළට නියම ලෙස හා ඵලදායී ලෙස එය ඇතුළත් කර නොතිබීම එහි ප්‍රතිඵලයකි. ඝානාවේ පුස්තකාල සේවය අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීමක් වුව ද, පුස්තකාල සංවර්ධන සැලැස්මවල් සහ සම්පූර්ණ ජාතික අධ්‍යාපන වැඩ පිළිවෙළවල් අවශ්‍යයෙන් ම එකිනෙකට සම්බන්ධ නොමැති ලෙස එකිනෙකින් වෙන් ව සමාන්තරව කටයුතු කරයි." යනුවෙන් නියාකෝ විස්තර කරයි. ඒ අනුව ඝානා රජය පාසල් පුස්තකාල සේවා වැඩ පිළිවෙළක් පිහිටුවන්නේ නැති ව, නොමිලේ පාඩම් පොත් බෙදා දීම සඳහා පවුම් දස ලක්ෂ 1 1/2 ක් වෙන් කළේය. එහෙත් රජයේ දේපොළ ආරක්ෂා කිරීම සඳහා පැවති නීති රීති එයට හරස් විය. ළමයින් මේ පාඩම් පොත් ගෙදර නොගෙනිය යුතු යයි නියම විය. නියාකෝ සඳහන් කරන අන්දමට මේ සියල්ල සිදුවූයේ හොඳ පොත් සාප්පු සහ පෞද්ගලික පුස්තකාල දක්නට නොමැති රටක ය.

අධ්‍යාපන ක්‍රමය තුළ පුස්තකාලයේ කාර්ය භාරය ගැන රජයේ නොදත්කම පිළිබිඹු වනුයේ සංවර්ධනය වන රටවල පමණක් නොවේ. අධ්‍යාපනයෙහි ව්‍යාපෘතිය සම්බන්ධ බ්‍රිතාන්‍ය රජයේ ධවල පත්‍රිකාවට පිළිතුරක් වශයෙන් ඉහත සඳහන් කළ ප්‍රකාශය පුස්තකාල සංගමය පිළියෙළ කළේ එ වැනි ව්‍යාපෘතියක් සඳහා ආධාරයක් වශයෙන් පුස්තකාලවල වැදගත්කම පිළිබඳ සඳහනක් ඒ වැදගත් ලේඛනයේ නොතිබුණු බැවිනි.

කෙසේ හෝ වේවා පුස්තකාල නොමැති ව අධ්‍යාපනික වැඩ සැලසුම් ක්‍රියාත්මක කළ නොහැකි බවට රජයේ අවධානය යොමු කිරීම ප්‍රශ්නයේ එක් පැත්තක් පමණි. අධ්‍යාපනික ආයතනවල පුස්තකාල පිහිටු වූ විට ද පුස්තකාලයාධිපතිවරුන්

සිය කාර්ය භාරය නිවැරදි ලෙස පැහැදිලි නො කරන, මේ පොතේ තේමාවට මූලික වූ ප්‍රශ්නය ද ඒ සමග ම ඇත. පාසල් පුස්තකාල පිළිබඳ සිය පොතේ සංඥාපනයෙහි කැරලින් ග්ලැඩ්ස්ටන් ලියොපෝල්ඩ් මේ දර්ශනය විශිෂ්ට ලෙස ගොනු කර ඇත. ''මා තහවුරු කිරීමට බලාපොරොත්තු වන්නේ පාසල් පුස්තකාලයාධිපතිට ඇති කාර්ය භාරයට වඩා වෙනස් කාර්යයක් ඇය විසින් ඉටු කළ යුතුව ඇත යන්නයි. ඇයට පොත්වලින් පිරි කාමරයක භාරකරුට වඩා තත්ත්වයක් තිබිය යුතුය. ප්‍රයෝජනයට ගනු ලැබුවත්, ඇගේ වෘත්තිය කාර්ය භාරය වනුයේ විවේචනාත්මක ව සිතීමට ළමයින් තුළ ඇති හැකියාව වර්ධනය කිරීම සඳහා පුස්තකාලය පාඩම් පොතක් වශයෙන් පාවිච්චි කිරීමයි. විවේචනාත්මක ව සිතීම යනුවෙන් මා අදහස් කරන්නේ තර්ක ශාස්ත්‍රයෙහි පොදු දුර්මත මග හැරීමට ඇති හැකියාවත් තර්ක විශ්ලේෂණය කිරීමට ඇති හැකියාවත් ය. තර්ක කිරීමෙහි එකිනෙකට ගැටෙන ක්‍රම අතර ඇති වෙනස්කම් ක්‍රමවත් ව දැක්වීමට අදාළ සිද්ධි හඳුනා ගැනීමටත්, ඇති හැකියාවත් ඉගෙන ගන්නා අය ගෙන් අපි බලාපොරොත්තු වෙමු. පුස්තකාලයක් විසින් නියෝජනය කළ යුතු දැනුම පිළිබඳ ක්‍රමවත් එකතුවක, එවැනි දක්ෂතා වර්ධනය කර ගැනීම සඳහා මූලික තොරතුරු අඩංගුව ඇත. පුස්තකාලයාධිපතිට ගුරුවරයකු වශයෙන් විශ්ව කාර්ය භාරයක් ඇත. පුස්තකාල සම්පත් ප්‍රයෝජනයට ගැනීම පමණක් නොව, සිද්ධි තෝරා බේරා ගැනීමත් විකල්ප තර්ක සොයා ගැනීමත් යම් කිසි තත්ත්වයකට, විශ්වාසයකට හෝ දැනුම පිළිබඳ අවස්ථාවකට හේතු වූ අදහස් වල ඓතිහාසික අනුපිළිවෙළක් ඇය විසින් ඉගැන්විය හැක.''

පාඨශාලා පුස්තකාලයාධිපති ගේ කාර්ය භාරය වෙනස් කිරීමට නම්, පුස්තකාල ක්‍රමයට දිගට ම ආධාර උපකාර ලැබීමට නම්, ඇත්ත වශයෙන් ම එසේ විය යුතු වේ. තමා වෙනස් ආකල්පයකින් තමා දෙස ම බලා මේ ආකල්පයට පරිපාලක-යින් ද නම්ම ගත යුතුයි. නව ආකල්පයක මාර්ගයෙන් තමා ගැන ම අවබෝධ කර ගැනීමට නම් තම විඥානයෙහි ම වෙනසක් සිදු විය යුතුයි. නව අන්තර් දෘෂ්ටියක් තිබිය යුතුයි.

1966 දී රිචර්ඩ් ඩාලිං, ඇමරිකානු පුස්තකාල සංගමයට සුළු වශයෙන් සහභාගිවීම පිළිබඳ විෂය සම්බන්ධයෙන්, ප්‍රාදේශීය පාසල් පුස්තකාලයාධිපතීන් කණ්ඩායමක් විසින් ආරම්භ කළ සාකච්ඡාවකදී, මේ අදහස අනුමත කළේය. වෘත්තීය විඥානයෙහි පහළ ම ප්‍රතික්‍රියා අවස්ථාව ඔවුන් ගේ ඵලදායි භාවයට ඇත්ත වශයෙන් ම බාධාවක් වූයේ යයි හේ සඳහන් කළේය.

වෘත්තිය විඥානයෙහි පහළ ම ප්‍රතික්‍රියා අවස්ථාව නමැති අශුභ පාඨය ඉතා හුරු පුරුදු ය. ලියපෝල්ඩ් මහත්මිය ගේ දර්ශනය ජැක්වේස් බාරසන් විසින් මුළු පුස්තකාලයාධි පතිත්වයට ම දීර්ඝ කර පුස්තකාලයාධිපති ගේ කාර්ය භාරය තව උසස් තත්ත්වයක තබයි. ''හැමදුම කළාක් මෙන් පුස්තකාලයාධිපති තැන ගුරුවරයකු ලෙස ද ශිෂ්‍යයකු ලෙස ද ක්‍රියා කළ යුතු යි. එහෙත් තව දුරටත් පොත් තිබෙන තැන හා ඒවායේ මාතෘකා වැනි හුදු ශිල්පීය තොරතුරු ආදී කරුණු ගැන නොවේ. මෙ වර ඔහුට ඒවායේ අඩංගු දේ ගැනත්, ඒ දේවල අගයන් සම්බන්ධවත් ඔහු පොතෙන් ම දැන සිටිය යුතු ය. ඔහු කෙළින් ම තමා තුළ ම හා තමා විසින් ම බුද්ධිමත් නියෝජිත බලයක් විය යුතුයි. එමෙන් ම ඔහු ගේ පුස්තකාලයත්, විමසුම්කාර සිතත් අතර ඔහු සම්බන්ධීකරණ ස්ථානයක් විය යුතුයි.'' කෙසේ හෝ වේවා පුස්තකාලයාධිපති ගේ අධ්‍යාපනික කාර්ය භාරය බාර්සන් විසින් උසස් කිරීමෙහි ලා බාධාවක් තිබෙන්නේ ඔහු එය බොහෝ ඈතකට ගෙන යාමයි. අවසානයේ දී නව පුස්තකාලයාධිපතිවරයා පොත් තෝරන්නාත් පොත් එකතු කප්පාදු කරන්නාත් විය යුතුයි. මේ සඳහා උගතුන් සහ ශිෂ්‍යයන් සමග ඔහුගේ සම්බන්ධකම් දිගට ම පවත්වා ගෙන යා යුතු අතර එය නිර්ව්‍යාජ විය යුතුයි. සමහර විට දූන් පවා විශාරදයන්ට අවුල් වූ පොත් ගොඩෙහි, බොර මණ්ඩි අතුරෙන් රත්තරන් වෙන් කර ගැනීමට හැකි වෙනවා ඇත. එහෙත් ඔවුන්ට පවිත්‍රකාරක වශයෙන් ක්‍රියා කිරීමට කාලයත්, බලයත් නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් ඔවුහු කිසිවක් නො කරති.

අධ්‍යාපනික වශයෙන් හෝ අන් ආකාරයකින් හෝ කප්පාදු කරන්කු වශයෙන් හෝ බොර මණ්ඩි අතුරෙන් නියම දේ තෝරා බේරා ගන්නකු වශයෙන් හෝ පවිත්‍ර කාරයකු වශයෙන් හෝ ක්‍රියා කිරීම පුස්තකාලයාධිපතිවරයකු ගේ කාර්‍ය්‍ය භාරයට අයත් කොටසක් නොවේ. පුස්තකාලයාධිපතිවරයකුට සමීක්ෂයකු විය නොහැක. සිතීමේ නිදහස හා ප්‍රකාශ කිරීමේ නිදහස ඔහු ආරක්ෂා කළ යුතු වේ. පෞද්ගලික වශයෙන් ඔහුට සමහර පොත් අප්‍රිය වුව ද වෘත්තිය වශයෙන් ඔහුට එය වැදගත් විය යුතු නොවේ. මේ සිද්ධාන්තය හැම නියම පුස්තකාලයාධිපතිකමකටම පොදු විය යුතු අතර කොතරම් හොඳ හිතින් කළ ද කිසිම විදියේ සමථයකට එය හේතුවක් නොවේ. එවැනි ම ආකාරයකට අධ්‍යාපනයෙහි පුස්තකාලයාධිපතිවරයා ගේ කාර්ය භාරය පිළිබඳව එන්සල් සමීක්ෂණයේ පහත දැක්වෙන නිර්දේශ සම්බන්ධයෙන් සමහර ව්‍යාතිරේක ඇත. 'ප්‍රතිපත්ති යොද ගැනීමෙන් හා අධ්‍යාපන ප්‍රතිපත්තියට අදළ ප්‍රශ්න සම්බන්ධයෙන් ප්‍රසිද්ධ ප්‍රකාශන නිකුත් කිරීමෙන් පුස්තකාලයාධිපතිත්වයේ අධ්‍යාපනික කාර්ය භාරය ඕස්ට්‍රෙලියාවේ පුස්තකාල සංගමය මගින් පිළිගත යුතුයි. ජාතික අධ්‍යාපනික ප්‍රතිපත්ති පුස්තකාලවලට බලපාන අන්දම සම්බන්ධයෙන් මිස එවැනි ප්‍රතිපත්ති ගැන විවේචනය කිරීම පුස්තකාල සංගමයට අයත් කාර්යයක් නොවේ. සර්වග්‍රාහී පාසල් සම්බන්ධයෙන් හෝ බහුතාක්ෂණික විද්‍යාල සම්බන්ධයෙන් හෝ පුස්තකාලයාධිපතිවරයකුට වෘත්තිය මතයක් තිබිය නොහැක. ඔහුට පෞද්ගලික මතයක් තිබිය හැක. එහෙත් එය පුස්තකාලයාධිපතිකමේ දර්ශනයට බලපාන්නක් නොවේ'.

ප්‍රධාන කරුණ නැවත අවධාරණය කරනවා නම් අධ්‍යාපනයෙහි පරමාර්ථ සහ පුස්තකාලයාධිපතිත්වයේ පරමාර්ථ අතර අවශ්‍යයෙන් ම සම්බන්ධකම් නොමැත. ඇත්ත වශයෙන් ම ඇත්තේ නිරන්තර ගැටුමකි. එ බැවින් අධ්‍යාපනයෙහි පරමාර්ථ ගැන ප්‍රකාශන විග්‍රහ කර බලා ඒවා පුස්තකාලයාධිපතිකමටත් අදළ වේදැයි සලකා බැලීම ප්‍රයෝජනවත් ය. සියලුම අධ්‍යාපනික ක්‍රමවල අඩු වශයෙන්ම මූලික පරමාර්ථ හතරක් ඇතැ යි ආර්. සී. බෙන්ග් කල්පනා

කරයි. 'පළමුව අධ්‍යාපනයෙන් වන්නේ සමාජයේ තමාට හිමි තැන ගැනීමට පුද්ගලයා පිළියෙළ කිරීමයි. (සමාජ අනුකූලනය), දෙවනුව, එය ප්‍රායෝගික දක්ෂතා ඔහුට උගන්වයි. (කාර්ය ලෝකය) තුන්වෙනුව එක්තරා විශ්වාස හෝ හර පද්ධතියක් හෝ ජීවිතයට එකට ගැලපෙන ආකල්පය හෝ ඔහු ඇති කර ගන්නවා ඇත. (සංකල්ප විද්‍යා ලෝකය) මේ පුළුල් සමාජ පරමාර්ථ වලට අමතරව සමහර විට ඒවාට විරුද්ධ ව, පුද්ගලයා අද්විතීය හෝ වෙනස් පුද්ගල භාවයක් ලෙස සලකන තාක් ඔහු දියුණු කිරීම සඳහා අවධානය යොමු කරන අධ්‍යාපනික පරමාර්ථ ඇත. මේ පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස මනෝ විද්‍යාත්මක සම්භාවණය හෝ පුහුණුව කරනු ලැබේ. මේ අනුව සමහර ගති ගුණ ඇති වන්නේ සමාජ වර්ගය අනුව හෝ ඒ සමාජය තුළ ඇති කණ්ඩායම් අනුව ය.

මේ අධ්‍යාපනික පරමාර්ථවල පළමු වැන්නෙන් පටන් ගන්නවා නම් සමාජ අනුකූලනය පුස්තකාලයාධිපතිත්වයේ ප්‍රධාන පරමාර්ථයක් ලෙස සැලකිය හැකි දැයි තර්ක කළ හැක. සමාජයේ සංස්කෘතිය පැතිරවීම සම්බන්ධයෙන් පුස්තකාලයට විශාල කාර්ය භාරයක් ඇති බව සත්‍යයකි. එහෙත් එය කිසිම පාසලක් කරනවාට වඩා පුළුල් ලෙසත්, වඩා අපක්ෂපාත ලෙසත්, විය යුතු ය. අනුකූලනය වීමේ හෝ හැසිරීමේ කිසි සැලැස්මක් සඳහා පුස්තකාලය අනුග්‍රහය නොදක්වයි. පුද්ගලයකු විසින් පුස්තකාලයක් පාවිච්චි කිරීමේ එක ප්‍රතිඵලයක් විය හැක්කේ, තමා අවට ඇති සමාජයට සම්පූර්ණයෙන් වෙනස් වූ ජීවිතය සම්බන්ධ පෞද්ගලික මතයක් ඇති කර ගැනීම වශයෙන් සිතා ගත හැක.

අධ්‍යාපනයෙහි දෙවැනි පරමාර්ථය වන ප්‍රායෝගික දක්ෂකම් ලබා ගැනීම පිළිබඳව පුස්තකාලයක සම්බන්ධය සාපේක්ෂීය ලෙස ආන්තික ය. තුන් වැනි පරමාර්ථය වන 'එක්තරා විශ්වාස හෝ හර පද්ධතියක් හෝ ජීවිතයට එකට ගැලපෙන ආකල්පයක් හෝ ඇති කර ගැනීම' පුස්තකාලයාධිපතිත්වයේ දර්ශනය හා සම්බන්ධයෙන් දැනට ම අවුල් සහගත ය. පුස්තකාලයක සම්පූර්ණ පරමාර්ථය—විය

යුත්තේ තම පැවැත්ම ගැන යම් පෞද්ගලික මතයක් ඇති කර ගැනීමට යම් පුද්ගලයකුට උපකාර වීමයි. එහෙත් එය ක්‍රිස්තියානි හෝ ප්‍රජාතන්ත්‍රික හෝ ආස්වාදික හෝ වෙන කිසියම් විශ්වාස ක්‍රමයක් හෝ කාවද්දනවාට වඩා වෙනස් ය. අවසාන පරමාර්ථය වූ 'මනෝ විද්‍යාත්මක සම්භාවනය හෝ පුහුණුව' පුස්තකාලයේ සියලු පරමාර්ථවලට සම්පූර්ණයෙන් ම ආගන්තුක ය.

පී. ඩබ්ලිව්. මස්ග්‍රේව් අධ්‍යාපනයෙහි සමාජ කාර්යයන් මාතෘකා පහක් යටතේ සලකා බලා ඇත.

i. සමාජයේ සංස්කෘතිය පැතිරවීම, මෙහි අවශ්‍යතාව මූලික වශයෙන් ගතානුගතික එකක් වූ පසල් මගින් සමාජයේ ප්‍රධාන රටාවන් ව්‍යාප්ත කිරීමයි.

ii. නවීකාරයන් සැපයීම, වර්තමාන තත්ත්වයන් යටතේ සමාජයේ පැවැත්මට අවශ්‍ය සමාජ විපරිනාම කවුරු හෝ ආරම්භ කළ යුතු ය. මෙම වෙනස්වීම් තාක්ෂණික දේශපාලන හෝ කලාත්මක ඒවා විය හැක.

iii. දේශපාලනමය කාර්යය ය, මෙය දෙපැත්තකින් බැලිය යුතු ය. පළමු ව ප්‍රජාතන්ත්‍රික සමාජයක සියලු මට්ටම්වල දේශපාලන නායකයන් සැපයීමට අවශ්‍යතාව ඇත. දෙවනුව වර්තමානයේ පවත්නා ආණ්ඩු ක්‍රම පද්ධතියට පක්ෂපාතිත්වය තහවුරු කර එය ආරක්ෂාවීම සඳහා අධ්‍යාපනය උපකාර විය යුතු යයි ඉල්ලීමක් ඇත.

iv. සමාජයීය තෝරාගැනීමේ (වර්ණය) කාර්යය, සම්පූර්ණ ජනගහනය අතුරෙන් වඩා දක්ෂ අය තෝරා ගැනීමේ ක්‍රියාවලියට අධ්‍යාපනය ප්‍රධාන ආධාරකය වේ.

v. ආර්ථික කාර්යය, වර්තමාන තාක්ෂණික තත්ත්වයන් යටතේ අවශ්‍ය වූ සංඛ්‍යාත්මක අතින් ද ගුණාත්මක අතින් ද උගත් මිනිස් බලයක් හැම අංශයකට ම සැපයිය යුතු ය.

මේවායින් පළමුවැන්න, පුස්තකාලවලට අදාළවන අන්දම දැනට ම ඉහත පරිච්ඡේදයේදී සැහෙන විස්තර සහිතව සලකා බලා ඇත. මස්ග්‍රේව් විසින් හඳුන්වා දී ඇති දෙවැනි කාර්යය නවීකාරයන් සැපයීම ඇත්ත වශයෙන් ම පුස්තකාලවලට ද අයත් කාර්යයක් වේ. බුද්ධිමය හෝ වේවා සමාජයීය හෝ වේවා හැම අංශයකම පුස්තකාලය පෙළඹවීමක් ඇති කරයි. පුස්තකාලවල තිබෙන හැම යුගයක ම හැම සමාජයක ම මත හා සිද්ධි පුද්ගලයන්ට නිදහසේ ලබා ගැනීමට ඉඩ දීම නිසා අනිවාර්යයෙන් ම ඇති වන ප්‍රතිඵලයක් නම් නවීකරණයට බලය හා ප්‍රබෝධය පුද්ගලයන් තුළ ඇති වීමයි.

අධ්‍යාපනයෙහි තුන් වන කාර්යය වන දේශපාලන කාර්යය දෙවිදියකින් සලකා බැලිය යුතු ය. ඓතිහාසික හා දේශපාලන ව්‍යාපාර සහ සිද්ධි සම්බන්ධයෙන් සියලු ලේඛනගත වාර්තා ද පුවත්පත් හා සඟරා වැනි සමකාලීන වාර්තා ද සියලු වර්ගයේ දේශපාලන හා සමාජ න්‍යායවාදීන් ගේ කෘතීන් ද යනාදි පුස්තකාලයක තිබෙන සම්පත්, පුද්ගලයන්ට දේශපාලන වශයෙන් අවබෝධයක් ලබා දෙයි. බ්‍රිතාන්‍යයේ මුල් සමාජවාදීන් සිය දේශපාලන අධ්‍යාපනයෙන් කොටසක් ලැබුයේ මහජන පුස්තකාල තුළය යන්න ඊට නිදර්ශනයකි. එවැනි දේ නිදහසේ ලබා ගැනීමට තිබීම පමණකින් ම දේශපාලන අවබෝධයක් ඇති කරයි. කෙසේ හෝ වේවා දේශපාලන කාර්යය යනුවෙන් අදහස් කරන්නේ දේශපාලන මත සිතට කා වැද්දීම නම් පුස්තකාලයට එහි කොටස් කාරයකු විය නොහැක. පුස්තකාලයක් විසින් එවැනි මත කා වැද්දීම කළ හැක්කේ සමහර දේශපාලන හා සමාජ මතවලට ධෛර්ය දෙන පොත පත පුස්තකාලයට ගැනීම තහනම් කිරීමෙනි. මේ විධියේ තහනම් කිරීමක් හෝ වෙන මොන අන්දමක හෝ තහනම් කිරීමක් වුවත් පුස්තකාලයාධිපති දර්ශනයට අයත් නොවේ. කොමියුනිස්ට් වාදය ගැන හෝ වේවා, කොන්සවටිව් වාදය ගැන හෝ වේවා, පැසිස්ට් වාදය හෝ සමාජ වාදය ගැන හෝ වේවා, ඒකාධිපති වාදය හෝ ප්‍රජාතන්ත්‍රවාදය ගැන හෝ වේවා, මේ සියල්ල ගැන ඇති පොත පත පුස්තකාලයේ පොත් රාක්කවල තිබිය යුතු ය.

මැක්ග්‍රෙව් ගේ වර්ග කිරීම අනුව අධ්‍යාපනයෙහි හතරවැනි සමාජ කාර්යය වූ සමාජ වරණය, පුස්තකාල විෂයයෙහි ලා අනුචිතය. වඩා දක්ෂ අය දක්ෂකමින් අඩු අයට වඩා ප්‍රයෝජන ලබා ගන්නා නමුදු, පුස්තකාලය භාවිතා කරන සියල්ලන්ට සම අවස්ථා ලබා දිය යුතුය. එක්තරා විධියකට සමාජයීය වශයෙන් සහ බුද්ධිමය වශයෙන් දැනට ම වරප්‍රසාද ලබා සිටින අය තව දුරටත් වරප්‍රසාද පටවනවාට වඩා දක්ෂකමින් අඩු අය කෙරෙහි පුස්තකාල වඩා සැලකිලිමත් විය යුතුය.

ඉතිරි කාර්යය වූ උගත් මිනිස් බලයක් සැපයීම පුස්තකාලවලට අදාළ වන්නේ පුස්තකාලයක කාර්ය භාරය ජාතික අධ්‍යාපනික වැඩ පිළිවෙළවල පුස්තකාල සම්බන්ධ වන බැවිනි. කෙසේ හෝ වේවා පුස්තකාලවලට ජාතික මිනිස් බල අවශ්‍යතා සමග නියම හෝ ප්‍රායෝගික සම්බන්ධතාවයක් නැත.

අධ්‍යාපනයෙහි පරමාර්ථ හා පුස්තකාලයේ පරමාර්ථ අතර නියම ගැටුම මදක් දීර්ඝ වශයෙන් වේගවත් ව, බ්‍රොඩ්ෆීල්ඩ් විසින් විස්තර කර ඇත. පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඔහුගේ දර්ශනය අනුව නම්, පුස්තකාලය භාවිතා කරන්නෝ සත්‍යය සොයන්නෝ වෙති. එහෙත් එවැනි සෙවීම් ඔවුන් තුළ ජනිත වූ අභිලාෂයක් අනුව විය යුතුයි. එ බැවින් ඔහු ගේ මතය අනුව 'අනිවාර්ය කියවීම් යනුවෙන් කියා දෙයක් නැත' 'තමාගේ භාරයේ සිටින ශිෂ්‍යයන් කෙරෙහි කියවීම බල කිරීමට තමාට අයිතිවාසිකමක් ඇතැයි අධ්‍යාපනඥයා ඇත්ත වශයෙන්ම පිළිගෙන ඇත. තමන් කියවිය යුත්තේ කුමක්දැයි යන්න ගැන දෙන ලද උපදේශ අනුගමනය කිරීම පිණිස නොඉවසිලිවන්ත ලෙස තරඟ වැදී සිටින පිරිස්වලට කාමර සැපයීමට ඇමරිකාවේ පුස්තකාලයාධිපතීන්ට අනිවාර්යයෙන් සිදු වී තිබේ. කියවීම අනිවාර්ය කිරීමට ඇති අයිතිය මූලික හේතු මත හෝ එහි යෝග්‍යත්වය අධ්‍යාපනික හේතු මත හෝ ප්‍රශ්න කරන්නෝ ස්වල්ප දෙනෙකි.

අධ්‍යාපන ක්‍රම මගින් සමහර වර්ගවල මත කෙරෙහි තබා ඇති ව්‍යාජ අවධානය නිවැරදි කිරීමට, පුස්තකාල විසින් කළ හැකි සේවය විශාල යයි හේ තව දුරටත් තර්ක කරයි. සත්‍යය

සෙවීමේ ලා කෙසේ පටන් ගත යුතු දැයි මිනිසුන්ට දැක්වීමට උත්සාහ කිරීමේදී ජාතික අධ්‍යාපනික ක්‍රමය ලබා ගන්නේ ඉතා මත් සීමාසහිත සාර්ථකත්වයකි. මෙය කෙසේ කළ යුතු දැයි ඔවුන්ගේ ශිෂ්‍යයන්ට පෙන්වීම ඔවුන්ගේ පරමාර්ථයක් වන්නේ කලාතුරකිනි. ඒ වෙනුවට තිබේ යයි විශ්වාස කරනු ලබන කරුණු ඉගැන්වීමට ඔහු අදහස් කරති. මේ තිබේ යයි විශ්වාස කරන කරුණු බොහෝ විට සිද්ධාන්ත මත පමණි. ඇත්ත වශයෙන් ඒවා එක්තරා ප්‍රමාණයකට තෝරා ගෙන ඇත්තේ ව්‍යවස්ථාදායකයන් කරන, පතන අන්දමට, පාලනය කරනු ලබන අයට ද කිරීමට හා පැතීමට පෙළඹවීමේ පරමාර්ථයෙනි. විශේෂයෙන් ශිෂ්‍යයා විසින් හැදෑරිය යුතු කරුණු ඉතිහාසයට, භූගෝල ශාස්ත්‍රයට, දර්ශන වාදයට, ජීවන රටාවලට, කලාවට, සංගීතයට, නිෂ්පාදිත ද්‍රව්‍යයන්ට හෝ රටේ අනාගත දියුණුවට හෝ අදාළ නම් තත්ත්වය එසේ ය. පුස්තකාලවලින් ලබනා මේ අධ්‍යාපනයේ අන්ත ප්‍රතිඵලවලින් බේරීමට ඔහුට තවත් හැකි විය යුතුය. එහෙත් හැකියාව තහවුරු කරන්නේ අධිෂ්ඨානය පමණි. පුස්තකාල පොත් තොගය තෝරා එකතු කළ යුත්තේ ශිෂ්‍යයන් ගේ තෝරා ගැනීමේ නිදහස පාවිච්චි කිරීම සඳහා කියවීමට බල කරන ලද හා නිර්දේශ කරන ලද පොත් ලැයිස්තු වලින් බාහිර පොත් කෙරෙහි අවධානය යොමුවන අදහසින් ය.

අධ්‍යාපන ක්‍රමය වඩා සැලකිලිමත් වන සමහර විට කලින් කරන ලද දෙයම යළිත් කරන විශාල සංඛ්‍යා ගැන, බ්‍රෝඩ්ෆීල්ඩ් නියම ලෙස ම බිය වේ. ඒ තත්ත්වය හා සන්සන්දනය කරන විට පුස්තකාලය නිතර ම සැලකිලිමත් වන්නේ සංචාරයෙහි යෙදෙන සිතන සහ කියවන තනි පුද්ගලයා සම්බන්ධයෙනි. සාම්ප්‍රදායික අධ්‍යාපනය, ප්‍රමිත කිරීම් සහ පාලනය කිරීම් පිළිබඳව කටයුතු කරයි. පුද්ගලයා ගේ පරිසරය හා උරුමය ගැන නො සලකා පුස්තකාල ඔහු ගැන ද කටයුතු කළ යුතු ය.

මුළු කාරණයෙහි ම වැදගත් ස්ථානය මෙයයි. සමාජය සිය සාමාජිකයන්ගේ ම ඕනෑ පිණිස යයි කල්පනා කර ඔවුන් අධ්‍යාපනයෙන් හැසිරවීමට සහ සංවිධානය කිරීමට තැත්

කරයි  රජයේ නියෝජිතයන්. විමෙන් මඟ හැරීම පුස්තකාල වලට කළ හැකි නම්, සංශෝධන ඉදිරිපත් කිරීම ඒවාට කළ හැක. පුස්තකාල නිත්‍ය වශයෙන් ම පෙරළිකාර ය. නිදහස සඳහා සටන් කරන සදාකාලික විමුක්ති ව්‍යාපාරයකි. අධ්‍යාපන ක්‍රමයට ඇද ගැනීමට විරුද්ධ ව දැඩි ලෙස විරුද්ධව ඒවා ක්‍රියා කළ යුතුය.

*References*


1 Jast, L S. *The Library and the community*. London Nelson, 1939.

2 Thomsen, C. *and others*: *Adult education activities for public libraries*. Paris, Unesco, 1950.

3 'Education: a framework for expansion': a statement on the government's White Paper. *Library Association record*, August 1973.

4 Graham: G, 'What cub–cum-cup might do.' *The book seller*, July 7 1973.

5 McAnally, A M: 'Status of the university librarian in the academic community.' *In* Orne, J *ed*: *Research librarianship*: *essays in honor of Robert B Downs*. New York, Bowker, 1971.

6 Nyarko, K: 'Educationists and library awareness in Africa.' *Library Association record*, June 1973.

7 Leopold, C C: *School libraries worth their keep*: *a philosophy plus tricks*. Metuchen, NJ, Scarecrow P, 1972.

8 Barzun, J: 'The new librarian to the rescue.' *Library journal*, November 1 1969.

9 Fielding, F D O: 'A valediction on a non-profession.' *Australian library journal*, May 1972.

10 Benge, R C: *Libraries and cultural change*. London, Bingley, 1970.

11 Musgrave, P W: *The social functions of education*. London, Methuen, 1965.

12 Broadfield, A: *A philosophy of librarianship*. London, Grafton, 1949.

## 8

# සංස්කෘතිය

පොදු සංස්කෘතික කටයුතුවල පුස්තකාල නිරතවීම අලුත් දෙයක් නොවේ. 'බ්‍රිතාන්‍යයේ මහජන පුස්තකාල හා කලා' යන හිසින් ඇලෙක්සැන්ඩර් විල්සන් සිය ලිපියෙහි සඳහන් කරන අන්දමට, මෙවැනි කටයුතුවලට, මහජන පුස්තකාල සාම්ප්‍රදයික ලෙස ඉඩ සලසා ඇත. සිය පූර්වගාමීන් වන යාන්ත්‍රික විද්‍යා ආයතනවල නිදර්ශනය අනුව යමින් පළමු නිදහස් පුස්තකාල බොහෝ විට සම්බන්ධ වූයේ කලා හෝ තාක්ෂණික පුහුණුව සඳහා ඇති වෘත්තීය පාසල් හා/හෝ කලාගාර සහ කෞතුකාගාර සමඟ ය. මෙහි අවසානයේදී දක්වෙන සම්බන්ධය අද දක්වා ද පවතියි. මේ ශත වර්ෂය ආරම්භයේ දී කාර්නගී සමයේ සිට, මහජන පුස්තකාල විසින් දේශන ශාලා, රැස්වීම් ශාලා සහ ප්‍රදර්ශනාගාර සපයා ඇත. 1939 යුද්ධයට පෙර අවුරුදුවල තනන ලද සමහර ප්‍රධාන පුස්තකාල ඉතාමත් නවීන උපකරණ සහිත නාට්‍ය ශාලා සහ ශ්‍රවණාගාරවලින් සමන්විත විය. ඒ යුද්ධයෙන් පසු පුස්තකාල කලා මධ්‍යස්ථාන බිහි විය.

එ වැනි සහභාගිවීම තනි තනි ව හා සාමූහික ව යන දෙවිදියට ම ය. එහෙත් මෙහි පසු ව සඳහන් වූ ආකාරයට, වඩා අවධානය ලැබී තිබේ. පොතට පමණක් කැපවී සිටීම අත් හැර දමා ප්‍රජා සංස්කෘතික මධ්‍යස්ථාන වීමට පුස්තකාල වලට බල කිරීමක් තිබේ. වර්තමානයේ ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍යයන් ගේ බහුලත්වයේ ආකාරයෙන්, නවීන තාක්ෂණ විද්‍යාව පොත්පත්වලට හා පුස්තකාලවලට සීමාවී සිටිය හැකි දැයි යනුවෙන් සැක කිරීමට හේතු තිබේ.

පුස්තකාල ප්‍රජා සංස්කෘතික මධ්‍යස්ථාන වීමට පක්ෂව බොහෝ බලගතු අය අදහස් දක්වා තිබේ. මේ රටේ කලා පරිපාලනයේ උච්ච ම ස්ථානයේ සිටින ගුඩ්මන් සාමිවරයා මෙසේ ප්‍රකාශ කරයි. මගේ සිත වැඩියෙන් ක්‍රියා කරන්නේ

පුස්තකාලයාධිපතිවරුන් තමන් ගැන ම ප්‍රචාරය කර නො-ගැනීමේ කරුණ ගැන ය. මෙය එක්තරා විධියක අවහැඩ කීමක් වුව ද, ඒ නිවැරදි ය. ඔබ ගේ කාර්යය ඉතාමත් වැදගත්, පරිපූර්ණ ලෙස වැදගත් කාර්යයකි. එහෙත් මහජනයා එහි වැදගත්කම දනී යයි මම නො සිතමි. ඔවුන් එය දකින්නේ හුදු ශිල්පීය කාර්ය භාරයක් ලෙස ය. එහි ඉමහත් සමාජ ප්‍රතිවිපාක හඳුනා නො ගෙන ලේඛක කාර්යයක් ලෙස කරන කටයුත්තක් ලෙස ය. එබැවින් ඔබ මා හමුවනවාට වඩා මා ඔබ හමුවීම වඩාත් වැදගත් වන්නේ ය. තමා කරන්නේ කුමක්ද? තමා ගේ ප්‍රශ්නවල තරම සහ තමා ගේ කටයුතුවල වැදගත්කම දැන ගැනීම, යම් යම් කරුණු සම්බන්ධයෙන් තීරණ ගන්නා ස්ථානවල ගැවසෙන අපට වැදගත් ය. ඔබ ගේ කාර්යය නිකම් ම පොත්වල තොග ගණන් ගැනීමත්, කල් ඉකුත් පොත් සොයා ගැනීමත්, පොත් රාක්කවල පිළිවෙළට පොත් ඇහිරීමත් නො වේ. එය ඔබගේ කාර්යයේ ආන්තික විස්තරයක් පමණි. ඔබ ගේ කාර්යය, ඔබ ආයතනය පිහිටා තිබෙන ප්‍රදේශය හැකි තරම් විචාරවත් ලෙස පාලනය කරන, සහ ඒ ප්‍රදේශයෙහි බලය පතුරුවන ආධිපත්‍යය ඇති කරන කාර්යයකි. ජනතාවගේ සංස්කෘතික ජීවිතයෙහි වැදගත් කොටසක් ඉටු කිරීමට ඔබට ඇත.''

ඔහු ගේ අදහස් කැමැත්තෙන් අනුකරණය කරන කොටසක් පුස්තකාලයාධිපතිවරුන් අතර ඇත. ඉහත පරිච්ඡේදවල සඳහන් කරන ලද 'මහජන පුස්තකාලය එහි අරමුණු සහ පරමාර්ථ' යන ලේඛනයෙහි අතුරු පරමාර්ථ දෙළසක් සඳහන් කර තිබේ. ඒවායින් හතක් ම ගුඩ්මන් සාමිවරයා සඳහන් කළ ඒවා ය. මේ ආකාරයට ඒවා දක්නට ඇත.

● ''පුද්ගලයන්ට කලාවන්හි සක්‍රිය අත් දමින් සහභාගි විය හැකි මධ්‍යස්ථාන වශයෙන් මහජන පුස්තකාල පාවිච්චි කිරීම සඳහා ආධාර දී ධෛර්යමත් කිරීම.

● 'සංස්කෘතික උත්සව ආරම්භ කර සංවිධානය කිරීමේ කාර්ය භාරය භාර ගැනීමට මහජන පුස්තකාලයාධිපතිට අනුබල දීම.

තම විවේක කාලය වැඩ දායක අන්දමින් කලා ක්ෂෙත්‍රයෙහි ගත කිරීම වර්ධනය කරමින් ප්‍රාදේශීය සමිති සමාගම් හා සංස්කෘතික සංවිධාන හා සමග සම්බන්ධකම් පැවැත්වීමට මහජන පුස්තකාලයාධිපතිට අනුබල දීම.

ප්‍රාදේශීය සමිති හා සංස්කෘතික සංවිධාන සඳහා 'විශේෂ පුස්තකාල' නියෝජ්‍යත්වයක් ලෙස මහජන පුස්තකාලය පාවිච්චි කිරීම වර්ධනය කිරීම හා ධෛර්ය දීම.

සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථාන වශයෙන් මහජන පුස්තකාල පාවිච්චි කිරීම වර්ධනය කිරීම හා ධෛර්ය දීම·

විවේක කාලය ගත කිරීමට පුද්ගලයාට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම වර්ධනය කිරීම.

ජනතාව අතර විශේෂ කණ්ඩායම්වලට සිය විවේකය ගත කිරීමට අවශ්‍ය සේවා සහ සැප පහසුකම් සඳහා අවශ්‍ය සේවා සැපයීම වර්ධනය කිරීම.

සමාජයේ පුස්තකාලය පිළිබඳ ලක්හැම් ගේ පොතට හැඳින්වීමක් සපයන තෝමස් කෙලි සඳහන් කළ පරිදි 1964 මහජන පුස්තකාල පනත ද 1968 පළාත් පාලන පනත ද එකට ගත් විට මහජන පුස්තකාල සංස්කෘතික මධ්‍යස්ථාන ලෙස දියුණු කිරීමට තිබුණ සියලුම බාධා ඉවත් කළ බව සත්‍යයකි. ලක්හැම් ම ප්‍රකාශ කරන පරිදි සමාජ සහ සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙස ප්‍රතිෂ්ඨාපනය වීමේ දී නගරයක පිහිටුවන මහජන පුස්තකාලයක් ප්‍රධාන වාසි දෙකක් සහිත ව පටන් ගන්නා බව ද සත්‍යයකි. ඒවා නම් එය සාමාන්‍යයෙන් පිහිටුවන්නේ මධ්‍යම ස්ථානයක ය. ඇහැට ගැටෙන එහි දර්ශනය ද සාමාන්‍යයෙන් ප්‍රතාපවත් ය. ලක්හැම් ගේ වචන වලින් ම කියනවා නම් ''පුස්තකාල විසින් පුළුල් කාර්ය භාරයක් ඉටුකිරීමට තරම් අනුමැතියක් ද අවශ්‍ය විය හැකි තරම් ඔනෑකමක් ද සාක්ෂිවලින් පැහැදිලි වන බව ද'' සත්‍යයකි.

කලා ප්‍රදර්ශන, කලා සංගම්, කලා උත්සව, විවිධ ප්‍රසංග, සාකච්ඡා, සමුළු, නාට්‍ය, චිත්‍රපට නිෂ්පාදන, චිත්‍රපට ප්‍රදර්ශන, කණ්ඩායම් වශයෙන් සංචාර, දේශන, චිත්‍රපට බැහැරදීම්,

නාට්‍ය කියවීම්, තැටි වාදනය වැනි සංස්කෘතික පහසුකම් සහ කටයුතු රාශියක් මහජන පුස්තකාලය විසින් වර්තමානයේ සැපයීම ඒ අනුව පුදුමයක් නොවේ. එහෙත් මේ කටයුතු සියල්ලක් ම විශේෂයෙන් ප්‍රශ්න රාශියක් නඟයි. පුස්තකාලය හෝ කලා මධ්‍යස්ථානය තනි ව භාවිතා කරන පුද්ගලයා ගේ තත්ත්වය කුමක්ද? මොන අන්දමේ ගුණාත්මක ස්වභාවයක් එහි පවත්වා ගෙන යනවා ද?

සමාජය සහ අධ්‍යාපනය ගැන ලියන ලද පසු පරිච්ඡෙද දෙකෙහි ම, පුස්තකාල තනි පුද්ගලයන් ගේ අවශ්‍යතා සපුරා ලීමට අධිෂ්ඨානාත්මක ලෙස පිළියෙළ වී තිබිය යුතු බව තර්ක කරනු ලැබී ය. සත්‍ය සෙවීම පිණිස පරීක්ෂණ පවත්වන, දේශාටනයෙහි යෙදෙන, සිතන සහ කියවන පුද්ගලයෙකු චිත්‍ර, මූර්ති, චිත්‍රපට, සංගීතය වැනි අනෙකුත් උගත් හා කලාත්මක පෙළඹීම් නිදහසේ ලබා ගැනීමට හැකි කමෙන් ඒ වාගේම ප්‍රයෝජන ලබන බව මෙයට සම්පූර්ණයෙන් අනුකූල ය. ඇත්ත වශයෙන් ම මේ සියල්ලට අවශ්‍ය වන්නේ පොත් පමණක් නොවේ.

මෙයට අමතර ව තවත් අතිරේක වාසියක් තිබේ. 'සාහිත්‍යය ගැන' වඩා ඇල්මක් නොමැති' අය වශයෙන් ග්‍රැහැම් හාර්වේ විසින් විස්තර කරන, පොත් පෙරළමින්, බලමින් එකට ගැවසීමට සතුටු, විශාල සංඛ්‍යාවක් පුස්තකාලයට හෝ ප්‍රජා කලා මධ්‍යස්ථානයට ඇදී ආ හැකි බව මේ වාසිය විය හැක. අපේ විවිධ අධ්‍යාපනික හා සමාජ ක්‍රමවල සිටින, දුබල වුවත් කෙළින් සිටීමට හැකි අය සම්බන්ධයෙන් අනුකම්පාව ඉපදවීම මිස පුස්තකාලයාධිපතිට වෙන කළ හැකි දෙයක් නැත.

අනිකුත් සංස්කෘතික කටයුතු ඇතුළත් පරිදි පුස්තකාල කාර්යන් ව්‍යාප්ත කරන හැම අවස්ථාවකදී ම එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන ආයතනික, සාම්ප්‍රදායික වර්ගයේ පුස්තකාල-වලට වඩා විශේෂ සහ අනෙක් පුස්තකාලවලින් වෙන් කරන ආයතන බවට පත්වීමේ අනතුර පරස්පර විරෝධී ලෙස ඇති වේ. එ වැනි ව්‍යාප්ත කිරීම්වල ගුණාත්මක පක්ෂය වැදගත්

වන්නේ එ බැවිනි. ශාඛා පුස්තකාලයක පවත්වා ගෙන යන සාමාන්‍ය පොත් හා සම්බන්ධ කටයුතුවලට අමතරව කුඹල් කර්මාන්තය පිළිබඳ පන්ති ස්වල්පයක් හෝ ඉරිදට පමණක් සිතුවම් කිරීමෙහි යෙදෙන චිත්‍ර කරුවන්ගේ චිත්‍ර කලාතුරකින් ප්‍රදර්ශනය කිරීමක් හෝ වාදන භාණ්ඩ ස්වල්පයක් ඇතුව කරන සුළු ගායනයක් හෝ, පවත්වා පුස්තකාලයාධිපතිත්වයේ විප්ලවයක් බලාපොරොත්තු විය නො හැක. අවශ්‍ය ව ඇත්තේ ජනතාව ගේ හා පුද්ගලයන්ගේ පෞද්ගලික ඕනෑ එපා කම් සම්බන්ධ පරිකල්පනයක්, දැඩි ධෛර්යයක් හා තීක්ෂණ සංවේදීතාවක් ය. තමා කලින් නිරත වී සිටි සාම්ප්‍රදායික පුස්තකාල කාර්යයන් ගේ නොවැදගත් ශිල්පීය කටයුතු අත්හැර දමා, 'සංස්කෘති' සහ 'විනෝදාත්මක' ගොහොරුවකට ඒ ලෙසින් ම කල්පනා නො කැර පැනීම, පුස්තකාලයාධිපතිවරයකුට කිසි වැඩකට නැති පරිවර්තනයක් වනවා ඇත.

අනිකුත් සංස්කෘතික කටයුතු අඩංගු වන පරිදි, සාම්ප්‍රදායික පුස්තකාලයකට, සිය කටයුතු කළ හැකි ආකාර තුනක් ඩී. ජේ. ජෙරාර්ඩ් හඳුනා ගෙන තිබේ.

1. **පරිස්සම් සාම්ප්‍රදායිකය:** කණ්ඩායම් සහ සමිති වශයෙන් ජනතාවට පුස්තකාල පරිග්‍රයේ ඉඩ සලසන අතර වැටුප් රහිත සම්බන්ධතා නිලධාරි වශයෙන් පුස්තකාලයාධිපති ක්‍රියා කරමින් මෙවැනි මහජන සම්බන්ධතා මගින් තමා ළඟ ඇති පොත් සම්භාරයේ භාවිතය වර්ධනය කිරීම.

2. **පුළුල්වන සාම්ප්‍රදායිකය:** පුස්තාලයාධිපතිවරයකු, නාට්‍ය අධ්‍යක්ෂවරයකු වැනි කාර්ය භාරයක් උසුලමින්, තමා ගේ අයිතිවාසිකම් අනුව වෘත්තීය කලාකරුවන් සමඟ සම්බන්ධකම් පවත්වමින්, විසිතුරු උත්සව මාලාවක් පැවැත්වීම.

3. **නව සංකල්පයක්:** නව පුස්තකාල ද්‍රව්‍ය සමඟ නියැලීම. මෙයට පොත් පදනම් වුවද ලබා ගත හැකි තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතයට ගැනීමෙන් අප කිසිවකු මෙතෙක් අත් නුදුටු නව සහ විභාග කැර නො බැලූ වටපිටාවක් ඇති කිරීම.

මෙහි පළමුවන සාම්භාව්‍යතාව ගැන කිව හැක්කේ කිසිවක් නැතිකමට වඩා මෙයවත් ප්‍රමාණවත් බවයි. ශිල්පීය සහ ලිපිකාර වශයෙන් එදිනෙද වැඩ කටයුතුවලට පුස්තකාලයාධිපති නිරත වීමට වඩා මෙය හොඳ ය. දෙවැන්න ගැන කිව හැක්කේ එහි පුස්තකාලයාධිපතිත්වය හා ඇති සම්බන්ධය ඉතාමත් අල්ප බවයි. ඉතා ලිහිල් අන්දමින් විස්තර කළ ද, තුන් වැන්න කරණ කොට ගෙන ය, යම් කිසි පෙරළියක් සිදු වීමට ඉඩ ඇත්තේ.

මුද්‍රිත වචනය තවමත් වාර්තා ගත කිරීමේ හා සංනිවේදනයේ ප්‍රධාන මාර්ගය වුව ද, ඒ පිළිබඳව එය ඒකාධිකාරයක් නොදරයි. මීට ඉහතදී ද සඳහන් කළ පරිදි නවීන තාක්‍ෂණ විද්‍යාව නිසා ශබ්දය හා දෘෂ්ටිය සංස්ථාන කළ හැකි බවට පත් කර තිබේ. විසි වන ශත වර්ෂය ගැන ලියන ඉතිහාසඥයන්ට පොත් සහරා සහ පුවත්පත් නොසලකා හැරීම කළ නොහැකි වෙනවා මෙන්ම, ඒ සඳහා චිත්‍රපට හා රූපවාහිනී වැඩ සටහන් නැරඹීමටත් ශබ්ද පටි සහ තැටිවලට සවන් දීමටත් සිදු වෙනවා ඇත. මුද්‍රිත වචන, ස්ලයිඩ්ස් සහ පටිගත කරන ලද ශබ්ද වලින් සමන්විත බහු සංනිවේදන පැකැට්ටු පුස්තකාලවලට ලැබීම දූන් සාමාන්‍ය දෙයක් වී තිබේ. "මුද්‍රිත දේත් මුද්‍රිත නො වන ද්‍රව්‍යයත් අතර අන්‍යොන්‍ය සම්බන්ධය කෙතරම් එකට වෙළී, ඔවුන් ගේ අනාගතය කෙතරම් සම්බන්ධවී ඇත්ද යත් අලුත් ද්‍රව්‍යයන්, තමන් පෙරදී ප්‍රධාන වශයෙන් කටයුතු කළ පොත් සමඟ ඉතාමත් කිට්ටු සම්බන්ධතාවයකින් සංවිධානය කිරීමට පුස්තකාලයාධිපතිවරුනට සිදුවනු ඇතැයි බී. ජේ. එන්රයිට් ප්‍රකාශ කර ඇත. "පුස්තකාලවල වර්ධනය විභාග කර බැලීමේදී ලිඛිත හෝ මුද්‍රිත වචනයෙන් එහා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය කරා පුස්තකාලයේ ප්‍රයෝජනය හා වැදගත්කම ව්‍යාප්තවීම තර්කානුකූල මෙන් ම නොවැළැක්විය හැකි ලෙස ද පෙනේ." යනුවෙන් ඔහු තව දුරටත් සඳහන් කරයි.

එන්රයිට් මෙතැන දී සලකා බලන්නේ අධ්‍යාපනයෙහි නව මාධ්‍යයන් සම්බන්ධයෙනි. එහෙත් ඔහු ගේ තර්ක වඩාත් සාමාන්‍ය හා පොදු තත්වවලට ද යෝග්‍ය ය.

පුස්තකාල භාවිතා කරන නව පරම්පරාව ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් කෙරෙහි ඉතා දැඩි ලෙස නැඹුරු වී සිටියි. ඔවුන් ඇති දැඩි වී ඇත්තේ රූපවාහිනිය, ගුවන් විදුලිය, චිත්‍රපට, ස්ලයිඩ්ස්, පටිගත කරන යන්ත්‍ර හා ශබ්ද තැටි බහුල ලෝකයක ය. මුද්‍රණයට පමණක් සම්පූර්ණයෙන් සීමාවූ ආයතනයක් ඔවුන්ට ආගන්තුකය, පුරුදු නැත. එ බැවින් පුස්තකාල පොත් සම්බන්ධ ව පමණක් සැලකිල්ලක් නො දැක්විය යුතු ය.

මේ නව වර්ධනයට මෙයට වඩා සියුම් ගුප්තාර්ථ ඇත. දැඩි ලෙස පොතට නැඹුරු වී ඇති පිළිබිඹුව ඉවත් කිරීමෙන් පුස්තකාලය සමහර දීර්ඝකාලීන බාධාවන්ද ඉවත් කරනවා විය හැක. ඉතාමත් අවබෝධයක් ඇති ව මේ අංශය රොබර්ට් ඇස්. ටේලර් විසින් සංක්ෂේපයෙන් දක්වා ඇත්තේ මෙසේය. "පොත් සහ මුද්‍රිත දෙයට, නැඹුරු වූ ආයතන වශයෙන් පුස්තකාල දියුණු වී තිබේ. මධ්‍යම පන්තික හරයන් ඇති අය සඳහා උසස් අධ්‍යාපනය පිළියෙළ කර තිබෙන්නාක් මෙන්, පුස්තකාල භාවිත කිරීම ද ලියන්ට කියවන්ට දත් මධ්‍යම පන්තිකයන්ට සීමා වී ඇත. ඉතාමත් දියුණු සමාජ සංචලතාවයක් හා විවිධාංගීකෘත මාධ්‍යයන් ඇති ලෝකයක මේ ආකල්පය නොගැලපෙන්නකි. පුස්තකාලයේ ඵලදායකත්වය එයින් බරපතල ලෙස යටපත් වේ. මෙයින් අදහස් කරන්නේ පොත තුච්ඡ කිරීම නොව පොත පත වඩා හොඳින් අවබෝධ කර ගෙන රස විඳිය හැකි තත්වයක් සැපයීමය.

මෙ වැනි පසුබිමක් ඇතිව ජෙරාර්ඩ් විසින් දක්වන ලද නව පරිසරය දර්ශනය කිරීම පහසුය. මෙ වැනි තත්වයක් යටතේ පුස්තකාල ව්‍යාප්ත වීම, පුළුල්වීම සහ අන්තිමේදී ඒවායේ නෛසර්ගික බලයෙන් සම්පූර්ණයෙන් ප්‍රයෝජන ගැනීම සිදුවනවා දැකිය හැක. වර්තමාන බ්‍රිතාන්‍ය නාට්‍ය ක්ෂෙත්‍රයේ ඉතාමත් කැපී පෙනුණු පුද්ගලයකු වූ අභාවප්‍රාප්ත සීන් කෙනී මෙසේ ප්‍රකාශ කළේය. 'කාරණය මෙයයි. පුස්තකාලවල මූලික ග්‍රන්ථ තිබෙන අතර වැඩි මනත් දේ කිරීමට මේ පොත පත ඔබට ධෛර්ය දෙයි. ඒවා ඔබට පුළුල් ලෙස අනුමති දෙයි' සංස්කෘතික හා සන්නිවේදන

මධ්‍යස්ථානයක් වශයෙන් නැවත උත්පාද වී ඇති පුස්තකාලය සඳහා නිර්වචනයක් වඩා පැහැදිලි ලෙස ඔහු සපයා ඇත. 'කිසිවක් බැහැර නොකරන පුස්තකාලයක් සම්බන්ධයෙන් නිර්වචනයක් දීමට තැත් කරන මෙන් මම ඔබෙන් ඉල්ලා සිටීමට කැමති ය. අප දන් කතා බස් කිරීමට යන කලා මධ්‍යස්ථානයට සිනමා, නාට්‍යශාලා, නැටුම්, ප්‍රදර්ශන, දේශන ශාලා සහ පුස්තකාලය අඩංගු වූවා යයි සිතමු....... පුස්තකාලය එවැනි කණ්ඩායමක නායකයා විය හැක....... තමාගේ මධ්‍යස්ථානයෙන් කිසිම කාර්යයක් බැහැර කිරීමට තැත් නොකරන්නේ නම් පුස්තකාලයාධිපතිට ප්‍රධානත්වය ගත හැක. තව අවුරුදු ස්වල්පයකින් සමහර විට පුස්තකාලය යන නම ද වෙනස් වනු ඇත. පුස්තකාලය යන නම අහෝසි වේ. වෙනින් සුදුසු නාමයක් නොමැති කම නිසා කලා මධ්‍යස්ථානය යනුවෙන් නම් කර ඇති මේ මධ්‍යස්ථාන පුස්තකාලයක් ලෙස ආරම්භ කළ නමුදු එහි ප්‍රධාන ලක්ෂණ වනු ඇත්තේ මිනිසා විසින් කරන ලද සියලු දේ ද අද ජන සමාජයේ මිනිසාගේ සිතුම් පැතුම් ද ඔහු දන් කිරීමෙහි නිරත ව සිටින දේ ද ගැන ගවේෂණය කිරීමට මිනිසුන්ට ප්‍රවේශ විය හැකි ස්ථානයක් ලෙස ය. පසුගිය දේ පමණක් නොව මේ මොහොතේ ලෝකයේ සිදුවන දේ පිළිබඳ ව ද කරුණු එකතුවක් මේ ස්ථානයේ දී දැක බලා ගත හැකි විය යුතු ය.''

නැවතත් පුස්තකාලවල බලය ගැන මෙතරම් අවබෝධයක් ඇත්තේ පුස්තකාලයාධිපති වෘත්තියෙන් පරිබාහිර කෙනෙකුටය යන්න වැදගත්ය. මේ අභියෝගයට මුහුණ දීමට ඔහු පුස්තකාලයාධිපති කෙනකු දෙස ම බැලීම එලෙස ම වැදගත් ය. මෙතෙක් කල් වෘත්තියේ දුබල ප්‍රතිචාරය ගැන ජෙරාර්ඩ් පැහැදිලි ලෙස ම මතක් කරයි. ''සිය කාර්ය භාරය පිළිබඳ ව පුස්තකාලයාධිපතිවරුන්ට බොහෝ මෙන් ම පරස්පර විරෝධ මත ද ඇත. මධ්‍යස්ථාව ආරක්ෂා කිරීමේදී හා නම් කළ නොහැකි සේවාදායී පිරිසක ගේ හඳුනා ගත නො හැකි සේවකයන් වශයෙන් ඔවුහු පසුගිය කාලය තුළ දැඩි මුරණ්ඩුතාවක් දැක් වූහ. සම්මතයන් පිළිගැනීම,

විශේෂයෙන් පෞද්ගලික සම්මතයක් පිළිගැනීම හෝ වෘත්තීය නිලයෙහි කටයුතුවලදී ඒවා යොදා ගැනීම සඳහා බැඳී සිටීම කෙරෙහි ද ඇති සහජ අකමැත්ත හා සමග මේ ආකල්ප බැඳී ඇත. එහෙත් ක්‍රමයෙන් සිදු වූ වෙනස් වීම් නිසා එය පස්සට තල්ලු විය.''

සංස්කෘතියට පුස්තකාලයේ ඇති සම්බන්ධකම පිළිබඳව කෙටියෙන් සලකා බැලීමේදී මෙන්ම සමාජයට හා අධ්‍යාපනයට පුස්තකාලයේ සම්බන්ධතාව පිළිබඳ කලින් කරන ලද සලකා බැලීමේදී ද, පැහැදිලිව පුස්තකාල බලය පිළිබඳ මේ පොදු තේමාව ඉදිරිපත් වේ. පුස්තකාල බලය තාත්වික ය. වර්ගීකරණ ක්‍රමවලට වඩා තාත්වික ය. පරිගණකයට වඩා තාත්වික ය. ඊනියා කළමනාකාර ශිල්ප ක්‍රමවලට වඩා තාත්විකය. එය ප්‍රතික්ෂෙප කර ඇත. නියම එහෙත් වෘත්තීය වශයෙන් වශයෙන් ඒ ගැන සොයා බලා නැත.

පුස්තකාලය වෘත්තිය, න්‍යාය, ධර්මයක් හෝ න්‍යාය ධර්ම පිහිටුවා ගත යුතු ය. තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් ඇති සර්ව ව්‍යාප්ති අවධාරණය බොහෝ දුරට අත්හැර දැමිය යුතුය. මේ අවධාරණය එක්සත් ජනපද රාජ්‍යයෙන් ආරම්භ වූවකි. නාමාවලී සකස් කිරීම, පුස්තකාල ගොඩනැගිලි, පොත් ඇසුරුම් ක්‍රම, පොත් සංසරණ ක්‍රම ආදී ගැන ඇමරිකානු විශේෂඥයෝ වැලක් ම, ඩිවිගෙන් පසු ව සිටියහ. ඇමරිකානු විශේෂඥ-තාවෙන් සහ වෘත්තීයතාවෙන් අප සම්පූර්ණයෙන් යටපත් කර දමා ඇත.

මෙ වැනි වෘත්තීයතාවට නියම තැනක් තිබේ. එහෙත් එය න්‍යාය රික්තයක භාවිත කරනු ලබන විට සහ පුස්තකාලය යනු කුමක්ද, එය විසින් ඉටු කළ යුතු කාර්ය භාරය කුමක් ද, සහ පුස්තකාලයාධිපතිට කුමන පරමාර්ථයක් තිබිය යුතුද, යන කරුණුවලින් අවධානය වෙනතකට යොමු කරන විට එය විහිළුවක් බවට පත් වේ.

*References*

1 Wlison, A: 'Public libraries and the arts in Britain.' *In* Gerard, D E *ed*: *Libraries and the arts: a symposium of papers and discussions at the seminar held in the College of Librarianship, Wales, September 1 – 6, 1969*. London, Bingley, 1970.

2 Goodman, B: *Lord*: *In* Gerard, op cit.

3 Luckham, B: *The library in society*. London, Library Association, 1971.

4 Harvey, G: 'Public library impact-breaking down the barriers. Part two – users.' *Assistant librarian*, August 1973.

5 *Op cit*.

6 Enright, B J: *New media and the library in education*. London, Bingley, 1972.

7 Taylor, R S: *The making of a library: the academic library in transition*. New York, Becker and Hayes, 1972

8 Kenny, S: *A theatre of books*. *In* Gerard, *op cit*.

# 9

# බලපෑම

බලය සහ බලපෑම සමගාමීය. පුස්තකාල සතු බලය ගැන පුස්තකාල වෘත්තිකයන් අතර ඇති අනවබෝධයෙන් පැන නගින නොවැළැක්විය හැකි හා කලින් කිව හැකි ප්‍රතිඵලයක් නම් පුස්තකාලයාධිපතිවරුන් විසින් යෙදිය හැකි හා යෙදිය යුතු බලපෑම පිළිබඳ ව එක හා සමාන ව තිබෙන අනවබෝධයකි. පුස්තකාලයාධිපතිවරුන්ට එ වැනි බල පෑමක ශක්තිය හා එය ඉදිරියට දියුණු කළ හැකි ප්‍රමාණය ගැන කියා දෙන්නට සිදු වූයේ දර්ශන වාදියකු හා දේශපාලන විද්‍යාඥයකු වූ ජෝස් ඔර්ටෙගා. වයි. ගැසට්ට ය.

පුස්තකාලයාධිපතිවරයකු ගේ සේවය ගැන විභාග කිරීමේදී පොත් සහ පුස්තකාලවලට ඇති තැන ඔර්ටෙගා වයි. ගැසට් ඓතිහාසික ලෙස සමාලෝචනය කරයි. පුස්තකාල-යාධිපතිගේ යුතුකම්, සමාජ අවශ්‍යතාවක් ලෙස පොතට ඇති වැදගත්කමට අනුලෝම සමානුපාතිකව වෙනස් වී ඇතැයි හේ කල්පනා කරයි. මධ්‍යතන යුගයේදී පොත්වලට දක්වන ලද සැලකිල්ල තව මත් අවර සමාජයීය විය. එ නම් පොදු දර්ශනයට ඒවා භාජන නොවීය. ''ඒවා තවමත් සැඟවී තිබිණි. රහසිගත ව, අභ්‍යන්තර ව, ආශ්‍රමයක් වැනි හුදකලා ස්ථානයන්හි රහසිගත ස්ථානවල තැන්පත් කර තිබිණි''. ඒ කාලය තුළ නියම ලෙස, පොත් අත් පත් කර ගැනීම හා පොත් නිෂ්පාදනය මීට පෙර අවදිය සමඟ සසඳන විට වැඩිවී තිබිණි.

කෙසේ හෝ වෙවා දහනව වැනි ශත වර්ෂයේදී පොත්වල අඩු පාඩුවක් නො වී ය. ඒ කාලයේදී වඩා අවශ්‍ය ව තිබුණේ ඒවා සූචිගත කිරීම හා ඒවා ගැන සෙවිල්ලෙන් සිටීමත් ය. විශේෂ උනන්දුන් ගැන ඔර්ටෙගා වයි. ගැසට් සඳහන් නොකළ ද ඉංග්‍රිසි සාහිත්‍යයේ ග්‍රන්ථ නාමාවලීකරණ ඉතිහාස-යේ ඉතා මත් ප්‍රකට නම් තුන මේ කාලය හා සම්බන්ධ බව සිහි කටයුතු ය. වොට්, ලවුන්ඩ්ස් සහ ඇලිබෝන් ඒ නම්

තුනයි. වොට්ගේ Bibliotheca britannica (4 volumes 1824) දැනුමේ හැම අංශයකම හා සාහිත්‍ය පිළිබඳ ව බ්‍රිතාන්‍ය ලේඛකයන්ට මහ පෙන්වීම අරමුණු කර ගෙන ලියවුණකි. ලවුන්ඩේස්ගේ The bibliographer's manual of English literature (4 volumes 1834) මෙහි පොත් පත් දහසකට වඩා සංඛ්‍යාවක තොරතුරු ඇතුළත් විය. ඇලිබෝන්ගේ A critical dictionary of English literature (3 volumes, 1859–71 මෙහි කතෘවරුන් හතලිස් හය දාහකගේ පමණ තොරතුරු අඩංගු කර තිබිණ.

පොත් සොයා ගැනීම ප්‍රශ්නයක් නොවී ය. ප්‍රශ්නයක් වූයේ පාඨකයන් සොයා ගැනීම සහ ධෛර්ය දීම ය. පුස්තකාල සහ පුස්තකාලයාධිපතීන්ගේ සංඛ්‍යාව වැඩි විය. එහෙත් වෘත්තියක් වශයෙන් පුස්තකාලයාධිපතිත්වය තවමත් නිල තත්ත්වයට වඩා ස්වයං සිද්ධ සහ සමාජයීය වූයේය. එයට නිල තත්ත්වය ලැබුණේ සේවිත පුස්තකාල සඳහා සාමූහික අවශ්‍යතාව ඉතාමත් තියුණු වූ විට හා එය තව දුරටත් සාමාන්‍ය අවශ්‍යතාවක් නොව පැහැර හැරිය නොහැකි අවශ්‍යතාවක් හා හදිස්සියක් වශයෙන් හැඟුණු විට ය.

"සිය ජීවිතය සැප පහසු කර ගැනීමට මනුෂ්‍යයා නිපදවන හැම දෙයක් ම හා ඔහු ශිෂ්ටාචාරය හා සංස්කෘතිය වශයෙන් හඳුන්වන සියල්ල අවසානයේ දී ඔහුට ම විරුද්ධ වන අවස්ථාවක් පැමිණෙන්නේ යයි" ඔර්ටෙගා වයි. ගැසට් දර්ශනවාදී ලෙස කල්පනා කරයි. "පොත් ඕනෑවට වැඩියෙන් තිබේ යයි දැන් හැඟීමක් පවතින නමුත් පොත්වල ආකර්ෂණ බලය තව දුරටත් නො පවතියි· ඒවා ගණන් ගනු ලබන්නේ විශාල බරක් වශයෙනි." යනුවෙන් හේ තර්ක කරයි. මේ අවස්ථාවේ නාට්‍යාත්මක ස්වභාවය ඔහු දකින්නේ මෙ සේ ය: "ඉතිහාසයේ මේ අවදියේදී පොත් අත්‍යවශ්‍ය ය. එහෙත් පොත් මිනිසාට අනතුරක් වී ඇති බැවින් පොත ද අනතුරකට මුහුණ පා තිබේ."

වෘත්තීය පරිණතියට පැමිණි බව පෙන්වා සිය බල පෑම කළ යුත්තේ පොත් සහ පුස්තකාල ක්‍රමයෙන් වෙනස්වන මේ අවස්ථාවේදී යයි ඔර්ටේගා වයි. ගැසට් කල්පනා කරයි. ''මෙතැන් සිට පුස්තකාලයාධිපති ජීවන කාර්යයක් ලෙස සලකා පොතට අවධානය යොමු කළ යුතු ය. පොත් පිළිබඳව ඇති උද්‍යෝගයේ ප්‍රධානියා ඔහු විය යුතු ය.''

ඔර්ටේගා වයි. ගැසට් ගේ අදහස අනුව පුස්තකාලයාධිපති ගේ බල පෑම තෙවිධියකින් ක්‍රියා කරනු ඇත.

පළමුවැන්න ග්‍රන්ථ විද්‍යාත්මක පාලනයට අදල වේ. යම් කිසි විෂයක ග්‍රන්ථ නාමාවලි පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ කාර්යය පමණක් වර්තමානයේ කතුවරයකුට සැහෙන වෙහෙසකාරී කර්යයක් වන්නාක් මෙන් ම සම්පූර්ණයෙන් නිෂ්ඵල කර්යයක් ද වේ. ''එම කටයුත්තෙහි ඒ කොටස නිම කළාට පසු, ඔහු කියවිය යුතු සියල්ල ම ඔහුට කියවන්ට නොලැබෙන බව කතුවරයාට පෙනී යයි. මෙයින් සිදු වන්නේ ඉක්මනින් කියවීමට ගොස් නොමනා අන්දමින් කියවීමයි. ඒ සමග ම තමා තුළ ම බල රහිත බවක් හා අසාර්ථක හැඟීමක් පහළ වී අවසානයේදී තමා ගේ කෘතිය ගැන ම සැක සහිත තත්ත්වයකට පත් වේ.''

කතුවරයා ගේ මේ දුෂ්කර තත්ත්වය අඩු කිරීම පුස්තකාලයාධිපති විසින් කළ යුතු අතර හැකි තරම් පොත් කියවීමේ නිෂ්ඵල ප්‍රයත්නයන්ගෙන් ඔහු මිදිය යුතු ය. යම් කිසි විෂයයක් සම්බන්ධයෙන් විස්තරාත්මක හා වරණීය ග්‍රන්ථ නාමාවලී කතුවරයාට කරදරයක් නොවීමට වග බලා ගැනීම ඉතාමත් අවශ්‍ය ය. මේ සඳහා ඉතාමත් ප්‍රබල හා ස්වයංක්‍රීය ලෙස ක්‍රියාත්මක වන ග්‍රන්ථ විද්‍යාත්මක ක්‍රමයන් සකස් කිරීම අවශ්‍ය වේ.

නිසැක ව ම මේ ග්‍රන්ථ විද්‍යාත්මක පාලනයේ ආරම්භය ඇත්තේ වොට්, ලවුන්ඩෙස් සහ ඇලිබෝන් වැන්නන් ගේ කෘතිවල ය. එහෙත් දැන් එය වඩා උසස් හා ඉහළ මට්ටමක තබා තිබේ. සූචිකරණ නීති සංග්‍රහයන් සහ වර්ගීකරණ ක්‍රම ද,

පුස්තකාල සූචීන් සහ මුද්‍රිත සූචීන් ද සූචි සහ සාර සංග්‍රහයන් ද, ජාතික හා විෂය ග්‍රන්ථ නාමාවලින් ද, යන්ත්‍ර මාර්ගයෙන් කිය විය හැකි වාර්තා සහ දත්ත බැංකු ද මෙයට ඇතුළත් වේ.

ලිපිවල අධිකත්වයක් ගැන ජේ. මාර්ටින් දී ඇති හැඟීම හේතු සහිත ය. මක්නිසා ද යත් තොරතුරු නොහොත් කරුණුවල අධිකත්වයක් ගැන යමකු සඳහන් කළත්... එයින් නියම ලෙස අදහස් කරන්නේ ලිපිවල අධිකත්වය ගැන ය. එනම් මුද්‍රිත කරුණු ගැන සංඛ්‍යාව නිරන්තරයෙන් අධික වන්නාක් සමඟ ම ඒ ප්‍රමාණයට ම දැනුමෙහි ද වැඩිවීමක් ඇති වී තිබෙයයි අදහස් කිරීමට ඉඩ ඇති බවක් පෙනේ. 1960 අවසානය වන විට විද්‍යාව හා තාක්ෂණ විද්‍යාව පිළිබඳ ව පිටවී තිබුණ ලිපි සංඛ්‍යාව දශ ලක්ෂයක් පමණ විය. ලිපි ලිවීම ආරම්භයේ සිට අද දක්වා වාර සඟරා සාහිත්‍යයේ දියුණුවෙන් පෙන්නුම් කරන්නේ, මේවායේ සංඛ්‍යාව මුළුමනින් ම දළ වශයෙන් දෙගුණ වූ විසි අවුරුද්දක කාලයක, ලිපි දශ ලක්ෂ තිහක් වූ බවයි. බී. සී. විකරි විසින් අනාවරණය කර ගන්නා ලද මේ කරුණු, ජේ. මාර්ටින් ගෙන හැර දක්වයි. මීට අමතර වශයෙන් සඳහන් කරතොත් විකරි සැලකිලිමත් වූයේ විද්‍යා, තාක්ෂණ විද්‍යා හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ලිපි ගැන පමණි. මේ ගණන් බැලීමේදී ඔහු සම්පූර්ණයෙන්ම සමාජ විද්‍යා හා මානව විද්‍යා අත්හැර ඇත.

ඔර්ටේගා වයි. ගැසට් විසින් ඉදිරිපත් කර ඇති පරිදි පුස්තකාලයාධිපති ගේ බල පෑම ක්‍රියාත්මක කළ යුතු දෙවන ක්‍රමය නම් විශේෂඥ දැනුමක් නො ලැබූ පාඨකයාට පොත් සම්භාරය පරිහරණය කරන ආකාරය පිළිබඳ ව උපදෙස් දීමයි. අද මිනිසුන් කෙතරම් කියවනවාද කියතොත් ඔවුන් ගේ මනස අර්ධ වශයෙන් අවබෝධ කර ගත් හා ව්‍යාජ මතවලින් පිරී ඇතැයි ඔර්ටේගා වයි. ගැසට් කල්පනා කරයි. ඔහු ගේ කල්පනාව අනුව පුස්තකාලයාධිපති කියවීම පිළිබඳ ''වෛද්‍යවරයා සහ ස්වස්ථතා පරීක්ෂක'' විය යුතු යි.

පුස්තකාලයාධිපති ගේ විභව බල පෑම පිළිබඳ ව ඔර්ටේගා වයි. ගැසට් ගේ මත පිළි ගැනීමට, මේ තාක් දුරට දුෂ්කරතාවක් නොමැත. වඩා යහපත් ග්‍රන්ථ විද්‍යාත්මක

පාලනයක් සඳහා ඔහු ගේ තර්කය පුස්තකාල වෘත්තියෙහි ඉතාමත් සම්ප්‍රදායානුකූල තැනැත්තා විසින් ද අනුමත කරනු ඇත. මක්නිසාද යත්, පසුගිය අවුරුදු දෙසීයක කාලය මුළුල්ලේම පුස්තකාල වෘත්තිය මේ අංශය කෙරෙහි සිය අවධානය යොමු කළ බැවිනි. දැනට පැහැදිලි ලෙස දක්නට ඇති, ජාත්‍යන්තර ලෙස සංවිධානය කරන ලද පරිගණිත සූචි සැකසුම' හා තොරතුරු සේවා ආරම්භ කිරීමත් සමඟ, ඒ මාර්ගයේ බොහෝ දුරට අප ගමන් කර ඇති බව කිව හැකි ය. පුස්තකාල වෘත්තිය මේ තත්ත්වයට දැනට පැමිණ ඇත්තේ බොහෝ ලෙස ස්වයං අනුග්‍රහකාරී සහ අන්තර් පරීක්ෂාකාරීව ප්‍රස්තුත කාරණයෙන් පිට පැනීමෙන් පසු ව බව සටහන් කර ගත යුතු ය. ඒවා නම් දැඩි ලෙස යොදා ගන්නා ලද ඉතාමත් වේදනාකාරී සහ පැටලිලි සහිත අනවශ්‍ය ලෙස විස්තර ඇති, සූචිකරණ නීති සංග්‍රහ, එහි ම වැරදි සහිත වර්ගීකරණ ක්‍රම සහ කිසිම අවශ්‍යතාවක් නැති ව ගුප්ත වාතාවරණයක රැකවරණය ගැනීම වේ.

එ ලෙස ම පොත් සහ තොරතුරු සම්භාරය තුළ පුස්තකාලයාධිපති මාර්ගෝපදේශකයකු වශයෙන් දක්වන ඔර්ටේගා වයි. ගැසට් ගේ මතය පිළිගත හැක. මේ පොතේ පස් වැනි පරිච්ඡේදයේ සඳහන් කර ඇති අන්දමට යම් වෘත්තිය කණ්ඩායමක ගේ කටයුතු හා සම්බන්ධ එවැනි ආශ්‍රය (Reference) කාර්යයන්, පුස්තකාලයාධිපතිත්වය පත් විය හැකි උසස්ම තත්ත්වය ලෙස, සැලකිය හැක. පුස්තකාල වෘත්තිය ආශ්‍රය කාර්යයන්හි නිරත වී ඇත්තේ නාමාවලී සැකසුමට වඩා අඩුකාලයක් තුළය. සමහර විට ඒ කාලය අවුරුදු සියයකට වඩා නැත. එහෙත් එහි වැදගත්කම අවසානයේදී පිළි ගනු ලැබී ය.

කෙසේ හෝ වේවා, පුස්තකාලයාධිපති විසින් පාවිච්චි කළ යුතු ලෙස ඔර්ටේගා. වයි. ගැසට් විශ්වාසකරන අවශේෂ බල පෑම් වර්ගය ගැන කතා කරන විට, ඔහුගේ මතය ඉතාමත් නිර්භය හා විප්ලවකාරී ලෙස පෙනේ. 'පොත් විශාල සංඛ්‍යාවක් තිබෙනවා පමණක් නොව ඒවා දිනපතා වැහි වහින්නාක් මෙන් වැඩි වේ. සමහර ඒවා වැදගැම්මකට නැති මෝඩ තකතීරු පොත් ය. එමෙන්ම පැවැත්ම හා සංරක්ෂණය

දැනටමත් අතිකුත් බරවලට යට වී සිටින ලෝකයාට තවත් අනවශ්‍ය බරකි. ඒ සමහර විෂයයන්හි පරයේෂණ ප්‍රමාද කරන' ඇතැම් පොත් නොමැතිකම ගැන කෙනෙක් කනගාටුවට ද පත්වෙති. සිතා මතා ගැනීමට යමකු පොළඹවන හිස් ප්‍රකාශවලට වඩා මේ කරුණ වැඩියෙන් බරපතල ය. පූර්ව පර්යේෂණ කටයුතුවල හිස්තැන් දක්නට ලැබෙන බැවින්, විවිධ විෂයයන්හි වැදගත් විසඳුම් කිසිදක පරිපතයට නොපැමිණීම ගණන් බැලිය නොහැකි තරම් ය. පොත්වල අධිකත්වයත්, පොත නැතිකමත් යන දෙකෙහිම සම්භවය එක් තැනක ය. නිෂ්පාදනය කරනු ලබන්නේ කිසි පිළිවෙළක් නොමැති ව ය. එය ඉබේම සිදු වීමට සම්පූර්ණයෙන් ඉඩ හැර ඇත.''

''අනවශ්‍ය පොත පත නිපදවීම නතර කිරීම ද, අනෙක් අතට හැම යුගයක ම තිබෙන සංකීර්ණ වැදගත් ගැටලු විසඳීම සඳහා ඇති අවශ්‍යතාවන් ගේ ඌනතාවක් ඇති වීම වළක්වා ලීමට පරිස්සම් වීමද, නුදුරු අනාගතයේදී ම පොත් නිෂ්පාදනය පාලනය කිරීම සඳහා සමාජය විසින් පුස්තකාලයාධිපති ගේ වගකීමට පත් කරන යුගයක් පැමිණේ යයි සිතීම සිතෙහි මවාගත් දෙයක් පමණ ද? මිනිසුන්ගේ සියලු කටයුතු ආරම්භ වන්නේ ඉබේ ම සහ ක්‍රමවත් නො වන පරිශ්‍රමයන් ලෙස ය. එහෙත් තමන් ගේ දියුණු කිරීම් සහ ව්‍යාප්ත කිරීම් නිසා කටයුතු අවුල් කර ගෙන එකිනෙකා සමඟ ගැටෙන විට සංවිධානාත්මක වීමට ඔහු කැමති වෙයි. පොත් නිෂ්පාදන-යෙහි ද සාමූහික සංවිධානයට පැමිණිය යුතු කාලය පැමිණ තිබේ යයි මට සිතේ. පොතට ද මේ සංවිධානය ජීවිතයත් මරණයත් අතර ප්‍රශ්නයකි.''

එවැනි පාලනයක් නිදහසට පහරක් වේය යන චෝදනාවට විරුද්ධ ව පුස්තකාලයාධිපති නියාමකයකු හෝ සමීක්ෂකයකු වශයෙන් ක්‍රියා කළ යුතු බවට තමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ආරක්ෂා කිරීමට ඔර්ටෙගා වයි ගැසට් යුහුසුලු වෙයි. කෙනෙකුට ඔහු ගේ තර්කය අගය කිරීමට හැකි වුව ද පුස්තකාලයාධිපතිවරයකු සමීක්ෂකයකුගේ කාර්ය භාර ගැනීමට පැකිළෙන්නේ පිටතින් පැමිණෙන වඩා වටිනාකමක් නැති සමීක්ෂණ කාර්යයන් කිරීමට ප්‍රතික්ෂෙප කිරීම ඔහුට නිතර ම

කරන්නට සිදු වන බැවිනි. සමීක්ෂණය සිය කැමැත්තෙන් කරනු ලැබුව ද පිටතින් බල කරනු ලැබුව ද පුස්තකාලයාධිපතීන් වැඩි කොටසකට එය පිළිකුල්ය. එය එසේ ම විය යුතු ය.

මැකාර්ති වාදයේ අනර්ථකාරී බල පෑම යටතේ, විප්ලවකාරී සාහිත්‍යය යයි සැක කරනු ලබන පොත් පුස්තකාලවල තබා ගැනීමට විරුද්ධ ව බලවත් ව්‍යාපාරයක්, 1950 ගණන්වල එක්සත් ජනපදයේ පැවතුණ අන්දම එවර් ටී. මුවර් සිහි කර තිබේ. එවැනි පොත් හිංසාකාරී සාහිත්‍යය වශයෙන් නම් කිරීමට හෝ ඒවා මුළුමනින් ම පුස්තකාලවලින් තහනම් කිරීමට හෝ පුච්චා දැමීමට හෝ පුස්තකාලයාධිපතිවරුනට බල කරන ලදි. මුවර් පහත දැක්වෙන නිදර්ශනය ගෙන හැර දක්වයි. 1953 මැයි මාසයේ දී ටෙක්සාස්හි ශාන්ත අන්තෝනියාවේදී, ශාන්ත අන්තෝනියාවේ කාන්තා සංවිධානය විසින්, කොමියුනිස්ට් අනුගාමිකයන් යයි කියනු ලබන කතුවරුන් ගේ පොත් 600 ක නම් ලැයිස්තුවක් නගර සභාවට ඉදිරිපත් කරන ලදි. කතුවරයා කොමියුනිස්ට් සම්බන්ධකම් ඇති කෙනකු වන බව පෙන්වීම පිණිස උපුටා දක්වන ලද පාඨ සංඛ්‍යාව සඳහන් කර, මේ පොත්වල කවරයේ පිට පැත්තේ එක වරට ම පෙනෙන සේ, විශාල රතු මුද්‍රාවක් තැබිය යුතු යයි නිර්දේශයක් ද ඒ සමඟ විය. මේ ලැයිස්තුවට ඇතුළත් වූ පොත් අතර අයින්ස්ටයින් ගේ Theory of relativity ග්‍රන්ථය ද, තෝමස් මැන් ගේ Magic Mountain හා Joseph in Egypt යන පොත් ද, නෝබර්ට් වයිනර් ගේ Cybernetics ග්‍රන්ථය ද විය. ඒ අතර කලාවන් පිළිබඳ ව විවිධ පොත් ද ජන කවි සංග්‍රහයන් ද මානසික රෝගීන් පිළිබඳ පොත් ද දරකාරක්ෂක කටයුතු හා මත්පැනට ඇබ්බැහි වූවන් පිළිබඳ පොත් ද ගුප්ත නවකතා ද තිබිණි.

මෙය එක ම සිද්ධියක් ද නො වේ. එම අවුරුද්දේ ම රටේ කණ්ඩායම් සියකට වඩා, පුස්තකාලවල පොත් තෝරා ගැනීමේ නිදහසට හා පුස්තකාලවලට ඇතුළුවීමේ නිදහසට බලපෑම් කළ බව, ඇමරිකානු පුස්තකාල සංගමයේ නිදහස් බුද්ධිමය නිදහස පිළිබඳ කමිටුවේ සභාපති වූ විලියම් ඇස්. ඩික්ස් වාර්තා කළේය.

1951 ජුලි මාසයේ කරන ලද 'වර්ග කිරීම පිළිබඳ ප්‍රකාශය' ඇමරිකානු පුස්තකාල සංගමය විසින් ඒකමතිකව පිළිගෙන තිබෙන බැවින්, පුස්තකාලවල පොත් මේ අන්දමට වර්ග කිරීමට සංගමය විරුද්ධ බව ඒ වන විටත් වාර්තා ගත වී තිබිණි. 1953 මැයි මාසයේදී සංගමයේ නායකයෝ 'ඇමරිකානු පොත් ප්‍රකාශක මණ්ඩලය' හා සමඟ 'කියවීමට නිදහස' යනුවෙන් ප්‍රකාශයක් නිකුත් කළ හ. 'නිව්යෝර්ක් ටයිම්ස්' පුවත් පත විසින් අප්‍රමාද ව පහත දැක්වෙන ප්‍රකාශය කිරීමට හේතු වූයේ එයයි. "තමන් විසින් කතා කළ යුතු හෝ මුද්‍රණය කළ යුතු හෝ කියවිය යුතු හෝ තමන් වටහා ගත් අන්දමට සිතිය යුතු දෙය කෙරෙහි, ක්‍රමයෙන් පැමිණෙන තහනම් කිරීමේ තර්ජනය මේ රටේ මිනිසුන් ඕනෑවටත් වඩා වැඩි කාලයක් ඉවසා තිබේ. අප විසින් මේ විචාරණය නො පිළි ගතහොත් අප යම්කිසි අන්දමක පීඩනයකට අසු වෙතියි යන තර්කය මත ආඥාදායක ක්‍රම වලට විරුද්ධ ව සටන් කිරීමේ මුවාවෙන් ආඥාදායක වාදයේ ම ප්‍රධාන විධියක් උපයෝගී කර ගැනීමට අපට බල කර තිබේ. බලය ලබා ගැනීමට ඇති මහත් ආශාව නිසා පටු අදහස් ඇති සුළු මිනිසුන් අපට අණ දීමට තැත් කර ඇත. අප බොහෝ දෙනකුට, නිසැකව ම පුස්තකාල සංගමයේ ලේඛන සකස් කළ අයට, සහ ඒවා අනුමත කිරීමට ඡන්දය දුන් අයට මේ තහනම්, ඇමරිකානු නිදහසේ ඉතා මත් උතුම් සම්ප්‍රදායයන්වලට නිග්‍රහයකි..........."

කෙසේ හෝ වේවා ප්‍රකාශයන් ගේ ආධාරය ඇතිව වුව ද තමා ගේ බලයෙන් ම මැකාර්ති ට විරුද්ධ ව නැගී සිටීමට පුස්තකාල වෘත්තියට හැකිව තිබුණාදැයි සැක සහිත ය. වාසනාවකට මෙන් ජනාධිපති ඩ්වයිට් ඩී. අයිසන්හවර් ම මැදිහත් වී සෙනේට් සභික මැකාර්ති ගේ ප්‍රතිපත්ති පහත දැක්වෙන අන්දමට පැහැදිලි ලෙස ම හෙළා දැක ඔහුගේ අදහස් ව්‍යර්ථ කළේය. 'පොත් ගිනි තියන්නට එකතු නොවන්න, යම් යම් වැරදි තිබුණ බවට ඇති සාක්ෂි යටපත් කිරීමෙන් ඔබ කරන්නේ වැරදි යටපත් කිරීම බව ඔබ සිතන්නේ නැද්ද?

ශිෂ්ටත්වය ගැන ඔබේ ම මතවලට හානියක් නොවනතාක් පුස්තකාලයට ඇතුළු වී හැම පොතක් ම කියවීමට භය නොවන්න. පොත් පිළිබඳ එක ම තහනම එය විය යුතුයි.'

මෙය ජනාධිපතිතුමා විසින් ඩාර්ට්මන් විද්‍යාලයයේ පැවැත්වුණු සම්මාන උපාධි ප්‍රදානෝත්සව උලෙළක දී අහම්බෙන් දෙන ලද පිළිතුරක් පමණි. එහෙත් එය ප්‍රමාණවත් විය. ''ශිෂ්ටත්වය ගැන ඔබේ ම මතවලට හානියක් සිදු නො වන තාක්, පුස්තකාලයට ඇතුළු වී හැම පොතක් ම කියවන්නට භය නොවන්න'' යන ඔහුගේ ම වචනවලින් ඔහු පොත් තහනමට, නියම ආකල්පය සංක්ෂේපයන් ප්‍රකාශ කර ඇත. පාඨකයා විසින් කියවිය යුත්තේ කුමක් ද?, නො කියවිය යුත්තේ කුමක්ද යන්නෙහි වගකීම ඒ ඒ පුද්ගලයා වෙත ම නිතර ම රැඳිය යුතු ය. පුස්තකාලයාධිපති මෙ තැන දී ක්‍රියා කරන්නේ සම්පූර්ණයෙන් ම කෘත්‍ය සාධකතා ආකාරයකට ය. ඔහු ගේ අය වැය ලේඛනය කෙරෙහි එල්ල වන නොවැළැක්විය හැකි සීමා කිරීම් ඇතුළත, හැකි තරම් පුළුල් හා ඉතාමත් සමබර පොත් තෝරා ගැනීම කළ යුතු ය.

'පුස්තකාලය සහ පාසල් විසින් පොත් තහනමට විරෝධය පාන්නේ කෙසේද? 1962 පෙබරවාරි 01 වන දින කවුන්සිලය විසින් අනුමත කරනු ලැබූ, බුද්ධියේ නිදහස පිළිබඳ කමිටුව මගින් නිකුත් කරන ලද ප්‍රකාශය' නමින් ඇමරිකන් පුස්තකාල සංගමය මගින් පළ කරන ලද තවත් ලේඛනයක මේ තේමාව දක්නට තිබේ. පොත් තෝරා ගැනීම පිළිබඳ සිය ප්‍රතිපත්තිය ලිඛිත ප්‍රකාශයක් හැම පුස්තකාලයක් මගින්ම පිළියෙළ කිරීම, මේ පිළිබඳ එල්ල වන චෝදනා ගැන ක්‍රියා කිරීමට පැහැදිලි ක්‍රමයක් ඇති කිරීම සහ ප්‍රජා ආගමික අධ්‍යාපනික හා දේශපාලන මණ්ඩල සමග සම්බන්ධකම් ඇති කර ගැනීමේ යහපත් මාර්ග දියුණු කිරීම වැනි ප්‍රායෝගික යෝජනා මාලාවක් මේ ලේඛනයට ඇතුළත් වේ. වඩා ම ගැටලු සහිත කරුණ වුව ද සමීක්ෂකයන් වීමට බලාපොරොත්තුවන්නන් ගේ පහරවලට ලක් වූ පුස්තකාලයාධිපතීන්ට දෙන ලද පහත දැක්වෙන උපදේශය එහි ඇත. එනම්' එක් තනි පොතකට වඩා කියවීමට ඇති

නිදහස පිළිබඳ ප්‍රතිපත්ති ද, ගුරුවරුන් ගේ හා පුස්තකාලයාධිපති ගේ වෘත්තීය වගකීම ද ආරක්ෂා කරන්න' යන්නයි. මෙහි වැදගත්ම වචනය 'වෘත්තීය වගකීම' වේ. පුස්තකාලයාධිපති තමාගේ ම ස්වාමියා විය යුතුය, තමා තමා ම විය යුතුයි. තමා කැමති ඕනෑ ම දෙයක් පුස්තකාලයෙන් සොයා කියවීමට පෞද්ගලික පාඨකයාට හැකි වන පරිදි තහනම් කිරීම සඳහා ඇති සියලු බලවේගවලට විරෝධය පෑ යුතු ය.

දේශපාලන පොත් තහනමකට වඩා වැදගත් කමෙන් අඩු වුව ද, එයට ම ආවේණික අන්දමින් ඉතාමත් කරදරකාරී තවත් දෙයක් වන්නේ අසභ්‍ය පොත පත ගැන දැනට ඇති ආන්දෝලනයයි. ලිංගික සදාචාරය සම්බන්ධයෙන් පිළිගත හැක්කේ කුමක්ද පිළිගත නොහැක්කේ කුමක්ද යන්න පිළිබඳ ව හැම යුගයකට ම විශේෂ වූ සම්මත හෝ ප්‍රමිති තිබෙන අතර, හැම යුගයක දී ම පොත් තේරීම සම්බන්ධයෙන් ද පොත් කියවීමට ලබා ගැනීමේ නිදහස සම්බන්ධයෙන් ද පුස්තකාලයාධිපති බල කිරීම්වලට ලක් වේ.

තමා ගේ ප්‍රසිද්ධ නො කළ ලිපියක බ්‍රයන් එල්. බවුම්පීල්ඩ් අසභ්‍යවාදයෙන් ඉදිරිපත් වී ඇති ප්‍රශ්න විභාග කර බලයි. සෑහෙන තරම් භාවිතයට ගැනෙන පොතක් වශයෙන් කිවහැකි ඕනෑම පොතක් පුස්තකාලයාධිපති විසින් ප්‍රතික්ෂෙප කරනවාට වඩා අත්පත් කර ගන්නා බව කියැවෙන පොදු සත්‍යය පෙන්වා දීමෙන් ඔහු ලිපිය ආරම්භ කරයි. අසභ්‍ය සාහිත්‍යයට පැමිණි විට හෙතෙම අනතුරු කිහිපයකට මුහුණ දෙයි. වරිපනම් ගෙවන්නන් ගේ වියදමින් අසභ්‍ය පොත පත සපයනවා යනුවෙන් පළාත් පාලන සභාව ඔහුට චෝදනා කරනු ඇත. දුශ්චරිතයට පමුණුවා දූෂ්‍ය කරන පොත් පුස්තකාලයට අත් පත් කර ගන්නේ යයි ඔවුන් සිතුවොත්, යම් අන්දමක සූපරීක්ෂාකාරී කමිටුවක් ඔවුන් පත් කරනු ඇත. පොත් ගැනීම සඳහා ඔහුට දී ඇති මුදල් ප්‍රමාණය කපා අඩු කිරීමෙන් පළි ගැනීමට ද පුළුවන.

අවාසනාවකට මෙන් 1959 'අසභ්‍ය ප්‍රකාශන පනත' පදනම් වී ඇත්තේ අර්ථ නිරූපනය කිරීමට නොහැකි හෝ දුෂ්කර වූ 'දුශ්චරිතයට පමුණුවා දූෂ්‍ය කරන' (tend to deprave or corrupt) සංකල්පය මත බැවින් නීතිය පුස්තකාලයාධිපතිට කිසි පිහිටක් නොවේ. එමෙන්ම වර්තමාන රසඥතාව ඉක්මනින් වෙනස් වන්නක් බැවින් ඔහුට වුවමනා වුවත් එය විනිශ්චය කිරීම පිණිස යොද ගත නොහැක. බ්‍රවුම්ෆීල්ඩ් දක්වා ඇති අන්දමට Lady Chatterley's lover යන පොත සම්බන්ධයෙන් මහත් ආන්දෝලනයක් පැවතියේ 1960 දීය. එහෙත් මේ පොත මහජන පුස්තකාලයක රාක්කවල අද තිබුණොත් එයින් චංචලයක් ඇති වන්නේ ඉතා ස්වල්ප වශයෙනි. නියම වශයෙන් අසභ්‍ය නොවන එහෙත් තර්කානුකූලව ඒ අන්දමේ ම කෝපයක් ඇති කළ යුතු නමුත් එසේ නොකරන පොත් ගැන සලකා බැලීමෙන් අසභ්‍ය පොත පත ගැන ඉතා සීමාකාරී මත අනුගමනය කිරීමේ මෝඩකම තවත් අවධාරණය වේ. නිදර්ශනයක් වශයෙන් වද හිංසා දීමේ ඉතිහාසය පිළිබඳ චිත්‍ර සහිත පොත් දැක්විය හැක.

අසංතුලිත හා අපරිණත පුද්ගලයන් කෙරෙහි අශ්ලීලත්වය කළ හැකි අන්තරායකාරී බලපෑම්වලට විවාදය සීමා කිරීම ප්‍රස්තුත කරුණෙන් සිත ඉවත් කරන්නකි. කෙසේ හෝ අන් කිසිවකුට වඩා අසංතුලිත අය අනතුරට පාත්‍ර වෙති යි සාක්ෂියක් නොමැත. ළමයින් සම්බන්ධයෙන් නම් බොහෝ පුස්තකාලයාධිපතිවරු සැක සහිත පොත්වලට ප්‍රවේශය දුෂ්කර, වැසූ අල්මාරිවල ඒ පොත් තබන්නේ, ප්‍රධාන වශයෙන් ඒවා ළමයින්ට පහසුවෙන් ලබා ගැනීමට නොහැකිවන ලෙස ම නොව, ඒවා විවෘත රාක්කාවල තැබුවොත් නිසැකව ම සොරකම් කරනු ලබන බැවිනි.

"ලෝකයේ පොත් තහනම් කිරීම පිළිබඳ දීර්ඝ ඉතිහාසයක්" තිබිණි. "සියලු මති මතාන්තර නියෝජනය විය යුතු බවට මහජන පුස්තකාලවල සම්ප්‍රදයක් තිබේ." යයි කියමින් බවුම්ෆීල්ඩ් මේ පිළිබඳ තමාගේ අදහස් පළ කිරීම අවසන් කරයි. පොතක් සෙමිටික් නොහොත් යුදෙව්

විරෝධී ද, පැසිස්ට්වාදී ද කතෝලික විරෝධී ද, නැත්නම් සම්පූර්ණයෙන් ජාති වාදී ද, එසේත් නැත්නම් අසභ්‍ය ද යන්න මේ සම්ප්‍රදයට වැදගත් නොවේ.

ඇත්ත වශයෙන් ම ඇමරිකානු පුස්තකාල සංගම් ලේඛනයේ භාවිත කරනු ලැබූ 'වෘත්තීයමය වගකීම' නැමැති පාඨයට මේ විවාදය නැවතත් යා යුතු ය. පුස්තකාලයාධිපති-වරයකුගේ පොත් තෝරන ප්‍රතිපත්තිය වෘත්තීය විනිශ්චයට අයත් දෙයකි. එය පදනම් වී ඇත්තේ පොත් ගැන දැනුමක් හා පාඨකයන් ගැන දැනුමක් මත ය. එය කෙරෙහි එක ම සීමා කිරීම පුස්තකාලයේ මුදල් තත්ත්වය වේ. සදාචාර අර්ථය පසෙක තිබියදී ග්‍රන්ථ විද්‍යාත්මක අංශයෙන් අර්ථ රහිත බැවින්, අසභ්‍ය නොහොත් අශ්ශීල පොත්වලින් පුස්තකාල පිරී ඉතිරී යෑම ගැන ප්‍රශ්නයක් නැත. සංඛ්‍යා වශයෙන් ගතහොත් සමනලයන් එකතු කිරීම සම්බන්ධ පොත්වලට වඩා වැඩියෙනුත්, ගෙවතු වගාව පිළිබඳ පොත්වලට වඩා අඩුවෙනුත් අශ්ශීල පොත පත තබා ගැනීමට පුස්තකාලයාධිපති තීරණය කරනවා වීමට පිළිවන.

'පුස්තකාල සහ පාසල් විසින් පොත් තහනමට විරෝධය පාන්නේ කෙසේද?' යන ඇමරිකානු පුස්තකාල සංගමයේ ලේඛනය අවසන් කිරීමක් වශයෙන් ඒ සංගමය මගින් නිකුත් කරන ලද පොත් තහනම පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශන මාලාවක් ඇත. 'කියවීමේ නිදහස' නමැති ප්‍රකාශයත් 'ලේබල් ගැසීම' පිළිබඳ ප්‍රකාශයත් හැරෙන්න 'පුස්තකාල පිළිබඳ අයිතිවාසිකම් පනත' (1948 සහ 1961 සංශෝධිත) 'පාසල් පුස්තකාල පිළිබඳ අයිතිවාසිකම් පනත' (1955) සහ 'පාසල් පුස්තකාල ද්‍රව්‍ය තෝරා ගැනීම සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියා පරිපාටි' (1961), ද ඇත. ඊට අමතරව ඇමරිකන් පුස්තකාල සංගමය, 'පුස්තකාලයාධිපතින් 26,000 කට අධික ජාතික සංවිධානයකි' යනුවෙන් සටහනක් ද විය. පුස්තකාලයාධිපතිවරුන් ගේ වෘත්තීය සංගම් මගින් නියම වශයෙන් යොදන බලපෑම් ප්‍රමාණය පිළිබඳ ප්‍රශ්නයක් මෙයින් පැන නගියි.

සාමාජිකත්වය 20,000 ට අධික බ්‍රිතාන්‍ය පුස්තකාල සංගමය, එලෙස ම බොහෝ ප්‍රතිපත්ති ප්‍රකාශන නිකුත් කර ඇත. 1942 සිට 1972 දක්වා සංගමය විසින් නිකුත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශන, සේවය පිළිබඳ තත්වයක් හා සාක්ෂි සංදේශ සම්බන්ධයෙන් මෑතදී සකස් කරන ලද ග්‍රන්ථ නාමාවලියක ලේඛන 150 කට වඩා ලැයිස්තු ගත කර තිබේ. මේ ලැයිස්තුව විග්‍රහ කිරීමේදී එහි අඩංගු කරුණු ප්‍රධාන කොටස් හතරකට බෙදෙන බව හෙළි වේ.

පළමු වැනි කොටස අදාළ වන්නේ වෘත්තීය සංවිධානයේ හුදු ශිල්පීය කරුණුවලට ය. නිදර්ශන වනුයේ 'ග්‍රැම්පෝන් තැටි පුස්තකාල' (1949), 'අධිලේඛනාගාර පරිපාලනය සම්බන්ධ සංදේශය' (1950), 'වර්තමානයේ පාසල් පුස්තකාල' (1950)' 'තරුණඅය සහ පාසල් පුස්තකාල අතර කාර්යයන්' (1951), 'ආරෝග්‍ය ශාලාවල වෛද්‍ය පුස්තකාල' (1966) යන ප්‍රකාශනයි. මෙවැනි වෘත්තීය මාර්ගෝපදේශ අවශ්‍ය ය. ප්‍රයෝජනවත් ය. ඒවා පුස්තකාල සංගමයේ කාර්ය භාරයේ වැදගත් අංශයක් නියෝජනය කරයි.

දෙ වැනි කොටස අදාළ වන්නේ නොයෙක් වර්ගයේ පුස්තකාලවල කාර්ය මණ්ඩලයෙහි, ඉඩ කඩෙහි, උපකරණවල හා පොත්වලට මුදල් ප්‍රතිපාදනයෙහි, ප්‍රමිතීන් පිහිටුවා ලීමටයි. 'තාක්ෂණික විද්‍යාලවල පුස්තකාල සේවය සඳහා ප්‍රමිති' (1957), 'කවුන්සිල් ශාඛා පුස්තකාල වාර්තා සහ නිර්දේශ කරඇති ප්‍රමිතීන්'(1958), 'උසස් තාක්ෂණික විද්‍යාලවල පුස්තකාල සැපයීම ගැන නිර්දේශ කරන ලද ප්‍රමිතීන්' (1963) 'නව බහුතාක්ෂණික විද්‍යාලවල පුස්තකාල' (1968), නිදර්ශන වේ. මේ කොටසේ ඇත්තේ විශේෂඥයන් ගේ මඟ පෙන්වා දීම අනුව පුස්තකාල සංගමයේ බලපෑම යෙදවීමයි. මේ නිර්දේශිත සම්මත අනිකුත් මණ්ඩල හා ආයතන විසින් මුළුමනින් ම පිළි ගැනීම නො කෙරුණත් අරමුණු කර ගත යුත්තේ කුමන ප්‍රමිතීන් ද යන්න දැක්වීමේ යහපත් ප්‍රතිඵලය ඒ මගින් ඒවාට ලැබේ. ඒ සමඟ ම තමා ගේ ආයතනයට තමාට අවශ්‍ය දේ පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට තනි පුස්තකාලයාධිපතිවරයකුට හේතු ද සපයයි.

තුන් වැනි කොටස අදාළ වන්නේ පුස්තකාලයාධිපතිවරුන්ගේ වේතන හා සේවා තත්ත්වයන් ගැන ය. 'ප්‍රධාන පුස්තකාලයාධිපතිවරුන් ගේ වේතන' (1945), 'මහජන පුස්තකාල කාර්ය මණ්ඩලයේ වේතන හා ශ්‍රේණි ගත කිරීම' (1946), 'විශ්ව විද්‍යාල හා විද්‍යාල පුස්තකාල කාර්ය මණ්ඩල වේතන හා ශ්‍රේණි ගත කිරීම' (1946), 'විශ්ව විද්‍යාල පුස්තකාලවල උපාධිධාරී නොවන කාර්ය මණ්ඩල' (1953), 'මහජන පුස්තකාල කාර්ය මණ්ඩලයේ ශුභ සාධනය හා වැඩ කරන තත්ත්වයන් පිළිබඳ නිර්දේශ' (1953), යන ප්‍රකාශන නිදර්ශන වේ. මෙහිදී සංගමය ක්‍රියා කරන්නේ වෘත්තීය සංගමයක ආකාරයෙනි. සමහර විට ඉතා ඵලදායක ලෙස ක්‍රියා කරයි. විශ්ව විද්‍යාල වැනි සේවා යෝජක ආයතන, වෘත්තීයමය සංගම් සහ වෘත්තීය සංගම් විසින් නිර්දේශ කර ඇති වේතන හා ශ්‍රේණි අනුව කටයුතු කිරීමට එකඟවීම සත්‍යයකි.

පුස්තකාලයාධිපතිවරුන් සංගමයක් වශයෙන් එක්සත් වීමට නිර්දේශ කළ එන්සල් ගේ සමීක්ෂණයේ මතය යහපත් උපදේශයක් වශයෙන් එෆ්. ඩී. ඕ. ෆිල්ඩින් ප්‍රකාශ කර ඇත. සමීක්ෂණය විසින් නිර්දේශය කරන ලද්දේ පහත දැක්වෙන අන්දමට ය. "වෘත්තීය කටයුතුවලදී තමන් නියෝජනය වන පිණිස සංගමයක් හෝ සංගම් පිහිටුවීමේ අරමුණු ඇති ව පුස්තකාලයාධිපතිවරු ඉදිරියට යා යුතු ය. තෘතීය අධ්‍යාපන ආයතන, රජය සහ රජයට අයත් විවිධ ප්‍රදේශයන්හි දෙපාර්තමේන්තු ආදිය එක පැත්තකින් ද, පළාත් පාලන ආණ්ඩුවල පුස්තකාලයාධිපතිවරුන්ට අනෙක් පැත්තෙන් ද, වෙනම සංගම් සුදුසු විය හැක. මේ මූලික අදහස යමකුට පිළිගත හැකි ය. එහෙත් එයට ව්‍යාතිරේක සහ එකතු කිරීම් ගණනාවක් සහිතව ය. බ්‍රිතාන්‍යයේ දැන් පවත්නා තත්ත්වය අනුව පුස්තකාලයාධිපතිවරුන් උදෙසා සංගම් එකකට වඩා තිබීම ඇත්ත වශයෙන් ම ඥානවන්ත ය. දැනට පවත්නා අන්දමට එක පැත්තකින් ශාස්ත්‍රීය ජාතික පුස්තකාලයාධිපතිවරුන් වශයෙන් ද අනෙක් පැත්තෙන් පළාත් පාලන ආණ්ඩු පුස්තකාලයාධිපතිවරුන් වශයෙන් ද බෙදීම, පෙනෙන

අන්දමට නිවැරදි ය. කෙසේ හෝ වේවා එක්සත් රාජධානියේ ශාස්ත්‍රීය පුස්තකාලයාධිපතිවරුන් විශ්ව විද්‍යාල ගුරුවරුන් හා එක්සත් වීමට කළ තීරණය යහපත් ය. මෙහි ප්‍රතිඵලය වූයේ බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාල පුස්තකාල වෘත්තිය කාර්ය මණ්ඩල, විශ්ව විද්‍යාල ගුරුවරුන් වූ සිය ශාස්ත්‍රීය සගයන් හා සමඟ එකට වෘත්තීය සංගම්වලට බැඳීමේ පටන්, වේතන හා සේවා තත්ත්වයන්ගෙන් පුදුමාකාර ලෙස දියුණු වීමයි. සිය ගුරුවර සගයන්ගේ උපකාරය තිබෙන බැවින් අධ්‍යාපන ආයතනවල සිටින පුස්තකාලයාධිපතිවරුන්ට මෙම පොදු සංගමයට බැඳෙන ලෙස උපදෙස් දීම මෙහි නොවැළැක්විය හැකි තීරණ ය යි. තර්කානුකූල ව මේ ප්‍රායෝගික යෝජනාව මේ පොතේ ප්‍රධාන තේමාව මත දැඩි ලෙස පදනම් වී ඇත. එනම්, පුස්තකාලයාධිපති උගත් පුද්ගලයෙකි. උසස් ගණයට අයත් කෙනෙකි. ඔහු කාර්මිකයෙක්වත් ලිපිකාර නිලධාරියෙක්වත් නොවේ. පුස්තකාලයාධිපතිවරයෙක් සංගම් කටයුතුවල දී මෙන් ම අනෙක් සියලු කටයුතුවලදී ද තමා හා සමාන පුද්ගල කණ්ඩායමට නියම ලෙස අයත් වේ.

මේ ආකාරයට පළාත් පාලන නිලධාරීන් විසින් සේවයෙහි යොදවා ඇති පුස්තකාලයාධිපතිවරුන් සාර්ථක ලෙස සංගමයක් වශයෙන් එක්වීමට සැලැස්වීම ඉතාමත් දුෂ්කර කාර්යයක් වී ඇත. බ්‍රිතාන්‍යයේ ඔවුන් පළාත් පාලන නිලධාරීන් ගේ ජාතික සංගමයට අයිති වීමට කැමැත්තක් දක්වා තිබේ. කම්කරු නොවන පළාත් පාලන කාර්ය මණ්ඩලයේ ඕනෑ එපාකම් ගැන සලකන සංගමය එයයි. ඔවුන් සංඛ්‍යා අතින් ශක්තිමත් සංගමයකට බැඳී සිටින බැවින් එක පැත්තකින් එය යහපත් කරුණකි. අනෙක් පැත්තෙන් එය ඉතාමත් නරක පිළිවෙළකි. මෙහි ගැටලුව ඇත්තේ පළාත් පාලන නිලධාරීන් ගේ ජාතික සංගමය ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ එහි වැඩි සංඛ්‍යාව වන ලිපිකාරවරුන් ගැන බැවිනි. අනෙක් අතට මේ නිසා පුස්තකාලයාධිපතිවරු ද ලිපිකාර නිලධාරීන් වශයෙන් සලකනු ලැබෙති. මෙය පුස්තකාලයාධිපතිවරයකුගේ නියම දර්ශනයට පරස්පර විරෝධ වන බැවින් එවැනි සම්බන්ධකමකින් කිසි යහපතක් බලාපොරොත්තු විය නො හැක.

කෙසේ හෝ වේවා වෘත්තීය සමිති සමාගම් ගැන නැවත කතා කරනවා නම් ඒවා වෘත්තීය සංගම් වශයෙන් සැලකිය නො හැකි බව අවධාරණය කළ යුතු ය. පුස්තකාල සංගමය වේතන හෝ සේවා තත්ත්වය හෝ ගැන කතා කරන සංගමයක් ලෙස සේවා දයකයන් හෝ වෘත්තීය සංගම් සම්මේලනය හෝ පිළිගෙන නැත. කෙසේ හෝ වේවා පුස්තකාල සංගමයට කළ හැකි හා කරන්නා වූ කාර්යය නම් සුදුසු සංගමයකට උපදෙස් දී ඒ හා එකමුතුව ක්‍රියා කිරීමයි. විශ්ව විද්‍යාල ද, පුස්තකාල සංගමයේ පර්යේෂණ අංශය ද, විශ්ව විද්‍යාල ගුරුවරුන් ගේ සංගමය ද එකිනෙකා සමඟ සහයෝගයෙන් දිගු කලක සිට කටයුතු කර ඇත.

හතර වැනි හා අවසාන කොටස ජාතික ප්‍රශ්න හා සම්බන්ධ වේ. 'ප්‍රකාශන අයිතිය පිළිබඳ ක්‍රියාකාරී මණ්ඩලයේ වාර්තාව' (1951), විද්‍යාව හා තාක්ෂණ විද්‍යාව සඳහා ජාතික බැහැර දෙන පුස්තාලය පිළිබඳ උපදේශක කාරක සභාවට භාර දෙන ලද සන්දේශය' (1959), 'රොබින්සන් සාමිවරයා ගේ සභාපතිත්වය යටතේ අගමැතිතුමා විසින් පත් කරන ලද උසස් අධ්‍යාපන කමිටුවට භාර දීම සඳහා උසස් අධ්‍යාපන ආයතනයන්හි පුස්තකාලයට ඇති තත්ත්වය පිළිබඳ සාක්ෂි සහිත සන්දේශය', (1961), 'ජාතික පුස්තකාල සේවය' (1968), 'මහජනයාට බැහැර දෙන අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියකාරී පක්ෂයේ වාර්තාව ගැන නිරීක්ෂණය' (1972) යන වාර්තා හා ප්‍රකාශන මෙම අංශයට නිදසුන් ලෙස දැක්විය හැක.

වෘත්තීය බලපෑම ඉතාමත් අඩුවෙන් ඇත්තේ ඉතාමත් වැදගත් මේ අංශයේ ය. බොහෝ අවස්ථාවලදී පුස්තකාල සංගමය සමඟ ප්‍රථමයෙන් සාකච්ඡා කිරීමක්වත් අදාළ ජාතික කමිටුවට සංගමයේ නියෝජිතයකු කැඳවීමට උත්සාහයක්වත් නො වීය. එ බැවින් එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදු වී ඇත්තේ වැදගත් කරුණුවලදී පුස්තකාල වෘත්තියට තව වැඩිපුර කරන්නට දෙයක් බාර දී නො තිබීමයි. අනෙක් අවස්ථාවලදී පුස්තකාල සංගමය විසින් ඉල්ලා හෝ නො ඉල්ලා සාක්ෂි ඔප්පු කොට හේතු තර්ක ඉදිරිපත් කළ කල්හි බොහෝ, විට සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් ඒවා ප්‍රතික්ෂේප කර

ඇත. වියසීම හා පිළි ගැනීම නොමැතිකම පිළිබඳ ඉතාමත් මැත, සිත් ඇද ගන්නා සුලු දර්ශනය වනුයේ මේ පොතේ දෙ වැනි පරිච්ඡේදයේ විස්තර කර ඇති බ්‍රිතාන්‍ය පුස්තකාලයේ ප්‍රධානියාගේ පත් කිරීමයි.

පුස්තකාලවලට අදාළ ජාතික තීරණවලට බලපෑමට පුස්තකාල සංගමය නිරන්තරයෙන් ම අපොහොසත් වීමට හේතුව සංගමයේ තර්ක නිසා හෝ ඒවා ඉදිරිපත් කරන ආකාරය නිසා හෝ නොවේ. අනාගත වර්ධනයන් සම්බන්ධයෙන් සෝදිසියෙන් සිටීමේ අඩුපාඩුවක් නිසා ද නොවේ. එයට හේතු වී ඇත්තේ සංගමයට නියම බලයක් නොමැති කම විය හැකිය. මෙතෙක් කල් දිගට ම තර්ක කළ පරිදි සංගමයට බලය නොමැත්තේ පුස්තකාලවලට ඇති නියම බලය පුස්තකාල සංගමය අගය නොකරන්නාක් මෙන් ම පුස්තකාලයාධිපතිත්වය ක්‍රියාත්මක කරන විට ඒ බලය පිළිබිඹු නොකරන බැවිනි.

පුස්තකාල සංගමයට වැදගත් ප්‍රභේදනයක් "ජාතික සහ විශ්ව විද්‍යාල පුස්තකාලවල ස්ථාවර සම්මේලනයෙන්" (standing conference of National and University Libraries") ලැබේ. එහි සාමාජිකත්වය සියයකට අඩු වුව ද (සාමාජිකත්වය අනිවාර්යයෙන් ම ප්‍රධාන පුස්තකාලයාධිපතිවරුන්ට හෝ ඔවුන් ගේ නියෝජිතයන්ට සීමා වී ඇත.) එය වඩා බලපෑම් කළ හැකි මාර්ගයක් බව ඔප්පු වී තිබේ. උගත්කම හා උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් පුස්තකාලවලට ඇති බලය පිළිබඳ ව විශ්ව විද්‍යාල හා ජාතික පුස්තකාලයාධිපතිවරුන්ට හොඳ අවබෝධයක් තිබේ. එ බැවින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කමිටුව ද, විශ්ව විද්‍යාල උප කුලපතිවරුන් හා විද්‍යාලාධිපතිවරුන් ගේ කමිටුව කෙරෙහි ද සැහෙන බලපෑමක් කිරීමට ඔවුනට හැකි වී තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශාස්ත්‍රීය පුස්තකාලවලට පොත් පත් සඳහා දුන් විශාල අරමුදල් ද, වඩා හොඳ ඉඩ කඩ ද, කවරදකටවත් වඩා ඉතා පුළුල් පහසුකම් ද තිබේ. අවශේෂ පුස්තකාලවල සාමාන්‍යයෙන් නොමැති තරමේ ගෞරවයක් මෙවැනි ප්‍රධාන පුස්තකාලයාධිපති හා කාර්ය මණ්ඩලයට ලැබේ.

එහෙත් ජාතික හා විශ්ව විද්‍යාල පුස්තකාල පිළිබඳ ස්ථාවර සම්මේලනයටවත්, පුස්තකාල සංගමයටවත් කිසිම සැලකිය යුතු තරමේ බලපෑමක් කිරීමට නොහැකි වූ ප්‍රධාන අංශයක් තිබේ. එය නම් පොත් වෙළෙඳ ව්‍යාපාරයයි.

පොත්පත් හා සඟරාවලට වර්ෂයකට පවුම් දශ ලක්ෂ ගණනක් වියදම් කරන වෘත්තියකට, ප්‍රකාශකයන් ගේ හා පොත් වෙළෙඳුන් ගේ සංගම් සමඟ නියම ලෙස සම්බන්ධකම් ඇති කර ගන්නා මාර්ග නොමැතිකම සහ ඔවුන් සමඟ නියමයන් හා කොන්දේසි සාකච්ඡා කර ගැනීමට නොහැකිකම පිට අයෙකුට එක්තරා තරමේ පුදුමයක් වනු ඇත. තෘතීය අධ්‍යාපනය සඳහා (Territorial Education) (එනම් ප්‍රධාන වශයෙන් උසස් අධ්‍යාපන ආයතනවලට) පොත් වෙළෙඳම වර්ෂයකට පවුම් දශ ලක්ෂ දහයක් පමණ යැයි ගෝර්ඩන් ග්‍රැහැම්ගේ ගණන් බැලීම අධ්‍යාපනය සම්බන්ධ පරිච්ඡේදයෙහි සඳහන්ව ඇත. මේ ගණන් බැලීමත් සමඟ ම 1972 මාර්තු 31 න් අවසන් වූ වර්ෂයේදී මහජන පුස්තකාල සඳහා පළාත් පාලන බලධාරීන් ගේ වියදම් පවුම් 16,585,646 වූ බව (පොත් සඳහා පවුම් 15,917,286 සඟරා සහ පුවත්පත් සඳහා පවුම් 668,360) නිල සංඛ්‍යා ලේඛනවලින් (මහනගර සභා භාණ්ඩාගාරිකයන් ගේ ආයතනයේ), ක්වුන්ට් භාණ්ඩාගාරිකයන් ගේ සමිතියේ පුස්තකාල සංඛ්‍යා ලේඛන 1971 – 72) කෙනකුට දැන ගත හැක. වර්ෂයකට එකතුව පවුම් දශ ලක්ෂ 26 කට වඩා වැඩි වන මේ සංඛ්‍යා දෙක පමණක් ගැනීමෙන්, පොත් පත් හා සඟරා වෙළෙඳ පොළ කෙතරම් දුරට පුස්තකාල මත රැඳී තිබෙනවාද යන්න ගැන හොඳ අවබෝධයක් දේ.

මෑත කාලයේ නිදර්ශන දෙකක් තිබිය දීත් බල සමතුලිතතාවය අනෙක් පැත්තට හැරී තිබුණාක් මෙන් පෙනිණි. පළමු වැන්න මහජනයාට බැහැර දීමේ අයිතිවාසිකමයි. (Public lending right) මෙය කතෘවරුන් ගේ මිලට වඩා වැඩිපුර මිලක් පුස්තකාල විසින් ගෙවිය යුතු බවත් එම වැඩි මිලෙන් එකතුවන මුදල පොතේ කතෘට දිය යුතු බවත් ය. එ වැනි අධිභාරයක් කතෘගේ සහ ප්‍රකාශක ගේ අභිමතය පරිදි නියම කරනු ලැබේ. කෙසේ හෝ වේවා වාම් සහ ලාභ

පරිපාලනයක් සඳහා තනි අධිහාරය වෙනුවට යම් සර්වව්‍යාපී බලපත්‍ර ක්‍රමයක් තිබිය යුතු යයි යෝජනා කරන ලදි. මෙයින් කෙරෙන්නේ කතෘවරුන් නියෝජනය කරන රැස් කිරීමේ සමිතියක් විසින් ගෙවීමක් සඳහා (සමහර විට පොත් අරමුදලෙන් සියයට විස්සක්) පුස්තකාලවලට වාර්ෂික බලපත් නිකුත් කිරීමයි. පසුව ඒ ඒ කතෘ ගේ පොත් පුස්තකාලවලට ගැනීමේ අනුපාතයට මේ මුදලින් කොටසක් ගෙවනු ලැබේ.

සියල්ලන්ට ලබා ගත හැකි නිදහස් පුස්තකාල ක්‍රමයේ දීර්ඝ සහ ගෞරවනීය සම්ප්‍රදය ගැන ආඩම්බරවන පුස්තකාල සංගමය, මේ යෝජනා ක්‍රමය ප්‍රතිපත්තියක් වශයෙන් සම්පූර්ණයෙන් හෙළා දැක්කේ ය. වැඩි දුරටත් මහජන බැහැර දීමේ අයිතිවාසිකමින් ඇත්ත වශයෙන් ම කතෘවරුන්ට ලාභයක් වේ යයි එය කල්පනා කළේ නැත. නිදර්ශනයක් වශයෙන් බලපත් ගැනීම සඳහා මුදල් ගෙවීමෙන් පසු පුස්තකාලවලට පොත් ගැනීමට මුදල් ඇත්තේ අඩුවෙන් නම්, නූතන කවියන්ට පාඩු වීදීමට සිදුවේ. සාපේක්ෂ වශයෙන් ඉතා අඩුවෙන් භාවිතා කරනු ලබන බව ඔවුන් දන්නා බොහෝ පොත් පත් මිල දී ගැනීමට ඔවුන්ට සිදුවේ. වඩා අඩු ප්‍රසිද්ධියක් ඇති කතෘවරුන් සහ ගැඹුරු විෂයයන් ගැන ලියන කතෘවරුන්, පොත් ප්‍රකාශනය අර්ථවත් කර ගැනීම සඳහා රඳා සිටින්නේ පුස්තකාල ඉල්ලුම මත ය. අනෙකුත් බොහෝ කරුණුවලින් ද පුස්තකාල විසින් කතෘවරුන් රකින බව හැඟී ගොස් තිබේ. මේ රටේ විකුණනු ලබන ඝන කවර සහිත පොත්වලින් සියයට 40 ක් හෝ 50 ක් පුස්තකාල මිල දී ගනියි. විද්වත් කතෘවරුන් සඳහා, ශාස්ත්‍රීය පුස්තකාල, පර්යේෂණාගාර වශයෙන් ක්‍රියා කරයි. කියවීමේ පුරුද්ද ඇති කිරීමට සියලු පුස්තකාල විශාල සේවයක් කරයි.

පුස්තකාල සංගමය විසින්, වචන රැසකින් ප්‍රකාශ නොකළද මේ යෝජනා ක්‍රමයෙන්, ප්‍රකාශනයන් ද (විශ්වකෝෂ වැනි වැඩවලදී මෙන්) කෙළින් ම පමණක් නොව (කතෘවරුන්ට ඔවුන් කරන ගෙවීම් වැඩි කිරීමට බලපෑම් කිරීම අඩු විය හැකි බැවින්) වක්‍ර වශයෙන් ද සැහෙන අන්දමේ අර්ථ ලාභීන් විය හැකි [illegible] අය අතර ද හැඟීමක් තිබිණි.

පුස්තකාල වෙළෙඳ ව්‍යාපාරය අතර වඩා කෙළින් ම හැප්පීමක් සිදු වූයේ තවත් වර්ගයක 'පුස්තකාල බලපත්' සම්බන්ධයෙනි. පොත් ප්‍රකාශකයන්ගේ සංගමය පොත් වෙළෙඳුන්ගේ සංගමය සහ පුස්තකාල සංගමය අතර පූර්ණ පොත් ගිවිසුම නමින් පළමුවෙන් 1929 දී සකස් කරන ලද ගිවිසුම අනුව, විවෘත කරන සාමාන්‍ය වේලාවන්හි, මහජනයා අයකිරීමක් නොමැති ව ඇතුළු කරන පුස්තකාල විසින් මිලට ගන්නා සියලුම අලුත් පොත්වල සිල්ලර මිලෙන් සියයට 16 ක වට්ටමක් ලැබීමට, පුස්තකාලය බලපත්‍රයක් ඉල්ලන්නේ නම්, ඉඩ දී තිබේ. එ තෙක් දුරට සාධාරණ වීම ප්‍රමාණවත් ය. එහෙත් පසුගිය අවුරුදු කිහිපය තුළ, විශේෂයෙන් විශ්ව විද්‍යාල පුස්තකාල පිළිබඳව, පුස්තකාල බලපත්‍රය දීම හෝ පවත්වා ගෙන යාම වෙනුවට පුස්තකාලයට ප්‍රවේශ වීම ගැන කොන්දේසි පැනවීමට ප්‍රකාශකයන් ගේ සංගමය තැත් කර තිබේ. මෑතකදී (තමාගේම ආයතනයේ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන්ට පාඩු සිදුවේ යයි ඔහු කල්පනා කළ බැවින්) නුදුරින් පිහිටි අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයන්ට සිය පුස්තකාලයේ පහසුකම් සැපයීම නොකළ හැකි බව විශ්ව විද්‍යාල පුස්තකාලයාධිපතිවරයකු තීරණය කළ නිසා ඔහු ගේ බලපත්‍රය දීම නතර කරනු ලැබීය. මෙය බලු වලිගය බල්ලාට පහර දීම වැනි ක්‍රියාවක් ලෙස ජාතික හා විශ්ව විද්‍යාල පුස්තකාලවල ස්ථාවර කමිටුව නියම ලෙස තීරණය කළේය.

පුස්තකාල විසින් පොත් වෙළෙඳ ව්‍යාපාරය ගැන කරන ලද, ඊටත් වඩා අන්තවාදී විවේචනයක් නම් නොපිළිගත හැකි ලෙස ලාභ ඉපයීම ගැනයි. විශ්ව විද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ චෝදනා කිරීම්වලට පසුව, එක් අවුරුද්දකදී සියයට 261 ක මිල වැඩි කිරීමක් ද ඇතුළු ව පොත් සහ සඟරාවල මිල අධික ලෙස වැඩි කිරීම ගැන පරීක්ෂණයක් ආරම්භ කිරීමට විශ්ව විද්‍යාල ගුරු සංගමය කටයුතු යොදන බව, 1973 ඔක්තෝම්බර් 26 වන දින 'ටයිම්ස් උසස් අධ්‍යාපන අතිරේකය' හි පළවූ ලිපියක, ඩේවිඩ් හෙන්ක් වාර්තා කළේය. විශ්ව විද්‍යාල සහ බහු තාක්ෂණික ආයතනවල පුස්තකාලවලින් සමහර ප්‍රකාශකයන් අධික ලෙස ලාභ උපයනවා ඇතැයි

සංගමය සැක කරයි. ප්‍රකාශකයන් විසින් විශ්ව විද්‍යාල ගසා කෑ හැකි අවදනමක් තිබෙන බවට එක් විශ්ව විද්‍යාල පුස්තකාලයාධිපතිවරයකුගේ කියමනක් එම ලිපියෙහි සඳහන් කර ඇත. එවැනි චෝදනා නියම ලෙස පදනම් සහිත ද යන්න වැදගත් නොවේ. පැහැදිලි ලෙසට දක්නට නොමැති දෙයක් නම්, තනි ප්‍රකාශකයන් අය කිරීමට බලාපොරොත්තුවන මිල ගණන් ගැන, පුස්තකාල වෘත්තිය විසින් නිල වශයෙන් කරන සමීක්ෂණයක් හෝ පුස්තකාල වෘත්තිය විසින් අනුමත නොකළ හැකි අන් ඕනෑම ප්‍රකාශන සිරිතක් හෝ ගැන සොයා බැලීමක් නොමැති කමයි. පුස්තකාල සංගමය හෝ ජාතික සහ විශ්ව විද්‍යාල ස්ථාවර කමිටුව නොව, විරුද්ධ වී ඇත්තේ විශ්ව විද්‍යාල ගුරු සංගමය යන්න පරස්පර විරෝධිය'යි කෙතරම් යහපත් අදහස් කළත්, විශ්ව විද්‍යාල ගුරුවරුන්ගේ සංගමය මෙවැනි කරුණු වලදී පුස්තකාල වෘත්තියව වඩා අඩු දැනුමක් තිබිය හැකි බවත් ඒ නිසා එවැනි සමීක්ෂණවලදී සාර්ථකත්වය අඩු විය හැකි බවත් කල්පනා කිරීම කනගාටු- දයක ය. ඊටත් වඩා සමස්තයක් වශයෙන් ගත් කල පුස්තකාල වෘත්තිය විසින් පොත් වෙළෙඳ ව්‍යාපාරය කෙරෙහි බලපෑමට සැලැස්විය හැකි විශාල දඩුවම්, විශ්ව විද්‍යාල ගුරුවරුන් සතුව නොපවතියි.

පොත් පත් ලෝකයට පුස්තකාල විශාල සේවයක් කළ බව පොත් වෙළෙඳ ව්‍යාපාරයට මතක් කර දිය යුතු ය. එය කියවීමේ රුචිය වර්ධනය කර, පොත්වලට ඇති අවශ්‍යතාව හා ඉල්ලුම වැඩි කර, පොත් නිෂ්පාදනය ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යාමට ධෛර්ය දුන්හ. මුද්‍රණ අකුරු විද්‍යාව සහ පොත් මුද්‍රණය, කඩදසි සෑදීම සහ පොත් බැඳීම, වැනි පොත් පත් කලාවෙහි මූලික අංග අගය කිරීමට, පුස්තකාල විද්‍යාලයෙහි ශිෂ්‍යයන්ට උගන්වනු ලැබේ. පුස්තකාල ද නිතර නිතර පොත් සති සහ පොත් ප්‍රදර්ශන පවත්වයි. පුස්තකාල පොත් අරමුදල්, අලුත් පොත් ප්‍රකාශකයට පමණක් නොව පරණ පොත් වෙළෙඳාමට ද, ප්‍රාදේශීය පොත් සාප්පු පැවැත්වීමට ද, ආධාර කරයි.

පොත්වල කඩදාසිවල ස්ථිරත්වය සහ කල් පැවැත්ම ගැන පුස්තකාලයාධිපතිවරුන් සැලකිල්ලක් දක්වා තිබේ. වර්තමාන මුද්‍රණ ද්‍රව්‍යයන් වේගයෙන් විනාශ වීමේ ප්‍රශ්නය ගැන යම් පිළියමක් යෙදීම සඳහා, නවීන පොත් කඩදාසි ශක්තිමත් කිරීමේ විධි ගැන අධ්‍යයනයක් කළ යුතු යයි, වර්ජිනියා ජනපද පුස්තකාලය, 'සංස්ථාගත පුස්තකාල සම්පත් මණ්ඩලයට', 1957 දී යෝජනා කළේය. පුස්තකාල සම්පත් මණ්ඩලය මේ සඳහා ආධාර මුදල් දුන් අතර අවසාන ප්‍රතිඵලය වූයේ තරඟකාරී මිල සීමාව තුළ ස්ථිර, කල්පවත්නා කඩදාසි තැනීමට ක්‍රම සකස් කර දියුණු කර ගැනීමයි.

පුස්තකාල සංගම්, නොයෙකුත් අන් අයුරින් ආධාර කර තිබේ. විශේෂයෙන් උසස් ගණයෙහි ප්‍රකාශන සඳහා තෑගි ආරම්භ කිරීම එක් නිදසුනකි. ළමයින් සඳහා ලියන ලද, ඇමරිකන් සාහිත්‍යයේ ඉතාමත් විශිෂ්ට කෘතියේ කතුවරයාට, වර්ෂයකට වරක් ඇමරිකන් පුස්තකාල සංගමය විසින් පිරිනමන නිව්බරි පදක්කම ඇත. පෙර වර්ෂය තුළ එක්සත් රාජධානියේදී පළමු වන වරට ප්‍රසිද්ධ කරන, ළමයින් සඳහා ඉංග්‍රීසියෙන් ලියන ලද විශිෂ්ට පොතක් සඳහා, වාර්ෂිකව පිරිනමන, බ්‍රිතාන්‍ය පුස්තකාල සංගමයේ කාර්නගී පදක්කම මේ සමාන ය. එමෙන් ම ළමයින් ගේ පොත් සඳහා හොඳම රූප සටහන් සැපයීම වෙනුවෙන් කේට් ග්‍රීන්මේ පදක්කම ද, හොඳ ම සූචිය සඳහා විට්ලි පදක්කම ද, හොඳ ම ආශ්‍රය යොමු පත සඳහා මැක් කොල්වින් පදක්කම ද, සාහිත්‍යයට මාර්ගෝපදේශ දෙන හෝ ග්‍රන්ථ නාමාවලිය සපයන හොඳ ම කෘතියට බෙස්ටර්මන් පදක්කම ද, පුස්තකාල සංගමය පිරිනමයි. මෙය, වැදගත් කෘතිවලට ධෛර්ය දීමේ සහ ඒවා අනුමත කිරීමේ අදහසින්, පුස්තකාලයාධිපතිවරුන්ට පොත් නිෂ්පාදනය හැසිර වීමෙහිලා කළ යුතු කොටසක් තිබේ යයි ඕර්වේගා. වයි. ගැසට් කළ නිර්දේශය, සුළු වශයෙන් හෝ අනුගමනය කිරීමකි.

පුස්තකාල විසින් කරන බලපෑමෙහි මත්තට ඇති විය හැකි සීමාව දක් වීමට ඉහත දැක්වුණු සමීක්ෂණය සෑහේ. එමෙන් ම වැදගත් හා අදාල අංශ කෙරෙහි මෙතෙක් බලපෑම්

කැර ඇත්තේ කෙ තරම් අඩු වශයෙන් ද යනු එයින් ම පෙන්වා දෙයි. සංඛ්‍යා ලේඛන සහ වෙළෙඳ පාඨවලින් විස්තර කළ ද පුස්තකාලවල නියම බලය තව ම නියම ලෙස ප්‍රයෝජනයට ගෙන නැත. පැස්බරුන් සිය හිස් වැල්ලෙහි සඟවා ගන්නාක් මෙන්, පුස්තකාලයාධිපතිවරු සාමාන්‍යයෙන් සිය හිස්, ක්‍රමචර්යා (Routine) කටයුතුවල ඔබා ගනිති. වර්තමාන ලෝකයේ එහි ප්‍රතිඵලය හාස්‍ය ජනක ය.


*References*:

1 Ortega y Gasset, J: 'The mission of the librarian'. *Antioch review, vol 21, 1961.*

2 Martyn, J: 'Secondary services and the rising tide of paper'. *Library trends*, July 1973.

3 Moore, E T: 'Intellectual Freedom'. *In* Orne, J *ed*: *Research librarianship: essays in honor of Robert B Downs*. New York, Bowker, 1971.

4 'Policy statements, standards of service and memoranda of evidence produced by the Library Association from 1942 to 1972: an annotated bibliography'. *Library Association library and information bulletin*, 19, 1972.

5 Fielding, F D O: 'A valediction on a non-profession'. *Australian library journal*, May 1972.

# 10

# ඇප කැපවීම

සිය වෘත්තිය කාර්යයන් සහ ව්‍යාවෘතව සිටින කරුණු වලින් වැඩි හරියක් අදාල නොවන දේ බව වරින් වර පුස්තකාල වෘත්තිය, අර්ධ වශයෙන් හෝ වටහා ගනියි. නිදර්ශනයක් වශයෙන් 1930 ස් ගණන් වලදී ෂේරා මතක් කර දෙන පරිදි, එක්තරා තරුණ පුස්තකාලයාධිපතිවරු කණ්ඩායමක් සමාජ ක්‍රියා මාර්ගයක් සඳහා බල කළ විට ඇමරිකාවේදී මෙය සිදු විය. හුවර් පරිපාලනයේ අවසාන අවුරුදුවල හා රූස්වෙල්ට් පරිපාලනයේ මුල් කොටසේදී ඇමරිකන් අර්ථ ක්‍රමයට බැට දුන් අර්බුදයේ කුණාටු පුස්තකාලයට සමාජ සම්බන්ධතා තිබෙන බවට හා පුස්තකාලයාධිපතිට ශක්තිමත්ව ශබ්ද නඟා කියා පෑ හැකි සමාජ හැඟීමක් තිබිය යුතු බවට අවබෝධයක් ඇති කළේය. 'ගතානුගතිකත්වයෙහි හා උදාසීනත්වයෙහි අවසානයක් ද ඒ වෙනුවට පුස්තකාලය ගැන ක්‍රියාශීලී සමාජ කාර්ය භාරයක් ද, මේ කණ්ඩායම ඉල්ලා සිටි කරුණු ය. ආර්ථික අර්බුදය නිසා පමණක් නොව, වර්ණ ආදී භේද නිසා ජාතීන් වෙන් කර තැබීම, සිය පොත් පත් එකතුන්වල සම්පූර්ණත්වය ආරක්‍ෂා කිරීම, ස්පාඤ්ඤ සිවිල් යුද්ධය හා ඒකාධිපතිවාදය නැඟී සිටීම වැනි කරුණු වලින් ද ඔව්හු කලබල වී සිටියහ.

කෙසේ හෝ වේවා සමාජ ක්‍රියා මාර්ගයක් සඳහා පුස්තකාලයේ සම්බන්ධතාවයට ම නෑකම් කියන සියලු කරුණු වලදී සාමූහික ක්‍රියා මාර්ගයක් සඳහා කරන ලද මේ කුඩා පුස්තකාලයාධිපති කණ්ඩායමේ ආයාචනය ඇමරිකන් පුස්තකාල සංගමය විසින් නොසලකා හරින ලදි. පුස්තකාල වෘත්තිය යහපත් වීමේ පරමාර්ථයෙන් අදහස් කරන ලද සමාජ මතයේ වැඩිමනත් භාවය නමැති ලෙඩෙන් පුස්තකාල වෘත්තිය පෙළෙන බව (ෂේරා විසින් උපුටා දක්වන ලද ජෝශප් ඇල්. විලර්ගේ වචන අනුව) ඒ සංගමයට හැඟී ගියේය.

වසර 1950 ස් ගණන් වැඩි වශයෙන් ගත වූයේ ඉහත පරිච්ඡේදයේ විස්තර කරන ලද සමීක්‍ෂණ සටන සම්බන්ධයෙන් වුවද ගතානුගතිකත්වයේ නියමයන් කුමක් වුවත් සමාජ ක්‍රියා මාර්ගයක් ඉවත දැමිය නොහැකි අලුත් ලෝකයකට තමන් තල්ලු වේගන යන බව නැවතත් 1960 ගණන් වලදී මහජන පුස්තකාලය අවබෝධ කර ගෙන සිටියේය. මේ අර්බුදය ඇතිවූයේ විශේෂයෙන් නගරය තුළ සිටින්නන් නගරාසන්න ප්‍රදේශවලට සංක්‍රමණය වී නව ජීවන රටාවල් ආරම්භ කිරීමෙනි. පුස්තකාලය අසල දන් සිටින අසල්වාසී පිරිසට නිසොල්මනේ විවේක කාලයක් ගත කිරීමට අවශ්‍යතාවක් නැති බවත් ඔවුන්ට අවශ්‍ය වන්නේ තොරතුරු සෙවීමටත්, භාෂා නිපුණතා විභාගවලින් සමත් වීමට උපකාරීවන පොත් සෙවීමටත්, නීග්‍රෝ ඉතිහාස අවබෝධ කර ගැනීමට කරුණු සෙවීමටත් හා ස්පාඤ්ඤ භාෂාව හැදෑරීමට පොත පත සෙවීමටත් බව අසල සම්ප්‍රදායානුකූල අසල්වාසී පුස්තකාලයට අවබෝධ විය. සිය පුස්තකාල තවදුරටත් නිශ්ශබ්ද, මධ්‍යම පංති වැදගත්කම මූර්තිමත් කරන ස්ථාන නොවන අතර, තමන් නගරයේ දිළිඳු අය සහ කළු ජාතීන්ගේ මුඩුක්කු සොයා යා යුතු බව බැල්ටිමෝර්, බොස්ටන්, චිකාගෝ, ක්ලීව්ලන්ඩ්, ඩෙට්රොයිට්, ලොස් ඇන්ජලීස් සහ නිව්යෝර්ක් වැනි ප්‍රධාන නගර ආශ්‍රිතව මධ්‍යස්ථාන නගරවල සිටින පුස්තකාලයාධිපති වරුන්ට අවබෝධ විය. කළු ජාතීන් සඳහා විශේෂයෙන් සකස් කරන ලද වැඩ පිළිවෙළවල්, දිළිඳු අයගේ යොවුන් පිරිසට ප්‍රයෝජනවත් ලෙස සකස් කරන ලද වැඩ පිළිවෙළවල් අතර, පුස්තකාල පොත පත බෙදා ගෙන පාවිච්චි කරති. විවාහ පූර්ව ගර්භනී තත්ත්වයන් ගැන ඇති වැඩ පිළිවෙළවල්, මත් ද්‍රව්‍ය සඳහා සකස් කර ඇති වැඩ පිළිවෙළවල් සමඟ කාලය එකට බෙදා ගනිති. තරුණයන් පුස්තකාල දෙරටු කරා ඇද ගැනීමට රොක් ඇන් රෝල් ප්‍රසංග පවා යොදා ගෙන ඇත. නගරයේ අඟහිඟකම්වලින් පිරි ප්‍රදේශවල සමාජ ආයතන සමඟ පුස්තකාල එකට වැඩ කිරීමට පටන් ගනියි. පුස්තකාලයට සහ එහි සේවයට විරුද්ධවාදිකම් ගොඩනැඟීම වළක්වාලීම පිණිස, පොත් ආපසු භාර දීමට වන ප්‍රමාද සඳහා සමහර පුස්තකාලවල ආදි කාලයේ පටන් අය කරන

දඩය අහෝසි කර තිබේ. ජනතාව අතර සිය සම්ප්‍රදායානුකූල කාර්ය භාරය, පුස්තකාලයාධිපතිවරු නැවතත් විමසා බලති. එහි ප්‍රතිඵලයක් වශයෙන් පුස්තකාල සේවා නැවතත් සකස් කරති. වැඩ පිළිවෙළවල් පුළුල් කරති. විවිධ ආකාරවලින් සාම්ප්‍රදායික ක්‍රම සම්පූර්ණයෙන් වෙනස් කරති.

එවැනි ම උනන්දුවක් බ්‍රිතාන්‍යයේ 'සහකාර පුස්තකාලයාධිපතිවරුන් ගේ සංගමයේ' සාමාජිකයන් අතර දක්නට තිබුණි. එය නියම වශයෙන් පුස්තකාල සංගමයට අයත් කණ්ඩායමක් වුවද එකඟ වන්නේ මව් සංගමයේ නිල අදහස් ස්වල්පයක් හා සමඟය. පුස්තකාලයාධිපතිවරුන් සමාජ ක්‍රියා මාර්ගවලට හා සමහර විට, දේශපාලන ක්‍රියා මාර්ගවලට පවා බැසිය යුතු යයි ඉල්ලා සිටිමින් ද, 1930 ස් ගණන්වල තරුණ ඇමරිකන් පුස්තකාලයාධිපතිවරුන් කළාක් මෙන්, වෘත්තියේ ගතානුගතිකත්වයට හා උදාසීනත්වයට පහර දෙමින් ද, සහකාර පුස්තකාලයාධිපතිවරුන් ගේ සංගමයේ සඟරාව වූ 'සහකාර පුස්තකාලයාධිපති' සඟරාවේ මෑත කාලයේ දී ලිපි සෑහෙන සංඛ්‍යාවක් පළවී තිබුණි.

'සහකාර පුස්තකාලයාධිපති' නමැති සඟරාවේ කළු ජාතික සංක්‍රමිකයන් සම්බන්ධයෙන්, මහජන පුස්තකාල ගැන මෑතකදී ලෙන් ඩෝව්ස් විසින් ලියන ලද ලිපියක, මහජන පුස්තකාලය සුදු ජාතික මධ්‍යම පංතික හරයන් ශක්තිමත් කර, අනෙක් ඒවා ඉවත ලන බව ප්‍රකාශ කරමින්, එය පැහැදිලි වන නොයෙක් ආකාරයන් ද පෙන්වා දෙයි. පළමු කොට පුස්තකාලය ජනතාවට හඳුන්වා දී ඇත්තේ නගර සභාවට අයත් එබැවින් ආඥාත්මක සංවිධානයක් ලෙස ය. පුස්තකාලවල ආඥාත්මක තත්ත්වය සහ අනවශ්‍ය මැදිහත්වීම, සංක්‍රමිකයන් අධෛර්ය කරන බව සත්‍යයකි. එහෙත් මෙය වරප්‍රසාද නොලත් හා පහසුකම් නොමැති හැම පාඨක වර්ගයකට ම අදාළ වේ. තව දුරටත්, එවැනි ආඥාදායකත්වයේ සමහර මූලයන් පුස්තකාලවල සුදු මධ්‍යම පංතික සම්ප්‍රදායයන්වල ඇති වුවද, එය පැන නැගීමට වෙනත් සාධක දෙකක් ද තිබේ.

එනම් ගතානුගතිකත්වය දෙසට පුස්තකාල හා පුස්තකාලයාධිපතිවරුන් නැඹුරුව හා ඔවුන්ගේ කාර්ය මණ්ඩලය සකස් කර ඇති ධූරාවලී (hierarchical) හා නිල බල (bureaucratic) ක්‍රමයයි.

ඩෝව්ස් අර්ධ වශයෙන් මේ තේමාව සලකා බලන්නේ ඔහු ගේ දෙවැනි කරුණ හැටියට ය. 'පුස්තකාලයාධිපතිත්වය සමහර විට පෙනෙන්නේ, අවුල් සහිත පිටස්තර ලෝකයෙන් වෙන් වූ, කරදර අඩු, නිල බලයෙන් යුක්ත, වෘත්තියක් ලෙස ය. එවැනි ක්‍රමයක ස්ථිරතාවය සහ නිවැරදිතාවය ප්‍රධාන වේ. මේ චිත්ත රූපය නිසා, පුස්තකාලයෙන් පිටත, නම් කළ නොහැකි ජීවිතයේ විවිධත්වය අගය කිරීමට අවශ්‍යයෙන්ම නොදත් අයගෙන් කාර්ය මණ්ඩලය ඇදී එයි. නිල බල ක්‍රමය අනුව සංවිධානය වූ ලිපිකාර නිලධාරීන්ගෙන් සමන්විත වූ, අද සිටින ඊනියා පුස්තකාලයාධිපතිවරුන් හා සසඳන විට, පුස්තකාලයාධිපතිකම හොඳට උගත් අයගෙන් සමන්විත, ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක නියම වෘත්තිය කාර්‍යයන් වල නිරත වන, විශිෂ්ටයන්ගේ වෘත්තියක් විය යුතු යයි මේ පොතේ හැම විට ම දැඩි ලෙස තර්ක කර තිබේ. සීමාසහිත හා ගතානුගතික පුද්ගලභාවයක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වීමෙන්, ඩෝව්ස් තර්ක කරන ආකාරයට මේ තත්ත්වය කාර්‍ය මණ්ඩලයට නිලධාරීන් බඳවා ගැනීමට බලපාන බව, තර්ක කර තිබේ.

මහජන පුස්තකාල පිළිගන්නේ සුදු මධ්‍යම පංතික ජනයාගේ හර පමණක්ය යන ඔහු ගේ ප්‍රස්තුතයට අනුබලයක් වශයෙන්, දක්වන ඩෝව්ස් ගේ තුන්වැනි කරුණ මෙයයි. 'සමහරවිට දැඩි ලෙස ක්‍රියාත්මක කරන ලද වැදගත්කමේ ස්වභාවයක්, පුස්තකාල පිළිබඳව ඇත. බාල වයස්කාර කරදර උපද්දන්නන්ට, පුස්තකාලය සිත් ඇද ගන්නා ඉලක්කයක් වී ඇත්තේ, මේ වැදගත්කමේ ස්වභාවය නිසයි; ඩෝව්ස් මෙතැනදී වාතාශ්‍රයක් නොමැතිකම පෙනුමෙන් හා කටයුතු කරන අන්දමින් පිළිකුල් උපදවන තරම පුස්තකාලවල ඇති නියම ස්වභාවය, මෙන් පෙන්නුම් කර තිබෙන දෙයට ඇති පෞද්ගලික

අප්‍රියතාව සමඟ පටලවා ගෙන ඇත. වැදගත්කම කුහක හෝ ව්‍යාජ හෝ වියයුතු නැත. කළු ජාතික සංක්‍රමිකයන් විසින් පුස්තකාල පාවිච්චි කිරීම ධෛර්ය ගැන්වීම නිසා, පුස්තකාල, වැදගත්කමේ විරුද්ධ පැත්ත එනම් අපකීර්තිදායක විය යුතු යයි කිසිවෙකු යෝජනා නොකරනු ඇත. පුස්තකාලය තමන් ගේ ජන කොට්ඨාශයේ, ඔවුන්ගේ මුළු ජන කොට්ඨාශයේ ජීවිතයේ කොටසක් බවට පත් විය යුතුයි. ඒවා වඩා සාදරයෙන් පිළි ගන්නා තැනක් වී, අඩුවෙන් සීමාකාරී විය යුතුයි. ඔවුන් වඩා ආනුභාව සම්පන්න හා බුද්ධිමත් පරිසරයක් ඉදිරිපත් කළ යුතුයි. ඒ අතර ඔවුන් අවංකව, ඍජුව හා සත්‍යශීලීව ද සිටිය යුතුය. එනම් වැදගත් විය යුතුය.

ඩෝච්ගේ අවසාන කරුණ අදාළ වන්නේ මහජන පුස්තකාලවල වර්තමාන පාඨක පිරිස සම්බන්ධවයි. අනුපාතික ව බලන විට, වැඩකරන ජනයාට වඩා මධ්‍යම පංතික ජනයා මහජන පුස්තකාල පාවිච්චි කරන බව, පුස්තකාලවල පාඨක පිරිස් ගැන කරන ලද සමීක්ෂණවලින් හෙළිවී තිබේ යයි හෙතෙම සඳහන් කරයි. මහජන පුස්තකාලවල පොත් බැහැර දීමේ මූලික කාර්ය භාරය හැරෙන්නට ඔවුහු අනෙකුත් නොයෙකුත් විශේෂඥ සේවා ඉදිරිපත් කරති. මේවා බොහොම–යකින් ප්‍රයෝජනය ගන්නේ හොඳ අධ්‍යාපනයක් ලද ජන කොටස් ය. තව දුරටත් පුස්තකාල සේවා ගැන ප්‍රශ්නකර ඒවා ගැන චෝදනා කරන්නේ, ජනතාව අතුරින් වඩා හොඳ අධ්‍යාපනයක් ලැබූ නිර්භීත අය යයි හෙතෙම ඒ සමඟ ම ප්‍රකාශ කරයි. මේ දෙවනුව කරන ලද ප්‍රකාශය කළ හැක්කේ; ලබා ගත හැකි දෙයින් යමක් ඉල්ලා ගැනීමට හා යමක් හා කැමති බැවින් ප්‍රසිද්ධියේ යමක් කියා පෑ හැකි හෙඳම කොටස ලබන පාඨශාලාවට, ජාතික සෞඛ්‍ය සේවාවලට සහ අන් නොයෙකුත් පහසුකම්වලට අදාළව බව වෝඩ්ස් නිසැකවම අවබෝධ කරගෙන ඇත. මෙතැන තිබෙන ප්‍රශ්නය මුල් බැස ඇත්තේ පුස්තකාලයාධිපතිකමේ නොව අපේ සමාජ ක්‍රමය තුළ පවතින අසමතාව තුළ ය. විශේෂයෙන්, සමාජයෙන්, කොන් කර, නොසලකා හැර තිබෙන කොටස් ද ඇතුළුව, සමාජයේ හැම කොටසක් විසින්ම, පුස්තකාල භාවිතයට

ධෛර්ය දෙමින්, පුස්තකාලයාධිපතිවරු තුමූම, සමාජ ක්‍රියා මාර්ගයට අවතීර්ණ වෙති දැයි යන්නට නියම හේතුවක් තිබේ.

පුස්තකාල සමාජ විපර්යාස සඳහා ගතානුගතිකත්වය සඳහා බලවේගයන් වූයේ ඇයි යන්න ඉහතදී ඇමරිකානු පුස්තකාලයාධිපතිවරුන් කළාක් මෙන්, ඩෝව්ස් ආවර්ජනය කරයි. එයට ප්‍රධාන හේතු දෙකක් තිබේ යයි හේ විශ්වාස කරයි. පළමුව පරිපාලනය නිල බල ක්‍රමයට සකස් කිරීමයි. හැම තැනින් ම ලැබෙන සාක්ෂි අනුව මෙය ප්‍රතික්ෂේප කළ නොහැක. දෙවනුව පුස්තකාලයාධිපතිවරුන් විසින් ම තමන්ට වෘත්තීය තත්ත්වයක් නොමැතිකම සම්බන්ධයෙන් මුළු කාලය ගත කිරීමයි. මේ තර්කය හෙතෙම තවදුරටත් පුළුල් කරයි. පුස්තකාලාධිපතිගේ අහංකාරය වැඩි වන විට, පාඨකයන් කෙරෙහි ඔහුගේ සැලකිල්ල අනුපාතිකව අඩු වෙයි. ඒසමඟ ම පුස්තකාලය සම්බන්ධ තීරණ ගන්නා අය, පුස්තකාලයේ පවත්නා නියම තත්වයෙන් වඩ වඩා ඈත් වෙති. මේවායින් පසු, පුස්තකාලයේ යථා තත්වය පිළිබඳව වඩා ප්‍රත්‍යක්ෂ අංග දැක්වෙයි. නිදර්ශනයක් වශයෙන් නිල බල සහිත පුස්තකාලයාධිපති, නිශ්ශබ්ද වාතාවරණය, දඩ ගැසීම් සහ නුවුවමනා නීති රීති වැනි තත්වය රකින කරුණු වේ.

මේ සම්බන්ධ නියම සත්‍යය ඩෝව්ස්ගේ තර්කවල විරුද්ධ පැත්ත ය. පුස්තකාලයාධිපතිවරු සිය තත්ත්වය සම්බන්ධයෙන් අඩුවෙන් ක්‍රියා කළ බැවින්, දඩ ගැසීම් සහිත නුවුවමනා නීති රීති සහිත නිලධාරීන් වීමට ඉඩ හැර තිබේ. තමන් සම්බන්ධයෙන් ම තිබිය යුතු වටිනා ගැනීම නොමැති කමින්, පාඨකයින් සමඟ තිබිය යුතු සම්බන්ධතා බිඳ දමා ඇත. තමා විශිෂ්ට සේවයක සාමාජිකයකු ලෙසත්, සමාජ අවශ්‍යතා අනුව තමා මේ තත්ත්වයේ සිටීම යුක්ති සහගත බවත් පුස්තකාලයාධිපති සැලකුවොත්, සිය පුස්තකාලය භාවිතා කරන්නන් හා සමඟ අතිශයින් සම්බන්ධතා ඇති කර නොගෙන සිටිය නොහැක. ෂෙක්ස්පියර්ගේ ප්‍රඥාව මෙහිදී පූර්වාදර්ශයක් සේ ගත යුතුය. "සියල්ලටම වඩා ඔබ ඔබටම සත්‍යශීලී වන්න. දවස පසුපස රාත්‍රිය යන්නාක් මෙන් ඒ අනුව යා යුතුයි. එවිට කිසි මිනිසකුට බොරු කාරයෙකු වීම ඔබට කළ නොහැක.

පුස්තකාලවල සමාජ කාර්යක්ෂමතාව දියුණු කිරීම සඳහා, ප්‍රධාන මාර්ග දෙකක් යෝජනා කරමින් ඩෝව්ස් මේ ලිපිය හමාර කරයි. පුස්තකාල දැනට වඩා 'සංස්කෘති විශේෂ' විය යුතු යයි හේ නිර්දේශ කරයි. එනම් තමන්ගේ ප්‍රදේශවල විශේෂ ලක්ෂණ පිළිබඳ පර්යේෂණ කර, ඒවා විග්‍රහ කර, ඒවා ජනතාවගේ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි, තමන්ගේ පහසුකම් සකස් කර ගැනීමට නිරන්තරයෙන්ම උත්සාහ කළ යුතුය. ජන සන්නිවේදන මාධ්‍යයන් මෙන් නොව, පුස්තකාල ප්‍රාදේශීය වශයෙන් පිහිටුවා තිබෙන බැවින් සහ ඒවා ක්‍රියා කරන්නේ සාපේක්ෂ වශයෙන් කුඩා පරිමාණයක බැවින්, මෙය එතරම් දුෂ්කර විය යුතු නොවේ. එලෙස ම විරුද්ධ විය නොහැකි ඔහුගේ දෙවන නිර්දේශය වනුයේ පුස්තකාලවල ප්‍රතිපත්ති සකස් කිරීම බලෙන් නියම කළ දෙයක් නොව, සාකච්ඡා මගින් පර්යේෂණ කිරීමෙන් සහ අත්හදා බැලීමෙන් ජනතාවට ඒ සේවා සම්බන්ධ කිරීම වේ. එසේ නැත්නම් පුස්තකාල 'ජනතාව හා සම්බන්ධයෙන් බලන විට එක්තරා ප්‍රමාණයකට ගණන් ගත යුතු නැති අදාල නොවන' ලෙස දැනට පවත්නා තත්ත්වයේම පවතිනු ඇතැයි හේ කියයි. පුස්තකාල පැවැත්වීම අවශ්‍ය බවත්, ජනතාවට ඒවා බලය ගෙන දෙන මාර්ගයක් බවත්, ඩෝව්ස් ගේ මූලික උපකල්පනය බව පැහැදිලිය. ඒවායේ මූලික කාර්ය භාරය ගැන හේ වාද නොකරයි. ෂේරා ගේ වචන අනුව 'පුස්තකාලයේ මූලික කාර්ය භාරය වෙනස් නො වේ. වෙනස්වීම්වලට භාජනය වන්නේ ඒ කාර්ය භාරයේ ගතිකත්වය හා ක්‍රියාවේ යෙදවීමේ ස්වභාවයයි.' ඉතාමත් සම්ප්‍රදායානුකූල ආකල්පයක් ඇති පුස්තකාලයාධිපතිට පවා මෙය පමණක් සෑහෙන සහතික වීමක් වන අතර, 'සමාජ දර්ශනයේ වැඩීමනත් ප්‍රමාණයක්' යනුවෙන් වීලර් වර්ගයේ චෝදනාවලට මෙය කෙටි උත්තරයකි. පුස්තකාලයාධිපතිත්වයට නියම න්‍යාය ධර්මයක් නොමැති විට එය අදාළ නොවන දේවලට යටපත් වේ. ඒ න්‍යාය ධර්මයෙන් කොටසක් විය යුත්තේ සමාජ ක්‍රියා මාර්ගයකට ඇති අවශ්‍යම පිළිගැනීමයි. ඒ කරණ කොට ගෙන උදසීනත්වය හා ගතානුගතිකත්වය පසු බසිනු ඇත.

පුස්තකාලය සමාජ වැඩට කැපවීම සම්බන්ධයෙන් ඉතාමත් ප්‍රායෝගික ප්‍රශ්න සමහරක් පිළිබඳව 'සහකාර පුස්තකාලයාධිපති' සඟරාවේ මෑතකදී පළ වූ ලිපියක ග්‍රැහැම් හාර්වේ සාකච්ඡා කරයි. ඉහත දී මේ පොතේ සමාජය ගැන පරිච්ඡේදයේ දී සාකච්ඡා කළ එහෙත් නැවතත් සඳහන් කිරීමට වටිනා විෂයකින් හේ පටන් ගනියි. 'මහජන පුස්තකාලය තවමත් පාඨකයින් නොවන සෙනගටත් අර්ධ උගත් අයටත් ළඟා වීමට අපොහොසත් වී තිබෙන අතර අවශ්‍යතා සහ යෝග්‍ය පුරුද්දක් වශයෙන්, කියවීමට උනන්දු කිරීම සම්බන්ධයෙන් ක්‍රියාශීලී කොටසක් ඉටු කර නැත. අද පවා සමහර පාසල් හැර යන්නෝ නාමිකව ලියන්නට කියන්නට දත් අය වෙති. කියවීමට ළමයකු හඳුන්වා දෙන අන්දමත්, ඔහුට කියවීමට ධෛර්ය දීමත් ඉතාමත් වැදගත් ය. කියවීමට ධෛර්ය දීමේ වඩා ක්‍රියාශීලී කොටසක් මහජන පුස්තකාලය ඉටු කළ යුතු අතර හැම මට්ටමකම කියවීමේ රුචිවලට අවශ්‍ය පොත පත සැපයිය යුතුයි. බොහෝ විට ප්‍රතික්ෂෙප කරනු ලැබූ කියවීමෙන් ලැබෙන මානසික සෞඛ්‍යය සාමාන්‍යයෙන් පිළි ගෙන තිබෙන පමණට වඩා වැඩිය.

පුස්තකාලය සිය පහසුකම් ජන කොටස්වල අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි සකස් කළ යුතුය, යන ඩෝව්ස්ගේ නිර්දේශය හාර්වේ අනුමත කළ ද පුස්තකාල කාර්ය මණ්ඩලයේ ස්වභාවයට සහ ආකල්පයන්ට ප්‍රායෝගික වශයෙන් සම්බන්ධ කරයි. මහජන පුස්තකාලයේ මතුවට ඇතිවන මහජන අවශ්‍යතා සමඟ කාර්යක්ෂම සම්බන්ධය පුළුල් කළ යුතු ය. මෙය කැපවුණු ආශාවන් දක්වන සහ උපකාරී වන කාර්ය මණ්ඩලයක් මගින් ඉටු කර ගත හැකි ය. මහජනයා ගැනත්, ඔවුන්ගේ ප්‍රශ්න ගැනත් නියම ලෙස සැලකිල්ලක් දක්වන, හොඳින් පුහුණු කරනු ලැබූ කාර්ය මණ්ඩලයක් විසින් පුස්තකාලය භාවිත කරන්නන්ගේ විශ්වාසය වැඩි කර මහජන පුස්තකාලය සහ පුස්තකාලයාධිපතිවරයාගේ කීර්තිය හා පිළිබිඹුව වැඩි දියුණු කරනවා ඇත. 'හොඳින් පුහුණු කරනු ලැබූ' යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැයි හේ විස්තර නො කරයි. වෘත්තීය

අර්ථය අනුව කළමනාකරණයේ මූලික කරුණුවලටත්, නාමාවලි, සූචි සකස් කිරීම වැනි එදිනෙද වැඩවල නොයෙක් පැටලිලි සහිත කරුණුවලටත්, වෘත්තීය අර්ථය අනුව සීමාවන පුහුණුව යන්නෙහි සාමාන්‍ය අර්ථය අනුව ඔහු අදහස් කළා විය නොහැක. ඔහුට අදහස් කළ හැක්කේ සිය කාර්යයන් පිළිබඳ නියම දර්ශනයක් ඇති පුස්තකාල කාර්ය මණ්ඩලයක් පමණි. කීර්තිය සහ පිළිඹිබුව පිළිබඳ ඔහු ගේ අවසාන ප්‍රකාශය යථාර්ථයක් වන්නේ එවිට ය.

ජංගම පුස්තකාලවලට ප්‍රශංසා කරමින්, සහ පුවත්පත් පාඨක කාමරය වැනි පැරණි අදහස් අද පවත්නා වෙනස් තත්ත්වයන් සඳහා ප්‍රයෝජනවත් ලෙස නැවත සකස් කර ගත හැකි බව පෙන්වා දෙමින් හාර්වේ ලිපිය අවසන් කරයි. ජංගම පුස්තකාල සේවයට හාර්වේ කැමැත්ත දක්වන්නේ, එවැනි පුස්තකාල විධි පූර්වක නොවන නිසාත්, මිනිසුන් විසින් පිළිකුල් කරන ස්වභාවයක් වාතාවරණයක් නොමැති බැවිනුත්, පාඨකයන් සමඟ වඩා කෙළින් සම්බන්ධයක් ඇති කර ගන්නා බැවිනුත්, පාඨකයන් සොයා ගෙන ඔවුන් වෙත යන බැවින් පාඨකයන් වැඩියෙන් ඇදී එන බැවිනුත්, සහ නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවලට එක හා සමානව සේවය කළ හැකි නිසාත් ය. දනට ඉතාමත් සතුටුදයක සහ මිනිසුන් ඉතාමත් කැමති, මහජන පුස්තකාල නම් ජංගම පුස්තකාල බව සත්‍යයකි. කියවීම් ශාලා සම්බන්ධයෙන් නම්, හාර්වේ කල්පනා කරන අන්දමට, මේවා අපකීර්තියට පත්ව ඇත්තේ ඒවා ඉබාගාතේ ඇවිදින්නන්ගේ සහ අයාලේ යන්නන්ගේ තිප්පොළවල් වී ඇති බැවින්ය. ඒ අතර හොඳ නව මතයක අවශ්‍යතාව තව ම පවතින බව අමතක කළා සේ පෙනේ. ඒවා දකුම්කලු සහ කාල්පනික ලෙස සැලසුම් කර, සරසා ඉතාමත් චාම් ලෙස, සැප පහසු හා විවේකශීලී වාතාවරණයක් සහිතව විවිධ සඟරා හා පුවත්පත් සහිතව තිබිය යුතුය. සමහර විට ආහාර පානාදී පහසුකම් ද ප්‍රයෝජනවත් ය.

පුස්තකාලයාධිපති වෘත්තියට සුදුසුකමක් ලෙස පොත් වලට රුචියකුත්, මහජනයාට සේවය කිරීමේ අභිලාෂයකුත්, එක සමාන ව තිබිය යුතුය, යන්න බොහෝ කාලයක සිට

පවතින පළපුරුද්දක් නිසා ලැබූ උපදේශයකි. එකක් අනෙක නොමැතිව පලක් නැත. පුස්තකාලවල සමාජ ඇප ැපවීමේ අදහස සමඟ තරුණ පුස්තකාලයාධිපතිවරු කෙතරම් බැඳී සිටිය යුතු ද යන්න පුදුමයක් ලෙස සැලකිය යුතු නොවේ. පුස්තකාලයාධිපතිවරුන් විසින් සමාජ ක්‍රියා මාර්ගයක් සඳහා ගත යුතු එවැනි සියලු ව්‍යාපාරවල ඓතිහාසික සම්බන්ධය ෂේරා සිය උගත්කමින් මතක් කර දෙයි. මෙහි 'අදාළත්වය' සඳහා පුස්තකාලයාධිපතිවරුන් විසින් කරන හැම ඉල්ලීමක්ම කියවීමේ රුචිය දියුණු කිරීමෙන්, මනුෂ්‍ය වර්ගයා දිළිඳු භාවයෙන්, අපරාධවලින්, දූෂණවලින්, බීමත්කමින් හා මනුෂ්‍යයන් හැටියට උරුමකම් කිව හැකි අනෙක් සියලුම දුෂ්චරිත වලින් ගලවා ගත හැකි සමාජ බලවේගයන් ලෙස මහජන පුස්තකාලය කෙරෙහි දහනව වන ශත වර්ෂය තුළ තිබූ විශ්වාසය දක්වා සම්බන්ධ කළ හැකි යයි හේ පෙන්වා දෙයි. මේ පොතෙහි දැනටමත් සඳහන් කර ඇති එවැනි අනෙකුත් නොයෙක් සුදුසුකම් මෙන් පුස්තකාල යහපත්කම සහ සන්තෝෂය වැඩි දියුණු කරයි යන මෙම අදහස සමහර විට බොළඳ යයි පෙනී යනු ඇත. එසේ වුවද මෙය හැර පුස්තකාලයාධිපතිත්වයේ අයිතිය රඳා පවතින වෙනත් පදනමක් නැත.

මෙයින් අදහස් කරන්නේ ඒ හා සමානව ම පොත් කෙරෙහි ඇති කැපවීම ප්‍රතික්ෂෙප කිරීම නොවේ. පොත් සදාකාලික බව තෝමස් කාලයිල් විශ්වාස කළාක් මෙන් පුස්තකාලයාධිපතිවරු ද විශ්වාස කළ යුතු ය. කෙසේ හෝ වේවා මේ අවස්ථාවේ දී පුස්තකාල සේවයට සාමාන්‍යයෙන් මේ කැපවීම ගැන මතක් කිරීමට එ තරම් විශාල අවශ්‍යතාවක් නැත. මතක් කිරීම පිළිබඳ වර්තමාන අවශ්‍යතාව ඇත්තේ මහජනයා කෙරෙහි පුස්තකාලවල සම්බන්ධය ගැන ය. සමහර විට යම් මතු දිනෙක තුලයතාව බොහෝ සෙමින් අනෙක් පැත්තට කැරකීමට ඉඩ ඇත. පුස්තකාලයාධිපතිවරුන් සමහර විට, ගුරුවරුන් හෝ සමාජ සේවකයන් හෝ නාට්‍යකරුවන් හෝ වී, තමන් භාරගත් කාර්ය භාරය බරපතල ලෙස සහ වැරදි ලෙස අතපසු කිරීමට පුළුවන. එහෙත්

එවැනි අවදනමක් හදිසි යයි කිසිසේත් විස්තර කළ නොහැක. පරස්පර විරෝධී ලෙස එහි වර්තමාන අදාළත්වය පුස්තකාලයාධිපතිවරුන් සමාජ ක්‍රියා මාර්ගයේ වැඩිපුර නිරත වීම නිසා නොව, පොත් එකතු ගොඩ නැංවීමේ ක්‍රියාවට හානි නො වන පරිදි, ව්‍යාපාර කළමනාකරණය කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වීමට ඇති වර්තමාන හිතුවක්කාර ප්‍රවණතාවයයි.

පුස්තකාලය සමාජ කණ්ඩායම්වලට කැපවීම සම්බන්ධයෙන් ෂේරා ද, ඩෝවිස් ද, හාර්වේ ද සැලකිල්ලක් දක්වති. අනෙක් අතින් බ්‍රෝඩ්ෆීල්ඩ් පුස්තකාලය, පුද්ගලයාට බාර වීම සම්බන්ධයෙන් ස්ථිර ලෙස සැලකිල්ලක් දක්වයි. ඔහු ගේ සිතත් ඔහු ගේ ගතිගුණත් නිතර ම ඔහු පොළඹවන්නේ සමාජය අනර්ථකාමී ලෙස සැලකීමට ය. සමාජය ගැන ඇති අමූර්ත මතය විසින් අප කෙරෙහි බලපාන ආකර්ෂණය සමහර විට සිය දිවි හානි කර ගැනීමට ඇති පොදු ආවේගය කරණ කොට ගෙන ඇති වන ආකාරයක් වූ ව්‍යාධිවේදීන් තත්ත්වයත් සමඟ සාමාන්‍යයෙන් එක්ව යන සංකේතනයෙන් (මේ අවස්ථාවේ තිර සහ තාරකා, පදක්කම්, ස්වස්තිකය සහ බිග්බෙන් ඔරලෝසුව) ශක්තිමත් කරනු ලැබේ. අපේ අරමුණක් විය යුත්තේ, මනුෂ්‍ය ටෝර්පිඩෝ බෝම්බ නිපදවන මේ ආවේගය නොව, පුස්තකාලයාධිපතිකමෙන් ඉටු කළ හැකි ශිෂ්ට සම්පන්න පුද්ගලයාගේ වැදගත් අවශ්‍යතා සැපයීම අවධාරණය කිරීමයි.

තමාට අවශ්‍ය දේ පිළිබඳ ව අවසාන තීරක වීමට සමාජයටවත් පුස්තකාලයාධිපතිටවත් නොව පුද්ගලයාට ම ඉඩ දිය යුතුය යන්න බ්‍රෝඩ්ෆීල්ඩ් ගේ මතයයි. මෙයින් අදහස් කරන්නේ, සමාජය විසින්, නැත්නම් ජනතාව විසින් කෙරෙන තහනම නොහොත් සමීක්ෂණය බාර ගත නොහැකි බවයි. 'ජන සම්බන්ධකම් හා උද්යෝගය නිසා විකෘති වී ඇති කරුණු ගැන නිදහස් විනිශ්චයක් ඇති කර ගැනීමට, හැම පුද්ගලයකුටම සහාය වීම, පුස්තකාලයාධිපති ගේ කාර්යයකි.

පුස්තකාල විසින් සමාජ කාර්යයන්ට ඇප කැපවන හා සත්‍යය රකින අය හැටියට අපේ වඩා විප්ලවකාරී යුතුකම් සමඟ අපේ ප්‍රාර්ථනය තුලනය කර ගත යුතු යයි බ්‍රෝඩ්පීල්ඩ් මතක් කර දෙයි. සත්‍යය ඉස්මතු වී බලපවත්වන තත්වයන් පුස්තකාලයාධිපතිවරුන් විසින් ඇති කළ යුතු ය. මේ කරුණු ගැන ඔවුන් ගේ ජන කොට්ඨාශවලින් විමසීමට අවශ්‍යතාවක් නැත. ඔවුන්ගේ ම ආචාර ධර්ම පදනම් කර ගෙන මෙය කළ යුතුය. පුස්තකාලයාධිපතිවරු සත්‍යයට ගරු කළ යුත්තේ ඒ සඳහා ම විනා සමාජ ප්‍රයෝජනය තකා ගෙන නොවේ. ඔවුන්ට එහි අගය ගැන ඒත්තු ගොස් ඇත්නම්, මත පිළිබඳ වඩා උසස් අගය කිරීමකුත්, එය ප්‍රකාශ කිරීමට ඇති ධෛර්ය ගැන අලුතෙන් නියම ලෙස අවබෝධ කර ගැනීමකුත්, ඇති කිරීමට ඔවුන් හේතු භූත විය හැක. අවිද්‍යාව මැඩ පැවැත්වී-මෙන් ද, ප්‍රියවන්නා වූ හා අප්‍රියවන්නා වූ ද අනුමත කළ හා අනුමත නො කළ වූ ද, ප්‍රයෝජන හා නිෂ්ඵල වන්නා වූද, දැනුම පැතිරවීමට උත්සාහ කිරීමෙන්ද ඔවුන්ට ඉවසීම වර්ධනය කළ හැකි ය.

පුස්තකාලය සත්‍යයට ඇප කැප වීම පිළිබඳවත්, පුද්ගලයාගේ නිදහස සම්බන්ධයෙනුත් ඇති මාර්ගයෙහි බාධක ගණනාවක් හේ දකියි. ජාතික පුස්තකාලවලට හැම විට ම ජාතික අවශ්‍යතා සහ උරුම අභිබවා යෑම නොකළ හැකි යයි අවසාන විග්‍රහයක් වශයෙන්, පළමු වෙන් ම හෙතෙම පෙන්වා දෙයි. බොහෝ රටවල පුස්තකාල දිගට ම පැවතීමට එහි ජාතික කරුණු අභිබවා නොයන බවට සාක්ෂියකි. ඔහුගේ මතය අනුමත කිරීමට ඉතා මෑතදී ඇති වූ ප්‍රමාණවත් සාක්ෂි ද වර්තමානයේ සැඟෙන සාක්ෂි ද ඇත.

පුස්තකාල වෘත්තියට තවත් බාධකයක් වෙයි. මේ පොතේ දෙ වැනි පරිච්ඡේදයේ සඳහන් කර ඇති, කොන්ග්‍රස් සභාවේ පුස්තකාලයාධිපතිවරයෙකු පත්කිරීම සම්බන්ධයෙන් රූස්වෙල්ට් ජනාධිපතිවරයා ක්‍රියා කළාක් මෙන්, අප දන්නා තරමට පුස්තකාලය, පුස්තකාලයාධිපතිවරුන්ට භාර නොදෙන තරම්ට වඩා වැදගත් වේ යයි බ්‍රෝඩ්පීල්ඩ් සිතන

බවක් පෙනේ. පුස්තකාල කාර්ය මණ්ඩලයේ බොහෝ සාමාජිකයන් අප අවට ලෝකයේ සිදු වෙමින යන දේවල් සම්බන්ධයෙන් කෙතරම් අපැහැදිලි හැඟීමක් ඇති ව සිටිනවා ද යත් අනාගතයේ ඇති විය හැකි තත්වයක් පිළිබඳ සලකුණු තේරුම් ගැනීමටත් ඒවා ගැන ක්‍රියා කිරීමටවත් ඔහු බලයක් නොමැතිව සිටියි. සම්පූර්ණයෙන් වෙනස් මූලයකින් තර්ක කිරීමට පටන් ගත් බ්‍රෝඩ්ෆීල්ඩ්, ඩොව්ස් ගේ හා සමාන අවසාන තීරණයකට පැමිණ සිටීම කුහුලක් ඇති කරවන්නකි. නියම වෘත්තිය ඇප කැපවීමක් සම්බන්ධයෙන් පුස්තකාල වෘත්තිය ගැන ඔහු ගේ මතය අනුව, මේ පොතේ නිතර ම පවත්වා ගෙන ආ තේමාවන් බ්‍රෝඩ්ෆීල්ඩ් නැවතත් සාකච්ඡා කිරීම එතරම් අපූරු දෙයක් නොවේ. 'රීති ක්‍රියාවට පරිවර්තනය කිරීමට මිස, නිසි ක්‍රියාවකට සම්බන්ධ නැති වැඩවලට කිසි ම පුස්තකාලයාධිපතිවරයකුට නොගෙවිය යුතු අතර මේ වර්ගයේ වැඩ දවස් භාගයකට වඩා ඉක්මවා යෑමට ඉඩ දිය යුතු නැත. ඒ වැඩවල එක සමානත්වය වැඩෙහි යෙදෙන්නට හානිකර වනවා පමණක් නොව, වැඩි සංඛ්‍යාවක් ඒ වැඩ භාර ගැනීමට සතුටු වීමෙන් එයින් ගැලවී යාමට වඩා කල්පනාකාරී පුද්ගලයන්ට තිබෙන ඉඩ කඩ නැතිවී, එය පහත් තත්වයකට වැටේ'. බ්‍රෝඩ්ෆීල්ඩ් ගේ බලාපොරොත්තුව ද විශිෂ්ට ගණයේ වෘත්තියක් පිහිටුවීමය

සංක්ෂේපයෙන් කියතොත් ෂේරා, ඩෝව්ස්, හාර්වේ සහ බ්‍රෝඩ්පීල්ඩ් යන හැම දෙනා ම ඇප කැපවීම පිළිබඳ ප්‍රශ්නය ගැන පෞද්ගලික අන්දමින් ක්‍රියා කළ ද සියලුදෙන ම එක ම මතය දරති. ඇප කැප වීම පිළිබඳ ඓතිහාසික ලෙස සලකා බැලුවත්, ප්‍රජාව සම්බන්ධයෙන් සලකා බැලුවත්, සත්‍යය හා පුද්ගලයාගේ වැදගත්කම අනුව සලකා බැලුවත්, බ්‍රෝඩ්ෆිල්ඩ් ගේ වචන අනුව මෙහි වැදගත් කරුණ වනුයේ, පුස්තකාලයාධිපතිත්වයේ දර්ශනය පදනම් විය යුත්තේ; හැම මිනිසා විසින් ම ගත කළ යුතු යහපත් ජීවිතය මත වේ.'

*References*


1 Shera, J H: *The foundations of education for librarianship*. New York, Becker and Hayes, 1972.

2 Dawes, L: 'Libraries, culture and blacks'. *Assistant librarian*, July 1973.

3 Harvey, G: Public library impact-breaking down the barriers. Part one-services'. *Assistant librarian*, July 1973.

4. Broadfield, A: *A philosophy of librarianship*, London, Grafton, 1949.

11

# අනාගතය

පුස්තකාලවල අනාගතයත්, පුස්තකාල වෘත්තියෙහි අනාගතයත් සම්පූර්ණයෙන් එකිනෙකට වෙනස් කරුණු දෙකකි. දැනට පවත්නා අවදානම නම්, ඒ දෙක එකට එකතුවීම ගැන ලකුණු ඇත්තේ ඉතා ස්වල්ප වශයෙන් වීමයි. පුස්තකාල විද්‍යා ප්‍රබන්ධවලට ඉඩ දෙන්නේ නැතිව, දැනට ලබා ගත හැකි සාක්ෂි මත ම රඳා සිටින්නේ නම්, පුස්තකාලවල අනාගතය සලකුණු කිරීම එතරම් දුෂ්කර නොවේ. කෙසේ හෝ වේවා, සලකුණු අනුව හා ලබා ගත හැකි සාක්ෂි අනුව නැවතත් රඳා සිටින්නේ නම් ඒ අනුව සිය අනාගතය හැඩ ගස්වා ගැනීමට පුස්තකාල වෘත්තිය සම්පූර්ණ උත්සාහයක් නොදරන බව ඒ හා සමාන ව ම ප්‍රත්‍යක්ෂ ය.

මෑතකදී ලියන ලද ලිපියක නෝර්මන් ඩබ්ලිව්. බෙස්වික් අනාගතයේ උසස් අධ්‍යාපනයෙහි පුස්තකාල සැලසුම් කිරීම පිළිබඳ ව, අදහස්, ස්වල්පයක් ඉදිරිපත් කළේය. මේවා අඩු වශයෙන් ආරම්භක කරුණු වශයෙන්වත් සැලකිය හැක. පාසල්වල ඉතාමත් ප්‍රත්‍යක්ෂ එහෙත් සැලසුම් කළ සමීක්ෂණ වලින් සහ සොයා ගැනීම් වලින් ඉගෙනීමට පක්ෂව, විධි පූර්වක ඉගැන්වීමට විරුද්ධ ප්‍රවණතාවක් ඇති සමහර උසස් පාඨශාලා සහ විශ්වවිද්‍යාල ගණනාවක දැනටමත් විද්‍යමාන වෙමින් එන දෑ වර්තමාන උගන්වන, ඉගෙනීමේ ක්‍රමය ගෙන හැර දක්වමින් හේ ආරම්භ කරයි. පෞද්ගලික ව ඉගෙන ගැනීමට දෙන ලද මේ නව අවධාරණයෙන් අදහස් කෙරෙන්නේ ශිෂ්‍යයන් විසින් පුස්තකාල භාවිත කිරීම තව තවත් වැඩි වීමයි.

බෙස්වික් සිය කෙටි ලිපියෙහි මේ කරුණ වැඩියෙන් විස්තර නො කරයි. එහෙත් මේ ප්‍රවණතාවයෙහි ප්‍රතිඵල හැම විශ්වවිද්‍යාල පුස්තකාලයක ම දැනටමත් පැහැදිලිව දැකිය හැකි ය. ඒවායේ තිබූ ආසන දෙව් මැදුරක තිබුණ නිශ්ශබ්දතාව තව

දුරටත් නැත. පවත්නා වාතාවරණය බස් නැවතුම් පළක වාතාවරණයට සමාන ය. අවාසනාවකට මෙන් මේ සාදෘශ්‍යය, සෙනග ගැවසී ගත් තත්ත්වයකට වඩා ගැඹුරට දිවෙයි. ශබ්ද, ආකූල ව්‍යාකූල තත්වය, අපහසුතාව, හිරිහැරය සහ ඉතාමත් අවුල් සහගත අන්දමින් ඇති රකනලද සංඥා පුවරුද දක්නට ලැබේ. කරුණු දන්නා, උගත් මාර්ගෝපදේශකයන් වන පුස්තක-කාල ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය, වෙනත් පුස්තකාල දෙදහසක පමණ එකවර ම සූචි පත්‍රිකා සකස් කරනු ලබන පොත් සඳහා තව දුරටත් සූචි පත්‍රිකා සකස් කරමින් හෝ, නියෝග යතුරු ලියනය කරමින් හෝ, වේලාව පසු වී සේවයට එන්නන් ගේ ලැයිස්තු සකස් කරමින් හෝ, වෙනින් තැනක අන් කටයුතුවල නිරත වී සිටිති. පුස්තකාලය භාවිත කිරීම සම්බන්ධයෙන්, ශිෂ්‍යයන්ට විධිමත් ලෙස කරුණු පැහැදිලි කර දීමක් කවරදකවත් නියම ලෙස ඉටු කර නැත. මුද්‍රිත මාර්ගෝපදේශ හා සංඥා එක්කෝ කිසිසේත් නැත. නැතිනම් තිබෙන ඒවා ප්‍රමාණවත් නැත. සූචින් සකස් කර තිබෙන්නේ අධි මානසික බලයක් සතු ව සිටින අය ගේ පාවිච්චියට පමණක් මෙන් හැඟී යයි. ඊටත් වඩා තමන්ට අවශ්‍ය සේවා මොනවාද? තමන් කැමති කුමන පහසුකම් ද යනුවෙන් ශිෂ්‍යයන්ගේ අදහස් විමසා බැලීමට කවරදකවත් ඔවුන් හා සාකච්ඡා කළ බවත් පෙනෙන්නට නැත. පොත් නිකුත් කරන අංශයේ පුස්තකාල සහකාර හැරෙන්නට, පුස්තකාල කාර්ය මණ්ඩලයේ අන් කිසිවෙකු මුණ ගැසීමේ අවස්ථාවක් පාඨකයනට නැති තරම් ය.

මහජන පුස්තකාලයක තිබෙන එවැනි ම කනගාටුදායක දර්ශනයක් නම් පුස්තකාල කාර්ය මණ්ඩලය කාර්යාලවල සැඟවී හෝ 'ඇතුල්වීම තහනම්' යන දැන්වීම් පුවරුවක් සහිත කුඩා දෙරකින්, උස කවුන්ටරයකින් වට වූ ස්ථානයකට වී සිටීමයි. මේ අවස්ථා දෙකෙන් ම බැස ගත හැකි තීරණය එක ම ය. අනාගතයේ දී පුස්තකාලයාධිපතිවරුන් වීමට බලා-පොරොත්තුවන අය සිය පාඨක පිරිසගේ පෞද්ගලික අවශ්‍යතා මග හැරීම නොකළ යුතු වෙයි. කිසිවකුට නොපෙනෙන සැඟවූ ස්ථානයක හෝ කිසිම වර්ගයක ආවරණයක් පිටුපස හෝ සැඟවීමේ පුරුද්ද හැකි තරම් ඔවුන් මග හැරිය යුතුය.

පුස්තකාලවල ගොඩනැගිලිවලින් සිදු විය යුතු අන්දමට ඒවා කාර්ය මණ්ඩල උද්දේශික වීමට වඩා පාඨක උද්දේශික වන්නේ එවිට ය.

පුස්තකාල වෘත්තිය, එබැවින් ලිපිකාර හෝ තාක්ෂණික අංශවලට වඩා, පාඨකයනට උපකාර වීමට සැදී පැහැදී සිටින අය පුස්තකාලයාධිපතිත්වයට තෝරා ගෙන ඔවුන් පුහුණු කළ යුතුය. පසුගිය පරිච්ඡේදවලින් පැහැදිලි වූ පරිදි මෙයින් අදහස් කෙරෙන්නේ ද්‍රව්‍ය තෝරා ගැනීම, භාවිතය සඳහා ද්‍රව්‍ය සකස් කිරීම, ආශ්‍රය යොමු කටයුතු, ග්‍රන්ථ විද්‍යාත්මක සහාය, තොරතුරු ප්‍රචාරණය හා පාඨක උපදේශ යන අංශ කෙරෙහි වෘත්තිය අවධාරණය තිබිය යුතු බවයි.

ලිපිකාර හා තාක්ෂණික කටයුතු පුස්තකාලයාධිපතිවරුන් විසින් අධීක්ෂණය කරනු ලැබේ. එහෙත් ඒවා ඉටු කරනු ලබන්නේ ඔවුන් විසින් නොවේ. මෙය පැහැදිලි කිරීමට නිදර්ශන දෙකක් ප්‍රමාණවත් වේ. පළමුවෙන් ම යම් අය සඳහා පොත් විශේෂයෙන් වෙන් කර තැබීම් සහ කල් ඉකුත් පොත් ගැන ක්‍රියා කිරීම් ඇතුළු ව පොත් සංසරණ ලේඛන පවත්වා ගෙන යාම පුස්තකාලවල දැන් වැඩි වැඩියෙන් ඉටු කරනු ලබන්නේ පරිගණක යන්ත්‍ර මාර්ගයෙනි. කිසි ම ප්‍රමාණයක පුස්තකාලයක ශ්‍රම මූලික (එනිසා වඩාත් ශ්‍රමිකයන් අවශ්‍යවන) ක්‍රම තව දුරටත් පවත්වා ගෙන යාමට කිසි ම අවශ්‍යතාවක් නැත. දෙවනුව ප්‍රාදේශීය වශයෙන් සූචීන් සකස් කිරීම කළ යුතුය. සූචීන් සකස් කිරීම මෙන්ම වර්ගීකරණයද ජාත්‍යන්තර පදනමක් මත කළ යුතු ය. හැම ප්‍රාදේශීය පුස්තකාලයක් ම සිය සූචිකරණ තොරතුරු මධ්‍යම ආයතනයකින් ලබා ගත යුතු ය.

මේ සියලුම වර්ධනයන් පුස්තකාල ගොඩනැගිලිවල සැලැස්ම කෙරෙහි ද බලපානු ඇත. සිය වාස්තු විද්‍යාඥයන් පුස්තකාල ගොඩනැගිලි සැලසුම් කිරීමෙහි අමුතු ම මඟක් ගැනීම පුස්තකාලයාධිපතිවරුන් විසින් අපේක්ෂා කරනු ඇත. අවධාරණය තිබිය යුත්තේ, තනි පුද්ගල පාඨකයන් ගේ අවශ්‍යතා කෙරෙහි නම්, පාඨක පිරිස වැඩි වීම නිසා ඇති වූ

ශබ්ද නවත්වන පිණිස පැහැදිලි ගමන් මාර්ග සහ සෙනග රැස් විය හැකි, විශාල කොටස් සහිත විශාල ගොඩනැගිලි, පළමුවන අවශ්‍යතාවයි. නිලධාරී ගතිගුණ සහිත ස්වභාවයක් සහ නිලධාරී පාලනයක් තිබෙන බවට යම්කිසි හැඟීමක් ගෙන දීම වැළැක් වීමට සුපුරුදු සහ මිත්‍රශීලී වට පිටාවක් ඇති කළ යුතුය. පුස්තකාලයට ඇතුළුවන තැන සිට, විවිධ අධ්‍යයන පහසුකම් සමග පොත පත වැනි පුස්තකාල ද්‍රව්‍ය සපයන, නිශ්ශබ්ද සහ සැප පහසු පරිසරයක් තිබිය යුතු ය. පුස්තකාල කාර්ය මණ්ඩලය හැම තැන ම දක්නට සිටිය යුතුය. එයින් අදහස් කෙරෙන්නේ ඔවුන්ගේ කාලයෙන් වැඩි කොටසක් පාඨකයන්ට හොඳින් පෙනෙන පරිදි පුස්තකාලයේ ගැවසීමයි. එබැවින් තිර වලින් වට වූ විශාල ප්‍රදේශවත්, බාධක හෝ කවුන්ටරවත් සැදීමට වාස්තු විද්‍යාඥයාට අවශ්‍යතාවක් නොලැබෙනු ඇත. පුස්ත කාලයේ කිසි ම දෙරක් 'පෞද්ගලික' යනුවෙන් ලකුණු කර නොතිබිය යුතු ය. දොර ඇත්තේ කුමන ප්‍රදේශයට ඇතුළු වීමට ද යනුවෙන් ලකුණු කිරීමේ වරදක් නැත. අවශ්‍ය නම් පමණක් එයට යතුරු දමා තිබුණාට කම් නැත. මේ පරිච්ඡේදයෙන් පටන් ගත් ඡේදවල සඳහන් කළ පරිදි ගොඩනැගිල්ලේ හැම තැන ම ප්‍රමාණවත් ලෙස සංඥා පුවරු සවි කර තිබිය යුතු ය.

බෙස්වික් විසින් විශේෂයෙන් සඳහන් කර ඇති තවත් දියුණුවක් අධ්‍යාපනික තාක්ෂණයට අදල වේ. මෙහිදී ද දැන් පුස්තකාලයෙන් පිටත සිදුවන දෙය අතරත්, පුස්තකාලය වෘත්තීය විසින් පුස්තකාලය ඇතුළත දී සලසන දේ අතරත්, වැදගත් වෙනසක් තිබේ. පුස්තකාලය පාවිච්චි කරන අලුත් පරම්පරාව, අවශ්‍ය දෘශ්‍ය කෙරෙහි ඉතාමත් දැඩි ලෙස උද්දේ- සික වී ඇති බව, සංස්කෘතිය ගැන පරිච්ඡේදයෙහි අපි දුටුවෙමු. ළමා කාලයේ සිටම ඔහු රූපවාහිනිය බලන්නට පුරුදු ව සිටිත්. එකිනෙකා අතර ලිපි හුවමාරු කර ගන්නවා වෙනුවට ඔහු ටෙලිපෝනයෙන් කතා කරති. ඔවුන් ගේ ජීවිතයෙහි දින චර්යාවට අයත් දේ ලෙස ඔහු ශබ්ද තැටි, ටේප් රෙකෝඩර් සහ ට්‍රාන්සිස්ටර් යන්ත්‍ර භාවිත කරති. වාණිජ්‍යමය ලෙස නිපදවන ලද හෝ චිත්‍රපට සහ ස්ලයිඩ්ස් නරඹති.

බෙස්වික් සඳහන් කරන අන්දමට ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ, එහා මෙහා පහසුවෙන් ගෙන ගිය හැකි, ක්‍රියා කිරීමට පහසු සහ ලාභ වුව ද, පුරෝගාමීන් අතලොස්සක් හැරෙන්නට පුස්තකාල වෘත්තිය තවමත් ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය, පුස්තකාලවලට සම්පූර්ණයෙන් ඇතුළත් කර ගෙන නැත. පුස්තකාල වෘත්තිය මේ නව ක්‍රම සහ ද්‍රව්‍ය යොදා ගැනීමට කොතරම් ප්‍රමාද ද යත්, බොහෝ ආයතන එවැනි පහසුකම් සැපයීමේදී එක්කෝ පුස්තකාලයාධිපතිවරයා ඉක්මවා ගොස් ඇත. එසේ නැතිනම් ඔහු අධ්‍යයන සම්පත් විශේෂඥයකුට දෙවන ස්ථානයේ ලා සලකා ඇත.

අනාගතයෙහි රැකියාවන් රාශියක් ඇති තවත් අංශයක, පුස්තකාල වෘත්තිය එලෙසම ප්‍රමාද වී ඇත. ඒවා නම් පරිගණක තොරතුරු ගබඩා කිරීම හා උද්ධරණ ක්‍රමයි. මේ ක්‍රම අතුරින් වැඩියෙන් ප්‍රසිද්ධ **MEDLARS** ක්‍රමය හා **UKCIS** ක්‍රමයයි. සාමාන්‍යයෙන් පුස්තකාලවල හැරෙන්න මේ අංශයෙහි හැම පැත්තකින්ම ව්‍යාපාර සහ ව්‍යාපෘති ඇත. නිදර්ශනයක් වශයෙන් **Aslib Proceeding** හි 1973 කලාපයේ විශේෂඥයන්ට හා පුස්තකාලයාධිපතීන්ට පරිගණක මගින් තොරතුරු සපයන වාණිජ්‍ය ක්‍රමයක්, යනුවෙන් දැන්වීමක් පළ විය. පෙනෙන පරිදි මෙහිදී අලුතින් ප්‍රකාශ කරන ලද සඟරා ලිපි 30,000 ක පමණ ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර පරිගණකයක ගබඩා කර තබයි. යම්කිසි තොරතුරක් සොයා ගැනීමට යම් කිසිවකු විසින් කළ යුත්තේ පරිගණකයට ටෙලිෆෝන් කොට තමාගේ ටර්මිනලය මගින් අවශ්‍ය තොරතුරු පරිගණකයට දැන්වීමයි, එවිට මිනිත්තු ගණනාවක් ඇතුළතදී අදාල ලිපිවල සම්පූර්ණ විස්තරයක් ලැබෙනු ඇත. බෙස්වික් කල්පනා කරන අන්දමට ජාත්‍යන්තර නාමාවලි දත්ත සේවයක් සකස් වීම, පුස්තකාලයාධිපතිවරුන්ට ඉක්මන් කිරීමට හැකි නම් විස්තරාත්මක ලැයිස්තු සැපයීමේ, ඉතා කුඩා දෙයට පවා සැලකිල්ලක් දැක්වීමට වෙහෙසෙන්නේ නැතිව, ද්‍රව්‍යවලට වඩා අවශ්‍ය වන විෂය විශ්ලේෂනයට වැඩියෙන් අවධානය යෙදීමෙන්, විශ්ව විද්‍යාල පුස්තකාලවල අනාගත සූචි සකසන්නන්ගේ ඒ කාර්ය යෙන් මිදී විෂය පිළිබඳ සේවයට වඩා ගැඹුරින් සේවය කිරීමට සැලැස්විය හැකි වනවා ඇත.

බ්‍රිතාන්‍යයේ එක් පොත් විකුණන ආයතනයක් එහි ග්‍රන්ථ නාමාවලි තොරතුරු සහ ඇණවුම් ආදී සියලුම දේ පරිගණක ගත කර ඇති අතර, ඒ ආයතනය පොත් සපයන පුස්තකාල වැඩි ගණනක් තවමත් සිය සූචි ගත කිරීම් සඳහා පදනම් කර ගෙන ඇත්තේ, ලීයෙන් තැනූ ලාච්චුවල තැන්පත් කර ඇති තුනයි පහේ කාඩ්පත් බව සඳහන් කිරීම ඒ හා සමානව ඛේදජනකය.

පරිගණක යන්ත්‍ර පුස්තකාලවල භාවිතයට එරෙහිව ඇති විශාලතම බාධක දෙක නම් මුදල් නො මැතිකම සහ ඒ සම්බන්ධ විශේෂඥ දැනුමක් නොමැති කම බව තර්ක කළ හැක. කෙසේ හෝ වේවා පුස්තකාල වෘත්තිය නියම ලෙස තම තත්ත්වය තහවුරු කර ගත හොත්, මුදල් ලබා ගැනීම දුෂ්කර කාර්යයක් නොවේ. විශේෂඥ දැනුමක් ඇති අය මුදල් ගෙවා වුවද ලබා ගත හැක. ප්‍රධාන ම බාධකය නම් පුස්තකාල වෘත්තියම වේ. එය ගතානුගතික මෙන්ම විද්‍යාවට වඩා කලා අංශය කෙරෙහි උද්දේශිකත්වයක් දක්වයි. පුස්තකාලයාධිපති වරුන් අතර විද්‍යාඥයන් නොමැති කමින් ඇතිවී ඇති ප්‍රතිඵලය නම් තාක්ෂණික හා නව නිර්මාණවලට නිතැතින්ම විරුද්ධත්වය පැමත්, සිය වැඩ කටයුතුවලට සාම්ප්‍රදයික ක්‍රියා මාර්ගයක් අදල කිරීමට, කලා උද්දේශික කණ්ඩායම් තුළ ප්‍රවණතාවක් ඇති වීමත් වේ.

අනාගතයේදී ඇතිවන පුස්තකාල වෘත්තියෙහි විද්‍යාඥයන් වැඩි අනුපාතිකයක් සිටිය යුතු බවට තවත් හේතූන් ඇත. බ්‍රෝඩ්ෆීල්ඩ් ලියා ඇති පරිදි, 'ඉංග්‍රීසි භාෂාවේ මෙතෙක් කල් 'සාහිත්‍යය වශයෙන් සම්ප්‍රදයානුකූලව හඳුන්වන ලද, කලා රසිකත්වයට හා සමාජ අධ්‍යයනයට වැඩි වශයෙන් සීමා වූ වෘත්තීය දර්ශනය පුළුල් කිරීම පිණිස, පුස්තකාලයාධිපතිත්වය තුළ ස්වාභාවික විද්‍යාඥයන් වැඩි ගණනක් සිටීම අවශ්‍ය වේ. ගැලීලියෝ ගේ කාලය වන තෙක් පුස්තකාලය, දැනුම ලබා ගත හැකි එක ම ස්ථානය වශයෙන් සලකනු ලැබීය. එහෙත් ඔහුගේ සොයා ගැනීම් වලට පසු, ඒ දැනුම බාහිර ස්වාභාවික ලෝක-යෙන්ද ලබා ගත යුතුව තිබුණු බැවින් පුස්තකාල තවමත් හැඩ ගැසීමට වීර්ය කරන, ඉවනස් තත්ත්වයක් ඇති විය. එනම්

පුස්තකාල හා සමඟ කාලානුරූපව දැනුම දියුණු වනවාට වඩා, ස්වාභාවික දැනුම කාලානුරූපව පුස්තකාලවල දැනුම දියුණු කර ගෙන තිබුණ බැවිනි. විද්‍යාව එබැවින් ආඥාත්මක පුස්තකාලයාධිපතිත්වයට හොඳ පිළියමකි.

විද්‍යා දැනුම වර්ධනය නිසා පුස්තකාලයාධිපතිත්වයේ බුද්ධිමය ප්‍රමාණය දැනට වඩා පුළුල් ලෙස පදනම් වීමට හැකි වන අතර විද්‍යාඥයන් හා තාක්ෂණික ශිල්පීන්ට වඩා නැණවත් ලෙස සේවය කිරීමට, පුස්තකාලයට හැකිවනවා ඇතැයි බ්‍රෝඩ්ෆීල්ඩ් තව දුරටත් පෙන්වා දෙයි.

හැම පුස්තකාලයකට ම රසායන විද්‍යාඥයකු, භෞතික විද්‍යාඥයකු, උද්භිද විද්‍යාඥයකු, ගණිත විද්‍යාඥයකු, අර්ථ ශාස්ත්‍රඥයකු යනාදී වශයෙන් ඇතුව සිටීම නොකළ හැක්කක් බැවින්, විෂය පිළිබඳ විශේෂඥකරණය එතරම් දුරට ගෙන ගිය නොහැකි බව මොරිස් ලයින් සඳහන් කර ඇත. අවශ්‍ය වන්නේ විෂයයක් සම්බන්ධයෙන් හෝ විෂයයන් කණ්ඩායමක් සම්බන්ධයෙන් හෝ සාමාන්‍ය දැනුමක් පමණ ය. අවසාන වශයෙන් බලන විට, භෞතික විද්‍යාඥයෙක්, රසායන විද්‍යා ක්ෂෙත්‍රයෙහි නිමග්න වී නොමැත. උද්භිද විද්‍යාඥයෙක්ද එලෙසම සත්ත්ව විද්‍යාවෙහි ඇලී ගැලී නොමැත. විෂය පිළිබඳ විශේෂඥයන්ට සිය ඥානය පුස්තකාල ක්‍රමාවලියට සහ ප්‍රතිපත්තිවලට අදාළ කළ හැකි බව ලයින් විසින් ඉදිරිපත් කරන ලද තවත් වැදගත් කරුණකි. මෙය පුස්තකාල වෘත්තියෙහි විද්‍යාඥයන් වැඩි වන තුරු තාක්ෂණික නව නිර්මාණ පුස්තකාල විසින් සම්පූර්ණයෙන් භාර නොගන්නා බවට ඇති තර්කය තව දුරටත් විකාශනය කිරීමකි. නොයෙක් පුස්තකාල කාර්යයන් තක්සේරු කිරීම ආර්ථික විද්‍යාඥයකුට කළ හැක. පාඨකයන් කෙරෙහි පුස්තකාල ක්‍රම බලපාන අන්දම සමාජ විද්‍යාඥයකුට අගය කළ හැක.

කෙසේ හෝ වේවා පටු විශේෂඥකරණය නැවැත්විය යුතු යයි බ්‍රෝඩ්ෆීල්ඩ් අදහස් කරයි. පුස්තකාලයාධිපතිත්වය විශේෂඥකරණය වැලඳ ගැනීමට ආශාවක් දක්වන අතර, අද උගත් ලෝකය එයින් මිදීමට උදක් ම උත්සාහ කරයි. පුස්තකාලයාධිපතිත්වය අලුත් ම චින්තනවලට සම්බන්ධකම්

තිබුණ ද තවමත් පසුපසට වී ඉදිරියට යැමට තැත් නොකරන බවට මෙය සලකුණකි. සාධාරණකරණයෙහි යුක්ති සහගත භාවය වන්නේ, විශේෂ අධ්‍යයනවල අන්‍යොන්‍ය සහභාගිත්ව යයි. යම්කිසි අධ්‍යයනයක් විශේෂඥ වෙත් ම විවිධ අධ්‍යයන, සිය කාර්යයන් ඉටු කර ගැනීම සඳහා යොදා ගැනීමට තරම් එය සාහසික වෙයි. එබැවින් හොඳම විශේෂඥයා පටු විශේෂඥයා නොවේ. හොඳ ම විශේෂඥයා වනුයේ සිය සාමාන්‍ය දැනුමෙන්, කිසිදක අසන්නට නොලැබුණ හා ඉතාමත් බලාපොරොත්තු විය නොහැකි තැන්වලින් ප්‍රතිඵල දයක තත්ත්වයක් ඇති කිරීමට හැකි වන පුද්ගලයාය. මෙය ඉටු කර ගැනීමට තාවකාලිකව පවා වෙනින් දෙයක් සඳහා විශේෂඥයෙකු වීමට ඔහු කැමති වේ. එහෙත් පටු විශේෂඥතාවයෙන් සිදු වන්නේ සම්පූර්ණ දැනුමෙන් ලැබෙන බලය උගත්කමේ එක අංශයකට නැතිවී යාමයි. අවශ්‍ය ව ඇත්තේ පොදු දැනුමක් සහිත විශේෂඥයෙකියි හේ නිවැරදි ලෙස අවධාරණය කරයි. කලා අංශය කෙරෙහි පුස්තකාල වෘත්තිය තුළ ඇති පක්ෂපාතිත්වයට අදාල මේ අදහස වෙනින් වචනවලින් කියතොත් මෙයින් අදහස් කෙරෙන්නේ ඉතිහාස විශේෂඥයෙකු හෝ ප්‍රංස භාෂාව පිළිබඳ විශේෂඥයෙකු හෝ සම්භාවනීය භාෂා පිළිබඳ විශේෂඥයෙකු විද්‍යාව ටිකක් හෝ දත යුතු බවයි.

'පුස්තකාලයාධිපතිවරයෙකු තුළ සාමාන්‍ය විෂය දැනුම සහ විශේෂ විෂය දැනුම අතර අපූරු සංකලනයක් තිබිය යුතුය'. යන මේ අරමුණ සම්බන්ධයෙන් පුස්තකාලයාධිපති තනතුරට පුහුණු කිරීමේ අනාගත ක්‍රමයක් බ්‍රෝඩ්ෆීල්ඩ් යෝජනා කරයි. මූලික වශයෙන් අවුරුදු හතරක සාමාන්‍ය විශ්ව විද්‍යාල පාඨමාලාවක් ද, අනතුරුව තෝරාගත් ක්ෂෙත්‍රයක අවුරුදු දෙකක පාඨමාලාවක් ද (ඔහු විශේෂඥ පුස්තකාලයාධිපතිවරයෙකු වීමට අදහස් කරයි නම්) පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ එක් අවුරුද්දක පාඨමාලාවක් ද. අනුගමනය කළ යුතුය. එවිට හැම පුස්තකාලයාධිපතිවරයෙකුටම අවුරුදු පහටත් හතටත් අතර විශ්ව විද්‍යාල පුහුණු වීමේ කාලයක් ලැබෙනු ඇත. මේ යෝජනාව සම්බන්ධයෙන් තර්ක කළ හැකි වුව ද, 'පුස්තකාල වෘත්තිය උගත් විය යුතුය' යන

අනාගත අවශ්‍යතාවට ගැලපෙන ලෙස දක්විය හැකි අතර, පුස්තකාලයාධිපති තනතුර සඳහා අධ්‍යාපනය ලැබීම පිළිබඳ මේ පොතේ කර ඇති තීරණය හා සැසඳෙන්නකි. එනම් පුස්තකාලයාධිපතිවරයා ගේ හුදු අධ්‍යාපනය ලැබීමේ ප්‍රමාණ-යෙන් වැදගත්කමයි.

අනාගත විද්‍යාවට බෙස්වික් ගේ ප්‍රවේශය අවසාන වන්නේ පුස්තකාල විසින් අනතුරුව ද්‍රව්‍ය නිෂ්පාදනය සම්බන්ධව අදාල වීමේ හැකියා පිළිබඳ සකච්ඡාවකිනි. ලිඛිතව කරන කාර්යයකට වඩා ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රමයෙන් කරන කාර්යයන් කිරීමට කැමති ශිෂ්‍යයන් සඳහා අධ්‍යයන ද්‍රව්‍ය ගබඩා කරන ලද හා උද්ධරණය කෙරෙන ප්‍රදේශය අසල මේ උපකරණ තිබීම විශ්ව විද්‍යාලයකින් ශිෂ්‍යයන් බලාපොරොත්තුවීම අසාධාරණ-යක් නොවේ. මුද්‍රිත ද්‍රව්‍යයන් සඳහා දැනටමත් ශිෂ්‍යයන්ට ඡායාරූප පිටපත් ගැනීමේ පහසුකම් තිබෙන්නාක් මෙන් ශ්‍රව්‍ය දෘශ්‍ය පිටපත් ගැනීමේ පහසුකම් ද ශිෂ්‍යයන්ට සැපයිය **යුතු** යයි හේ කල්පනා කරයි.

ඇත්ත වශයෙන් ම, පුස්තකාල ද්‍රව්‍ය නිපදවන ක්ෂේත්‍රය පිළිබඳ වැදගත් දියුණුවක් පුස්තකාල විසින් දක්වීම දැනට ම කළ යුතුව තිබෙන බව බෙස්වික් ගේ මේ යෝජනාවලින් තවත් ඔබ්බට ගමන් කිරීමේ දී ආවර්ජනය කිරීම වැදගත් ය. පුස්තකාල අතර පිරුළු ක්‍රමයේ විශාල ප්‍රමාණයක් දැන් කෙරෙන්නේ එක්කෝ ඉතාමත් ලාභයට හෝ එසේ නැත්නම් නොමිලේ හෝ ආපසු නොදෙන ඡායාරූප පිටපත් ක්‍රමයට ය. සූක්ෂම චිත්‍රපට සහ සූක්ෂම ඡායාරූප පිටපත් බොහෝ පුස්තකාලවලින් ලබා ගත හැක. මේවායින් සාම්ප්‍රදායික පිටපත් ලබා ගැනීමට පුස්තකාල විසින් සූක්ෂම චිත්‍රපට පිටපත් සැකසුම් යන්ත්‍ර යොදා ගනු ලැබේ. දැන් ටෙලෙක්ස් වශයෙන් නම් කෙරෙන යන්ත්‍රය, මතුවට දුර පිටපත් ලබා ගැනීම දියුණු කරගන්නවා ඇත. පරිගණකයේ ගබඩා කරන ලද පුස්තකාල නාමාවලී තොරතුරු, දෘශ්‍ය ප්‍රදර්ශක යන්ත්‍රවල පමණක් නොව, අකුරු පේළි මුද්‍රණය වන යන්ත්‍ර වලින් කඩදසි පිටපත්වල ලබා ගැනීමට ද, පාඨකයන්ට හැකි වනවා ඇත. අන්තිමේ දී කිසි ම සැකයක් නැති ව,

පුස්තකාල මාර්ගෝපදේශන සහ යොමු ග්‍රන්ථ නාමාවලී හා කියවීම් ලැයිස්තු පමණක් නොව නියම අධ්‍යාපන පාඨ ග්‍රන්ථ වලින් සමහරක් ද පුස්තකාල නොමිලේ බෙදා දෙනු ඇත.

අධ්‍යයන ද්‍රව්‍යවල නිෂ්පාදනය හා බෙදා හැරීම කෙරෙහි පුස්තකාල විසින් වඩා නිර්ලෝභී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම, නියම වශයෙන්ම ඔවුන්ගේ අනාගතයේ වැඩ කොටසක් විය හැකි ය. ඇලෙක්සැන්ඩ්‍රියාවේ මහා පුස්තකාල විද්වතුන්, පරිවර්තකයන් හා පිටපත්කරුවන් යොදවා හැකි සෑම සාධාරණ අන්දමකින් ම එහි පොත් සම්භාරයට තවත් එකතු කිරීම කළ බැවින්, ද්‍රව්‍ය නිෂ්පාදනය සහ ද්විත්ව කිරීම අලුත් දෙයක් නොවේ යයි බෙස්වික් මතක් කර දේ. අලුත් දෙයක් වන්නේ නිදහස් ත්‍යාගශීලී බෙදා හැරීමේ ප්‍රතිපත්තියකි. මේ මතය ඕර්වෙගා වයි. ගැසට් ප්‍රකාශ කළ අදහස්වලට අනුකූලවන අතර මේ ග්‍රන්ථයේ නව වන පරිච්ඡේදය ඒ අදහස් ගෙනා හැර දක්වා ඇත.

පසුගිය පරිච්ඡේදවල කෙටියෙන් සඳහන් කරන ලද සමහර අනාගත කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී, පුස්තකාල වෘත්තියට අනාගතයේදී අවශ්‍ය වන්නේ කොන්ග්‍රස් සභාවේ පුස්තකාලයාධිපතිකමට කෙනෙකු පත් කර ගැනීම අරභයා පිලික්ස් පැන්ක්පර්ටර් විනිශ්චයකාරතුමා ප්‍රකාශ කළ පරිදි, නිර්මාණශීලී බවත්, ශක්තියත්, දර්ශනයකුත් ය. වර්තමාන කාලය තුළ තිබෙන පරස්පර විරෝධය නම්, නිර්මාණශීලී භාවයට වඩා කළමණාකරණය කෙරෙහි අවධාරණය කරන වැරදි යොමුවක් තිබීමයි. පුස්තකාලයාධිපතිවරු කිසි පලක් නැති කළමනාකාර සේවී වාර්තා, වියදම් වැඩදායක කිරීමේ වැඩ පිළිවෙළවල් හා සංවිධාන සහ ක්‍රම සමීක්ෂණවලට ඕනෑවට වඩා වැඩියෙන් අවධානය යොමු කරති. එසේ නැත්නම් සංකේත, සංඥා හා පොත් එකතුව නොහොත් පොත් සම්භාරයේ ප්‍රමාණය පුස්තකාල ක්‍රමවල ධූරාවලි සම්බන්ධතා, බැහැරදීම සහ ද්විත්ව කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සහ සහ රාක්ක වල ඇසිරීමේ ක්‍රමවල ක්‍රියාකාරිත්වය අරබයා කෙරෙන පර්යේෂණවල ගණිතමය ශිල්ප ක්‍රමය ගැන අත්හදා බැලීම් කරති. ඒ අන්දමට සහ ඒ හේතු සඳහා ම, දෙවන පරිච්ඡේදයේ

සඳහන් කළ පරිදි, පුස්තකාලයක් සාර්ථකව ක්‍රියාත්මක වීමට නම්, ජ්‍යෙෂ්ඨ සිවිල් නිලධාරියකුගේ සංවිධානාත්මක හැකියාවන්ට වඩා කිසිවක් ජාතික පුස්තකාලයකට අවශ්‍ය නොවන බව 1972 දී බ්‍රිතාන්‍ය රජය තීරණය කළාය. එවැනි වැඩි දියුණු කිරීම් හරියට ඉස්තාලය වසා තබා අශ්වයාට පැන යාමට ඉඩ දීම වැනි කාර්යයකි මේ අවස්ථාවේදී අශ්වයා සංකේතවත් කරන්නේ අනාගත පුස්තකාලයාධිපතිත්වයයි.

*References*


1 Beswick, N W: 'The library resource centre in higher education: some personal specuiations'. *Library Association record*, July 1973.

2 Broadfield, A: *A philosophy of librarianship*. London, Grafton, 1949,

3 Line, M B: 'Staffing university libraries'. *British universities annual*, 1965.

4 Maidment, W R: 'Management of libraries and mechanization.' *British librarianship and information science, 1966 - 1970.* London, Library Association, 1972.

5. Mackenzie, A G and Buckland, M K: 'Operational research'. *British librarianship and information science, 1966–1970*. London, Library Association, 1972.

12

# අවසානය

මේ කෘතියෙහි මූලික පදනම වූයේ පුස්තකාල බලයෙහි මූලයන් යන්නයි. මේ බලය ප්‍රධාන වශයෙන් ලැබෙන්නේ පුස්තකාල දැනුම පිළිබඳ ගබඩාවන් හා මනුෂ්‍ය වර්ගයාගේ ජයග්‍රහණය හා සොයා ගැනීම් පිළිබඳ වාර්තා සුරක්ෂිත කරන ස්ථාන බැවිනි. පුස්තකාල අපේ සංස්කෘතිය සුරක්ෂිත කර බෙදා හරියි. ස්වයං සහ විධි පූර්ව අධ්‍යාපනයට පුස්තකාල රුකුල් දේ. අපේ ආර්ථික ශුභසාධනයෙහි ඒවා ඉස්මතු වී දැක් වේ. අනිකුත් සියලුම බුද්ධිමය කලාත්මක සහ නිර්මාණාත්මක කටයුතුවල ඒවා වැදගත් ලෙස සම්බන්ධ වී සිටියි. සාමාජික හා දේශපාලන වෙනස්කම්වල ඒවා උපකරණ වේ. නිදහස් චින්තනයේ ආරක්ෂකයන් වශයෙන් ඒවා නිදහසේ බලකොටු වේ.

එබැවින් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඕනෑ ම දර්ශනයක්, පුස්තකාලවල මේ බලය පිළිබඳ සම්පූර්ණ අගය කිරීමක් මත ශක්තිමත් ලෙස පදනම් වී තිබිය යුතුය. එහෙත් පුස්තකාල වෘත්තිය අද පවත්නා අන්දමට එවැනි අගය කිරීමක් නොකරන බව පැහැදිලි ව ම පෙනෙන අතර ඒවායේ කාලයෙන් සහ ශක්තියෙන් වැඩි කොටසක් කාර්ය ක්‍රම හා ලිපිකාර කටයුතුවලට යොදයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රධාන පුස්තකාල ආයතනවල පාලනය, පුස්තකාල වෘත්තියේ සාමාජිකයන් අතට බාර දීමට මැළිකමක් තිබේ.

මෙයට විසඳුමක් ඇත්තේ, හොඳින් අධ්‍යාපනය ලැබූ සහ ඇප කැපවූ පුස්තකාලයාධිපතිවරුන් ගේ විශිෂ්ට කණ්ඩායමක් ඇති කිරීමෙනි. මේ විශිෂ්ට කණ්ඩායම, ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ව්‍යුහගත කිරීම, එ ලෙස ම වැදගත් වන අතර, ඔවුන් ඉටු කරන කාර්යයන් පුස්තකාලයාධිපති සේවයට නියම ලෙස අයත් කාර්යයන්ට සීමා විය යුතුය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වෘත්තිය සඳහා කරනු ලබන තෝරා

ගැනීම් ඉතා දැඩි ලෙස කරනු ලබන අතර, පුස්තකාල ආයතන පාලනය කිරීමට යෙදෙන පුස්තකාලයාධිපතිවරුන්ගේ සංඛ්‍යාව අඩු වනු ඇත. තාක්ෂණික, ලිපිකාර සහ පරිපාලන කාර්ය මණ්ඩලය වැඩියෙන් සේවයේ යෙදවීමෙන් ශේෂය සමන්විත වෙයි.

සමාජය, අධ්‍යාපනය, සංස්කෘතිය තුළ පුස්තකාලයේ කාර්ය භාරය සාර්ථක ලෙස අර්ථ නිරූපනය කිරීමට හැකි වන්නේ සිය භාරයට පවරන ලද පුස්තකාලවලට, පුස්තකාල වෘත්තිය සුදුසු වූ විට පමණි. පුස්තකාලවලට අදාල ප්‍රශ්න කෙරෙහි පුස්තකාල වෘත්තිය නියම බලපෑම කළ හැක්කේ එවිට ය. අනාගතයේ අභියෝගයට මුහුණ දීමටත්, එයට ගැළපී එක හා සමානව සිටීමටත් හැකි වන්නේ එවිට ය.

බොරලැස්ගමුවේ, කැස්බෑව පාරේ, අංක 217 දරන ස්ථානයේ පිහිටි ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ මුද්‍රණාලයේ මුද්‍රණය කරවා පළ කැරිණි.

බ්‍රිතාන්‍යයේ උසස් පෙළේ පුස්තකාලයාධිපතිවරයෙකු වූ ජේම්ස් තොම්සන් ලියූ 'පුස්තකාල බලය' (Library Power) විසිවන සියවසේ පුස්තකාලයාධිපතිත්වය පිළි-බඳ ලියවුණු විශිෂ්ට කෘතියක් ලෙස සැලකේ.

සමාජයට අවශ්‍ය දැනුම සහ තොරතුරු එක් රැස්කර ඇති මධ්‍යස්ථාන ලෙස පුස්තකාලවල වටිනාකමත් ඒවා සතුව ඇති අසීමිත ශක්තිය හා බලයත් කතුවරයා මෙහිදී විවරණය කරයි. මෙම ආයතනවල කටයුතු කරන පුස්තකාලයාධිපතීන් තමන් සතු බලය හා ශක්තිය නිසිලෙස අවබෝධකර නොගැනීම, වර්තමානයේ පුස්තකාලයාධිපතිත්වය මුහුණ පා ඇති ප්‍රධාන ගැටලුව බව පෙන්වා දෙන කතුවරයා පුස්තකාල වෘත්තිය, එයට සමාජයේ හිමි උසස් ස්ථානය අත්පත්කර ගැනීම සඳහා කළයුතු මූලික දෙය පුස්තකාලයාධිපතීන් තමන් පිළිබඳ නව ආකල්පයන් ඇතිකර ගැනීම බව දක්වයි.

---

පිටකවරය : ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ නිරිතදිග කෙළවර
චිත්‍රය : රංජිත් බණ්ඩාර

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/19
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R.Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..........

Date : 2017/10/19.

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*